# කාර්ය සාධන වාර්තාව - 2016

## උතුරු මැද පළාත් සභාව

ප්‍රධාන ලේකම් කාර්යාලය
සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව
උතුරු මැද පළාත් සභාව
අනුරාධපුර.

# ප්‍රවේශය

2016 වර්ෂයේදී පළාත් සභාව විවිධ මුලාශ්‍රයන්ගෙන් ලද ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් සංවර්ධන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කළ හැකි විය. එහිදී යටිතල පහසුකම් සංවර්ධනය, සමාජ සුභසාධනය, සමාජ ආරක්ෂණය යන අංශයන් කෙරෙහි වැඩි අවධානය යොමු කරමින් සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කර ඇත.

විශේෂයෙන්ම ජාතික ප්‍රතිපත්තියට අනුව යමින් පළාතේ දැක්ම ළඟාකර ගැනිම සඳහා වන සැලසුම්, වැඩසටහන්, ව්‍යාපෘති ක්‍රියාත්මක කළ හැකි විය. සියළු අංශයන් ජාතික ප්‍රතිපත්තීන්ට සමගාමීව ක්‍රියාත්මක කිරීම තුළින් වර්ෂයේ අපේක්ෂිත ඉලක්ක කරා පළාත මෙහෙය වීමට යත්න දරමින් ජනතාවගේ ජීවන තත්වය නඟා සිටුවීම කේන්ද්‍ර කරගත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක විය. මේ සඳහා රජරට පුරවරයෙන් බිහිවූ ජාතික නායකත්වයේ ආශිර්වාදයද පළාත් සභාවේ දේශපාලන නායකත්වය මෙන්ම විධායක කළමනාකරණ යාන්ත්‍රණය ද දැරූ සාමුහික ප්‍රයත්නය හා කැපවීම තුළ ඉහත කී ඉලක්ක වෙත ළඟා විය හැකි විය.

විශේෂයෙන්ම අධ්‍යාපන අංශයේ සංවර්ධනය සඳහා වූ විශේෂ ව්‍යාපෘතිය මගින් පළාතේ පාසල් පද්ධතියේ පැවති යටිතල පහසුකම් ඌනතාවය සැලකිය යුතු ප්‍රමාණයකට සම්පූර්ණ කිරීමටත්, මාර්ග පද්ධතියේ සැලකිය යුතු සංවර්ධනයක් ඇති කිරීමටත් පළාතේ ආදායම් උත්පාදන මාර්ග පුළුල් කිරීමටත් සෞඛ්‍ය ක්ෂේත්‍රය හා සමාජ ආරක්ෂණ සේවා පුළුල්ව සැපයිය හැකි වූ වසරක් ලෙසත්, පළාතේ ජනතාවට ප්‍රබල අභියෝගයක්ව පැවති පිරිසිදු පානීය ජලය ලබා ගැනීම සඳහා පානීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ඇතුළු පළාතේ ප්‍රමුඛ ගැටළුවලට විසඳුම් ලබාදිය හැකිවූ වසරක් ලෙසද සඳහන් කළ හැකිය.

මෙහිදී ගරු ආණ්ඩුකාරතුමා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ගරු පළාත් සභා අමාත්‍යතුමන්ලා සහ ගරු මන්ත්‍රීතුමන්ලාද, ප්‍රධාන ලේකම්තුමා, අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින් හා ප්‍රාදේශිය ලේකම්තුමන්ලා ඇතුළු අනෙකුත් රාජ්‍ය ආයතන හා සංවිධානද ප්‍රජා දායකත්වයද සපයමින් පළාත් සංවර්ධන කාර්යය ශක්තිමත්කර ගැනීම සඳහා දායකත්වය සැපයූ සියළු දෙනාම ගෞරවයෙන් සිහිපත් කරමි.


පි.බී . දයාරත්න,<br>
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( සැලසුම් ),<br>
ප්‍රධාන ලේකම් කාර්යාලය,<br>
උතුරු මැද පළාත.

# උතුරු මැද පළාත

රජරට නුවරකලාවිය නොහොත් වැව් බැඳි රාජධානිය ලෙස විරුධාවලිය ලද උතුරු මැද පළාත, ශ්‍රී ලංකාවේ ප්‍රථම සහ ද්විතිය රාජධානි ඇතුලත් වූ අතිශයින්ම පුණ්‍යවන්ත වූ ස්වර්ණ භූමියකි. අනුරාධපුර සහ පොළොන්නරුව ලෙස වර්තමානයේදී භාවිතා වන පරිපාලන දිස්ත්‍රික්ක දෙකෙන් සමන්විත උතුරු මැද පළාත එයටම ආවේණික, අනන්‍ය, අවියෝජනීය, නෛසර්ගික සහ අද්විතීය අගයන්ගෙන් හා ශ්‍රී විභූතීන්ගෙන් සමන්විතය. අග්‍රගණ්‍ය සහ අසමසම අගයන් හා ජාතික උරුමයන් රැසක් දැයට දායාද කරමින් එම පෞඩත්වය මිහිඳන් ව සහ ඇතැම්විට ඉස්මතු වී පෙනෙමින් ශ්‍රේෂ්ඨ ජාතියක විශ්මය ජනක ගමන් මඟ යළි යළිත් සුජාතවන පරපුරට නිහඬව කියා දෙයි. සිංහල රාජ්‍ය වංශකතාව, ශිෂ්ටාචාරය හා සංස්කෘතියේ ප්‍රභවය හා විකාශනය මෙන්ම සිදු වූ ප්‍රවණතා පිළිබඳ සැලකීමේදී ශ්‍රී ලංකාව සංවර්ධිත රටක් බවට පත් කිරීමේදී ඒ සඳහා අවශ්‍ය වන ඓතිහාසික ශක්තිමත් අඩිතාලම රජරටින් සපයයි.



ශ්‍රී ලංකාවේ ජනාවාසකරණය, ජල ශිෂ්ටාචාරය රාජ්‍ය වංශ කතාව, දේශපාලනය, කළමනාකරණය හා පරිපාලනය, බෞද්ධ දර්ශනය, පුරාවිද්‍යාව-වාස්තු විද්‍යාව, මූර්ති හා කැටයම් කලාව, භාෂාව හා සාහිත්‍ය, ආදී සංස්කෘතිකාංග මෙන්ම ඒ මත ගොඩනැගුණු ශිෂ්ටාචාරයන් හා සභ්‍යත්වයන් ලොවට කියාපාන්නේ රජරට පුණ්‍ය භූමියෙන් ය.නවතම ප්‍රතිපත්ති, සැලසුම්, ක්‍රමෝපායන් සහ තාක්ෂණය සොයා අප යා යුතු වන්නේ රජරට පැවති ශ්‍රී විභූතිය වෙතට ගමන් කිරීමෙනි.



ක්‍රි.පූ. 543 දී පමණ එනම් සම්බුද්ධ පරිනිර්වාණ දිනයේදීම සිදු වූ විජයාවතරණයෙන් පසු අනුරාධ නම් සෙනෙවියෙකු අනුරාධ නැකතින් මල්වතුඔය අසල අනුරාධපුර ජනාවාසය ආරම්භ කරන ලදී. ක්‍රි.පූ. 4 දී පමණ ජෝතිය නැමැති ජෛන බමුණකුගේ සැලසුමකට අනුව පණ්ඩුකාභය රජතුමා විසින් අනුරාධපුර නගරය නිර්මාණය කර ඇත. එම නගර නිර්මාණය වර්තමානයේදී අගනගර නිර්මාණයේදී අනුගමනය කරනු ලබන අංගෝපාංගයන්ගෙන් බහුතරයකගෙන් සමන්විතවී තිබීම විශ්මයජනකය.

පොළොන්නරුව මුලින්ම අගනුවර කරගත්තේ චෝල ආක්‍රමණිකයන් විසින්ය. ක්‍රි.ව 1070 පමණ චෝල ආක්‍රමණිකයන් පලවා හැර පළමු වන විජයබාහු රජු විසින් අගනුවර ලෙස පොළොන්නරුව තෝරා ගෙන ඇත. චෝල පාලන සමයේදී ජනනාතමංගලම් ලෙස හැඳින් වූ පොළොන්නරු යුගය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දී ශ්‍රී ලංකාවේ කැපී පෙනෙන වකවානුවකි. අනුරාධපුර මෙන්ම ජල ශිෂ්ටාචාරය මත පදනම් වූ මෙම යුගය විශ්මිත කලා නිර්මාණ හා භාෂා සාහිත්‍ය අතින්ද ස්වර්ණමය යුගයකි. එම කාලයේදී මෙරටින් පිට රටට පවා සහල් යැවූ බව පැරණි පොත පතෙහි සඳහන් වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනයට සමගාමීව 1987 අංක 42 දරණ පළාත් සභා පණතින් සැලසුණු අවකාශයට අනුව ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත විය. මේ අනුව යහපාලන සංකල්පයට අනුගත වීම රජයේ ප්‍රධාන අරමුණක් වන අතර ඊට අනුව යමින් ශ්‍රී ලංකාවේ දේශපාලන හා පරිපාලන ව්‍යුහය තුළ පළාත් සභා ක්‍රමය හැරවුම් ලක්ෂයක් වන අතර පළාත් සභා ක්‍රමය තුළින් බලය බෙදා හැරීම සහ ප්‍රාදේශියව පවත්නා සමාජ ආර්ථික සංවර්ධන විෂමතා අවම කිරීම සඳහා මූලික දායකත්වයක් පළාත තුළින් සපයා ඇත. මධ්‍යම රජයට අමතරව මධ්‍යම රජයේ නියාමනයට අනුව පළාතේ සංවර්ධන පරිපාලන සමාජ සුභසාධන හා සමාජ ආරක්ෂණ මෙන්ම පුනරුත්තාපන හා ප්‍රතිසංවර්ධන කටයුතු වලදීද ප්‍රධානම කළමණාකරණ කේන්ද්‍රස්ථානය වන්නේ පළාත් සභාවයි. පළාතක ජන ජීවිතයේ යහපැවැත්ම, සමෘද්ධිමත් බව, සුභසිද්ධිය, තිරසාර බවට බාධා පමුණුවන පීඩාවන්, ප්‍රබල අභියෝග හා ගැටලු හඳුනාගෙන ඒ සඳහා තිරසාර, කඩිනම්, විධිමත් සහ ඉලක්කගත පිළියම් යෙදීමට පළාත් සභා ක්‍රමය යොදාගෙන ඇත.





පරිපාලන දිස්ත්‍රික්ක අටකින්ද [8] මායිම්ව පිහිටා ඇති උතුරු මැද පළාත, දිවයිනේ විශාලම පරිපාලන දිස්ත්‍රික්කය වේ. පළාතේ සම්පූර්ණ ජනගහනය 1,401,561ක් වන අතර මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර 10,645ක් පමණ වේ. එය ශ්‍රී ලංකාවේ සමස්ත භූමි ප්‍රමාණයෙන් 16% ක ප්‍රමාණයකි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ විසිනවයකින්ද [29], මහනගර සභා එකකින් ද [01], ප්‍රාදේශීය සභා විසිපහකින් ද [25], ග්‍රාම නිලධාරී වසම් නමසිය අසූ අටකින් ද [988] සමන්විත වේ. උතුරු මැද පළාතේ ජනගහනය ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් 6.5%ක පමණ ප්‍රතිශතයකි. පළාතේ මුළු පවුල් සංඛ්‍යාව 365,000 ක් පමණ වන අතර සමෘද්ධි සහනාධාර හිමි පවුල් සංඛ්‍යාව 83,180ක් පමණ වේ. දළ දේශීය නිෂ්පාදිතයට පළාතෙන් කරනු ලබන දායකත්වය 5.4 %ක පමණ ප්‍රතිශතයකි.

ජනඝනත්වය දෙස බැලීමේදී වර්ග කිලෝ මීටර එකක පදිංචි පුද්ගලයන් සංඛ්‍යාව 142 කි. මෙහිදී විශේෂත්වය වන්නේ ජනඝනත්වය අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කයට වඩා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනඝනත්වය ඉහළ අගයක් ගැනීමයි. පළාතේ භූමි ප්‍රමාණයෙන් විවිධ ප්‍රමාණයේ ජලාශයන්ගෙන් වර්ග කිලෝ මීටර 782ක් පමණ ආවරණය වී ඇත. සමස්ත ජනගහනයෙන් 5%ක් පමණ නාගරිකව ජීවත් වේ. පළාතේ පවතින විවිධ සම්පත් සහ විභව ශක්තීන් අතර මානව සම්පත, සරුසාර පස, ජලය, වනාන්තර, දැව, පොස්පේට්, රෝස තිරුවානා, සත්ව හා මිරිදිය, ධීවර සම්පත, පරිසර පද්ධතිය සහ විශේෂයෙන්ම එල්ලංගා ස්වරූපයේ වාරි පද්ධතිය සහ 250,000 ද ඉක්මවා ඇති පළාතේ ගව සම්පත විශේෂිත වේ.

## උතුරු මැද පළාතේ වැදගත් සමාජ ආර්ථික තොරතුරු

### 01.භූමි ප්‍රමාණය හා විශාලත්වය

| දිස්ත්‍රික්කය | ප්‍රමාණය(ව.කි.මී) | | |
|---|---|---|---|
| | ගොඩබිම් ප්‍රමාණය | අභ්‍යන්තර ජලාශ | මුළු භූමි ප්‍රමාණය |
| අනුරාධපුර | 6,627 | 552 | 7,179 |
| පොළොන්නරුව | 3,262 | 204 | 3,466 |
| උතුරු මැද පළාත | 9,889 | 756 | 10,645 |

### 02.ජනගහනය හා ජනඝනත්වය [2016]

| විස්තරය | 2012 | 2016 |
|---|---|---|
| මුළු ජනගහනය | 1,260,000 | 1,401,561[රැස් කරන ලද දත්ත] |
| ඡන්ද හිමි ජනගහනය | 967516[2015] | 982,568 |
| නාගරික ජනගහනය | 50,595 | 700,078 ඇස්තමේන්තුගත |
| ග්‍රාමීය ජනගහනය | 121,652 | 1,331,483 ඇස්තමේන්තුගත |
| ජනඝනත්වය | 128 | 142 |

### 03.සමාජ ආර්ථික දර්ශක [2015/2016]

| විස්තරය | 2015 | 2016 |
|---|---|---|
| පළාත් දළදේශීය නිෂ්පාදිතය[රු.මිලියන] | 607,000 | - |
| ජාතික නිෂ්පාදිතයට පළාතේ දායකත්වය[%] | 5.4 | |
| සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 86,126 | 83,180 |
| දරිද්‍රතා අනුපාතය[2012/2013] | 7.3 | |
| විරැකියා අනුපාතය[2014] | 3.3 | |

### 04.අධ්‍යාපන

| විස්තරය | 2015 | 2016 |
|---|---|---|
| පාසල් සංඛ්‍යාව | 806 | 811 |
| ගුරුවරුන් සංඛ්‍යාව | 16,101 | 16,264 |
| ශිෂ්‍ය සංඛ්‍යාව | 273,806 | 280,963 |
| ගුරු සිසු අනුපාතය | 1:17 | 1:17 |
| පරිගණක සාක්ෂරතාව[%] | 21.2 | 21.6 |

## 05.ජාතික විභාග ප්‍රතිඵල

| විස්තරය | 2014 | 2015 | 2016 |
|---|---|---|---|
| අ.පො.ස.සා.පෙළ සමත් ප්‍රතිශතය(උ.පෙ.සඳහා සුදුසුකම් ලැබූ) | 65.25 | 66.61 | 69.94 |
| අ.පො.ස උ.පෙ. සමත් ප්‍රතිශතය (විශ්ව විද්‍යාල ප්‍රවේශය ලැබීමට සුදුසුකම් ලැබූ) | 59.12 | 59.56 | 63.36 |

## 06.සෞඛ්‍ය තොරතුරු

| විස්තරය | 2014 |
|---|---|
| දළ උපත් අනුපාතිකය | 17.5 |

## 07.අනෙකුත් සෞඛ්‍ය අංශය හා සම්බන්ධ තොරතුරු

| විස්තරය | 2017 |
|---|---|
| ශික්ෂණ රෝහල් සංඛ්‍යාව | 1 |
| මහ රෝහල් සංඛ්‍යාව | 1 |
| මූලික රෝහල් සංඛ්‍යාව | 5 |
| ප්‍රාදේශීය රෝහල් සංඛ්‍යාව | 48 |
| ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර ඒකක සංඛ්‍යාව | 35 |

## 08.කෘෂි නිෂ්පාදනය

| විස්තරය | 2015/2016 මහ | 2016 යල |
|---|---|---|
| වී වගා කරන භූමි ප්‍රමාණය (හෙක්.දහස්) | 161.5 | 112.5 |
| වාර්ෂික වී නිෂ්පාදනය (මෙ.ටො.දහස්) | 657.3 | 466.3 |
| අතිරේක ආහාර බෝග නිෂ්පාදනය (මෙ.ටො) | 87,989 | - |
| වාර්ෂික එළවළු නිෂ්පාදනය( මෙ.ටො) | 40,959 | - |
| | 2015 | 2016 |
| වාර්ෂික මිරිදිය ධීවර නිෂ්පාදනය (මෙ.ටො) | 23860(2014) | - |
| වාර්ෂික කිරි නිෂ්පාදනය(ලීටර් මිලියන) | 35.9 | - |

## 09.සමාජ තත්වය

| විස්තරය | 2012/2013 |
|---|---|
| විදුලිබල පහසුකම් සහිත නිවාස(%) | 87.4 |
| ආරක්ෂිත පානීය ජල පහසුකම් සහිත පවුල් (%) | 93.4 |
| ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සහිත නිවාස (%) | 98.6 |
| ස්ථිර තත්වයේ නිවාස(%) | 94.6 |

# ඉදිරි දැක්ම

සංවර්ධනයේ ප්‍රතිලාභ මැනවින් හිමිකරගත් අභිමානවත් ජනතාවකගෙන් පිරිපුන් පළාතක් රටට දායාද කිරීම.

# මෙහෙවර

සියළුම පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන්, පළාතේ පවතින සියළුම සම්පත්වල හා විභවතාවන්ගෙන් ප්‍රශස්ත උපයෝජනයෙන්, පළාතේ මානව සම්පත් සංවර්ධනය ප්‍රමුඛ කරගත් ආර්ථික සංවර්ධන ප්‍රවේශයකින් විනිවිද භාවයෙන් යුතුව පළාත සංවර්ධනය කරමින් ජාතික සංවර්ධනයට සෘජු හා අඛණ්ඩ ලෙස දායක වීම.

## පළාත් සභාවේ ප්‍රධාන කාර්යයන්

- නීතිය හා සාමය පවත්වාගෙන යාම
- පළාත් සභා පරිපාලනය
- මූල්‍ය කළමනාකරණය
- මානව සම්පත් කළමනාකරණය
- ඉඩම් පරිපාලනය හා සංවර්ධනය
- වාරිමාර්ග සංවර්ධනය
- කෘෂිකර්ම සංවර්ධනය
- පශු සම්පත් සංවර්ධනය
- කර්මාන්ත සංවර්ධනය
- ප්‍රාදේශීය සංවර්ධනය
- සමූපකාර සංවර්ධනය
- ප්‍රජා සංවර්ධනය
- රෝහල් සේවාවන් සංවර්ධනය හා පවත්වාගෙන යාම
- මහජන සෞඛ්‍ය සේවාවන් සංවර්ධනය
- පොදු සෞඛ්‍ය සේවාවන් සහ පෝෂණ කටයුතු
- දේශීය වෛද්‍ය සේවාවන්
- පර්යේෂණ හා සංවර්ධන
- ප්‍රාථමික හා ද්වීතීක අධ්‍යාපනය
- අධ්‍යාපන ප්‍රවේශය සහ සහභාගීත්වය දියුණු කිරීම
- අධ්‍යාපන සැලසුම් හා පාලන සේවා
- ක්‍රීඩා සංවර්ධනය
- සංස්කෘතික සංවර්ධනය
- සමාජ ආරක්ෂණය හා සමාජ සුභසාධනය
- සංවර්ධන සැලසුම්කරණය හා මෙහෙයවීම
- මාර්ග සංවර්ධනය
- තොරතුරු තාක්ෂණය
- මාර්ගස්ථ මගී ප්‍රවාහනය
- ග්‍රාම සංවර්ධනය
- ඉදි කිරීම් සහ ඉංජිනේරු සේවා
- නිවාස සංවර්ධනය
- පළාතේ විගණන හා විමර්ශන කටයුතු
- පළාතේ ප්‍රතිපත්ති, සැලසුම්කරණය හා පසුවිපරම් කටයුතු
- පළාත් ආදායම් කටයුතු
- පළාත් පාලන කටයුතු
- සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ
- සංස්කෘතික හා කලා සංවර්ධනය
- මුල් ළමාවිය සංවර්ධනය
- පරිවාස හා ළමාරක්ෂක
- මාර්ග සංවර්ධන හා මගී ප්‍රවාහන කටයුතු

# පළාත් ගීතය

දිලේ රන්වැලි සැ හිසින් හිරු
රන් කිරණ ගෙන සිළුමිණේ
සැලේ මහ බෝ ළදළු පවනින්
සිසිල පතුරා බුදු ගුණේ

සයුරු පරදන වැව් තලා මත
සිය දහස් සියපත් පිපේ
අත වනා සිරිකතට හිනැහෙයි
රන් කරල් පුලතිසි කෙතේ

සව් සිරින් ගැදි පැදි කුසුම් මී
පන් හිදෙන් උතුරා හැලේ
රළු පරළු සෙල් කුළු මෙලෙක් වී
රූ රටා විස්කම් මැවේ

සියකමින් නොව යුතුකමින් සිත්
පහන් කළ විරු පරපුරේ
ගැමුණු පැරකුම් රජුන් විකුමන්
දිසෙයි යළි රජරට බිමේ

පද රචනය - පූජ්‍ය පල්ලේගම හේමරතන හිමි
සංගීතය - විශාරද කරුණාරත්න විජේවර්ධන

## පළාත් ධජය



## පළාත් පුෂ්පය



# උතුරු මැද පළාත - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ




## අනුරාධපුර දිස්ත්‍රික්කය

1. ගලෙන්බිඳුණුවැව
2. ගල්නෑව
3. හොරොව්පොතාන
4. ඉපලෝගම
5. කහටගසදිගිලිය
6. කැබිතිගොල්ලෑව
7. කැකිරාව
8. මහවිලච්චිය
9. මැදවච්චිය
10. මිහින්තලේ
11. නාච්චාදූව
12. නොච්චියාගම
13. මධ්‍යම නුවරගම් පළාත
14. නැගෙනහිර නුවරගම් පළාත
15. පදවිය
16. පලාගල
17. පලුගස්වැව
18. රාජාංගනය
19. රඹෑව
20. තලාව
21. තඹුත්තේගම
22. තිරප්පනේ

## පොළොන්නරුව දිස්ත්‍රික්කය

1. දිඹුලාගල
2. ඇලහැර
3. හිඟුරක්ගොඩ
4. ලංකාපුර
5. මැදිරිගිරිය
6. තමන්කඩුව
7. වැලිකන්ද

# උතුරු මැද පළාත් සභා සංවිධාන ව්‍යුහය



## උතුරු මැද පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමන්, ගරු ප්‍රධාන අමාත්‍යතුමන් ඇතුළු ගරු අමාත්‍ය මණ්ඩලය

| අ.අ | තනතුර | නම |
|---|---|---|
| 01 | උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරවර | පී.බී.දිසානායක මැතිතුමා |
| 02 | උතුරු මැද පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදන, පළාත් පාලන, පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම්, විශේෂ ව්‍යාපෘති, සංචාරක, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ප්‍රධාන අමාත්‍ය | එස්.එම්.පේෂල ජයරත්න බංඩාර මැතිතුමා |
| 03 | උතුරු මැද පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය | කේ.එච්.නන්දසේන මැතිතුමා |
| 04 | පළාත් ඉඩම්, පළාත් වාරිමාර්ග, ග්‍රාම සංවර්ධන හා කාන්තා කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය | එච්.බී.සේමසිංහ මැතිතුමා |
| 05 | උතුරු මැද පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන, සත්ව සෞඛ්‍ය, ධීවර සහ නිවාස කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය | ආර්.එම්.පී.බී.රත්නායක මැතිතුමා |
| 06 | උතුරු මැද පළාත් ප්‍රවාහන ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර, වෙළෙඳ හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය | එස්.එම්.රංජිත් මැතිතුමා |

## උතුරු මැද පළාත් සභාවේ ගරු ධුරධාරී මන්ත්‍රීවරුන්

| අ.අ | නම | තනතුර | පක්ෂය |
|---|---|---|---|
| 1 | ගරු ටී.එම්.ආර්.සිරිපාල මැතිතුමා | සභාපති | ආණ්ඩු පක්ෂය |
| 2 | ගරු ජයන්ත මාරසිංහ මැතිතුමා | උප සභාපති | ආණ්ඩු පක්ෂය |
| 3 | ගරු අනිල් රත්නායක මැතිතුමා | විපක්ෂනායක | විපක්ෂය |
| 4 | ගරු ඒ.එස්.කේ.රත්නායක මැතිතුමා | සභානායක (2016.12.19 දින මිය යන ලදී) | ආණ්ඩු පක්ෂය |
| 5 | ගරු කල්‍යාණවතී කරල්ලියද්ද මැතිතුමිය | ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක | ආණ්ඩු පක්ෂය |

# උතුරු මැද පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරුන්

| අනු අංකය | නම | තනතුර | පක්ෂය |
|---|---|---|---|
| 01 | ගරු ජී.වීරසේන මැතිතුමා | පළාත් සභා මන්ත්‍රී | එ.ජ.නි.ස |
| 02 | ගරු සුසිල් ගුණරත්න මැතිතුමා | පළාත් සභා මන්ත්‍රී | එ.ජ.නි.ස |
| 03 | ගරු එම්.හේරත් බංඩා මැතිතුමා | පළාත් සභා මන්ත්‍රී | එ.ජ.නි.ස |
| 04 | ගරු ජී.ජී.චන්ද්‍රසේන මැතිතුමා | පළාත් සභා මන්ත්‍රී | එ.ජ.නි.ස |
| 05 | ගරු සරත් ඉලංගසිංහ මැතිතුමා | පළාත් සභා මන්ත්‍රී | එ.ජ.නි.ස |
| 06 | ගරු ඩබ්ලිව්.එම්.උපාලි විජේකෝන් මැතිතුමා | පළාත් සභා මන්ත්‍රී | එ.ජ.නි.ස |
| 07 | ගරු ජනක් මහේන්ද්‍ර අධිකාරී මැතිතුමා | පළාත් සභා මන්ත්‍රී | එ.ජ.නි.ස |
| 08 | ගරු පී.බී.කුමාර මැතිතුමා | පළාත් සභා මන්ත්‍රී | එ.ජ.නි.ස |
| 09 | ගරු කේ.පී.සරත් කුමාරසිරි මැතිතුමා | පළාත් සභා මන්ත්‍රී | එ.ජ.නි.ස |
| 10 | ගරු ඒ.අතුකෝරල මැතිතුමා | පළාත් සභා මන්ත්‍රී | එ.ජ.නි.ස |
| 11 | ගරු අබ්දුල් රහීම් අබ්දුල් හුසේන් මැතිතුමා | පළාත් සභා මන්ත්‍රී | එ.ජ.නි.ස |
| 12 | ගරු සම්පත් ශ්‍රී නිලන්ත වික්‍රමආරච්චි මැතිතුමා | පළාත් සභා මන්ත්‍රී | එ.ජ.නි.ස |
| 13 | ගරු වසන්ත සමරසිංහ මැතිතුමා | පළාත් සභා මන්ත්‍රී | ජ.වි.පෙ |
| 14 | ගරු එම්.එම්.ඩොනල්ඩ් මැතිතුමා | පළාත් සභා මන්ත්‍රී | එ.ජා.ප |
| 15 | ගරු එස්.එච්.එම්.අන්සාර් මැතිතුමා | පළාත් සභා මන්ත්‍රී | එ.ජා.ප |
| 16 | ගරු එච්.ජී.පි.කේ.කේ.නෙල්සන් මැතිතුමා | පළාත් සභා මන්ත්‍රී | එ.ජා.ප |
| 17 | ගරු එස්.ඒ.ජනක ප්‍රියන්ත සමරසිංහ මැතිතුමා | පළාත් සභා මන්ත්‍රී | එ.ජා.ප |
| 18 | ගරු ඩී.එම් අමරතුංග මැතිතුමා | පළාත් සභා මන්ත්‍රී | එ.ජා.ප |
| 19 | ගරු කස්තුරි අනුරාධනායක මැතිතුමා | පළාත් සභා මන්ත්‍රී | එ.ජා.ප |
| 20 | ගරු ආර්.එම්.ප්‍රසන්න කුමාර මහින්දරත්න මැතිතුමා | පළාත් සභා මන්ත්‍රී | එ.ජා.ප |
| 21 | ගරු අරුණ බුද්ධික ගුණසේකර මැතිතුමා | පළාත් සභා මන්ත්‍රී | එ.ජා.ප |
| 22 | ගරු ඩබ්ලිව්.එම්.රෝහන බංඩාර මැතිතුමා | පළාත් සභා මන්ත්‍රී | එ.ජා.ප |
| 23 | ගරු පී.සහිදු මැතිතුමා | පළාත් සභා මන්ත්‍රී | එ.ජා.ප |

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 01. | ආණ්ඩුකාරවර ලේකම් කර්යාලය | 11 |
| 02. | පළාත් සභාව සහ පළාත් සභා ලේකම් කාර්යාලය | 15 |
| 03. | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 19 |
| 04. | පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව | 24 |
| 05. | ප්‍රධාන ලේකම් කාර්යාලය | 28 |
| 5.1. | පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 33 |
| 5.2. | පළාත් භාණ්ඩාගාරය | 41 |
| 5.3. | පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | 44 |
| 5.4. | පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව | 47 |
| 5.5. | පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය | 50 |
| 5.6. | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | 56 |
| 06. | පළාත් ප්‍රධාන අමාත්‍යාංශය | 61 |
| 6.1. | පළාත් පාලන දෙපාර්තමේන්තුව | 80 |
| 6.2. | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 86 |
| 6.3. | පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව | 90 |
| 6.4. | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | 97 |
| 6.5. | සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ එජන්සිය | 102 |
| 6.6. | මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය | 105 |
| 6.7. | පුස්තකාල සේවා මණ්ඩලය | 111 |
| 07. | පළාත් කෘෂිකර්ම,කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය, ධීවර සහ නිවාස කටයුතු අමාත්‍යාංශය | 120 |
| 7.1. | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 130 |
| 7.2. | පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 137 |
| 08. | පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක, පරිසර සහ පළාත් සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | 145 |
| 8.1. | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 152 |
| 8.2. | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | 155 |
| 8.3. | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපර්තමේන්තුව | 159 |
| 8.4. | පළාත් සමාජ සේවා දෙපර්තමේන්තුව | 163 |
| 09. | පළාත් ප්‍රවාහන, ක්‍රීඩා සහ යෞවන කටයුතු, සමුපකාර වෙළඳ හා අහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය | 173 |
| 9.1. | පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 182 |
| 9.2. | පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 186 |
| 9.3. | කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 190 |
| 9.4. | මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය | 193 |
| 9.5. | පළාත් ක්‍රීඩා දෙපාර්තමෙන්තුව | 201 |
| 10. | පළාත් වාරිමාර්ග, ඉඩම් , ග්‍රාම සංවර්ධන සහා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 210 |
| 10.1. | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 215 |
| 10.2. | පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 221 |
| 10.3. | පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව | 225 |
| ඇමුණුම් | | 231-247 |

# 2016 සංවර්ධන සැලැස්ම

## 2016 වර්ෂය සඳහා පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මඟින් අනුමැතිය ලබා දුන් සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය.

### [2016.12.31 දිනට වියදම]

| සංරචකය | වෙන්කළ මුදල (රු.මි) | 2016 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘති වල මුළු වටිනාකම (රු.මි) | වියදම රු.2016.12.31 දිනට | අනුමත ව්‍යාපාති සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ප්‍රධාන අමාත්‍යාංශය | 3,175.65 | 3,284.15 | 1,852.69 | 1,736 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 335.00 | 336.45 | 160.38 | 145 |
| සෞඛ්‍යය අමාත්‍යාංශය | 1,282.99 | 1,282.99 | 602.03 | 537 |
| සමුපකාර අමාත්‍යාංශය | 198.20 | 194.39 | 151.88 | 220 |
| වාරිමාර්ග අමාත්‍යාංශය | 584.31 | 572.17 | 362.47 | 259 |
| **අමාත්‍යාංශවල එකතුව** | **5,576.15** | **5,670.15** | **3,129.45** | **2,897** |
| පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව - විමධ්‍යගත | 165.00 | 164.89 | 163.29 | 3,218 |
| පසුගාමී ගම්මාන සංවර්ධනය සූර්ය කෝෂ | 3.84 | 3.84 | 2.89 | 1 |
| පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව - අනෙකුත් | 5.00 | 5.00 | 4.77 | 15 |
| ප්‍රධාන ලේකම් කාර්යාලය | 112.75 | 112.75 | 63.36 | 25 |
| පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 2.85 | 2.20 | - | 5 |
| සමුපකාර සේවක කොමිෂන් සභාව | 0.70 | 0.70 | - | 4 |
| පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | 17.79 | 17.79 | 15.38 | 17 |
| ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය | 15.43 | 15.43 | 5.13 | 11 |
| අභ්‍යන්තර විගණන ඒකකය | 2.80 | 2.80 | 2.47 | 4 |
| පළාත් සභා ලේකම් කාර්යාලය | 6.10 | 1.91 | 1.33 | 14 |
| පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | 17.18 | 17.18 | - | 14 |
| කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය | 14.50 | 6.46 | - | 14 |
| ප්‍රධාන ලේකම් කාර්යාලය හා සම්බන්ධ අනෙකුත් ආයතනවල එකතුව | 363.94 | 350.95 | 258.62 | 3,342 |
| **මුළු එකතුව** | **5,940.09** | **6,021.12** | **3,388.08** | **6,239** |

# 01

# ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය

01

# ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය

## ඉදිරි දැක්ම

"අභිමානවත් ජනතාවක්, සමෘද්ධිමත් පළාතක්"

## මෙහෙවර

"ව්‍යවස්ථාපිත කටයුතු, ප්‍රතිපත්ති සම්පාදනය, ආයතනික කටයුතු, මූල්‍ය නියාමනය සහ සමාජ - ආර්ථික කටයුතු සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව ජාතික ප්‍රතිපත්තියට අනුගතව සාධාරණ හා සමාන ක්‍රමවේද අනුව අභිමානවත් ජනතාවක් ජීවත්වන සමෘද්ධිමත් පළාතක් බිහිකිරීම සඳහා අඛණ්ඩව දායකවීම".

## අරමුණු

- ගුණාත්මක පළාත් රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම.
- විධිමත් මූල්‍ය කළමනාකරණයක් ඇති කරලීම.
- පළාතේ සංවර්ධනය සඳහා ප්‍රතිපත්තියක් සකස් කිරීම.
- මහජන ගැටලු විසඳීම සඳහා මගපෙන්වීම.
- සාරධර්ම පිළිපදින සමාජයක් කරා යොමු කිරීමට කටයුතු කිරීම.

## ප්‍රධාන කාර්යයන්



### ප්‍රධාන උපාය මාර්ගයන්

පළාතේ පරිපාලන හා මූල්‍ය යාන්ත්‍රණය ක්‍රියාකරවීමේ ප්‍රධානම ආයතනය වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා පළාත් සභා පනතින් ගරු ආණ්ඩුකාරතුමා වෙත පැවරී ඇති බලතල පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා ප්‍රධාන ලේකම් ඇතුළු පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ක්‍රියාත්මක කරවීම හා ජනතා සුභසාධනය හා සමාජ සංවර්ධනය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට අවශ්‍ය ජාතික හා පළාත් සැලසුම් නිර්දේශයන් අනුව ක්‍රියාත්මක වෙමින් ඒ සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට පළාත් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීම.

### කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | ගරු ආණ්ඩුකාරතුමා සහ පුද්ගලික කාර්යය මණ්ඩලය | ආණ්ඩුකාරවර ලේකම් ඇතුලු කාර්යය මණ්ඩලය |
|---|---|---|
| අනුමත සංඛ්‍යාව | 25 | 21 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 25 | 18 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 00 | 03 |

### මෙහෙයුම් ප්‍රතිඵල- පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 25.11 | 24.31 | 0.80 | 96.81 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 11.79 | 9.34 | 2.45 | 79.22 |
| **එකතුව** | **36.90** | **33.65** | **3.25** | **91.19** |

### මූලධන වියදම

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 10.00 | 9.79 | 0.21 | 97.90 |
| යන්ත්‍ර සූත්‍ර සවිකිරීම් හා උපකරණ | 0.72 | 0.69 | 0.03 | 95.83 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 0.85 | 0.79 | 0.06 | 92.94 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 2.05 | 1.84 | 0.21 | 89.76 |
| **එකතුව** | **13.62** | **13.11** | **0.51** | **96.26** |

**මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය**

පුනරාවර්තන වියදම්හී කාර්ය සාධනය 91.19% ඉක්මවා ඇති අතර එය මූලධන වියදම් විෂයෙහි 96.26%කි.
පළාතේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ දායකත්වය සහ නියාමනය ආණ්ඩුකාරවර කාර්යාලය මගින් සිදුකරනු ලබන අතර, ඒ මගින් පළාතේ සංවර්ධන කාර්යය වේගවත් කිරීමට අදාල මගපෙන්වීම හා දායකත්වය ලබාදීම සිදු විය. විශේෂයෙන්ම ජාතික නායකත්වයේ පළාත් අභිනියෝජනය මගින් මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අදාල මනා සම්බන්ධීකරණය ඇති කරමින් ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීම 2016 වසරේදීද සිදු විය.

2016 වර්ෂයේ උතුරු මැද පළාත් සභාවට අදාල වාර්ෂික ප්‍රතිපත්ති ප්‍රකාශය අදාල වර්ෂයේ සැසිවාරය විවෘත කරමින් පළාත් සභාව වෙත ඉදිරිපත් කිරීම සිදු විය. ඒ තුළින් උතුරු මැද පළාත මධ්‍යම රජයේ ඉලක්කගත දර්ශක වෙත අවධානය යොමු කරමින් 2016 වර්ෂය තුළ ඉලක්ක සහගතව තිරසාර සංවර්ධනයක් කරා මෙහෙයවිය හැකි අයුරින් ප්‍රතිපත්ති සම්පාදනයකොට ගෞරවණීය සභාව ආමන්ත්‍රණය කිරීම සිදු විය.

පළාත් සභා පනතින් ගරු ආණ්ඩුකාරවරයා වෙත පැවරුණු බලතල යටතේ ක්‍රියාත්මක වෙමින් 2016 වර්ෂය තුළදී පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන යෝජනා සලකා බලා අනුමැතිය ලබාදීම හෝ කොමිෂන් සභාව වෙත අවශ්‍ය උපදෙස් ලබාදීම සිදු කරන ලදී.

දෛනිකව කාර්යාලය වෙත පැමිණෙන සේවාලාභීන්ගේ ගැටළුවලට පිළියම් යෙදීම මෙන්ම ඔවුන්ට තම ගැටළු විසඳා ගැනීම සඳහා නිසි මාර්ගය වෙත නිවැරදිව යොමු කිරීමද සිදු කිරීමට හැකි විය.එසේම අතිගරු ජනාධිපතිතුමාගේ පළාත් නියෝජනය ලෙස කටයුතු කරමින් පළාත තුළ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරිමට, ජාතික ප්‍රතිපත්තීන්ට අනුව පළාත් ප්‍රතිපත්ති සකස්කර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස්, මගපෙන්වීම සඳහා 2016 වසර තුළදීද කටයුතු කරන ලදී.

තවද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය මගින් සමාජ සංවර්ධනය උදෙසාත්, සමාජයේ යහපැවැත්ම උදෙසාත් සකස් කරන ලද වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ යටතේ සාරධර්ම ප්‍රවර්ධන ව්‍යාපෘතිය සුවිශේෂී දායකත්වයක් දරන ලදී. එම ව්‍යාපෘතිය තුළින් උතුරු මැද පළාතේ ජනතාවගේ සාරධර්ම ප්‍රවර්ධනය කිරීම සඳහා විවිධ වැඩසටහන් හා දැනුවත් කිරීම් සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතිය මගින් පළාතේ ජනතාව තුළ යහපත් මෙන්ම ධනාත්මක ආකල්ප සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම කිරීම ද සිදු කෙරේ.

02

# පළාත් සභා ලේකම් කාර්යාලය

## 02

# පළාත් සභා ලේකම් කාර්යාලය

### ඉදිරි දැක්ම

“මනා ක්‍රියාකාරිත්වයෙන් යුත් ජනතාවාදී පළාත් සභාවක්, සමෘද්ධිමත් පළාතක්”.

### මෙහෙවර

“උතුරු මැද පළාතේ සමස්ත පළාත් සභා කටයුතුවල සංවර්ධනය උදෙසා සැසි හා රැස්වීම් කටයුතු සහ කාරක සභා කටයුතු අදාල පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව බල ගැන්වීම”.

### දිගුකාලීන හා කෙටි කාලීන අරමුණු

### දිගුකාලීන අරමුණු

පළාත් ව්‍යවස්ථාදායකයේ තීරණ කාර්යක්ෂම ලෙස ක්‍රියාවට නංවමින් පොදුවේ පළාතේ ජන ජීවිතය ඉහළ නැංවීමට දායක වීම.

### කෙටි කාලීන අරමුණු

- පළාත් සභාවට පැවරී ඇති නෛතික බලතල ක්‍රියාත්මක කිරීම උදෙසා පිහිටුවා ඇති ආයතන (පළාත් සභාව සහ කමිටු) විධිමත්ව හා අඛණ්ඩව පවත්වා ගෙන යෑම තුළින් ජනතාවගේ එදිනෙදා ප්‍රශ්න හා ගැටළු නිරාකරණය කිරීම.
- ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු ධූරධාරීන්ගේ සහ ගරු පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ රාජකාරී ඉටුකිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- ඉහත I හා II කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම උදෙසා ලේකම් කාර්යාලය පවත්වාගෙන යාම.

### ප්‍රධාන කාර්යයන්

- පළාත් සභා සැසි හා රැස්වීම් කටයුතු සංවර්ධනය.
- කාරක සභා කටයුතු සංවර්ධනය.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහපාලන කටයුතු සංවර්ධනය.

### කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 22 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 22 |

### මෙහෙයුම් ප්‍රතිඵල-පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 72.22 | 70.39 | 1.83 | 97.47 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 28.04 | 26.38 | 1.66 | 94.08 |
| **එකතුව** | **100.26** | **96.77** | **3.49** | **96.52** |

### මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 1.00 | 0.00 | 1.00 | 0 |
| යන්ත්‍රසූත්‍ර සවිකිරීම් | 0.50 | 0.49 | 0.01 | 98 |
| වෙනත් | 0.60 | 0.00 | 0.60 | 0 |
| **එකතුව** | **2.10** | **0.49** | **1.61** | **23.33** |

### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය

පුනරාවර්තන වියදම් හී කාර්ය සාධනය 96.52% ක් වන අතර, මූලධන වියදම්හි කාර්ය සාධනය 23.33%කි. තිරසාර සංවර්ධනය මගින් ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්වය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම සඳහා අවශ්‍ය දේශපාලන නායකත්වය ලබා දිම සඳහා ක්‍රියාත්මක වන ප්‍රධානතම ආයතනය වන මෙම පළාත් සභාව එහි ගෞරවය හා අභිමානය සුරැකෙන ආකාරයෙන් පවත්වා ගෙන යැම සඳහා අවශ්‍ය මූලික පහසුකම් සියල්ල සපුරා ගැනීමට මේවන විට සමත්ව ඇත.

පළාත් සභාව ක්‍රියාත්මක කරනු ලබන දේශපාලන නායකත්වය පරිපාලනය හා සම්බන්ධීකරණය කිරීම පළාත් සභා ලේකම් කාර්යාලය මගින් ප්‍රකාශිත වසරේද සුවිශේෂී දායකත්වයක් දක්වන ලදී. ඒ යටතේ සභා වාර පවත්වමින් පළාතේ සංවර්ධනය උදෙසා තීන්දු තීරණ ගැනීමට අදාල කටයුතු සංවිධානය කරන ලදී. ඒ තුළින් පළාත නියෝජනය කරන දේශපාලන නායකත්වය කළමනාකරණය හා මනා සම්බන්ධීකරණයක් ඇති කිරීමටත් අවශ්‍ය යාන්ත්‍රණය ක්‍රියාත්මක කරන ලදී. මේ තුළින් දේශපාලන යාන්ත්‍රණයේ පරිපාලන මෙහෙයවීම කැපීපෙනුණි. 2016 වර්ෂය තුළ උතුරු මැද පළාත් සභාව පවත්වන ලද වාර ගණන 22ක් විය.

එසේම ජාතික ප්‍රතිපත්තීන්ට අනුකූලව පළාත සංවර්ධනය කරා මෙහෙයවීම වෙනුවෙන් සකස් කරන ලද අණපනත්, ප්‍රඥප්ති සභාවට ඉදිරිපත් කිරීමද ඒවා සම්මත කරගැනීමටද කටයුතු කරන ලදී.

| සාකච්ඡා කළ දිනය | පනතේ නම | සම්මත වූ /නොවූ බව |
|---|---|---|
| 2016.03.23 | 1896-2 ධීවර සහ ජලජ සම්පත් පනත | සම්මත විය |
| 2016.10.11 | ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත් කෙටුම්පත 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 උ ව්‍යවස්ථාවේ [3] අනු ව්‍යවස්ථාව යටතේ පළාත් සභාවේ අදහස් ලබා ගැනීමට ඉදිරිපත් කරන පනත | සංශෝධන සහිතව සම්මත විය |
| 2016.11.29 | 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන[සම්මත අතුරු ව්‍යවස්ථා] පනත | සංශෝධන සහිතව සම්මත විය |

මූලාශ්‍රය:- පළාත් සභා ලේකම් කාර්යාලය

පළාත් සභා ලේකම් කාර්යාලයේ අපේක්ෂිත කාර්යභාරයන් ඉටු කිරීම සඳහා හා වාර්ෂික සැලසුම්ගත වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් ගොඩනැගිලි, ප්‍රවාහන පහසුකම් අවශ්‍ය මට්ටමට සපුරාගෙන ඇති අතර, අවශ්‍ය කාර්යය මණ්ඩල පුරප්පාඩු නොමැති වීමද හේතුවෙන් මෙම කාර්යාලයේ සේවාවන් අඛණ්ඩව හා යාවත්කාලීනව ඉටු කිරිමට සමත් වී ඇත. කාර්යාලයේ ගිණුම් කටයුතු හා අනෙකුත් රාජකාරී කටයුතු යාවත්කාලීනව පවත්වා ගෙන යමින් අපේක්ෂිත සේවාවන් උපරිම තලයකට ගෙන ඒමට කටයුතු කර ඇත. එමෙන්ම පළාත් සභාවේ අභිමානය සුරැකෙන අයුරින් සභාවේ ගොඩනැගිලි හා ඉදි කිරීම් නවීකරණ කටයුතු සිදු කරන ලදී.

2016 වර්ෂයේ පළාත් සභා ලේකම් කාර්යාලය මගින් ඉටු කරන ලද කාර්යයන් තුළින් කාර්යාලයේ දැක්ම කරා ළඟා වීම සඳහා ඉටු කළ යුතු කාර්යයන්ගේ කාර්ය සාධනය යහපත් මට්ටමක වූ අතර කාර්ය සාධනය ළඟාකර ගැනීම ඉහළ මට්ටමක පැවතුණි.

03

# පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03

# පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ඉදිරි දැක්ම

"ප්‍රශංසනීය පළාත් රාජ්‍ය සේවයක්, සංවර්ධිත පළාතක් "

### මෙහෙවර

"බඳවා ගැනීමේ පරිපාටි සහ පළාත් රාජ්‍ය සේවා කළමනාකරණය, සිය පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව විධිමත්ව ඉටුකරමින් ප්‍රශංසනීය පළාත් රාජ්‍ය සේවයක් සඳහා අඛණ්ඩව දායකවීම."

### අරමුණු

පළාත් සභා පනතෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරන ලද බලතල අනුව පළාතේ මානව සම්පත් පළාත් රාජ්‍ය සේවාව සඳහා දායක කරගෙන ප්‍රශස්ත මට්ටමේ පළාත් රාජ්‍ය සේවයක් මහජනතාව වෙත ලබාදීම සඳහා රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවා ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම.

### ප්‍රධාන කාර්යයන්




### ප්‍රධාන උපාය මාර්ගයන්

- පත්වීම් ලිපි.
- කාර්යක්ෂමතා කඩඉම් විභාග
- පත්වීමේ කොන්දේසි.
- දෙපාර්තමේන්තු පරීක්ෂණ.
- සම්මුඛ පරීක්ෂණ.
- බඳවා ගැනීම් පරිපාටි සැකසීම.

### කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 29 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 26 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 03 |

### මෙහෙයුම් ප්‍රතිඵල-පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 14.38 | 14.32 | 0.06 | 99.58 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 5.18 | 5.13 | 0.05 | 99.03 |
| **එකතුව** | **19.56** | **19.45** | **0.11** | **99.43** |

### මුලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2.50 | 1.49 | 1.01 | 59.6 |
| ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 0.09 | 0.09 | 0.001 | 100 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 0.25 | 0.25 | 0 | 100 |
| **එකතුව** | **2.84** | **1.83** | **1.01** | **86.15** |

### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික සංඛ්‍යාව 03ක් වූ අතර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව 27 ක් විය. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මෙහෙවර ප්‍රකාශය අනුව යමින් අනුමත රාජ්‍ය ප්‍රතිපත්තිවලට හා විධිමත් කාර්යය පටිපාටිවලට අනුකූලව 2016 වර්ෂය තුළදී ක්‍රියාකර ඇත.

2016 වර්ෂය තුළදී 602 වැය ශීර්ෂය යටතේ පෞද්ගලික පඩිනඩි වශයෙන් රු. 14,317,494/= ක මුදලක් සහ අනෙකුත් පුනරාවර්තන වියදම් වශයෙන් රු. 5,128,269/= ක මුදලක් වියදම් දරා ඇත.

2016 වර්ෂයේදී මූලධන වියදම් යටතේ මෙම ආයතනයට වාර්ෂික ඇස්තමේන්තු අනුව රු. 2,850,000 /= ක ප්‍රතිපාදන මුදලක් වෙන්කර තිබූණි. එයින් යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම සඳහා රු. 250,000/= ක

ප්‍රතිපාදනයක් වෙන්කර තිබූ අතර, (මු.රෙ. 66 යටතේ සලසා ගත් රු 3,825 /= ක මුදලක ප්‍රතිපාදනයක් ද ඇතුළුව) රු. 25385ක මුදලක් වැය කර කාර්යය මණ්ඩලයේ හා පරිපාලනයේ කාර්යක්ෂමතාවය ඉහළ නංවන පරිදි යන්ත්‍රසූත්‍ර, ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ සපයා ගන්නා ලදි.

ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ සපයා ගැනීම සඳහා වෙන්කරනු ලැබූ රු. 100,000/= ක මුදලින් රු. 95,130/= ක මුදලක් ඇතුළුව රු. 348,955/=ක මුදලක් යොදවන ලදි.

එසේම අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් විසින්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ ඇති දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ගොඩනැගිලිවල කිසිදු අලුත්වැඩියා කටයුත්තක් සිදු නොකරන ලෙස දන්වා තිබූ බැවින් ගොඩනැගිලි අලුත්වැඩියාව සඳහා වෙන්කර තිබූ රු. 2,500,000/= ක ප්‍රතිපාදනයෙන් රු. 1,488,685/= ක මුදලක් ගොඩනැගිලි නඩත්තු කිරීම සඳහා වැය කරන ලදි.

මෙම දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම අංක 60201 සඳහා වාර්ෂික ඇස්තමේන්තු යටතේ රු.1,200,000/= ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර ඒ යටතේ රු.1,178,732 /= ක මුදලක් කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම් වශයෙන් ගෙවීමට හා ණය ශේෂ පියවීමට කටයුතු කර ඇත. එසේම වාර්ෂික ඇස්තමේන්තු යටතේ අවම බැර සීමාව රු.1,000,000 /= ක් වූ අතර වර්ෂයේ ණය වාරික අයවීම අඩුවීම නිසා ඒ අනුව එම සීමාව රු. 975,000 /= ලෙස සංශෝධනය කර ගන්නා ලදී. තත්‍ය බැරකිරීම් ප්‍රමාණය රු. 988,989/= විය.කාර්ය මණ්ඩලයේ වාර්ෂික කාර්යසාධන වාර්තා අනුව නිර්දේශ ඉදිරිපත් කිරීමට පෙර ඔවුන්ගේ සාමාන්‍ය හැසිරීම , කාර්ය සාධනය , මහජන සම්බන්ධතාවය පෞද්ගලිකවම පරීක්ෂා කර ඇගයීම් කරන අතර හඳුන්වාදී ඇති පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කරවීමට මෙහෙයවීම තුලින් කාර්යාලයේ ප්‍රතිරූපය යහපත්ව නිර්මාණය කරගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග යහපත්ව හා අවංකව රාජකාරී ඉටුකරවීමට කාර්ය මණ්ඩලය මෙහෙයවා ඇත.

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණු හා සලකා බලන විට 2016 වර්ෂයේ ආයතනික කාර්ය සාධනය ළගාකර ගැනීම සඳහා සෘජු බඳවා ගැනීම් තනතුරුවලට පත් කිරීම, විධිමත් පත්වීම් ලිපි ලබා දීම, උසස් කිරීම්, පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කිරීම්, විශ්‍රාම ගැන්වීම්, අන්තර් පළාත් ස්ථාන මාරු මත නිදහස් කිරීම් හා පැමිණීම්, උතුරු මැද පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම්, පළාත් රාජ්‍ය සේවයෙන් මුදාහැරීම්/නිදහස් කිරීම්, සේවයෙන් ඉල්ලා අස්වීම්, නැවත සේවයේ යෙදවීම්, උතුරු මැද පළාත් බඳවා ගැනීම් පරිපාටි අනුව අන්තර්ග්‍රහණය , නව බඳවා ගැනීම සඳහා තරග විභාග පැවැත්වීම්, කොන්ත්‍රාත් පදනම මත පත් කිරීම්, විනය කටයුතු, බඳවා ගැනීම් පරිපාටි සකස් කිරීම් හා නිර්දේශ කිරීම් යන අංශයන්ගේ කාර්යයන් වර්ෂය තුළදී ක්‍රියාත්මක කර ඇත.

## 2016 වර්ෂයේ සංවර්ධන කාර්යයන්

| | |
|---|---|
| සෘජු බඳවා ගැනීම් | 1364 |
| තනතුරුවලට පත් කිරීම | 74 |
| විධිමත් පත්වීම් ලිපි ලබා දීම | 119 |
| උසස් කිරීම් | 346 |
| පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කිරීම් | 136 |
| විශ්‍රාම ගැන්වීම් | 49 |
| අන්තර් පළාත් ස්ථාන මාරු මත නිදහස් කිරීම් හා පැමිණීම් | 457 |
| උතුරු මැද පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම් | 58 |
| පළාත් රාජ්‍ය සේවයෙන් මුදාහැරීම්/නිදහස් කිරීම් | 11 |
| සේවයෙන් ඉල්ලා අස්වීම් | 10 |
| නැවත සේවයේ යෙදවීම් | 02 |
| උතුරු මැද පළාත් බඳවා ගැනීම් පරිපාටි අනුව අන්තර්ග්‍රහණය | 611 |
| විභාග පැවැත්වීම් | 98 |
| කොන්ත්‍රාත් පදනම මත පත් කිරීම් | 05 |
| විනය කටයුතු | 03 |
| බඳවා ගැනීම් පරිපාටි සකස් කිරීම් හා නිර්දේශ කිරීම් | 27 |
| වෙනත් කරුණු | 44 |

04

# පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව

04

# පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව

### ඉදිරි දැක්ම

“තෘප්තිමත් සමුපකාර කාර්යය මණ්ඩලයක්, උසස් මට්ටමේ සේවාවක්”.

### මෙහෙවර

“සමුපකාර සේවකයින්ගේ ආයතනික ගැටළු හා සේව්‍ය සේවක ගැටුම් නිරාකරණය සහ ආයතනික ධාරිතාව වර්ධනය සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් යහපාලනය පවත්වා ගනිමින් තෘප්තිමත් කාර්යය මණ්ඩලයක් බිහිකොට සමුපකාර සේවාව උසස් මට්ටමකට ගෙන ඒමට අඛණ්ඩව දායක වීම”.

### අරමුණු

- ගුණාත්මක සමුපකාර සේවක ආයතනික ක්‍රියාවලියක්.
- යහපත් සේව්‍ය සේවක සබඳතාවක්.
- ගුණාත්මක සේව්‍ය සේවක සබඳතාවක්.
- ගුණාත්මක සේවාවක් සපයන ආයතනයක්.
- සංහිඳියාවෙන් යුත් ආයතනයක්.

### ප්‍රධාන කාර්යයන්




### ප්‍රධාන උපාය මාර්ගයන්

- සමුපකාර සේවකයින්ගේ ආයතනික ගැටළු නිරාකරණය.
- සේව්‍ය සේවක ගැටුම් නිරාකරණය.
- යෝජිත නව වැටුප් සංශෝධනයක් ක්‍රියාත්මක කිරීම තුළින් සේවක මානසික වර්ධනය ඇති කිරීම.
- ආයතනය තුළ යහපාලනය හා සම්බන්ධ මූලධර්ම ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය කටයුතු කෙරෙහි මැදිහත්වීම.

## කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 08 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 07 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 01 |

## මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 4.69 | 4.50 | 0.19 | 95.94 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 1.09 | 0.87 | 0.22 | 79.81 |
| **එකතුව** | **5.78** | **5.37** | **0.41** | **92.91** |

## මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0.40 | 0.39 | 0.01 | 99 |
| යන්ත්‍ර සූත්‍ර සවිකිරීම් හා උපකරණ | 0.26 | 0.26 | 0.00 (රු.2410) | 100 |
| ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ | 0.03 | 0.03 | 0.00 (රු.46) | 100 |
| **එකතුව** | **0.69** | **0.68** | **0.01** | **99** |

## මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය

| අනු අංකය | ව්‍යාපෘතිය | වෙන්කළ ප්‍රතිපාදනය (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 1 | ගොඩනැගිලි ඉදිකිරීම | 0.40 | 0.39 | 97.5 |
| 2 | ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ | 0.03 | 0.03 | 100 |
| 3 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 0.27 | 0.27 | 100 |
| **එකතුව** | | **0.70** | **0.69** | **98.57** |

ආයතනයේ සේවා සැපයීම ගුණාත්මක බවින් ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකියාව ලැබී ඇති අතර, බාහිර පාර්ශව අතර ආයතනය කෙරෙහි ප්‍රසාදය ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකියාව ලැබී ඇත. 2016 වර්ෂයේ සමුපකාර සේවකයින්ගේ වැටුප් සංශෝධනයකර ආර්ථික මට්ටම ඉහළ නංවමින් ඔවුන් අභිප්‍රේරණය කිරීමට සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් කටයුතු කර ඇත.

| ක්‍රියාකාරකම | ප්‍රමාණය |
|---|---|
| සාමාන්‍යාධිකාරී හා ගණකාධිකාරීවරු බඳවා ගැනීම | 15 |
| සේවයේ ස්ථිර කිරීම් | 40 |
| බඳවා ගැනීම සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම | 60 |
| අභියාචනා සඳහා ගැටළු විසඳීම | 110 |

2016 වර්ෂයේදීද පළාත් සමුපකාර කොමිෂන් සභාව විසින් සමුපකාර පද්ධතිය තුළ පවතින ගැටළු නිරාකරණය කෙරෙහි ඍජු මැදිහත් කිරීමක් කරන ලදී. ඒ යටතේ සමුපකාර සේවකයින්ගේ උසස්වීම්, පත්වීම් ස්ථිර කිරීම හා සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම සඳහා මැදිහත්වීම් සිදු කරන ලදී. එසේම ඔවුන්ගේ වැටුප් හා සම්බන්ධව පැවති ගැටළු සැලකිය යුතු මට්ටමකින් නිරාකරණය කිරීම සඳහා ඉහත කී වර්ෂය තුළදී හැකියාව ලැබුණි.

පුරප්පාඩුව පවතින සාමාන්‍යාධිකාරීවරුන්, ගණකාධිකාරීවරුන් 15ක් පත්කර ගැනීම, සේවයේ ස්ථිර කිරීම් 40ක්ද, පූර්ව අනුමැතිය ලබාදීම් 60ක්ද සහ සේවකයින් 110 දෙනෙකුගේ ගැටළු විසඳීම් ප්‍රමාණයක් 2016 වර්ෂය තුළදී සිදු කරන ලදී. කාර්ය මණ්ඩලය හා කොමිෂන් සභාව උපරිම අයුරින් කැපකිරීම්කර අදාළ සේවාවන් ලබාදීම තුළින් පළාතේ සමුපකාර සංවර්ධනය සඳහා දායකත්වය ලබා දෙන ලදී.

2016 වර්ෂයේ පළාත් දැක්ම කරා ළඟා වීම සඳහා ඉටු කළ යුතු කාර්යයන්ගේ කාර්ය සාධනය යහපත් මට්ටමක වූ අතර කාර්ය සාධනය ළඟාකර ගැනීම ඉහළ මට්ටමක පැවතුණි.

# 05

## 5. ප්‍රධාන ලේකම් කාර්යාලය

## 5.1.පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## 5.2.පළාත් භාණ්ඩාගාරය

## 5.3.ඉංජිනේරු දෙපාර්තමේන්තුව

## 5.4.අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව

## 5.5.කළමනාකරණ හා සංවර්ධන පුහුණු ඒකකය

## 5.6.පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

05

# ප්‍රධාන ලේකම් කාර්යාලය

### ඉදිරි දැක්ම

"කාර්යක්ෂම, ඵලදායි හා ජනතාවාදී පළාත් රාජ්‍ය සේවයක්, සංවර්ධිත පළාතක්"

### මෙහෙවර

"පළාත් රාජ්‍ය සේවයේ පරිපාලන, මානව සම්පත්, මුල්‍ය, සැලසුම්, ඉංජිනේරු කටයුතු හා මධ්‍යම රජය ප්‍රමුඛ බාහිර පාර්ශව සමග සම්බන්ධීකරණය, විශේෂ සමාජ ආර්ථික වැඩසටහන්වලට පහසුකම් සැපයීම, ආපදා කළමනාකරණය සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් සහ විනිවිද භාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම. "

### ප්‍රධාන කාර්යයන්

- පළාත් රාජ්‍ය සේවයේ පරිපාලන කටයුතු හා මානව සම්පත් සංවර්ධනය.
- අනුබද්ධ දෙපාර්තමේන්තු හා ආයතනවල කටයුතු නියාමනය.
- මධ්‍යම රජය ප්‍රමුඛ බාහිර පාර්ශව සමග සම්බන්ධීකරණය සංවර්ධනය.
- විශේෂ සමාජ ආර්ථික වැඩසටහන්වලට පහසුකම් සැපයීම සංවර්ධනය.
- ආපදා කළමනාකරණය සංවර්ධනය.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහපාලන කටයුතු සංවර්ධනය.

### කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 116 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 86 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 39 |
| අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික පදනමේ සිටින සංඛ්‍යාව | 05 |

## මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම් (පාලන)

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජන (%) |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 36.56 | 35.89 | 0.67 | 98.17 |
| අනෙකුත් වියදම් | 122.68 | 117.45 | 5.23 | 95.73 |
| **එකතුව** | **159.24** | **153.34** | **5.90** | **96.29** |

## පුනරාවර්තන වියදම් (පුහුණු)

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජන (%) |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 13.26 | 13.18 | 0.08 | 99.39 |
| අනෙකුත් වියදම් | 10.75 | 9.46 | 1.29 | 88.00 |
| **එකතුව** | **24.01** | **22.64** | **1.37** | **94.29** |

## මූලධන වියදම් (පාලන)

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි ඉදි කිරීම් | 16.35 | 15.92 | 0.43 | 97.37 |
| යන්ත්‍ර හා උපකරණ නඩත්තු | 0.10 | 0.00 | 0.10 | 0 |
| වාහන | 0.10 | 0.00 | 0.10 | 0 |
| වාහන | 74.35 | 74.35 | 0.00 | 100 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 1.05 | 1.05 | 0.00 | 100 |
| යන්ත්‍ර හා උපකරණ | 1.00 | 0.74 | 0.26 | 74 |
| ගොඩනැගිලි ඉදි කිරීම් | 75.01 | 20.63 | 54.38 | 27.5 |
| වෙනත් | 1.10 | 0.98 | 0.12 | 89.09 |
| පළාත් සභා ශ්‍රවණාගාරය සඳහා ශබ්ද විකාශන පද්ධතියක් ස්ථාපනය කිරීම | 5.00 | 0.00 | 5.00 | 0 |
| දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 2.04 | 2.04 | 0.00 | 100 |
| **එකතුව** | **176.10** | **115.71** | **60.39** | **65.71** |

### මූලධන වියදම් (පුහුණු)

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි ඉදි කිරීම් | 1.00 | 0.55 | 0.45 | 55 |
| යන්ත්‍ර හා උපකරණ නඩත්තු | 1.00 | 0.00 | 1.00 | 0 |
| වාහන | 1.00 | 0.26 | 0.74 | 26 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 3.00 | 2.48 | 0.52 | 82.67 |
| යන්ත්‍ර හා උපකරණ | 5.50 | 1.29 | 4.21 | 23.45 |
| ගොඩනැගිලි ඉදි කිරීම් | 0.50 | 0.11 | 0.39 | 22.00 |
| වෙනත් | 1.00 | 0.00 | 1.00 | 0.00 |
| **එකතුව** | **13.00** | **4.69** | **8.31** | **36.08** |

### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය

| අංකය | ව්‍යාපෘතිය | වෙන්කළ ප්‍රතිපාදනය (රු.මි) | වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 01 | පළාත් සභාව වටා දැල් වැට අළුත්වැඩියා කිරීම | 0.77 | 0.67 | 87 |
| 02 | අංක 09 නිල නිවස අලුත්වැඩියා කිරීම | 0.24 | 0.21 | 89 |
| 03 | ප්‍රධාන ලේකම් නිල නිවස අලුත්වැඩියා කිරීම | 2.00 | 2.00 | 100 |
| 04 | සංචාරක බංගලා අලුත්වැඩියා කිරීම | 4.00 | 3.57 | 100 |
| 05 | පළාත් සභා ලේකම් කාර්යාලයේ අලුත්වැඩියාව | 24.90 | 9.47 | 38 |
| 06 | ෆොටෝ කොපි යන්ත්‍ර 04ක් සේවා කිරීම | 0.50 | - | - |
| 07 | මුද්‍රණ යන්ත්‍ර 16ක් නඩත්තු කිරීම | 0.50 | - | - |
| 08 | වාහන අලුත්වැඩියා කිරිම | 0.10 | - | - |
| 09 | නීති ඒකකයට පුටු මේස මිල දී ගැනීම | 5.00 | 0.50 | 100 |
| 10 | කාර්යාල මේස උපකරණ හා පුටු මිල දී ගැනිම | 5.00 | 0.52 | 100 |
| 11 | පරිගණක,ප්‍රින්ටර් යන්ත්‍ර,ලැප්ටොප් යන්ත්‍ර මිලදී ගැනිම | 1.00 | 0.74 | 70 |
| 12 | ආපන ශාලාව ඉදි කිරීම | 13.29 | 10.48 | 79 |
| 13 | කොඩි කණු ඉදි කිරීම | 0.15 | 0.15 | 100 |
| 14 | ඉඩම් දෙපාර්තමේන්තුවේ කාමර වෙන් කිරිම | 1.05 | 1.04 | 83 |
| 15 | ශ්‍රවණාගාරයේ තිර රෙදි සවි කිරිම | 0.22 | 0.22 | 1 |

| | | | | |
|---|---|---|---|---|
| | හා ටයිල් සවි කිරිම | | | |
| 16 | නව පළාත් සභා ගොඩනැගිල්ල ඉදි කිරීම | 0.43 | 0.43 | 1 |
| 17 | මැදවච්චිය ආර්ථික මධ්‍යස්ථානයේ අභ්‍යන්තර මාර්ග ඉදි කිරීම | 6.00 | 3.50 | 69 |
| 18 | මැදවච්චිය ආර්ථික මධ්‍යස්ථානයේ බෝක්කු හා පැති බැමි ඉදි කිරීම | 5.60 | 3.51 | 79 |
| 19 | මැදවච්චිය ආර්ථික මධ්‍යස්ථානයේ කානු පද්ධතිය | 3.30 | 1.28 | 38.79 |
| 20 | වකුගඩු ප්‍රචාරණ කටයුතු | 1.10 | 0.97 | 89 |
| 21 | පළාත් සභා ශ්‍රවණාගාරය සඳහා ශබ්ද විකාශන පද්ධතියක් ස්ථාපිත කිරීම | 5.00 | - | - |
| 22 | දැනුම වර්ධනය හා ආයතනක සංවර්ධනය | 2.00 | 2.04 | 101 |
| **එකතුව** | | **101.75** | **41.35** | **50.27** |

2016 වර්ෂයේදි ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. ඒ අතරින් පළාත් සභාව වටා දැල් වැට අළුත්වැඩියා කිරිම, ආපන ශාලාව ඉදි කිරීම,කොඩි කණු ඉදි කිරීම, ශ්‍රවණාගාරයේ තිරරෙදි සවි කිරිම හා ටයිල් සවි කිරිම, නව පළාත් සභා ගොඩනැගිල්ල ඉදි කිරීම, මැදවච්චිය ආර්ථික මධ්‍යස්ථානයේ අභ්‍යන්තර මාර්ග ඉදි කිරීම, වකුගඩු ප්‍රචාරණ කටයුතු, පළාත් සභා ශ්‍රවණාගාරය සඳහා ශබ්ද විකාශන පද්ධතියක් ස්ථාපිත කිරීම යනාදි සංවර්ධන ව්‍යාපෘති වැදගත් වේ.

2016 වර්ෂයේ පළාත් දැක්ම කරා ළඟා වීමට ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් ඉටු කරන ලද සංවර්ධන ව්‍යාපෘති තුළින් කාර්ය සාධනය යහපත් මට්ටමක වූ අතර කාර්ය සාධනය ළඟාකර ගැනීමද ඉහළ මට්ටමක පැවතුණි.

5.1

# පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

**ඉදිරි දැක්ම**

"ඵලදායි පළාත් සංවර්ධන සැලසුම්කරණ ක්‍රියාවලියක්, සෞභාග්‍යමත් පළාතක්."

**මෙහෙවර**

"පළාතේ සමස්ත සංවර්ධන ක්‍රියාවලියේ සැලසුම්කරණය ,ප්‍රගති පාලනය හා ඇගයීම , අංගසම්පූර්ණ දත්ත පද්ධතිය , අධ්‍යයන හා පර්යේෂණ , විදේශ ව්‍යාපෘති අධීක්ෂණය , පළාතේ සංවර්ධන සැලසුම් අංශ මනාව මෙහෙයවීම, ප්‍රතිපත්ති, කාර්ය සාධනය සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් , විනිවිදභාවයෙන් හා සමතාවයෙන් ක්‍රියාවට නංවමින් ජාතික සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට අඛණ්ඩව දායකවීම" .

**ප්‍රධාන කාර්යයන්**

01. පළාත සඳහා දීර්ඝකාලීන හා මධ්‍යකාලීන සැලසුම් පිළියෙල කිරීම.
02. වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලසුමක් පිළියෙලකර එය ක්‍රියාත්මක කිරීම, ප්‍රගතිය ඇගයීම අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීම.
03. සංවර්ධන සැලසුම් සඳහා දත්ත රැස් කිරීම, පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම.
04. සමීක්ෂණ හා පර්යේෂණ පැවැත්වීම.
05. පළාත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ප්‍රගතිය ඇගයීම හා ඉලක්කයන් කරා ළඟා වීම.
06. නව ව්‍යාපෘති හඳුනා ගැනීම, ඇගයීම හා තක්සේරුව.
07. විදේශාධාර හා ණය ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
08. ආංශික සැලසුම් හා ආයතනික සැලසුම් පිළියෙල කිරීම හා ඒ සඳහා ආයතනවලට සහාය වීම.
09. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සැලසුම් ඒකක මෙහෙයවීම හා සම්බන්ධීකරණය.
10. ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් රැස්කර ගැනීම හා පළාත් සැලසුම් සඳහා අදාල කර ගැනීම.
11. රජයේ ආයතන සමඟ සැලසුම් කටයුතු සම්බන්ධීකරණය.
12. අනෙකුත් පළාත් සභාවල සැලසුම් දෙපාර්තමේන්තු සමඟ කටයුතු කිරීම.
13. සැලසුම්වලට අදාල මුදල් කොමිෂම, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ එක්ව කටයුතු කිරීම.
14. ප්‍රධාන අමාත්‍යවරයාට, අමාත්‍යවරුන්ට හා ප්‍රධාන ලේකම්ට සැලසුම්කරණයට සහාය වීම.

### කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 55 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 48 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 07 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය ( %) |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව අනෙකුත් පුනරාවර්තන වියදම් | 32.72 | 31.19 | 1.53 | 95.32 |
| **එකතුව** | **32.72** | **31.19** | **1.53** | **95.32** |

### මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි.) | වර්ෂයේ 2016 වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය ( %) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම්, යන්ත්‍රසූත්‍ර සවිකිරීම් හා උපකරණ, වාහන, වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 170.00 | 168.00 | 2.00 | 98.82 |
| **එකතුව** | **170.00** | **168.00** | **2.00** | **98.82** |

### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය

ජාතික ප්‍රතිපත්තීන්ට සහ නියාමනයන්ට සමගාමීව ජාතික සංවර්ධනයට සෘජුවම දායක වෙමින් 1,401,561ක් වන පළාතේ ජනතාවගේ අභිවෘද්ධිය සහ යහපැවැත්ම සඳහා 2016 වර්ෂයේදීද පළාත් සභා සංවර්ධන කටයුතු වලදී පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුවට සුවිශාල වගකීමක් සහ කාර්යභාරයක් හිමි විය.

මේ අනුව පළාතට උචිත ප්‍රතිපත්ති, සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමද පසුවිපරම් ඇගයුම්, මෙහෙයුම් සහ ප්‍රගති සමාලෝචන කටයුතු ආදිය සඳහා පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මඟින් විධිමත් සහ කඩිනම් වැඩසටහන් රැසක්ම ක්‍රියාත්මක කිරීමට 2016 වසරේදීද කටයුතු කරන ලදී. පළාතේ සංවර්ධන, පරිපාලන, සමාජ සුභසාධන, සමාජ ආරක්ෂණ, ආදායම් උත්පාදන, ව්‍යවසායකත්ව සහ ජීවනෝපාය සංවර්ධන ආදී ක්ෂේත්‍රයන් වෙත විශේෂ අවධානයක්

යොමු කරන ලදී. මෙහිදී විනිවිදභාවය, අරපිරිමැස්ම, ඵලදායිතාව සහ ආයෝජනයන්ට සාපේක්ෂ ප්‍රතිලාභ ඉලක්කගත පුද්ගලයන්ට ලැබීම පිළිබඳවද සංවර්ධන ව්‍යාපෘතිවල ගුණාත්මක අගය සහ යෙදවුම් පිළිබඳව ද විවිධ මෙහෙයුම් සහ පසුවිපරම් කටයුතු සිදු කෙරිණි. මේ සඳහා ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශ අනුව පසුවිපරම් නිලධාරීන් අනුයුක්ත කර ඇත. 2016 වර්ෂයේදී ද ප්‍රතිලාභ රැසක් පළාතේ ජනතාවට ලබා දීම සඳහා පළාත් සභා යාන්ත්‍රණය වෙත ඍජු සහ සක්‍රීය දායකත්වයක් ලබා දීමට හැකි විය.

## 01. පළාත් සංවර්ධන සැලසුම මෙහෙයුම් සහ ප්‍රගති සමාලෝචනය කිරීම.

2016 වර්ෂයේ උතුරු මැද පළාතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන සැලසුමට අදාල ව්‍යාපෘතීන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම ප්‍රමුඛ කාර්යය විය. මේ යටතේ විවිධ මට්ටම්වලදී කාර්තුමය හා මාසිකව සහ විශේෂයෙන් අත්‍යාවශ්‍ය අවස්ථාවන්හිදී විශේෂ ප්‍රගති සමාලෝචන රැස්වීම් මගින් අදාල ව්‍යාපෘති ඉලක්ක කරා රැගෙන යාමට අවශ්‍ය පියවර ගන්නා ලදී. මේ අනුව පළාතට උචිත ප්‍රතිපත්ති, සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ද පසුවිපරම් ඇගයුම්, මෙහෙයුම් සහ ප්‍රගති සමාලෝචන කටයුතු සඳහා පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් විධිමත් සහ කඩිනම් වැඩසටහන් රැසක්ම ක්‍රියාත්මක කිරීමට 2016 වසරේදීද කටයුතු කරන ලදී. ඒ අනුව 2016 වර්ෂයේදී පහත සඳහන් පරිදි සංවර්ධන වැඩසටහන විවිධ මට්ටම්වලදී ප්‍රගතිය සවිස්තරාත්මකව සමාලෝචනය කරන ලදී.

01
- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම්
- වාර 02 බැගින් [අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක සඳහා]

02
- ප්‍රධාන අමාත්‍යතුමා සමග ප්‍රගති සමාලෝචන රැස්වීම්
- 02

03
- අමාත්‍යාංශ මට්ටමේ රැස්වීම්
- වාර 10

04
- දෙපාර්තමේන්තු මට්ටමින් රැස්වීම්
- වාර 03

05
- සංවර්ධන නිලධාරීන් සමග ක්ෂේත්‍ර මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම්
- වාර 10

## 02. විමධ්‍යගත සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

2016 වර්ෂයේදී පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් විමධ්‍යගත සංවර්ධන වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. එහිදී ප්‍රධාන සංරචක 05ක් ඔස්සේ ව්‍යාපෘති 3,218ක් පළාත තුළ ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රාදේශීය සහ පසුගාමී මෙන්ම ප්‍රත්‍යන්ත ප්‍රදේශවල ජනතාවට අවශ්‍ය ආර්ථික හා සමාජ යටිතල සහ සහය සේවා ලබා දීම පළාත් සභා ගරු මන්ත්‍රීතුමන්ලාගේ විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ 2016 වර්ෂයේදී ද ඉතා සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමට හැකි විය.

පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ ප්‍රාදේශීය සංවර්ධනය ඉලක්ක කරගත් මෙම විමධ්‍යගත සංවර්ධන වැඩසටහනට අනුව 2016 වර්ෂය සඳහා වෙන් කරන ලද මුදල රු.මි. 165 කි. එය 2015 වර්ෂයට වඩා රු.මි. 80ක වැඩි වීමකි. ඒ අනුව අනුමත කරන ලද ව්‍යාපෘතිවල වටිනාකම රු.මි. 84කි. මෙම ව්‍යාපෘති සියල්ලම නව ව්‍යාපෘති වූ අතර විශේෂයෙන්ම පළාතේ ග්‍රාමීය ජනතාවගේ දෛනික පැවැත්මට අත්‍යවශ්‍ය සමාජ හා ආර්ථික යටිතල පහසුකම් හා සහාය සේවා සැපයීමටත් ජනතාව විසින් මහජන නියෝජිත පළාත් සභාවේ ප්‍රධාන ඇමතිතුමා, අමාත්‍ය මණ්ඩලය සහ මන්ත්‍රීතුමන්ලාගෙන් කරන ලද විවිධ අත්‍යවශ්‍ය ඉල්ලීම් සඳහා මෙහිදී ප්‍රමුඛත්වය ලබා දීමට කටයුතු කෙරිණි.

| අනු අංකය | සංරචකය | ව්‍යාපෘති සංඛ්‍යාව | වෙන් කල මුදල ( රු.මි) | වැය කල මුදල (රු.මි) |
|---|---|---|---|---|
| 1 | **ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය** | **358** | **33.82** | **33.30** |
| | i. ග්‍රාමීය මාර්ග | 195 | 28.80 | 28.30 |
| | ii. පානීය ජල සැපයුම | 61 | 2.11 | 2.10 |
| | iii. විදුලිය | 102 | 2.91 | 2.89 |
| 2 | **සමාජ යටිතල පහසුකම් සංවර්ධනය** | **1933** | **76.10** | **75.12** |
| | i. අධ්‍යාපන | 268 | 12.80 | 12.50 |
| | ii. සෞඛ්‍ය (බටහිර හා ආයුර්වේද) | 37 | 1.70 | 1.60 |
| | iii. නිවාස | 316 | 17.79 | 17.61 |
| | iv. ග්‍රාම සංවර්ධන කටයුතු | 1247 | 40.56 | 40.31 |
| | v. ක්‍රීඩා කටයුතු | 65 | 3.10 | 3.10 |
| 3 | **ස්වයං රැකියා ස්ථාපනය** | **240** | **17.60** | **17.50** |
| 4 | **වාරිමාර්ග හා කෘෂිකර්ම සංවර්ධනය** | **136** | **12.95** | **12.95** |
| | i . වාරිමාර්ග | 28 | 3.00 | 3.00 |
| | ii. කෘෂිකාර්මික කටයුතු | 108 | 9.95 | 9.95 |
| 5 | **ආගමික, සංස්කෘතික හා කලා කටයුතු** | **551** | **24.20** | **24.10** |
| **මුළු එකතුව** | | **3,218** | **164.67** | **162.97** |

මෙහිදී ප්‍රධාන වශයෙන් ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය, සමාජ යටිතල පහසුකම් සංවර්ධනය, ස්වයං රැකියා ස්ථාපනය, වාරිමාර්ග හා කෘෂිකර්ම සංවර්ධනය හා ආගමික, සංස්කෘතික හා කලා කටයුතු සංවර්ධනය සඳහා සමස්ත ආයෝජනය රු.මි 165කි.

ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන සංරචකය යටතේ ග්‍රාමීය මාර්ග, පානීය ජල සැපයුම, විදුලිය සැපයීම යන අංශයන් යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. එසේම සමාජ යටිතල පහසුකම් සංවර්ධනය යටතේ පළාතේ අධ්‍යාපන, සෞඛ්‍ය, නිවාස, ග්‍රාම සංවර්ධන, ක්‍රීඩා කටයුතු යන අංශයන්ගේ සංවර්ධනය උදෙසා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.




තවද පළාතේ අඩු ආදායම්ලාභී පවුල්වල ආර්ථික මට්ටම නඟා සිටුවීම සඳහා ස්වයං රැකියා ස්ථාපිත කිරීමට සහය වීමේ ව්‍යාපෘතිද වාරිමාර්ග හා කෘෂිකාර්මික කටයුතු සංවර්ධනය කිරීම සඳහා හා පළාතේ ආගමික සංස්කෘතික හා කලා අංශය ප්‍රවර්ධනය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.



### 03. පළාතේ මුලික සංඛ්‍යාලේඛන ඇතුළත් තොරතුරු අත්පොත සම්පාදනය කිරීම.

පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව තුළ පිහිටි සංඛ්‍යාලේඛන ඒකකය මගින් 2016 වසරේදී 2015 වර්ෂයට අදාල පළාතේ මුලික සංඛ්‍යාලේඛන ඇතුළත් ග්‍රන්ථයක් සම්පාදනය කරන ලදී. සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී විවිධ අංශ සඳහා අවශ්‍ය මුලික දත්ත හා තොරතුරු මෙම ඒකකය මගින් ලබාදීම සිදුවේ.

## 04. අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ යාවත් කාලීන තොරතුරු ඇතුළත් නිබන්ධන සංග්‍රහය 2016.

පළාතේ සංවර්ධන පරිපාලන සහ සමාජ සුභසාධන කටයුතු සඳහා අත්‍යවශ්‍යවන පළාතට අදාළ සමාජ, ආර්ථික, දේශගුණික, මානව සම්පත්, කෘෂිකර්ම ආදී තොරතුරු යාවත්කාලීනව සකස් කිරීමේ කටයුතු 2016 වසරේදීද සිදු විය. එම විෂය ක්ෂේත්‍රය අතිශයින්ම පුළුල් වූවකි. එම සංඛ්‍යාන දත්තයන්ට අනුව අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ යාවත් කාලීන තොරතුරු ඇතුළත් නිබන්ධන සංග්‍රහය 2016 වසරේදී අවසන් කිරීමට හැකි විය.

## 05. වාර්ෂික සංගණන කටයුතු සම්බන්ධිකරණය හා ක්‍රියාත්මක කිරීම.

ශ්‍රී ලංකා මහබැංකුව මඟින් පවත්වනු ලබන රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ අර්ධ වාර්ෂික සංගණන කටයුතු සිදු කිරීමටත් 2016 වසරේදී ඍජු දායකත්වයක් සැපයීමට හැකි විය.

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සිදු කරන ලද උතුරු මැද පළාතේ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවා නියුක්තිකයන් පිළිබඳ සංගණන කටයුතු සිදු කිරීම.

## 06. ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සඳහා පළාත වෙනුවෙන් දැක්වූ දායකත්වය.

2017 වර්ෂය දිළිඳුකම පිටුදැකීමේ වර්ෂය ලෙස ප්‍රකාශිත ජාතික වැඩපිළිවෙලට අවශ්‍ය දිළිඳුකම පිළිබඳ පළාතට අදාළ තොරතුරු සැපයීමටද කටයුතු කෙරිණි.

### 6.1. වකුගඩු රෝග නිවාරණය ජාතික වැඩසටහන වෙනුවෙන් පළාත නියෝජනය කිරීම.

උතුරු මැද පළාත තුළ ව්‍යාප්ත වෙමින් පවතින මෙන්ම විශාල ගැටළුවක්ව පවතින වකුගඩු රෝගය නිවාරණය හා පාලනය කිරීම සඳහාත් පළාතේ දැනට පවතින රෝගීන් සංඛ්‍යාවට අලුතින් එකතුවන ප්‍රමාණය ප්‍රමාණාත්මකව පාලනය කිරිම සඳහාත් ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක කරනු ලබන වකුගඩු රෝග නිවාරණ වැඩසටහන සඳහා පළාත සම්බන්ධීකරණය කරමින් දායකත්වය ලබා දීම පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් සිදු වේ. එසේම වකුගඩු රෝග නිවාරණය සඳහා ජාතික මට්ටමේ සැලසුම් සකස් කිරීමේදී පළාත නියෝජනය කරමින් වඩාත් ඵලදායි මෙන්ම ප්‍රායෝගික යෝජනා ලබාදීමෙන්ද ක්‍රියාත්මක තලයේදී පළාත් දායකත්වය කාර්යක්ෂමව ලබා දෙමින්ද පළාත තුළ සමාජ ගැටළුවක්ව පවතින වකුගඩු රෝගය සැලකිය යුතු මට්ටමකින් පාලනයකර ගැනීම සඳහා පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය හා පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමග සහසම්බන්ධව කටයුතු කිරීමට හැකි විය.



### 6.2. ඵලදායිතාව පිළිබඳ වැඩසටහන.

ඵලදායිතා ලේකම් කාර්යාලය හා සමග සහසම්බන්ධව පළාතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතනවල ඵලදායිතාවය

හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය මූලික කටයුතු 2016 වර්ෂය තුළදී ආරම්භ කිරීමට හැකිවිය.

ඒ අනුව පළාතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවල ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය පිළිබඳව මූලික දැනුවත් කිරීම් කරමින් පළාතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවලින් ඵලදායි මෙන්ම කාර්යක්ෂම සේවයක් පළාතේ ජනතාවට ලබාදිය හැකි පරිදි ආයතන ජාලය ශක්තිමත් කිරීමට අවශ්‍ය මගපෙන්වීම මේ තුළින් සිදුවේ.

## 07. පර්යේෂණ හා සමීක්ෂණ සඳහා ක්‍රියාත්මක වීම.

2016 වර්ෂයේදී පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් පර්යේෂණ හා සමීක්ෂණ සඳහාද විශේෂත්වයක් ලබා දීමට කටයුතු කරන ලදී. ඒ අනුව ව්‍යවසාය හා ජීවනෝපාය සංවර්ධනය අරමුණුකර ගනිමින් කාර්මික පුහුණුව සම්බන්ධයෙන් සමීක්ෂණ හා පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. අන්තර්ජාලය සඳහා පළාතට අදාල තොරතුරු ලබාදීමට විශේෂයෙන් පළාතට පැමිණෙන සංචාරකයින් සඳහා අවශ්‍ය අදාල තොරතුරු යාවත්කාලීන කර දීමටත් දායක විය.

## 08. වෙනත් විදේශ අරමුදල් යටතේ පළාත තුළ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධීකරණය හා ප්‍රගති සමාලෝචනය වෙනුවෙන් දැක්වූ දායකත්වය.

### 7.1. උතුරු ඇල ව්‍යාපෘතිය - JICA අරමුදල්.

උතුරු ඇල ව්‍යාපෘතිය යටතේ උතුරු මැද පළාතේ එල්ලංගා පද්ධතිය හා කාර්යක්ෂම ජල කළමනාකරණය මෙන්ම ඒ හා ආශ්‍රිත ජනතාවගේ ජීවනෝපාය සංවර්ධන කටයුතු පිළිබඳ අධ්‍යයනයක් සිදු කරයි. මෙම අධ්‍යයනය මගින් හෙළිකර ගන්නා කරුණු උපයෝගිකර ගනිමින් ඉදිරියේදී ක්‍රියාත්මක වන උතුරු ඇල සංවර්ධන ව්‍යාපෘති වඩාත් ඵලදායි අන්දමින් සිදු කිරීම අපේක්ෂාවයි. මේ සඳහා පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව ඍජුවම සම්බන්ධ වී අවශ්‍ය පහසුකම් හා දායකත්වය ලබා දෙමින් මෙම කටයුත්ත සිදු කිරීමට දායකත්වය සලසයි.

### 7.2. අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිය 2016 – 2021.

සංවර්ධනය සඳහා වූ නියෝජිතායතනය හා ශ්‍රී ලංකා රජය ඒකාබද්ධව මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය මෙහෙයවීමෙන් සිදු කරන මෙම ව්‍යාපෘතිය සඳහා අනුරාධපුර නගරය ආශ්‍රිත කලාපය පහත අංග 4 යටතේ සංවර්ධනය කරයි.

- ජල කළමනාකරණය.
- ගමනාගමන පහසුකම් සංවර්ධනය.
- නගර අලංකරණය හා පහසුකම් සංවර්ධනය.
- නගර සංවර්ධනයට හා උරුම කළමනාකරණයට සම්බන්ධ ආයතනවල ධාරිතා සංවර්ධනය.

අනුරාධපුර නගරයට මෙතෙක් වෙන්වූ විශාලම මුදල වන ඇමරිකානු ඩොලර් මිලියන 57.5ක මුදලක් මේ සඳහා ආයෝජනය කිරිමට නියමිත අතර, මෙම ව්‍යාපෘතියේ ප්‍රධානතම සම්බන්ධීකාරක ලෙස පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව කටයුතු කරයි.

## 09. දුෂ්කර ප්‍රදේශවල පාසල් හා සෞඛ්‍ය සායන මධ්‍යස්ථානවල පානීය ජල අවශ්‍යතා සම්පූර්ණ කිරීම.

2005 වර්ෂයේ පින්ලන්ත රජයේ ආධාර ඇතිව උතුරු මැද පළාතේ දුෂ්කර ප්‍රදේශවල පාසල් හා සෞඛ්‍ය සායන මධ්‍යස්ථානවල සූර්යකෝෂ විදුලි බලයෙන් වැඩ කරන මෝටර් සවිකර එම පාසල්වල සිසුන්ගේ හා සෞඛ්‍ය සායන මධ්‍යස්ථානවලට පැමිණෙන ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ළිං ඉදි කරන ලදී.

වර්ෂ ගණනාවක් යන විට මෙම සමහර මෝටර් අක්‍රිය වීම නිසා එම ව්‍යාපෘතිය අසාර්ථක විය. පසුව පින්ලන්ත රජය සමග කරන ලද සාකච්ඡාවකින් පසු එම අක්‍රිය මෝටර් සියල්ල නැවත ලබා දී සවි කිරිමට එම රජය පොරොන්දු වූ අතර එම මෝටර් සවි කිරිමට පෙර ළිං පිරිසිදු කිරීම අවශ්‍ය විය.

මෙම ව්‍යාපෘතිය මගින් උතුරු මැද පළාතේ ළිං 215ක මෝටර් සවිකර ඇත. මෙම ළිං පිරිසිදු කිරිමට සහ එම ළිංවල ජල සාම්පල පරීක්ෂාව සඳහා එක ළිඳක් සඳහා රු: 55,616.55 වැයවන බව ජල සම්පාදක මණ්ඩලය විසින් ඇස්තමේන්තු කරන ලදී. ඒ යටතේ ළිං 215 පිරිසිදු කිරිම සඳහා රු:11,957,558.25 මුදලක් වැය වේ. මේ යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ළිං 121ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ළිං 70ක් ප්‍රතිසංස්කරණය කරන ලදි.

මේ යටතේ 2015 වර්ෂයේ ළිං 187ක් ප්‍රතිසංස්කරණය කිරිම සඳහා රු.750,646.85 සහ 2016 වර්ෂයේ ළිං 52ක් පිරිසිදු කිරිම සඳහා 2,892,060.60 වැයකර ඇත.

2016 වර්ෂයේ පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ දැක්ම කරා ළඟා වීම සඳහා ඉටු කළ යුතු කාර්යයන්ගේ කාර්ය සාධනය යහපත් මට්ටමක වූ අතර කාර්ය සාධනය ළඟාකර ගැනීම ඉහළ මට්ටමක පැවතුණි.

5.2

# පළාත් භාණ්ඩාගාරය

### ඉදිරි දැක්ම

"ප්‍රශස්ත මූල්‍ය කළමනාකරණයක්, සංවර්ධිත පළාතක්"

### මෙහෙවර

"සංවර්ධිත පළාතක් බිහි කිරීම සඳහා පළාතේ මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, මූල්‍ය කටයුතු පිළිබඳ උපදේශනය, පළාතේ ගිණුම් පවත්වාගෙන යාම සහ ප්‍රසිද්ධ කිරීම මූල්‍ය කළමනාකරණ තොරතුරු සැපයීම හා සියළු පාර්ශවයන්ගේ සහභාගිත්වයෙන් යුක්තව ගිණුම් ක්‍රම සංවර්ධනය කිරීම".

### අරමුණු

දීර්ඝකාලීන සංවර්ධන සැලසුම් හා ව්‍යාපෘති යෝජනා පදනම් කරගෙන සම්පත් වෙන් කිරීම, ගිණුම්කරණ කටයුතු සඳහා තොරතුරු හා සන්නිවේදන යෙදවුම් භාවිතය ඉහළ නැංවීම, මූල්‍ය කළමනාකරණය හා වත්කම් කළමනාකරණය ශක්තිමත් කිරීම.

### ප්‍රධාන කාර්යයන්

මනා සම්බන්ධීකරණයක් තුළින් පළාත් සභාව සහ මධ්‍යම රජය විසින් කරනු ලබන ආයෝජනයන්හිදි එකම කාර්යය සඳහා දෙඅංශයෙන්ම සිදුවන ආයෝජන වැළැක්වීම, ගුණාත්මක හා යාවත්කාලීන වාර්තාකරණ ක්‍රමයක් ඇති කිරීම, වියදම් ප්‍රමුඛතා හා අග්‍රිම නිදහස් කිරීම සම්බන්ධ අඛණ්ඩ අවධානය, නිමැවුම් පදනම් කරගත් ඇගයීමේ ක්‍රමයක් පිහිටුවීම, ආයෝජන සඳහා පෞද්ගලික අංශයේ සහභාගිත්වය.

### ප්‍රධාන උපාය මාර්ගයන්



### කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 32 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 25 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 07 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතපාදනය (රු.මි.) | 2016 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 17.30 | 16.60 | 0.70 | 95.95 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 335.79 | 109.72 | 226.07 | 32.68 |
| **එකතුව** | **353.09** | **126.32** | **226.77** | **35.78** |

### මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1.00 | 0.00 | 1.00 | 0 |
| යන්ත්‍රසූත්‍ර සවිකිරීම් හා උපකරණ | 0.20 | 0.00 | 0.20 | 0 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 69.55 | 55.44 | 14.11 | 79.71 |
| **එකතුව** | **70.75** | **55.44** | **15.31** | **78.36** |

### ආදායම්

| ශීර්ෂය | ඉලක්කය (රු.මි.) | සත්‍ය ආදායම (රු.මි.) | එකතු කිරීමේ ප්‍රගතිය % |
|---|---|---|---|
| 10.02.05.04 | 0.13 | 0.16 | 127 |
| 10.02.07.00 | 0.50 | 0.53 | 106 |
| 10.02.12.00 | 1.20 | 1.37 | 114 |
| 10.03.07.09 | 800 | 19 | 2 |
| 20.02.01.01 | 0.02 | 0.017 | 87 |
| 20.02.02.02 | 0.040 | 0.045 | 115 |
| 20.02.02.03 | 0.035 | 0.151 | 433 |
| 20.03.02.99 | 0.060 | 0.107 | 179 |
| 20.06.02.00 | 0.028 | 0.024 | 89 |
| **එකතුව** | **2.483** | **2.946** | **1366** |

### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය

2016 වසර සඳහා ඇස්තමේන්තු කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් අග්‍රිම නොලැබීම හේතුවෙන් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාද විය. භාණ්ඩාගාරය වෙත ලැබුණු මූලධන අක්මුදල් වලින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා 79.71% ක ප්‍රගතියක් කරා ළඟා විය හැකි විය.

පළාත් භාණ්ඩාගාරයේ මූලික මෙහෙවර වන්නේ පළාතේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කරමින් මූල්‍ය කටයුතු පිළිබඳ උපදේශන සේවා ලබා දීමයි. ගිණුම් ක්‍රම සංවර්ධනය කිරීමේ උපදෙස් හා මඟ පෙන්වීම තුළින් මූල්‍ය කළමනාකරණ හා වත්කම් කළමනාකරණය ශක්තිමත් කිරීමටත් ඇස්තමේන්තු සකස් කිරීමේ උපදේශනාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් පළාත් භාණ්ඩාගාරය විසින් ඉටු කරනු ලබයි.

උතුරු මැද පළාතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් ආයතනවලට අදාළ වත්කම් වාර්තා කිරීමේ අඩුපාඩු හා ප්‍රමාදයන් පැවති අතර, නිරන්තරයෙන් ඒ පිළිබඳව විගණනයෙන් විමසීම් කරන ලදී. ඊට විසඳුමක් ලෙස උතුරු මැද පළාතේ සියලුම වත්කම් හඳුනා ගැනීමට හැකිවන පරිදි වත්කම් කළමනාකරණය පිළිබඳ මෘදුකාංගයක් පළාත් භාණ්ඩාගාරය විසින් හඳුන්වා දී ඇත.

උතුරු මැද පළාත් භාණ්ඩාගාරය මගින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ඉලක්ක සහගත ක්‍රියාවලියක් ඉටු කිරිමට 2016 වර්ෂයේදී හැකි වු අතර ඒ තුලින් ආයතනයේ කාර්ය සාධනය ඉහල මට්ටමක පවත්වා ගැනීමට හැකිවිය.

5.3

# පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

**ඉදිරි දැක්ම**

"ගුණාත්මක හා ජනහිතකාමී ඉංජිනේරු ක්‍රියාවලියක්, සෞභාග්‍යමත් පළාතක්"

**මෙහෙවර**

"ඉංජිනේරු කටයුතු ප්‍රජා සහභාගීත්වය ඉංජිනේරු කටයුතුවලදී නවීන තාක්ෂණය භාවිතය සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම."

**ප්‍රධාන කාර්යයන්**

01. ඉංජිනේරු කටයුතු සංවර්ධනය.

- අළුත්වැඩියා හා නවීකරණ කටයුතුවල ඇස්තමේන්තු සැකසීම, අධීක්ෂණය හා බිල්පත් නිර්දේශකිරීම.
- වාස්තු විද්‍යාත්මක සැලසුම්, ව්‍යුහගත සැලසුම් හා සවිස්තරාත්මක වාස්තු විද්‍යාත්මක සැලසුම් සකස් කිරිම.
- අධීක්ෂණය, වැඩ බිම් පරික්ෂාව හා රැස්විම පැවැත්වීම හා බිල්පත් නිර්දේශකර යැවීම.

02. ප්‍රජා සහභාගීත්ව සංවර්ධනය.

03. ඉංජිනේරු කටයුතුවලදී නවින තාක්ෂණය භාවිතය සංවර්ධනය.

**කාර්යය මණ්ඩල සංයුතිය**

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 181 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 143 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 38 |
| අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික පදනමේ සිටින සංඛ්‍යාව | 02 |

**මෙහෙයුම් ප්‍රතිඵල- පුනරාවර්තන වියදම්**

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 83.34 | 82.90 | 0.44 | 99.47 |

| අනෙකුත් පුනරාවර්තන වියදම් | 14.47 | 14.25 | 0.22 | 98.48 |
|---|---|---|---|---|
| **එකතුව** | **97.81** | **97.15** | **0.66** | **99.33** |

**මූලධන වියදම්**

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 6.58 | 6.34 | 0.24 | 96.35 |
| යන්ත්‍රසූත්‍ර සවිකිරීම් හා උපකරණ | 3.90 | 3.89 | 0.01 | 99.74 |
| වාහන | 2.90 | 1.79 | 1.11 | 61.72 |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 1.90 | 1.87 | 0.03 | 98.42 |
| ගොඩනැගිලි ඉදි කිරීම් | 2.70 | 1.48 | 1.22 | 54.81 |
| **එකතුව** | **17.98** | **15.37** | **2.61** | **85.48** |

**මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය**

පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ මගින් අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ වන,

- පළාතේ ඉංජිනේරු කටයුතුවල ජනතාවාදී බව වර්ධනය වීම,
- පළාතේ යටිතල පහසුකම්වල පැවැත්ම වර්ධනය වීම,
- දෙපාර්තමේන්තුවේ ධාරිතා වර්ධනය වීමෙන් දැනුමැති නිලධාරීන් බිහි වීම වර්ධනය වීම,
- පළාතේ ඉදිකිරීම් කටයුතුවල ගුණාත්මකභාවය වර්ධනය වීම,
- පළාතේ යටිතල පහසුකම්වල කල්පැවැත්ම වර්ධනය වීම,
- සිදුවන ප්‍රමාද දෝෂයන් වැළකීම,
- ඉංජිනේරු කටයුතුවලට ගත වන කාලය අඩු වීම,
- බාහිර පාර්ශවයන්ට පළාතේ ඉංජිනේරු තොරතුරුවලට ඇති ප්‍රවේශය වර්ධනය වීම,
- ආයතනයේ සියළුම කටයුතුවල කාර්යක්ෂමතාව හා ඵලදායිතාව ඉහළ යාම,
- ආයතනයේ සේවක අභිප්‍රේරණය ඉහළ යාම,
- ආයතනයේ සේවා සැපයීමේ ගුණාත්මකභාවය ඉහළ යාම,
- බාහිර පාර්ශව අතර ආයතනය කෙරෙහි පවතින ප්‍රසාදය ඉහළ මට්ටමකට පත්වීම

යනාදියට මූලිකත්වය ලබා දෙමින් 2016 වර්ෂයේ සංවර්ධන කාර්යයන් සිදු කරන ලදී.



පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව පළාත් සභාවේ සියළු ආයතන ඉංජිනේරු සේවා සපයා දෙන ලෙස කරනු ලබන ඉල්ලීම් වෙනුවෙන් අවශ්‍ය කරන වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරු සේවා සපයා දීම සිදු කරනු ලබන අතර 2016 වර්ෂය තුළදී ඉල්ලා සිටි සියළුම ඉල්ලීම් ඉටු කිරිමට හැකි වී ඇත.

2016 වර්ෂයේදී අධ්‍යාපන සංවර්ධනය සඳහා උතුරු මැද පළාත් සභාව වෙත ලැබුණු විශේෂ ප්‍රතිපාදන වඩා කාර්යක්ෂමව හා ඵලදායිව භාවිතා කිරීම සඳහා අවශ්‍ය සැලසුම්, ඇස්තමේන්තු හා අනෙකුත් අත්‍යාවශ්‍ය සියළු තාක්ෂණික කාරණා ඉටු කිරීම කෙරෙහි කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම තුළ ඉතා සාර්ථක ප්‍රතිඵල කරා ළඟා විය හැකි විය.



එපමණක්ද නොව ඉදිකිරීම් ආරම්භයේ දී, ක්‍රියාත්මක වන අතරතුර හා එකී ව්‍යාපෘති සාර්ථකව නිමකර ජනතා අයිතියට පත් කරන තුරු නිරන්තර ක්ෂේත්‍ර මට්ටමේ අධීක්ෂණ කටයුතු කරමින් හා වැඩ බිම් රැස්වීම් පවත්වමින් ව්‍යාපෘතිය හා සම්බන්ධ අනෙකුත් පාර්ශවකරුවන්ද මනාව සම්බන්ධීකරණය කරමින් කාර්යාවලිය මෙහෙයවීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ඉලක්ක සහගත ක්‍රියාවලියක් ඉටු කිරිමට 2016 වර්ෂයේදී හැකි විය.

5.4

# පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව

## ඉදිරි දැක්ම

" ඵලදායී මූල්‍ය හා මානව සම්පත් කළමනාකරණයක්, විනය ගරුක පළාත් රාජ්‍ය සේවයක් "

## මෙහෙවර

"ඵලදායි මූල්‍ය හා මානව සම්පත් කළමනාකරණයක් මගින් විනය ගරුක පළාත් රාජ්‍ය සේවයක් බිහිකරනුවස් විගණන කාර්යයන් හා විමර්ශන කටයුතු සියලු පාර්ශවකරුවන්ගේ විධිමත් සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව අඛණ්ඩව හා කාලානුරූපිව ශක්තිමත් කිරිම. "

## අරමුණු

- සමස්ත ප්‍රතිපාදන වැයකිරිම් විනිවිදභාවයකින් යුක්තව සහ අවශ්‍ය ප්‍රතිඵල ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට සියලු ආයතනවලට අවශ්‍ය මග පෙන්වීම හා උපකාර වීම.
- පළාත් සභාවට අයත් සියලු ආයතනවල එදිනෙදා සිදු කරනු ලබන රාජකාරි විධිමත් හා නියමානුකූලව සිදුවේදැයි විපරම් කර ඉහළ කළමනාකාරිත්වයට වාර්තා කිරිම.

## ප්‍රධාන කාර්යයන්




### ප්‍රධාන උපාය මාර්ගයන්

- පළාත් සභාවට අයත් සියලු ආයතන වලට ගොස් (වාර්ෂික සැලැස්මට අනුව) ස්ථානීය පරික්ෂාවන් කිරිම.
- ක්ෂේත්‍රයට ගොස් විමසුම් කිරිම.
- පුද්ගලයින් හා එක්වී ක්‍රියා කිරිම, සාකච්ඡා කිරිම, ප්‍රකාශ ලබා ගැනිම.
- ලැබෙන නියෝජන/ නියෝග අනුව ක්‍රියා කිරිම.
- සමූහ ක්‍රියාකාරකම් වලට සහභාගි වීම ( විදුහල්පති රැස්වීම් වලට සහ සහභාගි වීම සහ පළාත් ගිණුම්කාරක සභාවට සහභාගි වීම).
- විගණන වාර්තා නිකුත් කිරිම.
- විනය කටයුතු සඳහා චෝදනා පත්‍ර කෙටුම්පත්කර අදාළ ආයතන වෙත ලබා දීම.
- විනය පරික්ෂණ/ නිතීමය කටයුතු වලට ඉදිරිපත් වීම. (අධිකරණ කටයුතු වලට සහයවීම).

### කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 38 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 12 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 26 |
| අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික පදනමේ සිටින සංඛ්‍යාව | 02 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | වර්ෂයේ 2016 වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 7.48 | 6.95 | 0.53 | 92.91 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 3.63 | 1.94 | 1.69 | 53.44 |
| **එකතුව** | **11.11** | **8.89** | **2.22** | **80.01** |

### මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2.00 | 1.68 | 0.32 | 84 |
| යන්ත්‍රසූත්‍ර සවිකිරීම් හා උපකරණ | 0.30 | 0.29 | 0.01 | 96.67 |
| වෙනත් මූලධන වත්කම් වැඩිදියුණු කිරීම | 0.50 | 0.49 | 0.01 | 98 |
| එකතුව | **2.80** | **2.46** | **0.34** | **87.86** |

මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය

| අංකය | ව්‍යාපෘතිය | ඉලක්කය | වෙන්කල ප්‍රතිපාදනය (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| 1 | ගොඩනැගිලි ඉදි කිරීම | කාර්යාලයේ වහලය අළුත්වැඩියා කිරීම | 2.00 | 1.68 | 84 |
| 2 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | කාර්යාලයට ගෘහ භාණ්ඩ මිල දී ගැනීම | 3.00 | 0.49 | 16.33 |
| 3 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | ෆැක්ස් යන්ත්‍රයක් මිල දී ගැනීම | 3.00 | 0.03 | 1 |
| | | පරිගණක උපාංග මිල දී ගැනීම | 3.00 | 0.25 | 8.33 |

වාර්ෂික සැලැස්ම අනුව විගණන හා විමර්ශන වාර්තා 143ක් නිකුත් කර ඇත. කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම නිසා වාර්ෂික සැලැස්මේ ඉලක්කයන් 100% සම්පූර්ණ කර ගැනීම දුෂ්කර කටයුත්තක්ව පවතී. විගණන නිළධාරීන් ප්‍රමාණය 25 දෙනෙක් දක්වා වැඩිකර ගැනීම සඳහා අනුමැතිය ලබාගෙන ඇත. එම තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටිය සකස් කිරීම සඳහා කටයුතු සිදු කෙරෙන අතර ඊට අදාල වැටුප් ක්‍රමයේ සංශෝධන සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.

පළාත් ගිණුම්කාරක සභාවේදී උද්ගත වූ කරුණු සම්බන්ධව නැවත විමර්ශනයකර ගිණුම්කාරක සභාවට වාර්තා 02ක් ද, ගරු ප්‍රධාන අමාත්‍යතුමා සහ ප්‍රධාන ලේකම්ගේ යොමු කිරීම මත විශේෂිත විමර්ශන කටයුතු 06ක් සිදු කරන ලදී. මේ අතර හැකි සෑම අවස්ථාවකම විගණන හා කළමනාකරණ කමිටුවලට සහභාගී වීම මගින් ආයතනවල ක්‍රියාකාරීත්වයට මග පෙන්වීම හා උපදෙස් ලබා දීම ද සිදු කරන ලදී.

සෑම ආයතනයකම යම් නිශ්චිත කාලයකදී කරන ලද ආයතනික කටයුතු මෙන්ම ගිණුම් ක්‍රියාවලියද ඇතුළත්ව සමස්ත කළමනාකරණ කාර්යයන් පිරික්සීම මෙම දෙපාර්තමේන්තුවට නියම වී ඇත. එම නිසා කුඩා කණ්ඩායමක් ලෙස විශාල කැපවීමකින් යුක්තව ක්‍රියාකිරීම තුලින් මහජන ප්‍රසාදයට ලක්ව ඇත. මහජන මුදල් වැය කිරීමේ දී වංචා දූෂණ හෙළිවීම් මාධ්‍ය මඟින්ද හෙළිදරව් කිරීම නිසා සාමාන්‍ය ජනතාවගේ දැනුවත්භාවය තුල මහජනයා විසින් විවිධ පෙත්සම් හා ලිපි එවීමද සිදුවිණි. සියළු රාජකාරී වල විනිවිදභාවය මෙන්ම නීත්‍යානුකූල හා නිවැරදිභාවය ඇති කිරීමට ක්‍රියා කිරීම සහ එහි ප්‍රතිඵල ඉදිරිකාලයේ දී ලැබෙනු ඇත. ඒ තුලින් රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාවය හා ඵලදායී බව වැඩි කිරීමට හැකි වූ අතර ඒ තුළින් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තු කාර්ය සාධනය ඉහළ නංවා ගැනීමට හැකි වි ඇත.

5.5

# කළමනාකරණ හා සංවර්ධන පුහුණු ඒකකය

## ඉදිරි දැක්ම

"පරිපූර්ණ මහජන සේවකයෙක්, ගුණාත්මක රාජ්‍ය සේවයක්"

## මෙහෙවර

"ජාතික ප්‍රතිපත්තියට අනුගතව පළාතේ රාජ්‍ය සේවකයින්ගේ ධාරිතා ඉහළ නැංවීම, පුහුණු අවශ්‍යතා තක්සේරුව, කාර්ය සාධන නියාමනය සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවිධානය කරමින් ජනතාවාදී රාජ්‍ය සේවයක් බිහි කිරීමට අඛණ්ඩව දායක වීම."

## දිගු කාලීන හා කෙටි කාලීන අරමුණු

### දිගු කාලීන අරමුණු

රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නිළධාරීන් පුහුණු කිරීම තුළින් කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවයක් ඇති කිරීම.

### කෙටි කාලීන අරමුණු

රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නිළධාරීන් පුහුණු කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- රාජ්‍ය සේවකයින්ගේ ධාරිතා සංවර්ධනය
- පුහුණු අවශ්‍යතා තක්සේරුව
- කාර්ය සාධන නියාමනය
- ආයතනික ධාරිතා සංවර්ධනය
- යහපාලනය





### කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 37 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 26 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 11 |
| අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික පදනමේ සිටින සංඛ්‍යාව | 02 |

### මෙහෙයුම් ප්‍රතිඵල-පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි.) | වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව අනෙකුත් පුනරාවර්තන වියදම් | 24.01 | 22.64 | 1.37 | 94.29 |
| එකතුව | **24.01** | **22.64** | **1.37** | **94.29** |

### මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 3.00 | 2.47 | 0.53 | 82.33 |
| යන්ත්‍රසූත්‍ර සවිකිරීම් හා උපකරණ | 6.00 | 1.29 | 4.71 | 21.5 |
| වෙනත් | 1.00 | 0.00 | 1.00 | 0 |
| මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 3.00 | 0.52 | 2.48 | 17.33 |
| එකතුව | **13.00** | **4.28** | **8.72** | **32.92** |

### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය

| අනු අංකය | දිනය | වැඩසටහන | දින ගණන | සහභාගී වූ සංඛ්‍යාව | මුළු වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| 1 | 2016.01.18 | පරිපාලන නිලධාරි පුහුණු වැඩසටහන | 4 | 27 | 0.18 |
| 2 | 2016.02.01 | කළමනාකරණ සහකාර සේවයට උසස්වූ නිලධාරීන් සඳහා වැඩසටහන | 10 | 30 | 0.17 |

| අනු අංකය | දිනය | වැඩසටහන | දින ගණන | සහභාගී වූ සංඛ්‍යාව | මුළු වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| 3 | 2016.02.08 | අභ්‍යාසලාභී උපාධිධාරී පුහුණු වැඩසටහන | 10 | 13 | 0.11 |
| 4 | 2016.02.16 | විගණන නිලධාරී පුහුණුව | 3 | 64 | 0.05 |
| 5 | 2016.02.19 | ප්‍රධාන කළමනාකරණ සහකාර පුහුණු වැඩමුළුව | 1 | 45 | 0.02 |
| 6 | 2016.02.23 | නවක කළමනාකරණ සහකාර පුහුණු වැඩමුළුව | 10 | 22 | 0.14 |
| 7 | 2016.02.25 | කාර්යාල කාර්ය සහයක පුහුණුව | 1 | 47 | 0.02 |
| 8 | 2016.03.14 | ලිපිගොණුකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව | 2 | 36 | 0.04 |
| 9 | 2016.03.14 | අන්තර්ජාල භාවිතය | 2 | 20 | 0.03 |
| 10 | 2016.03.17 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 2 | 26 | 0.03 |
| 11 | 2016.03.19 | ආකල්ප සංවර්ධන පුහුණු වැඩසටහන | 1 | 75 | 0.06 |
| 12 | 2016.03.28 | අන්තර්ජාල භාවිතය | 2 | 20 | 0.03 |
| 13 | 2016.03.31 | අත්තිකාරම් ගිණුම් | 2 | 21 | 0.03 |
| 14 | 2016.03.31 | සංවර්ධන සැලසුම්කරණය | 2 | 30 | 0.04 |
| 15 | 2016.04.07 | අන්තර්ජාල භාවිතය | 2 | 19 | 0.01 |
| 16 | 2016.04.29 | ගැටුම් කළමනාකරණය | 1 | 28 | 0.02 |
| 17 | 2016.05.02 | තාක්ෂණික සහයක පුහුණු වැඩසටහන | 5 | 31 | 0.09 |
| 18 | 2016.05.05 | රියදුරු පුහුණු වැඩමුළුව | 2 | 41 | 0.04 |
| 19 | 2016.05.10 | අන්තර්ජාල භාවිතය | 2 | 23 | 0.04 |
| 20 | 2016.05.12 | අන්තර්ජාල භාවිතය | 2 | 18 | 0.03 |
| 21 | 2016.05.19 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා කොන්ත්‍රාත් පරිපාලනය | | 35 | 0.04 |
| 22 | 2016.05.26 | ගැටුම් කළමනාකරණය | 1 | 29 | 0.02 |
| 23 | 2016.05.26 | වැටුප් පරිවර්තන | 2 | 45 | 0.04 |
| 24 | 2016.05.28 | සතුට පිරුණු ජීවිතයට උපදේශනය | 1 | 82 | 0.02 |
| 25 | 2016.05.30 | බලතල හා බලතල හා ක්‍රියාත්මක කිරීම | 1 | 110 | 0.53 |
| 26 | 2016.06.02 | ලිපිගොනුකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | 2 | 38 | 0.04 |
| 27 | 2016.06.09 | මූලික පරිගණක පුහුණු වැඩමුළුව | 5 | 27 | 0.08 |
| 28 | 2016.06.09 | අල්ලස් හා දූෂණය වැලැක්වීම පිළිබඳ පුහුණු වැඩමුළුව | 1 | 42 | 0.03 |
| 29 | 2016.06.16 | කාල කළමනාකරණය | 1 | 23 | 0.02 |
| 30 | 2016.06.23 | ගැටුම් කළමනාකරණය | 1 | 42 | 0.02 |
| 31 | 2016.06.23 | මූලික ගිණුම්කරණය පිළිබඳ පුහුණු වැඩසටහන | 3 | 36 | 0.06 |
| 32 | 2016.06.25 | ආකල්ප සංවර්ධනය I (වාරිමාර්ග අමාත්‍යාංශය) | 1 | 65 | 0.06 |
| 33 | 2016.06.29 | ධනාත්මක ආකල්ප වර්ධනය තුලින් ආකල්ප වර්ධනය | 2 | 43 | 0.05 |
| 34 | 2016.07.01 | රාජ්‍ය සේවයේ සතුට හා සුවය වෙනුවෙන් ආකල්ප සංවර්ධනය | 1 | 45 | 0.04 |
| 35 | 2016.07.04 | මූලික පරිගණක පුහුණු වැඩමුළුව | 2 | 25 | 0.03 |
| 36 | 2016.07.14 | විශ්‍රාම වැටුප් සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව | 2 | 40 | 0.05 |
| 37 | 2016.07.26 | ඵලදායිතාවය පිළිබඳ පුහුණු වැඩමුළුව | 1 | 35 | 0.02 |
| 38 | 2016.07.28 | පළාත් සභා බලතල හා මූල්‍ය පරිපාලනය | 2 | 60 | 0.05 |
| 39 | 2016.08.01 | වැටුප් පරිවර්තන | 2 | 40 | 0.04 |
| 40 | 2016.08.01 | ගැටුම් කළමනාකරණය | 1 | 42 | 0.02 |

| අනු අංකය | දිනය | වැඩසටහන | දින ගණන | සහභාගී වූ සංඛ්‍යාව | මුළු වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| 41 | 2016.08.01 | සිගාස් | 2 | 24 | 0.04 |
| 42 | 2016.08.04 | නගර සභා හා සෞඛ්‍ය සුළු සේවක පුහුණු වැඩමුළුව | 4 | 47 | 0.02 |
| 43 | 2016.08.18 | නගර සභා සුළු සේවක පුහුණු වැඩමුළුව | 1 | 52 | 0.03 |
| 44 | 2016.08.12 | කණිෂ්ඨ සේවක කාර්ය සාධනය පිළිබඳ පුහුණු වැඩමුළුව | 1 | 68 | 0.03 |
| 45 | 2016.08.11 | සිගාස් | 2 | 25 | 0.04 |
| 46 | 2016.08.29 | මූලික විමර්ශණ පැවැත්වීම පිළිබඳව පුහුණු වැඩසටහන | 3 | 36 | 0.06 |
| 47 | 2016.09.02 | මහජන සේවය තුලින් රාජ්‍ය සේවයේ සතුට | 1 | 70 | 0.08 |
| 48 | 2016.09.03 | ආකල්ප සංවර්ධනය II (ආණ්ඩුකාර ලේකම් කාර්යාලය) | 1 | 50 | 0.04 |
| 49 | 2016.09.08 | ක්ෂේත්‍ර නිලධාරි | 2 | 45 | 0.05 |
| 50 | 2016.09.13 | නගර සභා සුළු සේවක | 1 | 35 | 0.02 |
| 51 | 2016.09.15 | මූලික විමර්ශණ පැවැත්වීම පිළිබඳව පුහුණු වැඩසටහන | 1 | 30 | 0.02 |
| 52 | 2016.09.30 | සේවක වරප්‍රසාද අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳව පුහුණු වැඩසටහන | 1 | 42 | 0.02 |
| 53 | 2016.10.20 | ආධුනික කාර්මික නිලධාරින් සඳහා සේවාරම්භක පුහුණු පාඨමාලාව II | 1 | 25 | 0.0099 |
| 54 | 2016.10.25 | නගර සභා සුළු සේවක පුහුණු වැඩසටහන | 1 | 40 | 0.02 |
| 55 | 2016.10.28 | ඵලදායි රාජ්‍ය සේවයක් සඳහා යහපත් මානසික ශාරීරික සමාජ පරිසරයේ වැදගත්කම | 1 | 220 | 0.08 |
| 56 | 2016.10.31 | මූලික පරිගණක පුහුණු වැඩමුළුව | 5 | 25 | 0.07 |
| 57 | 2016.11.11 | කාර්යාල ක්‍රම හා ලිපිගොණුකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව | 1 | 39 | 0.0083 |
| 58 | 2016.11.18 | කණිෂ්ඨ සේවක කාර්ය සාධනය පිළිබඳ පුහුණු වැඩමුළුව | 1 | 68 | 0.02 |
| 59 | 2016.11.22 | රියදුරු පුහුණු වැඩමුළුව | 1 | 29 | 0.02 |
| 60 | 2016.11.28 | උපදේශන ගුරු භවතුන්ගේ වෘත්තීය සංවර්ධනය | 1 | 450 | 0.13 |
| 61 | 2016.12.05 | ආයතනික ධාරිතා සංවර්ධන වැඩමුළුව | 2 | 53 | 0.05 |
| 62 | 2016.12.19 | මූලික පරිගණක පුහුණු වැඩමුළුව | 2 | 22 | 0.03 |
| 63 | 2016.12.20 | වාර්ෂික පුහුණු සැලැස්ම සකස්කිරිම 2017 | 1 | 51 | 0.06 |
| 64 | තාක්ෂණ නිලධාරීන්ගේ පුහුණු පාඨමාලාව (කොත්මලේ) | | මාස 11 | 13 | 2.80 |
| | | **මුළු වියදම** | **136** | **3086** | **6.19** |

2016 වර්ෂයේ පුහුණු සැලැස්මට අනුව පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වර්ධනය කිරීමේ අරමුණින් විවිධ විෂය ක්ෂේත්‍රයන් ඔස්සේ වැඩසටහන් 46 ක්

පැවැත්වීමට සැලසුම්කර තිබුණි. 2016 වර්ෂය අවසන් වනවිට විෂය ක්ෂේත්‍රයන්ට අදාල මෙන්ම විෂය බාහිර හා වෙනත් ආයතනවල ඉල්ලීම මත වැඩසටහන් 64ක් පවත්වන ලදී.

උතුරු මැද පළාත් කළමනාකරණ හා සංවර්ධන පුහුණු ඒකකය මගින් 2016 වර්ෂයේදී සියළු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පළාත් පුහුණු ඒකකයේ පුහුණු සංචිතය සතු සම්පත්දායකයින්ගේ සේවය ලබා




ගනිමින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. [ඇමුණුම් අංක 02] එහිදී ආකල්ප සංවර්ධනය හා ධාරිතා සංවර්ධනය කේන්ද්‍රකර ගත් පුහුණු වැඩසටහන් පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩල සඳහා පවත්වන ලදී.

එසේම පරිපාලන නිලධාරි පුහුණු වැඩසටහන, කළමනාකරණ සහකාර සේවයට උසස්වූ නිලධාරීන් සඳහා වැඩසටහන, අභ්‍යාසලාභී උපාධිධාරි පුහුණු වැඩසටහන, විගණන නිලධාරි පුහුණුව, ප්‍රධාන කළමනාකරණ සහකාර පුහුණු වැඩමුළුව, නවක කළමනාකරණ සහකාර පුහුණු වැඩමුළුව, මූලික ගිණුම්කරණය පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වමින් රාජ්‍ය සේවයේ දැනට සිටින නිලධාරින් මෙන්ම නවක නිලධාරීන් වෙනුවෙන්ද වෘත්තීය තත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම ඉලක්කකරගත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

තවද ඉතාම අඩු පුහුණු අවස්ථා ලබන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල සේවය කරන කණිෂ්ඨ සේවකයින්ගේ සේවා තෘප්තිය හා තම කාර්යය කෙරෙහි උනන්දුව මෙන්ම කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම කේන්ද්‍ර කරගත් කාර්යාල කාර්ය සහයක පුහුණුව, රියදුරු පුහුණු වැඩමුළුව, නගර සභා හා සෞඛ්‍ය සුළු සේවක පුහුණු වැඩමුළුව, කණිෂ්ඨ සේවක කාර්ය සාධනය පිළිබඳ පුහුණු වැඩමුළු පවත්වන ලදී.



කාර්යාල කටයුතු පහසුකරණය, ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ දැමීම සඳහා අවශ්‍ය වන ලිපිගොණුකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව, අන්තර්ජාල භාවිතය, ප්‍රසම්පාදන ක්‍රියාවලිය, අත්තිකාරම් ගිණුම්, විශ්‍රාම වැටුප් සකස් කිරිම පිළිබඳ පුහුණු වැඩමුළුව, ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා කොන්ත්‍රාත් පරිපාලනය, වැටුප් පරිවර්තන, කාල කළමනාකරණය,

කාර්යාල ක්‍රම හා ලිපිගොණුකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව, ගැටුම් කළමනාකරණය ඉලක්කකරගත් පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

නවීන තාක්ෂණය සේවකයින් අතර ප්‍රචලිත කිරීමටත් නවීන තාක්ෂණික මෙවලම් භාවිතය ප්‍රචලිත කිරීමත් අරමුණුකරගත් අන්තර්ජාල භාවිතය, , මූලික පරිගණක පුහුණු වැඩමුළු පවත්වන ලදී. එසේම සංවර්ධන සැලසුම්කරණය, ඵලදායිතාවය පිළිබඳ පුහුණු වැඩමුළුව, 2017 වාර්ෂික පුහුණු සැලැස්ම සකස් කිරිම සඳහා පුහුණු වැඩසටහන්ද ක්‍රියාත්මක කළ වසරකි.



එසේම හුදු න්‍යායාත්මක කාරණාවලින් බැහැරව මානසික තෘප්තිය වර්ධනය කිරිම සඳහා සැකසුණු පුහුණු වැඩසටහන් කෙරෙහි අවධානය යොමු කරමින් පුහුණු වැඩසටහන් සංවිධානයකර ක්‍රියාත්මක කර ඇත. ඒ අතර සතුට පිරුණු ජීවිතයට උපදේශනය, ආකල්ප සංවර්ධනය I (වාරිමාර්ග අමාත්‍යාංශය), ධනාත්මක ආකල්ප වර්ධනය තුලින් ආකල්ප වර්ධනය, රාජ්‍ය සේවයේ සතුට හා සුවය වෙනුවෙන් ආකල්ප සංවර්ධනය, මහජන සේවය තුලින් රාජ්‍ය සේවයේ සතුට, ආකල්ප සංවර්ධනය II (ආණ්ඩුකාර ලේකම් කාර්යාලය), ක්ෂේත්‍ර නිලධාරි, නගර සභා සුළු සේවක, මූලික විමර්ෂණ පැවැත්විම පිළිබඳව පුහුණු වැඩසටහන, සේවක වරප්‍රසාද අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳව පුහුණු වැඩසටහන, ආධුනික කාර්මික නිලධාරින් සඳහා සේවාරම්භක පුහුණු පාඨමාලාව II,නගර සභා සුළු සේවක පුහුණු වැඩසටහන, ඵලදායි රාජ්‍ය සේවයක් සඳහා යහපත් මානසික ශාරිරික සමාජ පරිසරයේ වැදගත්කම, මූලික පරිගණක පුහුණු වැඩමුළු ප්‍රධාන තැනක් ගනී.

එසේම පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරිමේදි පුහුණු කරුවන් හා මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් අනෙකුත් පාර්ශවකරුවන්ද මනාව සම්බන්ධීකරණය කරමින් කාර්යාවලිය මෙහෙයවීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ඉලක්ක සහගත ක්‍රියාවලියක් ඉටු කිරිමට 2016දී හැකි විය.

5.6

# පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

### ඉදිරි දැක්ම

"ප්‍රශස්ත බදු රැස් කිරීමේ ක්‍රියාවලියක්, සංවර්ධිත පළාතක්."

### මෙහෙවර

"සංවර්ධිත පළාතක් බිහිකිරීම සඳහා බදු හා ගාස්තු රැස් කිරීම, බදු හා ගාස්තු ගෙවන්නන්ගේ ආකල්ප සහ අනෙකුත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය, අදාල පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම."

### අරමුණු

- සියළු බදු හා ගාස්තු ආදායම් රැස් කිරීම ඉහළ නැංවීම.
- ස්වේච්ඡා බදු අනුකූලතාව වර්ධනය.

### ප්‍රධාන කාර්යයන්




### ප්‍රධාන උපාය මාර්ගයන්

- බදු හා ගාස්තු ගෙවන්නන්ගෙන් හා විවිධ ආයතන වලින් තොරතුරු කැඳවීම.
- බදු හා ගාස්තු ගෙවන්නන් කැඳවා සම්මුඛ සාකච්ඡා තුළින් පෙර බදු හා ගාස්තු අය කිරීම.
- බදු හා ගාස්තු ගෙවන්නන් හා නොතාරිස්වරුන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම.
- හිඟ බදු හා ඌණ මුද්දර ගාස්තු අය කිරීම.
    - i. වංචල හා නිශ්චල දේපළ තහනම් කිරීම.
    - ii. බැංකු ගිණුම් තහනම් කිරීම.
    - iii. නඩු පැවරීම.

කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 51 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 39 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 13 |
| අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික පදනමේ සිටින සංඛ්‍යාව | 01 |

මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016 වර්ෂයේවියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 33.31 | 31.40 | 1.91 | 94.26 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 3.35 | 2.82 | 0.53 | 84.18 |
| **එකතුව** | **36.66** | **34.22** | **2.44** | **93.34** |

මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ප්‍රතිපාදනය (රු.මි.) | 2016වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 15.67 | 8.51 | 7.16 | 54.30 |
| යන්ත්‍රසූත්‍ර සවිකිරීම් හා උපකරණ | 1.50 | 1.32 | 0.18 | 88 |
| **එකතුව** | **17.17** | **9.83** | **7.34** | **57.25** |

ආදායම්

| ශීර්ෂය | ආදායම් විස්තරය | ඉලක්කය (රු.මි.) | සත්‍ය ආදායම (රු.මි.) | එකතු කිරීමේ ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 10-02-04-05 | මෙරට මත්පැන් බලපත්‍ර ගාස්තු | 60.0 | 67.43 | 112 |
| 10.02.07.01 | දේපල පැවරීම මත මුද්දර ගාස්තු | 105.0 | 156.99 | 150 |
| 10.02.07.02 | අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු | 5.0 | 4.76 | 95 |
| 10.02.09.00 | ව්‍යාපාර පිරිවැටුම් බදු | 8.0 | 0.98 | 12 |
| 20.03.02.27 | ඖෂධ හා රසායන ද්‍රව්‍ය බද්ද | 0.1 | 1.61 | 1610 |
| 20.03.02.30 | ඛනිජ සම්පත් මත බදු | 6.0 | 5.15 | 86 |
| 20.03.03.01 | උසාවි දඩ | 185.0 | 209.85 | 113 |
| **එකතුව** | | **369.1** | **446.77** | **121** |

## මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය

| ව්‍යාපෘතිය | වෙන් කළ ප්‍රතිපාදනය (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| පොළොන්නරුව පළාත් ආදායම් නියෝජ්‍ය කොමසාරිගේ නිළ නිවස ඉදිකිරීම | 6.0 | 1.32 | 22 |
| පොළොන්නරු කාර්යාලයේ සෝදන කාමරය අළුත්වැඩියාව | 0.4 | 1.50 | 40.54 |
| පොළොන්නරු කාර්යාලය වායු සමනය කිරීම | 0.7 | | |
| කාර්යාල බිම ටයිල් කිරීම- පොළොන්නරුව | 0.6 | | |
| පොළොන්නරුව කාර්යාලය වටා තාප්පයක් ඉදිකිරීම | 2.0 | | |
| කාර්යාල බිම ටයිල් කිරීම- අනුරාධපුර | 2.6 | 5.68 | 100 |
| අනුරාධපුර කාර්යාලයේ කාමර වෙන් කිරීම | 0.3 | | |
| අනුරාධපුර කාර්යාලය වටා තාප්පයක් ඉදිකිරීම | 2.5 | | |
| අනුරාධපුර කාර්යාලයේ ගෙට්ටුව ඉදිකිරීම | 0.1 | | |
| තමන්කඩුව කාර්යාලයේ වාහන අංගනය ඉදිකිරීම | 0.5 | - | - |
| **එකතුව** | **15.7** | **8.5** | **54.14** |

**2016** වර්ෂය තුළ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් මෙරට මත්පැන් බලපත්‍ර ගාස්තු ආදායම රු.මි 67.4ක්ද දේපල පැවරීම මත මුද්දර ගාස්තු මගින් රු.මි 157ක්ද අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු මගින් රු.මි 4.7ක්ද ව්‍යාපාර පිරිවැටුම් බදු මගින් රු.මි 0.98ක්ද ඖෂධ හා රසායන ද්‍රව්‍ය බදු මගින් රු.මි 1.5ක්ද ඛනිජ සම්පත් මත බදු ගාස්තු රු.මි 5.15ක්ද සහ උසාවි දඩ මගින් රු.මි 209.8ක් ලෙස ආදායම් උපයා ගෙන ඇත.




මෙහිදී විශේෂයෙන් සලකා බලන විට පෙනී යන්නේ මෙරට මත්පැන් බලපත්‍ර ගාස්තු මත අය කරන ලද බලපත්‍ර ගාස්තු වලින් අපේක්ෂා කළ ඉලක්කය කරා යාමට හැකි වූ බවයි.

### 1. 10-02-04-05- මෙරට මත්පැන් බලපත්‍ර ගාස්තු

පළාත තුල ඇති මත්පැන් අළෙවිසැල් ගණන 137 කි. මෙම මත්පැන් බලපත්‍ර වලින් අපේක්ෂිත ආදායම රු.මි. 60.0කි. රැස් කල ආදායම රු. මි. 67.4කි. මෙම වැඩි වීමට හේතුව පසුගිය වර්ෂයට අදාල බලපත්‍ර ගාස්තුද මෙම වසර තුළදී ගෙන්වා ගැනීමයි.

### 2. 10-02-07-01 දේපල පැවරීම මත මුද්දර ගාස්තු

මෙහි ඉලක්කය රු. මි. 105.0කි. රැස්කල ආදායම් රු. මි. 157.0කි. මෙම ඉලක්කය ඉක්මවා යාමට හේතුව වන්නේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ඔප්පු පරීක්ෂා කිරීමෙන් පසුව අතිරේක මුද්දර ගාස්තු අය කිරීමයි. එමෙන්ම මෙම ඔප්පු පරීක්ෂා කිරීම නිසා දේපල මිලදී ගන්නන් දේපලවල පවත්නා වෙළඳපල වටිනාකම මත මුද්දර ගාස්තු ගෙවීමට පෙළඹීම ද ආදායම වර්ධනයට හේතුවකි..

### 3. 10-02-07-02- අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු

ආදායම් ඉලක්කය රු.මි. 5.0කි. රැස් කල හැකි වූයේ රු. මි. 4.7 කි. මෙම ඌණතාවයට හේතුව වන්නේ අධිකරණ 04 ක් මඟින් 2016 දෙසැම්බර් මාසයට අය කරන ලද අධිකරණ ලියවිලි මුද්දර ගාස්තු ද එම වසර තුලදීම ප්‍රේෂණය කර නොමැති වීමයි. සාමාන්‍යයෙන් අය කර ගත් මාසයට පසු මාසයේ මෙම මුදල් එවීම සිදු කෙරේ.

### 4. 10-02-09-00- ව්‍යාපාර පිරිවැටුම් බද්ද

ඉලක්කය රු. මි. 8.0කි. රැස් කර ගත හැකි වූයේ රු. මි. 0.98 කි. 2010 වර්ෂයේ සිට අහෝසි කරන ලද මෙම බද්දේ ඉතිරිව ඇත්තේ හිඟ බදු අය කිරීම පමණි. අය කල හැකි සියළු හිඟ පිරිවැටුම් බදු මේ වන විට අය කර ගෙන ඇත. තව දුරටත් අය කල යුතුව ඇති හිඟ බදු අය කිරීම ඉතා දුෂ්කර නිසා ආදායම් ඉලක්ක සපුරා ගත නොහැකි විය.

### 5. 20-03-02-27 ඖෂධ හා රසායන ද්‍රව්‍ය බද්ද

ඉලක්කය රු. මි. 0.1 කි. රැස් කල ආදායම රු. මි. 1.6 කි. ආදායම් ඉලක්ක ඉක්මවිය හැකි වූයේ අලුත් ව්‍යාපාරික ස්ථාන පිළිබඳ තොරතුරු ලබාගෙන නව ගොනු විවෘත කර බදු රැස් කිරීම නිසාය. ඒ අනුව ආදායම රු. මි. 1.5 කින් වර්ධනය කර ගත හැකි විය.

### 6. 20-03-02-30- 6.6 ඛනිජ සම්පත් බද්ද

අපේක්ෂිත ඉලක්කය රු. මි. 06 කි. රැස් කල හැකි වූයේ රු. මි. 5.1 කි. මෙම ඌණතාවයට හේතු වූයේ පසුගිය වසර කිහිපය තුල විශාල ප්‍රමාණයේ ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම හේතුවෙන් පළාත තුළ පවත්වා ගෙන ගිය ගල් වැඩපළවල් විශාල ප්‍රමාණයක් වැසී යාමයි.

## 7. 20-03-03-01 උසාවි දඩ මුදල්

අපේක්ෂිත ඉලක්කය රු. මි. 185 කි. රැස්කල ආදායම රු. මි. 209.8 කි. මෙම වර්ධනයට හේතු වූයේ පසුගිය වර්ෂයේදී දෙපාර්තමේන්තුවට එවිය යුතු අධිකරණ දඩ මුදල් මෙම වසර තුළදී අධිකරණ වලින් ගෙන්වා ගැනීමට කටයුතු කිරීමයි.

දෙපාර්තමේන්තුවේ 2016 වර්ෂයේ ආදායම් ඉලක්කය රු. මි. 369.1 කි. 2016 වර්ෂයේ රැස්කල මුළු ආදායම රු. මි. 447.0කි. මේ අනුව රු. මි. 78.0ක ප්‍රමාණයක් වැඩිපුර රැස්කර ඇත. මෙම වර්ධනය සමඟ 2015 වර්ෂයට වඩා 2016 වර්ෂය තුල ආදායම් වර්ධනය රු. මි. 65.0 ක් පමණ වේ.එය 2015 වර්ෂයට වඩා 17%ක ප්‍රතිශතයකි.

මෙතෙක් පැවති සේවක ඌණතාවන් එසේම පවතිද්දී වෙනත් කිසිදු නව සම්පත් උපයෝජනයක් නොකර ගනිමින් මෙලෙස ආදායම් වර්ධනයට ප්‍රමුඛතම හේතු ලෙස පහත කරුණු දැක්විය හැක.

- පළාත තුල නිශ්චල දේපල හුවමාරුවට (විකුණුම්, පැවරුම් හා තෑගි) අදාල ඔප්පු සියල්ල එකිනෙක විමර්ශනය කරමින් වෙළඳපොල වටිනාකම මත ඌණ මුද්දර ගාස්තු අය කිරීමට කටයුතු කිරීම නිසාත්, ඒ නිසාම බොහෝදුරට වෙළඳපොල වටිනාකමට සරිලන ලෙස වටිනාකම් ඔප්පු වල සඳහන් කිරීමට ඔප්පු හිමිකරුවන් මෙන්ම නොතාරිස්වරුන් ක්‍රියා කිරීම.
- පළාත තුල පිහිටි අධිකරණ වෙත ගොස් අය කරනු ලබන අධිකරණ දඩ හා ලියකියවිලි මත මුද්දර ගාස්තු නිසි පරිදි ප්‍රේෂණය වන්නේද යන්න පරීක්ෂා කර ඒවා නියමිත පරිදි ගෙන්වා ගැනීමට ක්‍රියා කිරීම.
- පළාත තුළ පිහිටි මත්පැන් හල් වෙනුවෙන් නිකුත් කරනු ලබන බලපත්‍ර සඳහා වූ බලපත්‍ර ගාස්තු නිසි පරිදි දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය වන්නේ දැයි එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ගොස් පරීක්ෂා කර ඒවා ගෙන්වා ගැනීමට ක්‍රියා කිරීම.
- දෙපාර්තමේන්තුවේ සියලු කාර්යය මණ්ඩලයේ එකමුතු බව හා කාර්යක්ෂමතාවය.

එසේම ආදායම් රැස් කරිමේද හා ආයතනය සතු කටයුතු ක්‍රියාත්මක කිරිමේදි මනා සම්බන්ධීකරනය හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල කරා ඉලක්ක සහගත ක්‍රියාවලියක් ඉටු කිරිමට 2016 වර්ෂයේදී හැකි වු අතර ඒ තුලින් ආයතනයේ කාර්ය සාධනය ඉහල මට්ටමක පවත්වා ගැනීමට හැකිවිය.

# 06

## 6.පළාත් ප්‍රධාන අමාත්‍යාංශය

### 6.1.පළාත් පාලන දෙපාර්තමේන්තුව

### 6.2.පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### 6.3.පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව

### 6.4.මාර්ග සංවර්ධන අධිකාරිය

### 6.5.සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය

### 6.6.මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය

### 6.7.පුස්තකාල සේවා මණ්ඩලය

## 06

# පළාත් ප්‍රධාන අමාත්‍යාංශය

### ඉදිරි දැක්ම

"යහපත් සමාජයක්, සෞභාග්‍යවත් පළාතක්".

### මෙහෙවර

"සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව පළාත් පාලනය, පළාත් මාර්ග, ග්‍රාමීය යටිතල පහසුකම්, විකල්ප බලශක්ති, ජනමාධ්‍ය හා සන්නිවේදනය, පුස්තකාල, මුද්‍රණ හා තාක්ෂණික සේවා, ජනතා සුභසාධනය හා සවිබල ගැන්වීම, සංචාරක, අධ්‍යාපනය, සංස්කෘතික, මුල් ළමාවිය අධ්‍යාපන කටයුතු සංවර්ධනය කිරීම සහ පළාතේ තොරතුරු තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම"

### දිගු කාලීන හා කෙටි කාලීන අරමුණු

### දිගු කාලීන අරමුණු

- තිරසාර සංවර්ධනයක් කරා සාමාජීය, ආර්ථික කටයුතු ඵලදායීව සහ කාර්යක්ෂමව ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.
- ප්‍රමාණාත්මක හා ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනයක් ඇති කිරීම.
- උතුරු මැද පළාතේ සංස්කෘතික උරුමයන් ආරක්ෂාකර ගනිමින් සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම.

### කෙටි කාලීන අරමුණු

- පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම හා විධිමත් සංවර්ධනයක් තුළින් ජනතාවගේ දෛනික කටයුතු පහසු කිරීම.
- ජනතාවගේ සමාජ සංවර්ධනය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා අධ්‍යාපන සංවර්ධනය තහවුරු කිරීම.
- පළාතේ තරුණ තරුණියන් සම්පතක් ලෙස සලකා ඒකාබද්ධ සංවර්ධනයට වැඩි දායකත්වයක් ලබාගත හැකි වන පරිදි තරුණ සංවර්ධන වැඩසටහන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
- මාර්ග පද්ධතිය විධිමත්ව හා සංවිධානාත්මකව වැඩි දියුණු කිරීම තුළින් ජනතාවගේ කාර්යයන් පහසු කිරීම හා පළාත තුල ඒකාබද්ධ සංවර්ධනයට ඉඩකඩ සැකසීම.

- රටේ ජීවනාලිය බඳු ළමා පරපුරේ අනාගතය ශක්තිමත් කිරිම සඳහා පූර්ව ළමා සංවර්ධන මධ්‍යස්ථාන නගා සිටුවිම.
- පළාත් සාම්ප්‍රදායික සංස්කෘතික සාරධර්ම ආරක්ෂාකර ගැනීම හා වර්තමාන පරම්පරාව ඒ පිළිබඳ දැනුවත් කිරිම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම මෙන්ම තරුණ තරුණියන්ගේ සෞන්දර්යාත්මක හැකියාවන් වර්ධනය කිරිම.
- අධික විදුලි අවශ්‍යතාවයන්ට පිළියම් වශයෙන් විකල්ප බලශක්ති ක්‍රම හඳුන්වා දිම.
- සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරිම උදෙසා විවිධ පුහුණු වැඩසටහන් පැවැත්විම හා සංචාරක ගම්මාන ඇති කිරිම සඳහා පහසුකම් සැලසිම.

## ප්‍රධාන කාර්යයන්




## ප්‍රධාන උපාය මාර්ගයන්

- නීතිය හා සාමය පවත්වා ගැනීමට පළාත් සභාව සියළු ආරක්ෂක අංශ ඒකාබද්ධව ක්‍රියාත්මක වීම.
- පළාත් පාලනය ආයතන පරිපාලනය කිරීම හා මූල්‍ය පාලනය සඳහා මාසික, ත්‍රෛයිමාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
- පළාතේ ජන ජීවිතය යථාවත් කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය.
- ආර්ථික හා සමාජිය යටිතල පහසුකම් සංවර්ධනය.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- අධ්‍යාපන සංවර්ධනය.
- යහපාලනය.

### කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 94 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 75 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 33 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජන (%) |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 15.89 | 15.30 | 0.59 | 96.29 |
| අනෙකුත් වියදම් | 31.54 | 30.86 | 0.68 | 97.84 |
| **එකතුව** | **47.43** | **46.16** | **1.27** | **97.32** |

### පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජන (%) |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 49.14 | 48.95 | 0.19 | 99.61 |
| අනෙකුත් වියදම් | 180.98 | 169.22 | 11.76 | 93.50 |
| **එකතුව** | **230.12** | **218.17** | **11.95** | **94.81** |

### මූලධන වියදම් 610.03.01

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තගත ප්‍රතිපාදන (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජන % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 7.45 | 7.45 | 0.00 (රු.4.94) | 100 |
| යන්ත්‍රසූත්‍ර සවි කිරීම් හා උපකරණ | 1.07 | 1.07 | 0.00 (රු.455) | 100 |
| වෙනත් මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 0.50 | 0.25 | 0.25 | 50 |
| **එකතුව** | **9.02** | **8.77** | **0.25** | **97.23** |

## මූලධන වියදම් 610.03.02

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජන % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 11.09 | 5.78 | 5.31 | 52.11 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ | 4.71 | 4.71 | 0.00 (රු.629.55) | 100 |
| වෙනත් මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම(ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ) | 0.50 | 2.37 | 0.06 | 97.56 |
| **එකතුව** | **16.30** | **12.86** | **5.38** | **78.89** |

## අධ්‍යාපන - ප්‍රාථමික 610-81-05-01

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජන % |
|---|---|---|---|---|
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 293.47 | 182.27 | 111.20 | 62.11 |
| මූලධන වත්කම් අත්පත් කිරිම | 668.60 | 87.82 | 580.78 | 13.13 |
| **එකතුව** | **962.07** | **270.09** | **691.98** | **28.07** |

## අධ්‍යාපන - ද්විතික 610-81-06-01

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජන % |
|---|---|---|---|---|
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 922.32 | 103.99 | 818.33 | 11.27 |
| මූලධන වත්කම් අත්පත් කිරිම | 3,240.99 | 789.42 | 2,451.57 | 24.36 |
| වෙනත් | 422.23 | 237.72 | 184.51 | 56.30 |
| **එකතුව** | **4585.54** | **1131.13** | **3454.41** | **24.67** |

## අධ්‍යාපන සැලසුම් හා පාලන- 610-88-09-01

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජන % |
|---|---|---|---|---|
| මූලධන වත්කම් අත්පත් කිරිම | 151.30 | 71.39 | 79.91 | 47.18 |

මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය

## පළාතේ ග්‍රාමීය ජනතාවගේ ආදායම් උත්පාදන අවස්ථා ජනිත කිරීම

සුවිශේෂී අඹ ප්‍රභේදයක් වන TJC අඹ වගාව පළාතේ අක්කර 500ක වගා කිරීම 2015 වර්ෂයේදී ආරම්භ කළ අතර එය 2016 හා 2017 යන වර්ෂ තුලදීද අඛන්ඩව ක්‍රියාත්මක වේ.

2015 හා 2016 වර්ෂවල රු.මිලියන 10ක් ව්‍යාපෘතිය සඳහා වැය කළ අතර 2017 සඳහා මිලියන 05 ක් වෙන් කර ඇත.මුලු වගා කර ඇති අක්කර ප්‍රමාණය 300කි.

මේ සඳහා ගොවීන්ට අවශ්‍ය අඹ පැල ,පුහුණුව හා පැල කප්පාදු කර ගැනීම සඳහා කප්පාදු කතුරු ලබාදී ඇත.

### 01. TJC අඹ වගා ව්‍යාපෘතිය



2016.10.18 දින අඹ වගා පුහුණුවේදී උපකරණ ලබා දීම



### අපේක්ෂිත අරමුණු හා ප්‍රතිඵල

මෙම ව්‍යාපෘතිය තුළින් කෙටි කාලීනව මෙන්ම දිගුකාලීනව ද ප්‍රතිලාභ රැසක් ලබා ගැනිමට අපේක්ෂා කෙරේ.

#### ව්‍යාපෘතියේ අරමුණු

•පළාතේ T.J.C අඹ නිෂ්පාදනය වැඩි කිරීම, වැඩි පාර්ශවකරුවන් ප්‍රමාණයක් අඹ වගාව සඳහා යොමුකරලීම හා එම නිෂ්පාදනයන්ගෙන් වැඩි ප්‍රමාණයක් විදේශීය වෙළඳ පොල සඳහා යොමු කරලීමට අවශ්‍ය සහය ලබාදීම.

•පළාතේ පවතින ආන්තික ඉඩම් වලින් වැඩි ප්‍රමාණයක් අඹ වගා කිරීම සඳහා යොදා ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම



ක්ෂේත්‍රයේදි අඹ පැල සිටුවීම

### අපේක්ෂිත ප්‍රතිඵල

- පළාතේ භාවිතයට නොගන්නා ඉඩම් භාවිතය තුළින් අඹ නිෂ්පාදනය ඉහළට ගෙන ඒම.
- පාර්ශවකරුවන්ගේ ආදායම් මට්ටම සාපේක්ෂව ඉහළ මට්ටමකට ගෙන ඒම.
- පාර්ශවකර්වන් විධිමත් ක්‍රමවේදයන්ට අනුව අඹ වගාකිරීම සඳහා හුරු කරවීම.
- නව නිෂ්පාදන වලට යොමුවීම තුළින් ග්‍රාමීය ජනතාව සඳහා රැකියා අවස්ථා ඇතිවීම.
- පළාතේ ග්‍රාමීය ජනතාවගේ විකල්ප ආදායම් ඉපයීමේ අවස්ථා වැඩි කරලිම.
- නිෂ්පාදනයන් අපනයනය තුළින් විදේශ විනිමය උපයාගැනීම.
- යටිවගාවන් ඇතිකිරීම තුළින් අමතර ආදායම් උපයා ගැනීම.
- පළාතේ ජනතාවගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීම තුළින් ජීවන මට්ටම ඉහළට ගෙන ඒම.



වගා ක්ශේත්‍රය නිරීක්ෂණය



2016.07.20 උපකරණ ලබා දිම

### 02. "දිරිය සහන වැඩසටහන" යටතේ ස්වයං රැකියා ලාභින් හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයින් පුහුණු කිරිම, තාක්ෂණික සහය ලබා දිම.

පළාතේ ජනතාවගේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ස්වයං රැකියාලාභින් හා කුඩා පරිමාණ ව්‍යවසායකයින් දිරි ගැන්විම හා තාක්ෂණික සහාය ලබාදිම.

මේ සඳහා 2016 වර්ශයේ රු.මි.17.7 වෙන්කරන ලද අතර මේ වන විට ප්‍රතිලාභින් 174 ක් සඳහා තම වෘත්තිය කරගෙන යාමට සහන ලබාදුන් අතර ඉදිරියටත් ප්‍රතිලාභින් සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීමට සහන ලබා දීමට කටයුතු කරගෙන යනු ලැබේ.



2016.07.20 උපකරණ ලබා දිම

2016 දී වටු කුරුළු බිත්තර නිෂ්පාදන දිරි ගැන්විම

මල් වගාව ව්‍යාප්ත කිරිම

නිම් ඇදුම් නිෂ්පාදනය දිරි ගැන්විම

සත්ත්ව පාලනය

ආහාර නිෂ්පාදන අලෙවිය හා ප්‍රවර්ධනය

රූපලාවන්‍ය අංශය දිරිමත් කිරීම

විසිතුරු මත්ස්‍ය වගාව ව්‍යාප්ත කිරිම

කුඩා පරිමාණ කර්මාන්ත නගා සිටුවීම (දිරිය සහන වැඩසටහන යටතේ)

## 03.සංචාරක අංශයේ ප්‍රවර්ධනය

දෙස් විදෙස් සංචාරකයන් සඳහා සුවපහසු ගමනාන්තයන් සලසා දීම මගින් සංචාරක කර්මාන්තය ආශ්‍රිත ආදායම් ඉහල නැංවීම අරමුණු කර ගනිමින් විවිධ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයද ලබා ගනිමින් සංචාරක ආකර්ශන ස්ථාන ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය සඳහා 2016 වර්ෂයේ ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර ඇත.




සංචාරක කර්මාන්තය

ප්‍රවර්ධනය

රු.මිලි

280 යි

### 01.සනීපාරක්ෂක පහසුකම් ප්‍රවර්ධනය රු.මිලි 95 යි

- දීප උයන සනීපාරක්ෂක පහසුකම් පද්ධතිය ඉදිකිරීම
- රුවන්වැලිසෑය රථ ගාල අභියස සනිපාරක්ෂක පහසුකම් පද්ධතියක්
- ඉසුරුමුණිය පූජා භූමියට සනිපාරක්ෂක පහසුකම් පද්ධතියක්
- කුට්ටම්පොකුණ හා සමාධි පිළිමය අතර රථගාල අසල සනිපාරක්ෂක පහසුකම් පද්ධතිය

### 02.සංචාරක කර්මාන්තය නියාමනය සඳහා වන පහසුකම් සැලසීම-රු.මිලි 80

- හබරණ සංචාරක තොරතුරු මධ්‍යස්ථානය ඉදිකිරීම
- මින්නේරිය ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථානය ඉදිකිරීම
- ගෘහස්ථ සංචාරක නිවාස ව්‍යාපෘතිය



අනුරාධපුර තොරතුරු මධ්‍යස්ථානය විවෘත කිරීම



පොළොන්නරුව දීප උයන උද්‍යානය

## උද්‍යාන අලංකරණය
## රු.මිලි 80

දෙස් විදෙස් සංචාරකයින් සඳහා ආකර්ශනිය පරිසරයන් ගොඩනැගීම තුලින් පළාතට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් ප්‍රමාණය වර්ධනය කර ගැනීම අපේක්ෂා කෙරේ.

### 1.පොළොන්නරුව දීප උයන සංවර්ධනය කිරිම.

පොළොන්නරුවේ ඇති අතීත උරුමයන් නැරඹීම සඳහා පැමිණෙන සංචාරකයින්ගේ සනීපාරක්ෂක පහසුකම් අවශ්‍යතාවයන් හා ආකර්ශනිය මෙන්ම ප්‍රියමනාප පරිසරයක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවය කලක පටන් හඳුනාගෙන තිබුණි.එහෙයින් 2016 වර්ෂයේදී ඉහත කී අවශ්‍යතාවය සම්පූර්ණ කිරිම සඳහා වු ව්‍යාපෘතිය යතාර්ථයක් බවට පත් විය.

### 2.නුවර වැවේ වැව් බැම්ම ආකර්ෂණීය ලෙස සංවර්ධනය කිරිම.

අනුරාධපුරට පැමිණෙන සංචාරකයින් ආකර්ශනය කරගත හැකිවන පරිදි නුවර වැවේ වැව් බැම්ම ආකර්ෂණීය ලෙස සංවර්ධනය කිරිම සංචාරක ප්‍රවර්ධන උදෙසා හඳුනා ගත් ව්‍යාපෘතියක් වු අතර සංචාරක අමාත්‍යාංශය හා ඒකාබද්ධව ක්‍රියාත්මක කළ ව්‍යාපෘතියකි. එහි ආරම්භක අදියර 2016 වර්ෂයේදී ක්‍රියාත්මක කළ අතර 2017 වසරේදී අවසන් කිරීමට ඉලක්කකර ඇත.

එසේම මෙම ව්‍යාපෘතිය තුළින් විදේශීය මෙන්ම දේශීය සංචාරකයින්ගේද ප්‍රදේශයේ ජනතාවගේද මුලික අවශ්‍යතාවයක්ව පැවති ඇවිදින මන්තීරු ඉදි කිරීමට ද යෝජිතය.

### 3.අනුරාධපුර මිරිදිය හෝටලය ඉදිරිපිට උද්‍යානය අලංකරණය කිරීම හා ප්‍රවේශ මාර්ගය.

කලක් අතහැර තිබු නමුත් සංවර්ධනය කළ යුතු යැයි හඳුනාගත් අනුරාධපුර මිරිදිය හෝටලය ඉදිරිපිට උද්‍යානය අලංකාරවත් ලෙස සංවර්ධනය කිරිම මුල් අදියර 2016 වර්ෂය තුළදී ක්‍රියාත්මක විය.



පොළොන්නරුව දීප උයන උධ්‍යානය ඉදිකිරිම



මිරිදිය හෝටලය ඉදිරිපිට අලංකරණ ව්‍යාපෘතිය



නුවර වැව වැව් බැම්ම සංවර්ධනය කිරිම

## සංචාරක තොරතුරු ලබා දීම හා පුහුණු
## රු. මි 7.0

**01.** සංචාරක මාර්ගෝපදේශකයින් පුහුණු කිරිම තුලින් දෙස් විදෙස් සංචාරකයින් සඳහා නිවැරදි හා ගුනාත්මක බවින් යුත් තොරතුරු ලබා දීම



සංචාරක මාර්ගෝපදේශකයින් පුහුණුව

**02.**

ත්‍රෛමාසික සංචාරක සත්කාරක සේවා පුහුණු වැඩසටහන යටතේ ගෘහස්ථ කළමනාකරණය පිළිබඳ පුහුණුවක් ලබාදීමතුලින් හෝටල් ක්ෂේත්‍රයේ දේශීය හා විදේශීය රැකියා සඳහා පළාතේ තරුණ තරුණියන් යොමු කිරිම



පොලොන්නරුව ජපන් භාෂා පුහුණු වැඩ සටහන

**03.** ජපන් හා කොරියානු භාෂා පුහුණු වැඩසටහන යටතේ විදේශ භාෂා පුහුණු ලබාදීම තුලින් විවිධ ක්ෂේත්‍රයන්හි විදේශීය රැකියා අවස්ථාවන් සඳහා පළාතේ තරුණ තරුණියන් යොමු කිරිම



සංචාරක දිනය සැමරිම

**04.** අත්දැකීම් හුවමාරු වැඩසටහන් පැවැත්වීම යටතේ මධ්‍යම/දකුණු /උතුරුමැද පළාත් මාර්ගෝපදේශකයින් අතර අත්දැකීම් හුවමාරුව තුලින් පළාත් අතර සුහදතාවය වර්ධනය කිරිම.



මාර්ගෝපදේශක අත්දැකීම් හුවමාරු වැඩසටහන

# 04.

**සංචාරක කර්මාන්තය නියාමනය සඳහා වන පහසුකම් සැලසීම සඳහා වූ වියදම රු මිලි 83කි.**

- දෙස් විදෙස් සංචාරකයිනට තොරතුරු ලබාදීම සඳහා ස්වයංක්‍රිය තොරතුරු ලබා ගැනීමේ යන්ත්‍ර [Kiosk යන්ත්‍ර] 05 ක් ස්ථාපිත කිරීමට අදාල මූලික කටයුතු 2016 වසරේදී ආරම්භ විය. ඒ යටතේ පහත දක්වා ඇති ස්ථානයන්හී ස්වයංක්‍රිය තොරතුරු ලබා ගැනීමේ යන්ත්‍ර සවි කිරීමට යෝජිත ය.

1.පළාත් සභා ගොඩනැගිල්ල

2.සංචාරක තොරතුරු මධ්‍යස්ථානය

3.අනුරාධපුර දුම්රිය ස්ථානය

4.ශ්‍රී මහා බෝධි ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය

5.පොළොන්නරුව දුම්රිය ස්ථානය

- සංචාරක ආකර්ශනිය ස්ථාන සඳහා ස්ථානිය පුවරු සහ නාම පුවරු සවි කිරිම. [Location Boards and Direction Boards]
  ස්ථානිය පුවරු 100 ක් පමණ සවිකර න ලදී .

- සංචාරක
  ආකර්ශනීය ස්ථානවල ඇතුලත් ග්‍රන්ථයක්,
  විඩියෝ පටයක්,
  වෙබ් අඩවියක් නිර්මාණය කිරිම
  [Coffee Table Book and Vedio on Tourism+ Web site]








## 05. පසුගාමි ග්‍රාමීය ප්‍රදේශවල සමාජ ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය

## රුපියල් මිලියන 685

| | |
|---|---|
| ග්‍රාමීය මාර්ග පුනරුත්තාපනය | රු. මිලි 320 |
| පොදු ක්‍රීඩාපිටි වැඩිදියුණු කිරීම | රු. මිලි 15 |
| පානීය ජල පහසුකම් ලබා දීම | රු. මිලි 20 |
| ග්‍රාමීය පොදු ගොඩනැගිලි ඉදිකිරිම | රු. මිලි 40 |
| ජල උල්පත් සංරක්ෂණය | රු. මිලි 10 |
| ග්‍රාමීය සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරිම | රු. මිලි 22 |
| වැව් අමුණු හා ඇලවේලි වැඩිදියුණු කිරිම | රු. මිලි 10 |
| ග්‍රාමීය විදුලි දිගු ලබා දිම | රු. මිලි 10 |
| නාගරික ප්‍රවේශ මාර්ග සංවර්ධනය | රු. මිලි 100 |
| නිවාස ඉදිකිරිම සඳහා සහය විම | රු. මිලි 85 |



### 2016

**1.**

පසුගාමී හා හුදකලා ගම්මාන සංවර්ධනය යටතේ මැදිරිගිරිය වැලිකන්ද හා හිගුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල අවධානයට යොමු නොවූ ගම්මාන 3 ක් තෝරාගෙන එම ගම්මානවල කෘෂිකාර්මික සංවර්ධනය, පිරිසිදු පානීය ජල පිරිපහදු පද්ධති (RO) ස්ථාපිත කිරීම, වාරිමාර්ග සංවර්ධනය, ආගමික ස්ථාන, පාසල්, මාර්ග සංවර්ධනය හා ස්වයං රැකියා අවස්ථා වලට යොමු කිරීම සඳහා රු මිලියන 19.8 [රුපියල් ලක්ෂ 198 ක්] යෙදවිම.

**2.**

ස්ථිර වහලක් නොමැති පවුල් සඳහා නිවාස සෙවිලි කර ගැනීම සඳහා නිවාස ආධාර ලෙස පවුල් 750 ක් සඳහා රු.මිලියන 15 ක් [ලක්ෂ 150]යෙදවීම.

**3.**

පළාතේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා අර්ධ වශයෙන් නිමකල නිවාස වල වැඩ අවසන් කර ගැනීමට පවුල් ඒකක 40 ක් සඳහා රු. මි. 40 ක් ලබාදීම.

**4.**

පළාතේ අඩු ආදායම්ලාභී පවුල් 164ක් සඳහා පූර්ණ වශයෙන් නිවාස ඉදිකිරීමට රු. මි. 66 ලබා දීම.

**5.**

5.ස්ථිර වහලක් නොමැති පවුල් පවුල් 800ක් සඳහා රු.මිලියන 15 ක් (ලක්ෂ 150) යෙදවීම.

### පුනර්ජනනීය බලශක්ති භාවිතය ප්‍රවර්ධනය කිරීම

**පුනර්ජනනීය බලශක්ති මඟින් පරිසර සංරක්ෂණය හා බලශක්ති අවශ්‍යතාවය සම්පූර්ණ කරගැනීම සඳහා විකල්ප බලශක්ති භාවිතය කෙරෙහි යොමු වීම. මෙහි ආරම්භක පියවර 2015 දී ක්‍රියාත්මක වූ අතර 2016 වර්ෂයේදී එය තව දුරටත් ක්‍රියාත්මක විය.මෙම සංවර්ධන ව්‍යාපෘතිය තුළින් පුනර්ජනනීය බලශක්ති භාවිතය මෙන්ම හඳුනාගත් අත්‍යවශ්‍යයෙන්ම වීථි ලාම්පු සවි කළ යුතු ස්ථානයන්හී ආලෝකකරණය කිරිමත් විකල්ප අරමුණු අතර විය.ඒ අනුව ප්‍රසිද්ධ ස්ථානවල මෙන්ම දෙස් විදෙස් සංචාරකයින් බහුල වශයෙන් ගැවසෙන ස්ථානයන් ආලෝකකරණය කිරීමත් ව්‍යාපෘතිය තුළින් සිදු කිරීම ඉලක්ක විය.**



පුනර්ජනනීය බලශක්ති භාවිතය ප්‍රවර්ධනය කිරිමේ ව්‍යාපෘතිය 2016

රු.මිලි. 15

2015 වර්ෂයේදි ග්‍රාමීය ප්‍රදේශවල මංසන්ධි ආශ්‍රිතව සියලුම පළාත් පාලන කොට්ඨාශ ආවරණය වන පරිදි විථි ලාම්පු 58ක් ස්ථාපිත කිරිම.

2016 වර්ෂයේදි සංචාරක ආකර්ශනිය ස්ථානවල සහ වෙනත් විශේෂිත ස්ථානවල විථි ලාම්පු 158ක් ස්ථාපිත කිරිමට කටයුතු කරමින් පවතී.

**සූර්ය බල වීථි ලාම්පු ස්ථාපිත කිරීම දිස්ත්‍රික්ක අනුව සංසන්දනාත්මක ප්‍රගතිය**

| වර්ෂය | දිස්ත්‍රික්කය | | වෙන් කළ මුදල (රු.මි.) |
|---|---|---|---|
| | අ/පුර | පොළ/නරුව | |
| **2015** | 42 | 16 | 5 |
| **2016** | 65 | 35 | 10 |
| **එකතුව** | 107 | 51 | 15 |

පුනර්ජනනීය බලශක්ති භාවිතය සඳහා උතුරු මැද පළාතේ 2016 අවසන් වනවිට රු මිලියන 15ක් ආයෝජනය කර ඇති අතර ඒ තුළින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ හා පොළොන්නරුව දිස්ත්‍රික්කය ද ඇතුළුව සූර්ය බල වීථි ලාම්පු 158ක් ව්‍යාපෘතිය තුළින් සවි කෙරෙනු ඇත.

## දුෂ්කර ගම්මාන සඳහා ජල සැපයීමේ විශේෂ ව්‍යාපෘතිය-2016

රුපියල් මිලියන -60

**උතුරු මැද පළාතේ
දුෂ්කර ගම්මාන සඳහා
ජල පිරිපහදු පද්ධති ස්ථාපිත කිරීම.**

දුෂ්කර ගම්මාන සඳහා පිරිසිදු පානීය ජලය ලබා දීමට 2015 වර්ෂයේදී රු.මිලියන 50ක ප්‍රතිපාදන වෙන් වූ අතර, එම මුදල් මහවිලච්චිය සහ වැලිකන්ද යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකට රු. මිලියන 25 බැගින් ලබා දී එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල පානීය ජල අවශ්‍යතාවය සපුරාලීම සුදුසු බව යෝජනා විය. ඒ අනුව, එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට ජල පිරිපහදු පද්ධති 10 බැගින් සක්‍රීය තත්ත්වයේ පැවති ප්‍රජා ජල සංවිධාන තුල ජල පිරිපහදු පද්ධති 20ක් ස්ථාපිත කර ඇත.

එම ප්‍රදේශයන්හි ජීවත් වන ජනතාවගෙන් බොහෝ පිරිසක් වකුගඩු රෝගයෙන් පීඩා විදින අතර, දැඩි ආර්ථික අපහසුතා වලින් යුත් ජනතාවක් ද වේ. මෙම සත්කාර්ය මගින් එක් එක් වසම තුල ජීවත් වන පවුල් විශාල සංඛ්‍යාවක පානීය ජල අවශ්‍යතාවය ප්‍රශස්ත ලෙස සපුරාලීමට හැකියාව ලැබී ඇත.



2016.09.08 ගල්පොත්තේගම ජල පිරිපහදු පද්ධතිය විවෘත කිරීම

### මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රජා මූල ජල ව්‍යාපෘති.

01. 362,පේමඩුව,සිසිලස
02. 358,ඔයාමඩුව, ස්වශක්ති
03. 364,පළුගස්වැව මිහිදු
04. 369, සඳමල්එළිය
05. 356, දුනුමඩලාව සමාධි
06. 357,හැළඹවැව සම්පත්
07. 361,කිරල්පැටියාව
08. 287,මානින්ගමුව,ඇලයාපත්තුව පිබිදෙන ප්‍රජා මූල සංවිධානය.
09. 370,ඇත්දත්කල්ල,ඔයාමඩුව සහනප්‍රජා මූල සංවිධානය.
10. 371,නවෝදාගම,ගැමුණු ප්‍රජා මූල සංවිධානය.

### වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය.

01. 260,ගිනිදමන
02. 285,මුතුවැල්ල.
03. 287,අළුත්වැව.
04. 267, කටුවන්විල උතුර
05. 281,කඩවත්මඩුව.
06. 282, කුරුළු බැද්ද. මහඉන්දගම
07. 282, මහඉන්දගම(මහසෙන්පුර)
08. 286, සිංහපුර.
09. 283,කන්දකඩුව.
10. 264,මුතුගල.

# අධ්‍යාපන අංශයේ භෞතික හා ගුණාත්මක සංවර්ධනය

# උදෙසා ඉගෙනුමට මුල්තැන

**ළඟම පාසල**
**හොඳම පාසල**
**වැඩසටහන**

පාසල් වල කුඩා නවීකරණ කටයුතු - (පාසල් 461) - රු.මි.483.11

පාසල් වල ප්‍රධාන නවීකරණ කටයුතු - (පාසල් 100) - රු.මි.578.19

ප්‍රාථමික ඉගෙනුම් ආධාරක මධ්‍යස්ථාන-Single Storied - පාසල් 58 - රු.මි.689.68

Double Storied- පාසල් 15 - රු.මි.337.82
ඉදිකිරීම




පන්ති කාමර ගොඩනැගිලි ඉදිකිරීම - (පාසල් 36) - රු.මි.1576.42

විදුහල්පති නිළ නිවාස ඉදිකිරීම -(30) - රු.මි.232.39

ගුරු නිවාස ඉදිකිරීම - (22) - රු.මි.331.05

ද්විතියික විද්‍යාගාර ඉදිකිරීම -(42) - රු.මි.919.66

ආපන ශාලා ඉදිකිරීම - (13) - රු.මි.188.06

ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම - (08) - රු.මි.204.08

සෞන්දර්ය ඒකක ඉදිකිරීම- (08) - රු.මි.171.28

තාක්ෂණික ගොඩනැගිලි ඉදිකිරීම- (32) - රු.මි.715.76

සනීපාරක්ෂක ඒකක ලබා දීම - (331) - රු.මි.422.0

ජල පහසුකම් ලබා දීම- (75) - රු.මි.22.28

විදුලි පහසුකම් ලබා දීම -(810) - රු.මි.173.51

පාසල් දන්ත වෛද්‍ය ඒකක ඉදිකිරීම -(03) - රු.මි.36.11

පාසල් දන්ත වෛද්‍ය ඒකක නවීකරණය කිරීම- (06) - රු.මි.09.1

| මුළු ප්‍රතිපාදන වෙන් කිරිම රු මිලි | ඇස්තමේන්තු පිරිවැය රු මිලි | 2016 සඳහා වෙන් කිරිම | මූල්‍ය ප්‍රගතිය 12/30 දිනට |
|---|---|---|---|
| **7223.87** | 7439.67 | 4399.60 | 614.86 |

**පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන නව හා අවිච්ඡේද**

| | |
|---|---|
| 01. | 2015 හා ඊට පෙර අවසන් නොකළ පාසල් ගොඩනැගිලි වැඩ නිම කිරීම - 52 (රු.මිලි 295) |
| 02. | පළාතේ හඳුනාගත් පාසල් 04ක් අංග සම්පූර්ණ පාසල් ලෙස සංවර්ධනය කිරීම (රු.මිලි 325) |
| 03. | පාසල් ගොඩනැගිලි ඉදිකිරීම,නවීකරණය හා ගුණාත්මක සංවර්ධනය(ගොඩනැගිලි ඉදිකිරීම නවීකරණය,වැට මායිම් නිරවුල් කිරීම හා නර්තන ඇඳුම් සැපයීම- 94 (රු.මිලි 248) ) |
| 04. | පොළොන්නරුව ආදර්ශ ප්‍රාථමික විද්‍යාලයේ ගොඩනැගිලි ඉදිකිරීම - 01 (රු.මිලි 50) |
| 05. | කලාප කාර්යාල ඉදිකිරීම - 02(රු.මිලි 47) |
| 06. | වැලිකන්ද කොට්ඨාසයේ ගුරු නිවාස අළුත්වැඩියාව-20 (රු.මිලි 40) |

ලෝක බැංකු මුදල

| අනු අංකය | වැඩසටහන | ව්‍යාපෘති ගණන | වෙන් වූ මුදල (රු.මි.) |
|---|---|---|---|
| 1 | පාසල් වල මූලික යටිතල පහසුකම් | 04 | 43.00 |
| 2 | පාසල් ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම | 13 | 25.70 |
| 3 | පාසල් සෞන්දර්ය ඒකක ඉදිකිරීම | 08 | 50.00 |
| 4 | කොට්ඨාස කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම | 11 | 79.30 |
| 5 | පාසල් උපකරණ මිලදී ගැනීම-පාසල් 226ක | 01 | 122.00 |

අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්

**ප**ළාත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා 2016 වර්ෂයේදී පියවරයන් රැසක් ආරම්භ කරන ලදී. එහිදී අඛණ්ඩ ගුරු පුහුණුව තුළින් නිරන්තර අළුත්වන හා වෙනස්වන නව දැනුම ගුරුවරුන් වෙත ලබා දීමත් ඊට අමතරව වාර විභාග විධිමත්ව හා ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීමත් ගුරුවරුන් සඳහා විධිමත් වාර සටහන් මෙන්ම පාසල් ලිත හඳුන්වා දීමත් සිදු විය.




එසේම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය ඉලක්කකර ගත් ගුරු මාරු ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමද සිදු විය.

එපමණක්ද නොව පළාතේ විශාල ගැටළුවක්ව පැවති ගුරු හිඟය සම්පූර්ණ කිරීම සඳහා අළුතින් ගුරු සේවයට ගුරුවරුන් දහසක් [1000] බඳවා ගැනීම සිදු විය.

තවද අධ්‍යාපනයේ අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර ගැනීම සඳහා දරුවන් මෙන්ම දෙමව්පියන්ද ඉගෙනුම් ක්‍රියාවලිය කෙරෙහි නැඹුරු කිරීම සඳහා අද අපේ පාඩම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

### උතුරු මැද පළාත් අධ්‍යාපන සංවර්ධන අරමුදල.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 -9 වන උප ලේඛනයේ ද01.වගන්තිය හා1987 අංක 07 දරණ පළාත් සභා පනත යටතේ උතුරු මැද පළාත් සභාව මඟින් 1348/8 හා 2013 අංක 05 දරණ ප්‍රඥප්තිය යටතේ උතුරු මැද පළාත් අධ්‍යාපන සංවර්ධන අරමුදල ස්ථාපනය කර ඇත.

උතුරු මැද පළාතේ අධ්‍යාපනය ප්‍රමුඛ තලයට ගෙන ඒම සඳහා මානසික සමබරතාවයකින් යුතුව අධ්‍යාපන කටයුතු ඉදිරියේ අසරණ නොවී අභිමානයෙන් යුතුව සමාජයට මුහුණ දීමට හැකි වාතාවරණයක් ගොඩනැන්වීම අරමුදලේ ප්‍රමුඛ පරමාර්තය වේ.

අරමුණු කීපයක් ඔස්සේ ඉතා සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් සඳහා ප්‍රතිලාභ ලබාදෙමින් ක්‍රියාත්මක වූ මෙම අරමුදල ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ නායකත්වය යටතේ 2013 වර්ෂයේ සිට නව ජවයක් සහිතව ක්‍රියාත්මක විය.

පළාත් සභා සංවර්ධන ප්‍රදාන , සාමූහික ප්‍රදාන, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා අනිකුත් දේශීය හා විදේශීය අරමුදල් මඟින් ප්‍රතිලාභ ලබාදිය නොහැකි සිසු අවශ්‍යතා සඳහා ප්‍රතිලාභ ලබා දීම මේ මඟින් සිදු කරයි. ඒ සඳහා අවශ්‍ය මුල්‍ය උත්පාදනය 2013 හා 2015 වර්ෂ වලදි අධ්‍යාපන සංවර්ධන අරමුදල් ලොතරැයිය අලවියෙන් ලබාගන්නා ලදි.

### 2016 වර්ෂයේදී අධ්‍යාපන සංවර්ධන අරමුදල මඟින් ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩ සටහන්.

2015 වර්ෂයේ ශිෂ්‍යත්ව විභාගය සමත්වුවන් ඇගයීමට ලක්කිරිම, දැඩි ආර්ථික අපහසුතා සහිත සිසුන් 5000 ක් සඳහා පාසල් උපකරණ කට්ටල ලබාදිම, දැඩි ආර්ථික අපහසුතා සහිත ඉතා දුෂ්කර මාර්ග ගෙවා පාසල් යන සිසුන් සඳහා පාපැදි ලබාදීම, ජාතික ජාත්‍යන්තර තරඟ සඳහා සුදුසුකම් ලැබූ සිසුන් සඳහා ගමන් වියදම් ලබාදීම, සමස්ත ලංකා මට්ටමෙන් ඉහළ ජයග්‍රාහකයන් ඇගයීම සඳහා මුල්‍ය ත්‍යාග පිරිනැමීම හා ජාත්‍යන්තර තරඟ ජයග්‍රාහකයන් සඳහා මුල්‍ය ත්‍යාග පිරිනැමීම වැනි විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

### 2015-2016 වර්ෂයේදී අධ්‍යාපන සංවර්ධන අරමුදල මඟින් පළාතේ අධ්‍යාපනය ලබන දරු දැරියන් උදෙසා ලබාදුන් ප්‍රතිලාභ

| අනු අංකය | විස්තරය | වැයකල මුදල(රු.මි) | |
|---|---|---|---|
| | | 2015 | 2016 |
| 01. | 2015- 2016 ශිෂ්‍යත්ව සමතුන් ඇගයීම සඳහා | 3.56 | 0.14 |
| 02. | 2015-දැඩිආර්ථික අපහසුතා සහිත සිසුන් 5000ක් සඳහා පාසල් උපකරණ කට්ටල ලබාදිම | 9.96 | ක්‍රියාත්මක කරමින් පවති |
| 03. | 2016 දැඩි ආර්ථික අපහසුතා සහිත ඉතා දුෂ්කර මාර්ග ගෙවා පාසල් යන සිසුන් සඳහා පාපැදි ලබා දීම. | - | 0.07 |
| 04. | 2015-2016 ජාතික, ජාත්‍යාන්තර තරඟ සඳහා සුදුසුකම් ලැබූ සිසුන් සඳහා ගමන් වියදම් ලබාදීම. | 0.50 | 1.38 |
| 05. | සමස්ත ලංකා මට්ටමෙන් ඉහළ ජයග්‍රාහකයන් ඇගයීම සඳහා මුල්‍ය ත්‍යාග පිරිනැමීම. | 0.01 | 0.008 |
| 06. | ලොතරැයි ජයග්‍රාහකයන් සඳහා ත්‍යාග ප්‍රදානය | 0.17 | 1.34 |
| | එකතුව | **14.20** | **2.93** |

## මුල් ළමාවිය සංවර්ධනය සඳහා ප්‍රධාන අමාත්‍යාංශයේ දායකත්වය හා මැදිහත් වීම

2015 වර්ෂයේ සංවර්ධන වැඩසටහන යටතේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයන්හි භෞතික සම්පත් සංවර්ධනය සඳහා රු.මි.8.6 ක් යොදවා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 86 ක සංවර්ධන කටයුතු සිදුකරන ලදි. මෙම තත්වය තවත් ඉදිරියට ගෙනයමින් 2016 වර්ෂයෙදි 35, 000ක් පමණ වන පෙර පාසල් දරුවන්ගේ පෙර පාසල් වල භෞතික සම්පත් සංවර්ධනය සඳහා රු.මි.25ක් වෙන් කර ඇත. මෙහිදි පෙර පාසල් ගොඩනැගිලි අලුත්වැඩියා කිරිම,සෙල්ලම් මිදුල් හා ක්‍රීඩා උපකරණ ඉදිකිරිම, ආරක්ෂිත වැට,ගේට්ටු ඉදිකිරිම හා පෙර පාසල් වල සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය වැනි අංශ කෙරෙහි වැඩි අවධානයක් යොම කර ඇත.

දරුවන්ට වඩාත් ආකර්ෂණීය පෙර පාසල් පද්ධතියක් ඇති කිරිමේ අරමුණෙන් අනුරාධපුර හා පොළොන්නරුව ප්‍රධාන දිස්ත්‍රික්ක දෙක ආවරණය වන පරිදි නවීන පහසුකම් සහිත අංග සම්පූර්ණ පෙර පාසල් 02ක් ඉදිකිරිමේ කටයුතු ආරම්භ කර ඇත.මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි.30ක මුදලක් වෙන් කර ඇත.

භෞතික සම්පත් මෙන්ම පෙර පාසල් දරුවන්ගේ හා ගුරුවරුන්ගේ මානසික හා ආකල්ප සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් සඳහා රු.මි.2.4ක මුදලක් වෙන් කර ඇත. මේ යටතේ පෙර පාසල් පාලිකාවන් මෙන්ම දෙමව්පියන්ගේ ආකල්ප හා හැකියාවන් සංවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක වේ.

පෙර පාසල් පාලිකාවන් වෘත්තීමය සුරක්ෂිතභාවය ඇති කිරිමේ අරමුණෙන් පෙර පාසල් පාලිකාවන් 2400ක් සඳහා හදිසි අනතුරු රක්ෂණ ක්‍රමයක් හා විශ්‍රාම වැටුප් අරමුදලත් අරම්භ කරන ලද අතර ඒ සඳහා 2016 වර්ෂයේදි රු.මි 05ක මුදලක් යොදවා ඇත.






## ආගමික සිද්ධස්ථාන හා ඒ ආශ්‍රිත දහම් පාසල් වල යටිතල පහසුකම් සංවර්ධනය කිරිම

උතුරු මැද පළාත තුල ඇති අඩුපාඩුකම් වලින් යුතු වෙහෙර, විහාරස්ථාන, කෝවිල්, පල්ලි ආදියේ පහත සඳහන් අත්‍යාවශ්‍යයෙන් කළයුතු කාර්යයන් සඳහා මූල්‍යමය ආධාර ලබාදීම සඳහා 2016 වර්ෂයේදි වෙනත් මුලධන වියදම් යටතේ රු. මි.19.4 ක් වෙන් කරන ලදි.

ඒ අනුව,

1. සංඝාවාස ප්‍රතිසංස්කරණය.
2. විහාරගෙය ප්‍රතිසංස්කරණය.
3. සනීපාරක්ෂක පහසුකම් සැපයීම.
4. වැට, තාප්පය, ගේට්ටුව ආදිය ඉදිකිරීම.
5. බුදු මැදුර ප්‍රතිසංස්කරණය.
6. වෙනත් යටිතල පහසුකම්.

වැඩසටහන ව්‍යාපෘතියේ ප්‍රතිලාභ

- වෙහෙර විහාරස්ථාන, කෝවිල්, පල්ලි ආදිය සංවර්ධනය කිරීම තුළින් ආගමික සමාජීය ප්‍රබෝධයක් ඇති කිරීම.
- ඒ තුළින් දැහැමි සමාජයක් බිහිකිරීමට සහය වීම.

| වර්ෂය | දිස්ත්‍රික්කය | | වෙන් කළ මුදල (රු.මි.) |
|---|---|---|---|
| | අනුරාධපුර | පොළොන්නරුව | |
| **2016** | 93 | 100 | 19.40 |

2016 වර්ෂයේ සංවර්ධන වැඩ සඳහා රු .මි 900 ක් වෙන් වී තිබුණි. ඒ සඳහා විවිධ ව්‍යාපෘති යටතේ ව්‍යාපෘති 1008 අනුමත කර ක්‍රියාත්මක කරන ලදි. ඒ යටතේ ප්‍රධාන වශයෙන් ආයෝජන ප්‍රවර්ධනය හා ජීවනෝපාය සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය, බලශක්ති, සංචාරක, අධ්‍යාපන, ලෝක බැංකු ආධාර යටතේ සැලසුම් කර තිබූ සියළුම සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීමට හැකි වුණි.

එසේම වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා ආයතන අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් අනෙකුත් පාර්ශවකරුවන් සමග සහයෝගයෙන් කටයුතු කරමින් කාර්යාවලිය මෙහෙයවීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ඉලක්ක ලඟා වීමටත් ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීමට හැකි විය.

# 6.1

# පළාත් පාලන දෙපාර්තමේන්තුව

### ඉදිරි දැක්ම

"අවශ්‍යතා සපුරා ගත් තෘප්තිමත් ප්‍රජාවක්".

### මෙහෙවර

"පළාත් පාලන ආයතනවල මිතුරෙක්, මග පෙන්වන්නෙකු, නියාමකයෙකු සහ දාර්ශනිකයෙකු වශයෙන් විනිවිද භාවයකින් යුතුව සමාජ හා ආර්ථික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, සේවා සැපයීම, කාර්යක්ෂම කිරීම සියළුම පාර්ෂවකරුවන් අතර මනා සම්බන්ධතාවය ශක්තිමත් කිරීම මගින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට සහය වීම".

### දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු

1. පළාත් පාලන ආයතන වල ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය.
2. පළාත් පාලන ආයතන වල සමාජ යටිතල පහසුකම් සංවර්ධනය.
3. පාර්ෂවකරුවන් අතර මනා සම්බන්ධීකරණය
4. ආයතනික ධාරිතා සංවර්ධනය.
5. යහ පාලනය ස්ථාපිත කිරීම.

### කෙටි කාලීන අරමුණු

1. පළාත් පාලන ආයතන වල මං මාවත් වැඩි දියුණු කිරීම.
2. කාර්යක්ෂම වෙළඳ පහසුකම් ඇති කිරීම.
3. ප්‍රජා ජල පහසුකම් වැඩි දියුණු කිරීම.
4. ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය සඳහා තිරසාර යාන්ත්‍රණයක් සැකසීම.
5. පොදු සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම
6. පුස්තකාල පහසුකම් වැඩි දියුණු කිරීම.
7. පෙර පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය.
8. කාලීනව අතුරු ව්‍යවස්ථා පැනවීම.
9. පළාත් පාලන බල ප්‍රදේශවල සුසාන භූමි සංවර්ධනය.
10. පළාත් පාලන බල ප්‍රදේශවල ළමා උද්‍යාන ක්‍රීඩා පිටි සංවර්ධනය.
11. පළාත් පාලන ආයතනවල සඵලතාවය හා කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම.
12. පළාත් පාලන ආයතන පුද්ගලික අංශය, මධ්‍යම රජය හා පළාත් සභාව අතර මනා සම්බන්ධතාවක් පවත්වා ගැනීම.

13. පළාත් පාලන ආයතනවල කාර්යක්ෂම මනා පුහුණුවකින් යුත් කාර්යය මණ්ඩල ස්ථාපිත කිරීම.
14. පළාත් පාලන ආයතන හරහා ක්‍රියාත්මක කර්මාන්ත අධීක්ෂණය.

### ප්‍රධාන කාර්යයන්

1. පළාත් පාලන ආයතනවලට තේරී පත්වූ මහජන නියෝජිතයින් පළාත් පාලන විෂය ක්ෂේත්‍රයෙහි දැනුවත් කිරීම හා මර්ගෝපදේශකත්වය ලබා දීම.
2. පළාත් පාලන ආයතනවල ශක්තීන් ගොඩනැගීම.
3. පළාත් පාලන ආයතනවල මූල්‍යම ශක්තීන් ගොඩනැගිම.
4. සම්බන්ධිකරණ කටයුතු.

### ප්‍රධාන සංවර්ධන උපාය මාර්ගයන්

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන්, පළාත් පාලන ආයතන භාර විමර්ෂණ නිළධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් පළාත් පාලන ආයතනවල කටයුතු නිරීක්ෂණය හා අධීක්ෂණය.

### කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 114 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 72 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 47 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 35.41 | 34.51 | 0.90 | 97.45 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 913.00 | 752.80 | 160.2 | 82.45 |
| **එකතුව** | **948.41** | **787.31** | **161.1** | **83.01** |

### මූලධන වියදම්

| වියදමේ ස්වාභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0.20 | 0.00 | 0.20 | 0 |
| යන්ත්‍රසූත්‍ර සවිකිරීම් හා උපකරණ | 0.30 | 0.29 | 0.01 | 96.67 |
| වාහන | 1.00 | 0.74 | 0.26 | 74 |
| **එකතුව** | **1.50** | **1.03** | **0.47** | **68.67** |

### ආදායම්

| ශීර්ෂය | ආදායම (රු.මි) |
|---|---|
| 20.02.01.01 | 0.01 |
| 20.02.02.02 | 0. 80 |
| 20.03.02.99 | 9.86 |

### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය

2016 වර්ෂයේදී උතුරු මැද පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු කරා ළඟා වීම සඳහා පහත දැක්වෙන අංශ යටතේ පළාතේ සියළු පළාත් පාලන ආයතන නියෝජනය වන පරිදි වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. ඒ යටතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා ග්‍රාමීය දුෂ්කර ප්‍රදේශයන්හී පානීය ජල අවශ්‍යතා සම්පූර්ණ කිරීම විෂයෙහි සැලකිය යුතු දායකත්වයක් සපයන ලදී.

පළාත් පාලන දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතන 26 ක දායකත්වයද ඇතිව පළාතේ ජනතාවගේ සමාජ ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මිලියන 215ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර ජනතා සුබවිහරණය සඳහා සංවර්ධන ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර ඇත. 2016 වර්ෂයේදී එම වර්ෂයේ අපේක්ෂා කළ ඉලක්ක ද අභිබවා සංවර්ධන කටයුතු සිදු කර ඇත. මේ ඉලක්ක කරා ලඟා වීම සඳහා පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය දැක්වූ සහයද අතිමහත්ය. පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය විසින් මිලියන 183.63 ක ප්‍රතිපාදන ලබා දී ඇති අතර මේ යටතේද සංවර්ධන ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර ඇත.

2016 වර්ෂයේ ක්‍රියාත්මක කළ විශේෂ ව්‍යාපෘති ලෙස කසල එක් රැස් කිරීමේ කටයුතුවල නිරත සෞඛ්‍ය කම්කරුවන්ගේ සෞඛ්‍ය තත්වය නගා සිටුවීම සඳහා සෞඛ්‍ය පරීක්ෂණ හා සායන පවත්වන ලදී.

එසේම මාර්ග සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කළ මාර්ග සතිය වැඩසටහන ද ඉතා සාර්ථකව ක්‍රියාත්මක වූ වැඩසටහනක් ලෙස දැක්විය හැක.

ඊට අමතරව උතුරු මැද පළාත් සභාව විසින් ක්‍රියාත්මක කරන ලද සෑම වැඩසටහනක් සඳහාම පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නොමඳ සහය ලබා දෙන ලදී.

1. ආයතනික සංවර්ධනය
2. දැනුම හා ආයතනික සංවර්ධනය
3. ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ
4. යන්ත්‍ර හා උපකරණ
5. පළාත් පාලන මාර්ග වැඩිදියුණු කිරීම
6. මහ නගර සභා ධාරිතා සංවර්ධනය
7. පානීය ජල පහසුකම්
8. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය
9. වෙනත් පළාත් පාලන සේවා වැඩි දියුණු කිරීම

උතුරු මැද පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් 2016 වර්ෂයේදී ප්‍රධාන අංශ 09ක් යටතේ පළාත් පාලන ආයතන මගින් සිදුවන මහජන සේවය වඩාත් කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් මෙන්ම ග්‍රාමීය ජනතාවගේ අත්‍යාවශ්‍යතාවයන් සඳහා සහය දැක්වීම මගින් වඩාත් ඵලදායි සේවාවක් සැපයීම සඳහා අවශ්‍ය පියවරයන් හා ක්‍රියාමාර්ග ගනු ලැබිණි.

## 2016 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අංකය | ව්‍යාපෘතිය |
|---|---|
| 1 | අනුරාධපුර මහ නගර සභාවේ නිලධාරීන් සඳහා පුහුණු පැවැත්වීම. |
| 2 | කැබිතිගොල්ලෑව යකාවැව පානීය ජල ව්‍යාපෘතියේ දෙවැනි අදියර ක්‍රියාත්මක කිරීම. |
| 3 | අනුරාධපුර මහ නගර සභාවේ මළ අපවහන පද්ධතිය ඉදි කිරීම. |
| 4 | කසල අපහරණ ක්‍රියාවලිය සඳහා කසල දාහක යන්ත්‍ර මිලදී ගැනීම. |
| 5 | උතුරු මැද පළාතේ පළාත් පාලන ආයතන19 ක පළාත් පාලන සතිය ක්‍රියාත්මක කිරීම. |
| 6 | උතුරු මැද පළාතේ පළාත් පාලන ආයතන 19 ක සේවකයන්ගේ සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම. (සෞඛ්‍ය සේවකයන්ගේ) |
| 7 | අනුරාධපුර මහ නගර සභාවට අයත් පුස්තකාල වල යටිතල පහසුකම් සංවර්ධනය. (පුස්තකාල 1) |
| 8 | පදවිය ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල වල යටිතල පහසුකම් සංවර්ධනය..( පුස්තකාල 1) |
| 9 | කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල වල යටිතල පහසුකම් සංවර්ධනය. (පුස්තකාල 1) |
| 10 | මැදවච්චිය ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල වල යටිතල පහසුකම් සංවර්ධනය.(පුස්තකාල 1) |
| 11 | රඹෑව ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල වල යටිතල පහසුකම් සංවර්ධනය.( පුස්තකාල 1) |
| 12 | හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල වල යටිතල පහසුකම් සංවර්ධනය. පුස්තකාල 1) |
| 13 | කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල වල යටිතල පහසුකම් සංවර්ධනය. (පුස්තකාල 1) |
| 14 | ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල වල යටිතල පහසුකම් සංවර්ධනය.(පුස්තකාල 1) |
| 15 | මිහින්තලේ ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල වල යටිතල පහසුකම් සංවර්ධනය. (පුස්තකාල 1) |
| 16 | තිරප්පනේ ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල වල යටිතල පහසුකම් සංවර්ධනය. (පුස්තකාල 1) |
| 17 | ම.නු.ප ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල වල යටිතල පහසුකම් සංවර්ධනය.( පුස්තකාල1) |
| 18 | නැ.නු.ප ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල වල යටිතල පහසුකම් සංවර්ධනය.( පුස්තකාල 1) |
| 19 | නොච්චියාගම ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල වල යටිතල පහසුකම් සංවර්ධනය. ( පුස්තකාල 1) |
| 20 | රාජාංගනය ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල වල යටිතල පහසුකම් සංවර්ධනය. (පුස්තකාල 2) |
| 21 | තලාව ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල වල යටිතල පහසුකම් සංවර්ධනය.( පුස්තකාල3) |

| අංකය | ව්‍යාපෘතිය |
|---|---|
| 22 | ඉපලෝගම ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල වල යටිතල පහසුකම් සංවර්ධනය.(පුස්තකාල1) |
| 23 | ගල්නෑව ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල වල යටිතල පහසුකම් සංවර්ධනය.( පුස්තකාල 2) |
| 24 | කැකිරාව ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල වල යටිතල පහසුකම් සංවර්ධනය.(පුස්තකාල 2) |
| 25 | පලාගල ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල වල යටිතල පහසුකම් සංවර්ධනය.( පුස්තකාල 2) |
| 26 | ම.නු.ප උළුක්කුලම ගමේ පොදු ළිං ප්‍රතිසංස්කරණය කිරිම. |
| 27 | පදවිය ප්‍රාදේශීය සභාවට පෙර පාසල් නඟා සිටුවීම. |
| 28 | කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් නඟා සිටුවීම. |
| 29 | මැදවච්චිය ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් නඟා සිටුවීම. |
| 30 | රඹෑව ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් නඟා සිටුවීම.(කොකටියගොල්ලෑව පෙර පාසලේ ගොඩ නැගිල්ල අලුත්වැඩියාව) |
| 31 | හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් නඟා සිටුවීම. |
| 32 | කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් නඟා සිටුවීම. |
| 33 | ගලෙන්බිදුනුවැව ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් නඟා සිටුවීම. |
| 34 | මිහින්තලේ ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් නඟා සිටුවීම. |
| 35 | තිරප්පනේ ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් නඟා සිටුවීම. |
| 36 | නොච්චියාගම ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් නඟා සිටුවීම. |
| 37 | රාජාංගනය ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් නඟා සිටුවීම.(451 කැකුළු පෙර පාසලේ ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු සඳහා) |
| 38 | තලාව ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් නඟා සිටුවීම.(එප්පාවල ප්‍රාදේශීය සභා පෙර පාසල) |
| 39 | ඉපලෝගම ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් නඟා සිටුවීම. |
| 40 | ගල්නෑව ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් නඟා සිටුවීම. |
| 41 | කැකිරාව ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් නඟා සිටුවීම. |
| 42 | පලාගල ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් නඟා සිටුවීම. |
| 43 | ම.නු.ප ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් නඟා සිටුවීම. |

| අංකය | ව්‍යාපෘතිය |
|---|---|
| 44 | උතුරු මැද පළාතේ පලාත් පාලන ආයතන 19 ක පිහිටුවා ඇති ප්‍රජා මණ්ඩල (365)ශක්තිමත් කිරිම. |
| 45 | ඇඳගල එප්පාවල ආදාහනාගාරය භූමිය සකස් කිරීම හා වැට ඉදි කිරිම. |
| 46 | 117 සී වලහාවිද්දවැව ගමේ පොදු සුසාන භූමියෙහි ගොඩනැගිල්ලක් ඉදි කිරිම. |
| 47 | සමරපුර මධ්‍යම පාන්තික නිවාස සංකීර්ණයට අයත් ක්‍රීඩා පිටිය ප්‍රතිසංස්කරණය. |
| 48 | පළාත් පාලන ආයතන වල සේවකයින් සඳහා සේවක අභිප්‍රේරණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම. |
| 49 | මදුරු මර්ධනය සඳහා මහ නගර සභාව සඳහාදුමක යන්ත්‍රයක් ලබාදීම |
| 50 | කසල එක් රැස් කිරීම සඳහා පළාත් පාලන ආයතන 04 කට බේල් මැෂින් ලබා දීම.(කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව, මැදවච්චිය ප්‍රාදේශීය සභාව, තිරප්පනේ ප්‍රාදේශීය සභාව, මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව) |
| 51 | පළාත් සභා කාර්යාල සංකීර්ණය සඳහා වර්ණ කේත ක්‍රමයට සැකසූ කසල බහාලූ කට්ටල 15 ක් ලබා දීම |
| 52 | පළාත් පාලදෙපාර්තමේන්තුව සඳහා අත්‍යවශ්‍ය කාර්යාල උපකරණ හා උපාංග ලබා දීම |
| 53 | පළාත් පාලන හා අනුරාධපුර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන වල වාහන අලුත්වැඩියාව |
| 54 | පොළොන්නරුව දිස්ත්‍රික්කයේපළාත් පාලන ආයතන වල වාහන අලුත්වැඩියාව |
| 55 | පළාත් පාලන දෙපාර්තමේන්තු හා පළාත් පාලන ආයතන වල නිලධාරීන් සඳහා පුහුණු පැවැත්වීම. |
| 56 | පළාත් පාලන දෙපාර්තමේන්තු හා පළාත් පාලන ආයතන සඳහා අත්‍යවශ්‍ය වන ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ අවශ්‍යතාවය අනුව මිලදී ගැනීම. |
| 57 | පළාත් පාලන ආයතන සඳහා අවශ්‍ය වන යන්ත්‍ර හා උපකරණ අවශ්‍යතාවය මත මිලදී ගැනීම. |
| 58 | ග්‍රාමීය මාර්ග සංවර්ධන සතිය කැකිරාව ප්‍රාදේශීය සභාව. |
| 59 | ග්‍රාමීය මාර්ග සංවර්ධන සතිය තිරප්පනේ ප්‍රාදේශීය සභාව. |





6.2

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### ඉදිරි දැක්ම

"අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි, නිපුණතා සපිරි දරු පිරිසක්, සමෘධිමත් පළාතක්"

### මෙහෙවර

"අධ්‍යාපනයේ සම අවස්ථා සලසමින් මානව සම්පත් හා භෞතික සම්පත් මනා කළමණාකාරිත්වයකින් යුතුව භාවිතාකර උතුරු මැද පළාත සමෘද්ධිමත් කිරීම සඳහා දායකත්වය සැපයීම"

### දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු

- උතුරු මැද පළාතේ පාසල් අධ්‍යාපනය ලබන දරුවන් බුද්ධිමත් හා රැකියා වෙළඳපොළට සුදුසු නිපුණතා ඇති දරුවන් බවට පත් කිරීම.
- ඉපැරණි රජරට සංස්කෘතිය හා කෘෂි ජීවන රටාව මෙන්ම දේශීය හරපද්ධතිය හා සාරධර්ම අගය කරන පුරවැසි පිරිසක් පාසල් අධ්‍යාපනය තුළින් බි.හි කිරීම

### කෙටිකාලීන අරමුණු

- උතුරු මැද පළාතේ අනිවාර්යය අධ්‍යාපන වයස් සීමාව තුළ සිටින සියලුම දරුවන් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සහ එහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම.
- උතුරු මැද පළාතේ පාසල්වල ඉගැන්වීම් කාර්යයයේ නියුතු ගුරුවරුන්ගේ ඉගැන්වීම් කුසලතා හා ක්‍රමවේදයන් ඉහළ තලයට ගෙන ඒමට අවශ්‍ය මග පෙන්වීම් සිදුකිරීම.
- උතුරු මැද පළාතේ අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වන්නා වූ භෞතික,මානව හා මූල්‍ය සම්පත් සැපයීම.
- පළාතේ පාසල් දරුවන්ගේ කායික, මානසික සංවර්ධනය සහ කුසලතා ඉහළ නැංවීම.
- ඵලදායී ඉගෙනුම් පරිසරයක් ගොඩනැගිය හැකිවන පරිදි නිලධාරීන්ගේ හා විදුහල්පතිවරුන්ගේ කළමණාකරණ ශක්තිය ඉහළ නැංවීම.

### ප්‍රධාන කාර්යයන්

- ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපන ප්‍රවේශය සඳහා සම අවස්ථා වර්ධනය
- ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ගුණාත්මක බව වර්ධනය
- භෞතික සම්පත් සහ යටිතල පහසුකම් සංවර්ධනය
- ආයතනික ධාරිතා සංවර්ධනය
- යහපාලනය සහ සේවා සැපයීම ශක්තිමත් කිරීම

### ප්‍රධාන සංවර්ධන උපාය මාර්ගයන්

1. උතුරු මැද පළාත තුළ පාසල්වල මූලික ඉඩකඩ සම්පූර්ණ කිරීම.
2. උතුරු මැද පළාත තුළ පාසල්වල උසස් තලයේ ඉඩකඩ සම්පූර්ණ කිරීම.
3. උතුරු මැද පළාත තුළ පාසල්වල මූලික උපකරණ අවශ්‍යතා සම්පූර්ණ කිරීම.
4. උතුරු මැද පළාත තුළ පාසල්වල උසස් තලයේ උපකරණ අවශ්‍යතා සම්පූර්ණ කිරීම.
5. මානව සම්පත් සංවර්ධනය.
6. ශිෂ්‍ය සංවර්ධනය.

### කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 144 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 126 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 21 |
| අතිරික්ත | 03 |
| අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික පදනමේ සිටින සංඛ්‍යාව | 02 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජ්‍ය නය (%) |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 9,751.70 | 9,750.69 | 1.01 | 99.98 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 281.81 | 278.67 | 3.14 | 98.89 |
| **එකතුව** | 10,033.51 | 10,029.36 | 4.15 | 99.96 |

### මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජ්‍ය නය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 30.39 | 29.59 | 0.80 | 97.37 |
| යන්ත්‍රසූත්‍ර සවිකිරීම් හා උපකරණ | 56.67 | 56.16 | 0.51 | 99.10 |
| **එකතුව** | 87.06 | 85.75 | 1.31 | 98.49 |

#### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය

2016 වර්ෂයේදී ප්‍රාථමික අධ්‍යාපනය, ද්වීතියික අධ්‍යාපනය, විශේෂ අධ්‍යාපනය, නොවිධිමත් අධ්‍යාපනය යන අංශයන්ගේ සංවර්ධනය ඉලක්ක කරගත් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

| අනු අංකය | ව්‍යාපෘතිය | වැඩසටහන | වෙන් වූ ප්‍රතිපාදනය (රු.මි) | 2016 වර්ෂයේ වියදම (රු.මි) |
|---|---|---|---|---|
| 1 | ප්‍රාථමික අධ්‍යාපනය | ගුරු හා සිසු පුහුණුව | 8.75 | 8.71 |
| 2 | ද්වීතියික අධ්‍යාපනය | ගුරු සිසු ඇගයීම | 1.75 | 1.28 |
| | | සිසු පුහුණු හා වාර විභාග | 73.23 | 73.23 |
| | | ගුරු සංවර්ධනය | 10.12 | 10.11 |
| | | ඉගෙනුම් සඳහා නියාමන දර්ශක | 13.12 | 13.11 |
| | | ක්‍රීඩා සංවර්ධනය | 3.97 | 3.97 |
| 3 | විශේෂ අධ්‍යාපනය | ගුරු හා සිසු පුහුණුව | 0.87 | 0.60 |
| 4 | නොවිධිමත් අධ්‍යාපනය | ගුරු පුහුණුව | 0.43 | 0.43 |
| | | පාඨමාලා ගාස්තු | 0.56 | 0.44 |
| 5 | යහපාලනය හා සේවා | කාර්යමණ්ඩල පුහුණු | 0.70 | 0.60 |
| | | සැලසුම් හා පර්යේෂණ | 0.61 | 0.52 |
| එකතුව | | | **26.81** | **1.28** |

#### සේවාස්ථ ප්‍රගතිය -2016 ඉගෙනුම් සහාය සඳහා නියාමන දර්ශක

| අනු අංකය | වෙන් කළ මුදල (රු.මි) | වැඩසටහනේ නම | ඇස්තමේන්තුගත මුදල (රු.මි) | වැය වූ මුදල (රු.මි) |
|---|---|---|---|---|
| 1 | 13.125 | වාරසටහන් මුද්‍රණය සඳහා | 6.92 | 6.51 |
| 2 | 6.619 | පාසල් ලිත | 0.29 | 0.25 |
| | 6.369 | කළමනාකරණ දිනපොත | 0.67 | 0.66 |
| | 5.713 | ක්ෂේත්‍ර පොත | 0.32 | 0.31 |
| 3 | 5.401 | අද අපේ පාඩම | 4.52 | 7.02 |
| එකතුව | | | **12.72** | **14.75** |

### ඖෂධ උයන් නිර්මාණය කිරිම හා පාසල් පරිසරය අලංකරණය කිරීමේ වැඩසටහන

පළාතේ පාසල් පද්ධතිය තුළ ඖෂධ උයන් නිර්මාණය කිරිමත්, ඒ කෙරෙහි පාසල් දරුවන් යොමු කිරීමත්, අලංකාරවත් පාසල් පරිසර පද්ධතියක් නිර්මාණය කිරීමත් අරමුණු කරගෙන ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.



ඒ තුළින් දරුවන් කෙරෙහි දේශීය ඖෂධ කෙරෙහි අවධානය යොමු කරවිමටත් පරිසරය හා සහසම්බන්ධව ක්‍රියාකාරකම් කිරීම සඳහා යොමු කරවීමටත් අවශ්‍ය කටයුතු ව්‍යාපෘතිය තුළින් සිදු කරන ලදී.

එපමණක්ද නොව පරිසරයට ආදරය කරන හා පරිසරය විඳින පාසල් දරු පරපුරක් නිර්මාණය කිරීමට අවශ්‍ය මූලික පෙළඹවීම ව්‍යාපෘතිය තුළින් සිදු විය.



තවද ගස් වැල් රැකබලා ගැනීමටත් ඒ තුළින් පාසල් පරිසරය අලංකාරවත්ව පවත්වාගෙන යාමටත් දරුවන් හුරු කිරීම තුළින් ප්‍රියමනාප පාසල් පරිසරයක් නිර්මාණය කිරීමටත් ඉහත කී ව්‍යාපෘතිය තුළින් හැකි විය.

එසේම පුලියන්කුලම ගොවිපල යාන්ත්‍රික අභ්‍යාස පුහුණු මධ්‍යස්ථානය සම්බන්ධකර ගනිමින් සිසු පුහුණු වැඩසටහන් ද පුලියන්කුලම පිහිටි රජරට විශ්වවිද්‍යාලයීය කෘෂිකර්ම පීඨය සම්බන්ධ කරගනිමින් ගුරු පුහුණු වැඩසටහන්ද, සිසුන් සඳහා ප්‍රායෝගික පුහුණු වැඩසටහන්ද, විදුහල්පතිවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන්ද, අ .පො.ස. (උ.පෙළ) ජෛව පද්ධති තාක්ෂණවේදය සඳහා ප්‍රායෝගික පෙරහුරු පරීක්ෂණය ද පවත්වන ලදී.

එසේම වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදි අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා ආයතන අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් අනෙකුත් පාර්ශවකරුවන්ද සමග සහයෝගයෙන් කටයුතු කරමින් කාර්යාවලිය මෙහෙයවීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ඉලක්ක ලඟා විමටත් ආයතනයේ කාර්ය සාධනය ඉහල නැංවීමට හැකි විය.

6.3

# පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව

## ඉදිරි දැක්ම

"සංස්කෘතිකාංග ගරු කරන සාරධර්ම සපිරි සමාජයක් සෞභාග්‍යවත් පළාතක්".

## මෙහෙවර

"දැහැමි කලාකාමී හා අභිමානවත් සමාජයක් බිහි කිරීම සඳහා සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව දහම් අධ්‍යාපනය නංවාලීම, උසස් කලා නිර්මාණකරණය හා රසවින්දනය දිරිගැන්වීම, අතීත සංස්කෘතික උරුමයන් හා ශිල්ප සංරක්ෂණය සහ කලාකරුවන්ගේ කුසලතා ඔප්නැංවීම".

## අරමුණු

- අත්‍යවශ්‍ය භෞතික සම්පත් සහිත දැහැමි පාසල් පද්ධතියක් සහ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කරගත් දහම් පාසල් ප්‍රජාවක්.
- දක්ෂ කලාකරුවන්ගේ නිර්මාණ එළිදැක්වීමට කාර්යක්ෂම ක්‍රමවේදයක්.
- උසස් කලා නිර්මාණ බිහි කිරීම.
- පළාතේ සංස්කෘතිකාංග අඛණ්ඩව පවත්වාගෙන යාමට විධිමත් ක්‍රමවේදයක්.
- ඉහළ ධාරිතාවයකින් යුත් කලායතන පද්ධතියක් හා කලාකරුවන් පිරිසක්.
- කාර්යක්ෂම ආයතන පද්ධතියක්.
- නර්තන කලාව, ලේඛණ කලාව, සංගීත හා රංග කලාව වැනි සංස්කෘතික අංගයන් ප්‍රවර්ධනයට කටයුතු සැලසීම.
- පළාතේ කලාකරුවන්ගේ හැකියාවන් හඳුනා ගැනීම හා ඇගයීමට ලක් කිරීම.
- පළාතේ ආගමික පුනර්ජීවය වෙනුවෙන් සංවර්ධන කාර්යයන් ඉටු කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- දහම් අධ්‍යාපනය නංවාලීම.
- උසස් කලා නිර්මාණ බිහි කිරීම සංවර්ධනය.
- උසස් රසාස්වාදනය ප්‍රචලිත කිරීම.
- අතීත සංස්කෘතික උරුමයන් හා කලා ශිල්ප සංරක්ෂණය.
- කලාකරුවන්ගේ කුසලතා නංවාලීම.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහපාලන කටයුතු සංවර්ධනය.




### කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 18 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 17 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 02 |
| අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික පදනමේ සිටින සංඛ්‍යාව | 03 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 8.13 | 8.11 | 0.02 | 99.75 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 9.11 | 7.23 | 1.88 | 79.36 |
| **එකතුව** | **17.24** | **15.34** | **1.90** | **88.98** |

### මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0.05 | 0.05 | 0.00 (රු.1234.24) | 100 |
| යන්ත්‍රසූත්‍ර සවිකිරීම් හා උපකරණ | 0.50 | 0.49 | 0.01 (රු.1680) | 98 |
| වාහන | 0.05 | 0.04 | 0.01 | 80 |
| **එකතුව** | **0.60** | **0.58** | **0.02** | **96.67** |

මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන වැඩ පිළිබඳ කාර්යය සාධනය

| ව්‍යාපෘතිය | ඉලක්කය<br>ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වෙන්කළ ප්‍රතිපාදනය (රු.මි) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| ප්‍රාදේශීය සංස්කෘතික උළෙල | ප්‍රාදේශිය මට්ටමේ කලාකරුවන්ට අනුහිත දීම | 6.00 | 5.80 | 96.67 |
| පළාත් කලා උළෙල | හැකියාවෙන් පරිපූර්ණ කලා ශිල්පීන් බිහි වීම | 2.00 | 1.90 | 95 |
| පළාත් කලා උළෙල | පළාතේ කලාකරුවන්ගේ හැකියා වර්ධනය කිරිම. | 3.00 | 2.97 | 99 |
| ආගමික කටයුතු | ආගමික පුනර්ජීවය සඳහා අධාර කිරීම | 15.00 | 14.99 | 99.93 |
| සාම්ප්‍රදායික උත්සව | පාරම්පරික උරුමයන් ආරක්ෂා කිරීම | 2.33 | 1.88 | 80.69 |
| දහම් පාසල් සංවර්ධනය | උතුරු මැද පළාත තුළ විසිරි පවතින දහම් පාසල් වල භෞතික සම්පත් සංවර්ධනය කිරීම සඳහා මහින් අධ්‍යාපනය වෙත සිසුන් යොමු කර දහම් දැනුම හා ආකල්ප වර්ධනය කිරීම | 10.00 | 10.00 | 100 |
| නැටුම් හා ගායන හැකියා වර්ධනය | පළාතේ පාරම්පරික උරුමයන් අනාගත පරපුර වෙත දායාද කිරීම | 7.60 | 4.55 | 59.87 |
| විවිධ සංස්කෘතික වැඩ සටහන් | කලා නිර්මාණ වෙත නව ප්‍රේක්ෂක ආකර්ෂනයක් ඇති කරලීම හා රස වින්දනයෙන් යුතු ප්‍රේක්ෂක පිරිසක් බිහිකරලීමට දායක වීම | 1.17 | 1.16 | 99.15 |
| එකතුව | | 47.11 | 43.25 | 91.81 |

ප්‍රතිලාභීන් සංඛ්‍යාව පළාතේම ජනතාව වේ.

## 2016 වර්ෂයේ ව්‍යාපෘති යටතේ සිදු කළ කාර්යයන්

### 01. ප්‍රාදේශීය සංස්කෘතික උළෙල

**i.** ප්‍රාදේශීය වශයෙන් හුදකලාව සිටින කලාකරුවන් හඳුනාගනිමින් ඔවුන්ගේ හැකියාවන් ජාතික තලය වෙත රැගෙන ඒමේ මූලික පියවර වන්නනේ මෙම වැඩසටහනයි. පළාතේ පළාත් පාලන ආයතන 26 හා සම්බන්ධ වෙමින් ප්‍රාදේශීය වශයෙන් තරඟ පවත්වා පළාත් පාලන ආයතන 26ක් තුළ මෙවර ප්‍රාදේශීය කලා උළෙල පවත්වන ලදි.

### ii. සාහිත්‍ය උත්සවය හා සමගාමී ක්‍රියාකාරකම්

උතුරු මැද පළාත තුළ සිටින විවිධ සාහිත්‍යධරයන් වෙනුවෙන් පොළොන්නරුව බුද්ධි මණ්ඩපයේදී 2016.09.08 වන දින සාහිත්‍ය උත්සවය පැවැත්විය. එහිදී ලේඛකයන්ගේ නව නිර්මාණ එළි දැක්වීමත් මුද්‍රිත ග්‍රන්ථ අලෙවිකර ගැනීම අවස්ථාව සැලසිය. සාහිත්‍ය උත්සව අවස්ථාවේදී හරවත් දේශණ, ප්‍රායෝගික වැඩමුළු හා උත්සවය වර්ණවත් කිරීම සඳහා නාට්‍ය සංදර්ශණ කෙටි චිත්‍රපටි හා නැටුම් වේදිකා ගත කෙරුණි.

## 02. පළාත් කලා උළෙල

### i. පළාත් කලා උළෙලට සමගාමීව වැඩමුළු පැවැත්වීම

උතුරු මැද කලා උළෙලට සමගාමීව පළාතේ කලායතන හා සියලුම කලාකරුවන්ගේ දැනුම හා අවබෝධය වර්ධනය කිරීම අරමුණු කරගනිමින් කලා ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සම්බන්ධකර ගනිමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා මුසු වූ වැඩමුළු පවත්වන ලදී. මෙම වර්ෂය තුළ තෙදින නාට්‍ය වැඩමුළුවක්, දෙදින කෙටි චිත්‍රපටි වැඩමුළුවක් හා තෙදින නර්තන වැඩමුළුවක් පැවැත්විය.

### ii. කලා උළෙලේ ජයග්‍රාහී නිර්මාණ කලඑළි දැක්වීම

නිර්මාණකරුවන්ට තමාගේම නිර්මාණ එළිදැක් වීමට අතහිත දීම මෙහි ප්‍රධාන අරමුණ විය. මේ යටතේ උතුරු මැද කලා උළලේ ජයග්‍රාහී නාට්‍ය නිර්මාණ වේදිකා ගත කිරීම සිදු විය.

## 03. පළාත් කලා උළෙල

27 වන උතුරු මැද කලා උළෙල මෙවර ද ඉතා උත්කර්ෂවත් අයුරින් පැවැත්වීමට හැකිවිය.උතුරු මැද කළාකරුවන් ජාතික තලය වෙත දායාද කිරීමේ මූලික පියවර වන්නේ පළාත් කලා උළෙලයි. මෙහි දී පළාතේ කලාශිල්පීන් එකම වේදිකාවක් මතට එක් කිරීම සුවිශේෂි කාර්යයක් විය.

## 04. ආගමික කටයුතු

### i. ඓතිහාසික දළඳා පෙරහැර

අතීතයේ සිට ලාංකික ශ්‍රී විභූතිය පෙන්නුම් කරන ඓතිහාසික දළඳා පෙරහැර මෙවරද පැවැත්විණි. එහි සංස්කෘතික අංග ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය නර්තන ශිල්පීන් සම්බන්ධ කරමින් දළඳා පෙරහැරේ කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය කටයුතු මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලැබෙයි.

### ii. පෝ දින වැඩසටහන

අනුරාධපුර මහා විහාරය (උඩමළුව) මසක් පාසා පොහොය දින වැඩ සටහන ක්‍රියාත්මක කිරිමට මුදලින් දායකත්වය සැපයීම මෙහිදී සිදු කෙරිණි.

### iii. අනුරාධපුර පොළොන්නරුව පෙරහැර අවස්ථාවන් සඳහා අනුග්‍රහය දැක්වීම

උතුරු මැද පළාතේ පවත්වන අනෙකුත් පෙරහැර සඳහා දායකත්වය සැපයීම මෙහිදී සිදු කෙරුණි.

### iv. අනුග්‍රාහකත්වය ලබාදෙන වෙනත් ආගමික උත්සව

උතුරු මැද පළාත තුළ ඉපැරණි සම්ප්‍රදායන් හා බැඳුණු විශේෂ ආගමික උත්සව රාශියක් පවතී. එම උත්සව සහ අක්ත්‍ර පත්‍ර පිළිගැන්වීම, සෙත් පිරිත් සජ්ඣායනා, ආදාහන පූජෝත්සව සඳහා ද අනුග්‍රහය ලබා දීම මේ යටතේ සිදු කෙරුණි.

**2016 වර්ෂයේ අනුග්‍රාහකත්වය ලබා දී ඇති පෙරහැර හා වෙනත් ආගමික උත්සව නාම ලේඛනය (අනුරාධපුර දිස්ත්‍රික්කය)**

| අනු අංකය | නම | ලබා දුන් මුදල රු. |
|---|---|---|
| 1 | තඹුත්තේගම දුරුතු පෙරහැර | 0.10 |
| 2 | ආදාහන පූජෝත්සවය - දිඹුලාගල මෙත් සිසිල කලාපීය බෞද්ධ සංගමය | 0.05 |
| 3 | ජයන්ති වෙසක් පෙරහැර - කඳුරුවෙල | 0.10 |
| 4 | බුද්ධගයා වෙසක් අසිරිය - අනුරාධපුර තරුණ බෞද්ධ පදනම | 0.10 |
| 5 | ආදාහන පූජෝත්සවය - රන්පත්විල | 0.03 |
| 6 | ආදාහන පූජෝත්සවය - සිවුරු සඳහා ගෙවීම | 0.04 |
| 7 | කැකිරාව මල් දෙණිය ශ්‍රී විසුද්ධාරාම මිහිඳු පෙරහැර | 0.30 |
| 8 | පොළොන්නරුව ඉසිපතනය මිහිඳු පෙරහැර | 0.50 |
| 9 | පොළොන්නරුව දළදා පෙරහැර | 0.50 |
| 10 | මිහින්තලය රජමහ විහාරය පොසොන්උත්සවය | 0.50 |
| 11 | දිඹුලාගල විහාරයේ මිහිඳු පෙරහැර - වැලිකන්ද ප්‍රාදේශීය සභාව | 0.10 |
| 12 | දිඹුලාගල බුද්ධශ්‍රාවක මහා සභාවේ මිහිඳු පෙරහැර | 0.30 |
| 13 | හිඟුරක්ගොඩ මිහිඳු පෙරහැර | 0.10 |
| 14 | දිඹුලාගල පෙරහැර | 0.10 |
| 15 | අරලගංවිල පෙරහැර | 0.25 |
| 16 | හුරුළු වැව දේවාලය | 0.30 |
| 17 | ගලෙන්බිඳුණුවැව ගාමිණී රජමහ විහාරය | 0.10 |
| 18 | අනුරාධපුර ඓතිහාසික දළදා පෙරහැර | 1.00 |
| 19 | අත්තනකඩවල ශ්‍රී පරාක්‍රම විහාරය - ආදාහන පූජෝත්සවය | 0.08 |
| 20 | හුරියගස්වැව ශ්‍රී වර්ධනාරාමය - ආදාහන පූජෝත්සවය | 0.03 |
| 21 | ආදාහන පූජෝත්සවය - අනුරාධපුර | 0.03 |
| | **එකතුව** | **4.61** |

### v. ආගමික සිද්ධස්ථාන සංවර්ධනය

විවිධ ආර්ථික දුෂ්කරතා මැද පවත්වාගෙන යන ආගමික සිද්ධස්ථාන සඳහා ආධාර ලබා දීම මේ යටතේ සිදු විය.මෙහිදී සර්ව ආගමික ස්ථාන සංවර්ධනය සඳහා දායකත්වය ලබා දීමත් ඒ තුළින් පළාතේ අභිවෘද්ධිය සඳහා සර්ව ආගමික සහජීවනය ලබා ගැනීමත් අපේක්ෂා කෙරුණි.

## 05. සාම්ප්‍රදායික උත්සව පැවැත්වීම සඳහා දායකත්වය

### පාරම්පරික පූජා කර්ම පැවැත්වීම

උතුරු මැද පළාතේ සියලුම ජනතාවට ආශිර්වාද පතා මෙම පළාතේ හා වෙනත් පළාත් වලින් දක්ෂ ශිල්පීන් යොදා ගනිමින් බලි ශාන්ති කර්මයක් පළාත් සභා පරිශ්‍රෙය්දී පැවැත්වීම මෙහි මූලික පියවර වේ. අනතුරුව උතුරු මැද පළාත තුළ ප්‍රාදේශීය මට්ටමින් පවත්වනු ලබන පූජා කර්ම පැවැත්වීම සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දීම සිදු විය. ඒ යටතේ බලි ශාන්තිකර්මය, වලිසිංහ ක්‍රීඩා පිටියේ පැවැති දහඅටසන්නිය , පුබුදුපුර ක්‍රීඩා පිටියේ පැවැති දහඅටසන්නිය, යන සාම්ප්‍රදායික පූජා කර්ම පැවැත්වීම සඳහා රු. 540,740.56 ක මුදලක් ලබා දෙන ලදී.

### අනුරාධපුර පොළොන්නරුව සංස්කෘතික උත්සව පැවැත්වීම.

උතුරු මැද පළාත තුළ සංවිධානය කරනු ලබන අවුරුදු උත්සව ඇතුළු සංස්කෘතික, සාහිත්‍ය හා විශේෂ රාජ්‍ය උත්සව සඳහා අනුග්‍රාහකත්වය ලබාදීම මෙම ක්‍රියාකාරකම මඟින් සිදු කරයි.පදවිය අවුරුදු උත්සවය, කඩපනහ අවුරුදු උත්සවය, ජාත්‍යන්තර වකුගඩු දිනය, රුවන්වැලි සෑ උත්සවය, ඇළහැර අවුරුදු උත්සවය, සාහිත්‍ය උත්සවය පැවැත්වීම සඳහා රු. 863,500.00 ක අනුග්‍රාහකත්වය ලබා දෙන ලදී.

### සංස්කෘතික සංරක්ෂණය

පළාත තුළ පවතින සංස්කෘතික උරුමයන් සංරක්ෂණය උදෙසා උතුරු මැද පළාතේ කෘෂිකර්මාන්තය ආශ්‍රිතව පවතින ජනශ්‍රැත පිළිබඳව අධ්‍යනයක නිරතව එහි අතීත උරුමයන් වීඩියෝ ගතකර සංරක්ෂණය කරනු ලැබේ.

## 06. දහම් පාසල් සංවර්ධන

උතුරු මැද පළාත තුළ විසිරී පවතින දහම් පාසල්වල භෞතික සම්පත් සංවර්ධනය කිරීම තුළින් දහම් අධ්‍යාපනය වෙත සිසුන් යොමුකර දහම් දැනුම හා ආකල්ප වර්ධනය කිරීම.

## 07. නැටුම් හා ගායන හැකියා වර්ධනය

### i. කලාව වෙත ආධුනික ශිල්පීන් දායාද කිරීම

සුවිශේෂී ගායන හැකියාවෙන් යුත් තරුණ තරුණියන් ග්‍රාමීය මට්ටම දක්වා විසිරී සිටියද ඔවුනගේ හැකියා ඔපමට්ටම් කරමින් ඉදිරියට රුගෙන යාමට තරම් හැකියාවක් ඔවුන් වෙත නොමැති බව දන්නා කරුණකි . එවන් හැකියාවෙන් යුත් තරුණ තරුණියන්ගේ හැකියාවන් හඳුනා ගනිමින් අනාගතයේදී කලාව වෙනුවෙන් සංගීත ක්ෂේත්‍රය පිළිබඳ මනා අවබෝධයක් ඇති ශිල්පීන් පිරිසක් බිහිකරලීම සඳහා ස්වර්ණරාව ගී තරු අභිෂේකය ක්‍රියාත්මක කරන ලදී.

### ii. පළාත් රාජ්‍ය නර්තන කණ්ඩායම

උතුරු මැද පළාතේ නර්තන හැකියාවන්ගෙන් යුත් ආධුනික ශිල්පීන් එක්රැස් කරමින් පුහුණු දීමනාවක් සහිතව පුහුණුවීම් ලබා දෙමින් ඔවුනගේ හැකියාවන් පළාත තුළ (රාජ්‍ය උත්සව වෙනත් උත්සව සඳහා දායකත්වය සපයමින්) මෙන්ම ජාතික හා ජාත්‍යන්තර තලය වෙත රැගෙන යාමත්, සාම්ප්‍රදායික කලාවන් අනාගත පරපුර වෙත දායාද කිරීමත් මෙයින් සිදු වේ.

### iii. පළාත් රාජ්‍ය සංගීත කණ්ඩායම

පළාතේ ගායන හා වාදන හැකියාවන් ඇති ආධුනික ශිල්පීන් 15 දෙනෙකුගෙන් යුත් මෙම කණ්ඩායම පුහුණුවීම්වල නිරත වේ. සුභාවිත සංගීතය මෙන්ම ශාස්ත්‍රීය සංගීතය පිළිබඳ අවබෝධය ද මෙයින් ලබා දෙනු ඇත. පළාතේ සුවිශේෂි ප්‍රසංගයන් සඳහා මෙම කණ්ඩායමේ දායකත්වය ලබා දෙනු ඇත.

## 08. විවිධ සංස්කෘතික වැඩ සටහන්

උතුරු මැද පළාත් සභාව යටතේ සුරපුර එළිමහන් රංග පීඨය තුළ මෙම වර්ෂයේ සෑම මසකම අවසන් සෙනසුරාදා දින හෝ ඊට ආසන්න දිනක පස්වරුවේ නාට්‍ය දර්ශනයක් හෝ නර්තන, සංගීත ප්‍රසංගයක් නොමිලේ ප්‍රදර්ශනය කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු විය. ඒ යටතේ (වේදිකා ගත කළ වේදිකා නාට්‍ය) වෙල්ලවැහුම් වේදිකා නාට්‍ය, අරුන්දතී වේදිකා නාට්‍ය, දික්තල කාලගෝල වේදිකා නාට්‍ය, නරිබෑනා, ජසයා හා ලෙන්චිනා සහ සුරංගනා කථාවක් වේදිකා නාට්‍ය සංදර්ශන පවත්වන ලදී.

එසේම වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදි අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා ආයතන අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් අනෙකුත් පාර්ශවකරුවන්ද සමග සහයෝගයෙන් කටයුතු කරමින් කාර්යාවලිය මෙහෙයවීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ඉලක්ක ලඟා විමටත් ආයතනයේ කාර්ය සාධනය ඉහල නැංවීමට හැකි විය.

6.4

# පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

## ඉදිරි දැක්ම

"ආරක්ෂාකාරී සහ කාර්යක්ෂම ඒකාබද්ධ මාර්ග පද්ධතියක්, සමෘද්ධිමත් ප්‍රජාවක්".

## මෙහෙවර

"මාර්ග නඩත්තුව, වැඩි දියුණුව සහ පර්යේෂණ කටයුතු සියළු පාර්ශවකරුවන්ගේ මනා සහයෝගීතාවයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව ඉටු කිරීම.

## අරමුණු

උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග හා නිර්මිත (පාලම් හා බෝක්කු) පුනරුත්තාපනය, ප්‍රතිසංස්කරණය.

❖ සංවර්ධිත මාර්ගයන් කාලානුරූපීව හා අවස්ථානුකූලව ගමනාගමනයට සුදුසු පරිදි නඩත්තු කර පවත්වා ගෙන යෑම.

❖ මාර්ගයන්හි වැඩිවන රථවාහන සංඛ්‍යාවට (Traffic Volume) අනුරූපීව අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම හා සැලසුම් කරණය (Traffic Management)

a) අවශ්‍ය ස්ථානවල වටරවුම් ඇතුළු අනිකුත් සේවාවන් ස්ථාපිත කිරීම.

b) වටරවුම් සඳහා අවශ්‍ය භූමි අත්පත්කර ගැනීමට ක්‍රියාකිරීම.

## ප්‍රධාන කාර්යයන් සහ ප්‍රධාන සංවර්ධන උපාය මාර්ගයන්

| අනු අංකය | කාර්යය | උපාය මාර්ගය |
|---|---|---|
| 01 | සී හා ඩී මාර්ග නඩත්තු කිරීම | ♦ දෛනික නඩත්තුව<br>♦ කාලීන නඩත්තුව<br>♦ හදිසි අවස්ථා නඩත්තුව |
| 02 | මාර්ග සංවර්ධනය කිරීම | ♦ පවතින මාර්ග වැඩි දියුණුව<br>♦ මාර්ග පුනරුත්ථාපනය<br>♦ නව මාර්ග ඉදි කිරීම |

| | | |
|---|---|---|
| 03 | පර්යේෂණ හා අධ්‍යයන සිදු කිරීම | ♦ රසායනාගාර පරීක්ෂණ<br>♦ සමාජ හා පාරිසරික අධ්‍යයන<br>♦ ගමනාන්තර අතර කාලය පිළිබඳ අධ්‍යයන<br>♦ විශේෂ මාර්ග අවශ්‍යතා සහ විශේෂ සිද්ධි සහිත මාර්ග අධ්‍යයන<br>♦ ශක්‍යතා අධ්‍යයන<br>♦ ශ්‍රව්‍ය දෘෂ්‍ය නිර්මාණ<br>♦ ඵලදායිතාව වර්ධනය සඳහා අන්තර් අංශ සම්බන්ධතා වර්ධනය පිළිබඳ අධ්‍යනය |
| 04 | දත්ත හා තොරතුරු රැස් කිරීම | පරිගණකගත දත්ත පද්ධතිය |
| 05 | නඩත්තු විමධ්‍යගත කිරීම | විධායක ඉංජිනේරු කොට්ඨාශ මට්ටමේ නඩත්තු නියෝජිතයින් |
| 06 | කාර්යය මණ්ඩලයේ දැනුම යාවත්කාලීන කිරීම හා ආකල්ප වර්ධනය | දේශීය, විදේශිය පුහුණු වැඩමුළු සම්මන්ත්‍රණ අධ්‍යයන චාරිකා, කාර්යය මණ්ඩල ඇගයීම |
| 07 | මාර්ග වැඩවල ගුණාත්මකභාවය රැක ගැනීම | තත්ත්ව පාලන කටයුතු විධිමත් කිරීම මගින් කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම්කරුවන් පළාත් සභාවේ ඇගයීමට ලක් කිරීම. |

**කාර්යය මණ්ඩල සංයුතිය**

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 154 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 143 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 11 |
| අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික පදනමේ සිටින සංඛ්‍යාව | |
| තත්කාර්ය | 130 |
| කොන්ත්‍රාත් | 01 |

### මෙහෙයුම් ප්‍රතිඵල-පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වාභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 87.39 | 87.14 | 0.25 | 99.71 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 22.71 | 20.65 | 2.06 | 90.93 |
| **එකතුව** | **110.10** | **107.79** | **2.31** | **97.90** |

### මූලධන වියදම්

| වියදමේ ස්වාභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| යන්ත්‍ර සූත්‍ර සවිකිරීම් හා උපකරණ | 0.50 | 0.26 | 0.24 | 52 |
| **එකතුව** | **0.50** | **0.26** | **0.24** | **52** |

### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය




2016 සංවර්ධන වැඩසටහන යටතේ පහත ප්‍රභේද 03ක් යටතේ පළාත් මාර්ග සංවර්ධන කටයුතු සිදු විය.

පළාත් මාර්ග පුනරුත්ථාපනය යටතේ අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙක තුළ මාර්ග කි.මී 23කට ආසන්නව ඉදිකර අවසන් කරන ලදී.

එසේම මාර්ග හා සම්බන්ධ යටිතල පහසුකම් පුනරුත්ථාපනය (බෝක්කු සහ පාලම්) සහ වෙනත් අදාල නවීකරණයන් සහිතව අඛණ්ඩව මාර්ග නඩත්තු කිරීම සිදු විය.

තවද, මින්නේරිය, මනම්පිටිය, හොරොව්පතාන, මරදන්කඩවල හා නොච්චියාගම යන විධායක ඉංජිනේරු කාර්යාලයන්හී අත්‍යවශ්‍ය ඉදි කිරීම හා අළුත්වැඩියා කටයුතු සිදු කරන ලදී.

## පළාත් මාර්ග සංවර්ධන කටයුතු

| උප ව්‍යාපෘතිය/ ක්‍රියාකාරකම | ගිවිසුම්ගත/ඇස්තමේන්තුගත මුළු මුදල (රු) | භෞතික ප්‍රගතිය % | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| පළාත් මාර්ග පුනරුත්ථාපනය - 16/610/52/04/04/2005/24 (i) රු. මි 332.9 | | | |
| අනුරාධපුර දිස්ත්‍රික්කය | | | |
| ඇතාකඩ මයිලගස්වැව මාර්ගය මැකඩම් ක්‍රමයට කඩතොළු සකසා තාර දැමීම (0+000-8+800) | 21.48 | 60 | 43 |
| වැලි ඔය තම්මැන්නාව-කහපත්විල මාර්ගය ඒබීසී යොදා කාපට් ඇතිරීම (කි.මී. 1.5) | 23.65 | 10 | 20 |
| තිසාවැව පාළුගම මාර්ගය මැකඩම් ක්‍රමයට කඩතොළු සකසා තාර දැමීම (0+000-8+650) | 29.71 | 72 | 48 |
| ඇතුන්ගම ඒරු වැව මාර්ගය ඒබීසී යොදා කාපට් ඇතිරීම (කි.මී. 4) | 32.05 | 85 | 26 |
| ගලෙන්බිඳුණු වැව- සීප්පුකුලම මාර්ගය ඒබීසී යොදා කාපට් ඇතිරීම (කි.මී. 3සහ4) | 43.93 | 65 | 83 |
| ඉකිරිගොල්ලෑව - රත්මල්ගහවැව ඒබීසී යොදා කාපට් ඇතිරීම (කි.මී. 2) | 35.91 | 55% | 25% |
| **එකතුව** | **186.73** | | |

| පොළොන්නරුව දිස්ත්‍රික්කය | | | |
|---|---|---|---|
| **උප ව්‍යාපෘතිය/ ක්‍රියාකාරකම** | **ගිවිසුම්ගත/ඇස්තමේන්තුගත මුළු මුදල (රු)** | **භෞතික ප්‍රගතිය %** | **මූල්‍ය ප්‍රගතිය %** |
| දිඹුලාගල - වීරාන මාර්ගය මැකඩම් ක්‍රමයට කඩතොළු සකසා තාර දැමීම (7 + 050 - 11+500) | 22.47 | 85 | 56 |
| නුවරගල - පහල යක්කුරේ මාර්ගය මැකඩම් ක්‍රමයට කඩතොළු සකසා තාර දැමීම (1 + 820 - 3+400) | 12.57 | 75 | 20 |
| මැණික් ඇළ - බෝගස් වැව මාර්ගය ඒබීසී යොදා කාපට් ඇතිරීම (0 + 000 - 3+000) | 39.39 | 45 | 20 |
| වෙහෙරගල - මල්දෙනිය මාර්ගය ඒබීසී යොදා කාපට් ඇතිරීම ( 7 + 000 - 10+000) | 39.25 | 40 | 20 |
| හිගුරක්ගොඩ - ගල් අමුණ මාර්ගය ඒබීසී යොදා කාපට් ඇතිරීම (2 + 600 - 4 + 000) | 21.36 | 50 | 20 |
| මීගස්වැව - වඩිග වැව මැකඩම් ක්‍රමයට කඩතොළු සකසා තාර දැමීම ( 0 + 000 - 1 + 700) | 14.65 | 35 | 20 |
| **එකතුව** | **149.69** | | |
| **උප එකතුව** | **336.42** | | |

| මාර්ග හා සම්බන්ධ යටිතල පහසුකම් පුනරුථාපනය (බෝක්කු සහ පාලම්) සහ වෙනත් අදාල වැඩ - 16/610/52/04/4/2005/24(ii) රු.මි.64.4 | | | |
|---|---|---|---|
| උප ව්‍යාපෘතිය/ ක්‍රියාකාරකම | ගිවිසුම්ගත/ඇස්ත මේන්තුගත මුළු මුදල (රු) | භෞතික ප්‍රගතිය % | මූල්‍ය ප්‍රගතිය % |
| වැලි ඔය - තම්මැන්නාව මාර්ගය 7 + 750 ස්ථානයේ පාලම් (Cell Box) ඉදි කිරීම | 11.70 | 95 | 63 |
| සිංහාරගම - රනෝරාව - නිකවැව මාර්ගය හානියට පත්ව ඇති පැතිබැම් ඉදි කිරීම (22+000-22+250) | 3.84 | 0 | 0 |
| සිංහාරගම - රනෝරාව - නිකවැව මාර්ගය හානියට පත්ව ඇති පැතිබැම් ඉදි කිරීම (22+250-22+700) | 3.84 | 0 | 0 |
| පරසන්ගස්වැව - කටුකැලියාව මාර්ගය ගංවතුරින් හානිවූ කොටසේ නිර්මිතයන් සැකසීම | 1.90 | 80 | 0 |
| පන්වැල්ල-මීමින්නාවල-කුඹුක් වැව සපත්තු පාලම ඉදි කිරීම | 4.85 | 0 | 0 |
| විජයපුර ජනහිත හංදිය මාර්ගය ගංවතුරින් හානිවූ කොටසේ පැති බැම් සැකසීම | 6.61 | 40 | 37 |
| පුදූර් මුස්ලිම් ගම්මාන මාර්ගය පැති බැම් සැකසීම (Retaining Wall) | 5.63 | 0 | 0 |
| ප්‍රධාන කාර්යාලයේ විදුලි පද්ධතිය පිළිසකර කිරීම සහ පරිනාමකය සවි කිරීම, රථ වාහන නැවතුම් අංගනය සැකසීම. | 1.74 | 50 | 0 |
| නොච්චියාගම විධායක ඉංජිනේරු කාර්යාලය කාර්යාලීය ගොඩනැගිල්ල, නිළ නිවාස, මුර කුටි, නඩත්තු අංගනයන් අළුත්වැඩියා කිරීම. | 3.37 | 100 | 93 |
| මරදන්කඩවල විධායක ඉංජිනේරු කාර්යාලය කාර්යාලීය ගොඩනැගිල්ල, නිළ නිවාස, මුර කුටි, නඩත්තු අංගනයන් අළුත්වැඩියා කිරීම සහ මුර වැට සැකසීම. | 2.86 | 65 | 0 |
| හොරොව්පොතාන විධායක ඉංජිනේරු කාර්යාලය කාර්යාලීය ගොඩනැගිල්ල පිළිසකර කිරීම හා නඩත්තු අංගනයන් සකස් කිරීම. | 2.22 | 100 | 0 |
| මින්නේරිය විධායක ඉංජිනේරු කාර්යාලය කාර්යාලීය ගොඩනැගිල්ල, නිළ නිවාස, මුර කුටි, නඩත්තු අංගනයන් අළුත්වැඩියා කිරීම. | 3.58 | 40 | 0 |
| මනම්පිටිය නව විධායක ඉංජිනේරු කාර්යාලීය ගොඩනැගිල්ල ඉදි කිරීම | 13.49 | 35 | 0 |
| එකතුව | 65.63 | | |
| උප එකතුව | 402.05 | | |

6.5

# පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය

## ඉදිරි දැක්ම

“1990 අංක 11 දරණ ප්‍රඥප්තියෙන් ලැබී ඇති විධි විධාන අනුව ස්ථාපිතකර ඇති මෙම ආයතනය මගින් පළාතේ කෘෂිකාර්මික, වාරි මාර්ග හා මහා මාර්ග ඉදි කිරීම්, ගොඩනැගිලි නඩත්තු කටයුතු වාහන හා යන්ත්‍ර සූත්‍ර නඩත්තුව, අලුත්වැඩියා කටයුතු වාහන සේවා කිරීම් කටයුතු හා සියළුම මුද්‍රණ කටයුතු මනා ගුණාත්මක භාවයෙන් යුතුව කාර්යක්ෂම ලෙස අඩු පිරිවැයකින් සපයා දීමෙන් උතුරු මැද පළාත් සභාවේ ඉලක්කගත සැලසුම්වලට සහය දීම”.

## මෙහෙවර

“උතුරු මැද පළාතේ වාරි මාර්ග ඉදි කිරීම් සඳහා යන්ත්‍ර/වාහන සැපයීම් යන්ත්‍ර හා වාහන අලුත්වැඩියාවන් හා වාහන සේවා සැපයීම, රාජ්‍ය හා පුද්ගලික අංශයන්හී සියලුම මුද්‍රණ කටයුතු කලට වේලාවට කාර්යක්ෂමව ඉටුකර දීම හා වෙනත් ව්‍යාපෘති කටයුතු වලට දායක වීමෙන් පළාතේ ජනතාවගේ ආර්ථික වෘත්තීය සඳහා දායක වීම”.

## අරමුණු

- දැනට ඉටු කරනු ලබන සේවාවන් පුළුල් කිරිම තුළින් පළාත් සභාවේ අරමුණු හා ඉලක්කයන් සපුරා ගැනීම සඳහා සහය වන ප්‍රමුඛතම ආයතනය බවට පත්වීම.
- පළාත් සභාවට සේවාවන් සපයන ආයතනයක් බවට පත් කිරීමේ අරමුණින් මුද්‍රණ, යාන්ත්‍රික හා සේවා අංශයන්ගෙන් ලබාදෙන සේවාවන් පුළුල් කිරිම තුළින් පළාත තුළ ප්‍රමුඛතම සේවා සපයන ආයතනය බවට පත්වීමත්, ඒ තුළින් ආදායම් ඉහළ නංවා ගැනීමත් අරමුණු වේ.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- මුද්‍රණ අංශය මගින් කරනු ලබන සියලුම මුද්‍රණ කටයුතු සඳහා නිසි ප්‍රමිතියට අනුව නියමිත වේලාවට ලබා දීම සඳහා නවීන යන්ත්‍ර සූත්ර උපයෝගී කරගැනීම.
- යන්ත්‍ර/වාහන කුලියට දීමෙන් ලැබෙන ආදායම් වැඩිකර ගැනීම සඳහා වැඩි වශයෙන් රාජ්‍ය හා පුද්ගලික අංශයන් වෙත යන්ත්‍ර/වාහන සැපයීම අරමුණකි.
- වාහන සේවා අංශය මගින් අවම මිලට කඩිනමින් සේවාවන් ලබා දීම.
- ආයතනයේ පළපුරුදු කාර්යක්ෂම කාර්මිකයින් ලවා වාහන අලුත් වැඩියා කිරිම සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර ලබා ගැනිම.
- සියලුම ඉදි කිරීම් හා වෙනත් ව්‍යාපෘති කටයුතු නිසි ප්‍රමිතියට අනුව කලට වේලාවට සිදුකර ගැනිම.
- ඉහත ප්‍රධාන කාර්යයන්වලට අදාලව දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතනවල අනුග්‍රහය ලබා ගැනිම සඳහා ප්‍රධාන අමාත්‍යාංශයෙන් සහය ලබා ගැනිම.

### කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 58 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 62 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 02 |
| අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික පදනමේ සිටින සංඛ්‍යාව | 11 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 33.39 | 32.00 | 01.39 | 95 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 11.24 | 11.24 | 0.00 | 100 |
| **එකතුව** | 44.63 | 43.24 | 01.39 | 97 |

### මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | 2016 වර්ෂයේවියදම (රු.මි.) |
|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1.54 |
| යන්ත්‍රසූත්‍ර සවිකිරීම් හා උපකරණ | 24.84 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 11.05 |
| **එකතුව** | **37.43** |

### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය

සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය මගින් 2016 වර්ෂයේදී සාපේක්ෂව සාධනිය තත්වයක් කරා ළඟා වීමට හැකි විය. එහි මුද්‍රණ අංශය, යාන්ත්‍රික/මෙහෙයුම්/සිවිල් අංශය හා වාර සේවා අංශය මගින් පළාත් සභාව සතු වාහන සඳහා හා අනෙකුත් සේවා සැපයීම තුළින් කැපී පෙනෙන වර්ධනයක් පෙන්වා ඇත.

| අංකය | ව්‍යාපෘතිය | ඉලක්කගත ප්‍රතිපාදනය (රු.මි) | වියදම (රු.මි) | නිම කළ ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 01 | මුද්‍රණ අංශය සංවර්ධනය | 5.0 | 2.8 | 56 |
| 02. | සේවා අංශය සංවර්ධනය | 2.5 | 2.0 | 70 |
| 03 | තාප්පය නවීකරණය | 1.6 | 1.0 | 70 |

### මුද්‍රණ අංශය සංවර්ධනය උදෙසා

මුද්‍රණාල අංශය මගින් මේවන විට රාජ්‍ය හා පෞද්ගලික යන අංශයන් දෙකෙහි මුද්‍රණ කටයුතු සිදු කරමින් පවතී. මේ තුළින් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විශාල මුද්‍රණ ඇණවුම් සංඛ්‍යාවක් ඉටුකරමින් උතුරු මැද පළාතේ අධ්‍යාපනයට විශාල දායකත්වයක් ලබා දී ඇත. එලෙසම ඉදිරියේදීද මෙම අංශය මගින් උතුරු මැද පළාත තුළ තව තවත් මුද්‍රණ ඇණවුම් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සඳහා වන සැලසුම් මේවන විටත් කරගෙන යනු ලැබේ.

### යාන්ත්‍රික/මෙහෙයුම්/සිවිල් අංශය සංවර්ධනය සඳහා දායකත්වය

ප්‍රධාන ආදායම් මාර්ගය වන මාර්ග සංවර්ධන අධිකාරිය, වාරි මාර්ග අධිකාරිය හා පුද්ගලික අංශය වෙත යන්ත්‍ර වාහන කුලී පදනම මත ලබා දීම ප්‍රධාන කාර්යයක් වන අතර සුභසාධන පදනම මත පළාතේ සංවර්ධන කටයුතු සඳහා දායක වේ. කාර්යශූර කාර්මිකයන්ගෙන් සමන්විත මෙම යාන්ත්‍රික අංශය තුළ වාහන නඩත්තු කිරිමේ අංගනයක්ද පවති. ඒ තුළ සියලු වාහනයන්හී පැස්සුම් වැඩ, අලුත්වැඩියා කටයුතු, පින්තාරු වැඩ යනාදි කාර්යයන් ඉටු කරනු ලබයි.

සිවිල් අංශය මගින් විශාල ව්‍යාපෘති රැසක් ඉටුකර ඇති අතර ඉදිරියේදීද ඉදි කිරීම් හා නව ව්‍යාපෘති රැසක් ඉටු කිරිම සඳහා සැලසුම් සකස් කොට ඇත.

2016 වර්ෂය තුළදී සිදු කරන ලද ව්‍යාපෘතින් ලෙස අඩු ආදායම්ලාභි නිවාස ව්‍යාපෘතියත්, ප්‍රදර්ශන කුටි ඉදි කිරිමත් සිදු කරන ලදී. වාහන සේවා අංශය මගින්ද පළාත් සභාවට අයත් වාහන කඩිනමින් සේවාකර නැවත ලබා දිමට කටයුතු සිදු කරන ලදී. මීට අමතරව ප්‍රධාන ආදායම් මාර්ගය වන යන්ත්‍ර වාහන කුලියට දීමෙන් ලබන ආදායමත්, මුද්‍රණ අංශයෙන් ලබන ආදායමත් ආයතනයට විශාල මූල්‍ය දායකත්වයක් ලබා දීමට සමත් වී ඇත.

ආයතනය සතු යන්ත්‍ර වාහන ඉතා පැරණි ඒවා විමෙන් එම යන්ත්ර වාහන  නිතර අලුත්වැඩියා කිරීමට සිදුවීමත්, පෙර වර්ෂගත බැඳීම් ලෙස හිඟ අර්ථසාධක  සහ නොවිසඳනු මූල්‍යමය වගකීම්  වලින් සැලකිය යුතු ප්‍රමාණයක් 2016 වර්ෂයේදී ගෙවා අවසන්කර ඇති අතර, තවමත් ගෙවීමට ඇති හිඟ මුදල් ද ආයතනය සතු විශාල වගකීමක්ව පවති.

මුද්‍රණාල අංශය, යාන්ත්‍රික අංශය හා  සේවා අංශයට අයත් පුහුණු ශ්‍රමිකයින් මෙම ආයතනය සතුව ඇත. මෙම අංශයන්ද වැඩි දියුණු කිරිමෙන් හා නව යන්ත්‍ර යොදා ගැනිම තුළින්ද  ආයතනයේ අරමුණ වන පළාත තුළ රාජ්‍ය හා පුද්ගලික අංශයන්හී සියලුම වාහන අලුත්වැඩියා කටයුතු හා සියලුම මුද්‍රණ කටයුතු මෙම ආයතනය මගින් සිදු කිරිමෙන් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සියට ඉලක්කගත ආදායම්  උපයා ගැනීමට හැකි වී ඇත.

6.6

# මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය

### ඉදිරි දැක්ම

“සතුටින් පිරි නිපුණතාවයන්ගෙන් හෙබි සදාචාර සම්පන්න පෙර පාසල් දරුවන් උතුරු මැද පළාත තුළ බිහි කිරීම” .

### මෙහෙවර

“උතුරු මැද පළාත තුළ (අනුරාධපුර / පොළොන්නරුව ) විවිධත්වයෙන් යුතු , මනා ක්‍රියාකාරීත්වයෙන් හෙබි , නිසඟ කුසලතාවයෙන් යුත් , සෞන්දර්යාත්මක හැඟීමෙන් පිරිපුන් , සාරධර්ම සපිරි , පෙර පාසල් දරු පරපුරක් බිහි කිරීම සඳහා මධ්‍යම රජයේ හා පළාත් සභාවේ මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානද සම්බන්ධකර ගනිමින් 2003 අංක 04 දරණ ප්‍රඥප්තියට අනුකූලව වැඩසටහන් සම්පාදනය , සම්බන්ධීකරණය හා ඵලදායී ලෙස මෙහෙයවීම පිළිබඳව පළාතේ කේන්ද්‍රීය ආයතනයක් ලෙස කැපවීමෙන් කටයුතු කිරීම”.

### දිගු කාලීන හා කෙටි කාලීන අරමුණු-දිගු කාලීන අරමුණු

- ගුණාත්මක සේවා සපයන පෙර පාසල් ගුරු පද්ධතියක් ඇති කිරිම.
- මුල ළමාවිය සංවර්ධනය පිළිබඳව මනා දැනුමක් සහිත සමාජයක් ඇති කිරිම.
- ගුණාත්මක සේවාවක සපයන ආයතනයක් බවට ආයතනය පත් කිරීම.
- සංහිදියාවෙන් යුත් (යහපාලනයෙන් යුත්)ආයතනයක් බවට පත් කිරිම.

### කෙටි කාලීන අරමුණු

- පෙර පාසල් ගුරුවරුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම.
- වර්තමාන ළමා ආරක්ෂණයට ගැළපෙන පරිදි දෙමාපියන් දැනුවත් කිරීම.
- ළමා සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම

### ප්‍රධාන කාර්යයන්

.

04 → මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳව ප්‍රජාව බල ගැන්වීම

03 → ආයතනික ධාරිතා සංවර්ධනය

02 → යහ පාලන කටයුතු සංවර්ධනය

01 → පෙර පාසල් ගුරුවරුන්ගේ කුසලතා වර්ධනය

### ප්‍රධාන උපාය මාර්ගයන්

- ආයෝජන ධාරිතා පුළුල් කිරීම.
- මානව සම්පත් සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම.
- අධිකාරියේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා අදාල ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම.

### කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 40 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 13 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 35 |
| අනුයුක්ත | 05 |
| අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික පදනමේ සිටින සංඛ්‍යාව | |
| අනියම් | 01 |
| කොන්ත්‍රාත් | 02 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 4.50 | 3.80 | 0.70 | 84.44 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 9.90 | 8.20 | 1.70 | 82.82 |
| පෙර පාසල් ගුරු දීමනා ගෙවීම | 57.6 | මෙම මුදල ප්‍රධාන අමාත්‍යාංශය විසින් වියදම් දරා ඇත | | |
| **එකතුව** | **72.00** | **12.60** | | 16.67 |

### මූලධන වියදම්

ප්‍රතිපාදන වෙන්කර නැත

### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය

| අනුමත ව්‍යාපෘති | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි) | වෙනත් |
|---|---|---|
| 245 | 25.00 | මෙම මුදල ප්‍රධාන අමාත්‍යාංශය විසින් වියදම් දරා ඇත |

මෙම ආයතනයේ අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව 40කි. නමුත් සේවයේ යෙදී සිටින සංඛ්‍යාව 13කි. නමුත් නොයෙකුත් බාධක හා අපහසුතාවයන් මැද අදාල කටයුතු කරන ලද අතර 83%ක ප්‍රගතියක් ලබා ගැනීමට හැකි විය. අනුමත සේවක සංඛ්‍යාවෙන් 1/3ක පමණ දෙනාගේ දැඩි කැපවීම හා උනන්දුව නිසා මෙම කටයුතුවල අදාල ප්‍රගතිය ලබා ගැනීමට හැකි වූ බවද සඳහන් කරමි. ඉදිරියේදී අදාල සංවර්ධන කටයුතුවල නියමිත ප්‍රගතිය ලබා ගැනිම සඳහා මෙම ආයතනයට අදාල මානව සම්පත් අවශ්‍යතාවය සම්පූර්ණකර ගැනිමට ඉහළ කළමනාකාරිත්වය දැනුවත් කර ඇත. අදාල කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.

සුළු නිලධාරීන් සංඛ්‍යාවක් මගින් මෙම ආයතනයට අදාල රාජකාරී කටයුතු ඉටුකරගෙන යෑම පිළිබඳව මහජනතාව (සිසු දෙමව්පියන්) ප්‍රශංසාව පළකර සිටින බවද සඳහන් කරමි.

ළමා අවධිය, මානව සම්පතේ පසු කරනු ලබන සොඳුරුතම සන්ධිස්ථානයයි. ඒ සොඳුරු කඩඉම පසු කරන කිසිවෙකුත් එම කඩඉම නිදහසේ භුක්ති වින්දේද / භුක්ති විඳින්නට ඉඩ සලසා දෙන්නේද යන්න මහත් ගැටළුවකි.

ළමා පරපුරට, වර්තමානය වනවිට අතීතයට වඩා සංකීර්ණ වුත්, හුදෙකලා වූත් ජීවිතයක් ගතකිරීමට සිදු වි තිබේ.මීට දශක 5කට පෙර දෙමාපිය වැඩිහිටි ආදරය,කරුණාව,පිළිගැනිම,සුරක්ෂිතතාව,ඇගයිම,ප්‍රශංසාව, ඇතිව තම නිවෙස් හා අවට පරිසරයේ වැඩෙමින් සුන්දර ජීවිතයක් ගතකළ දරුවාගේ සමස්ත සංවර්ධනය සඳහා සුවදායි පරිසරයක් ගොඩනැගුනේ නිතැතින්ය.

වැඩිහිටි ජීවන රටාවේ අවිවේකිවන වර්තමානයේදී දරුවා තම සියලු අයිතිවාසිකම් අහිමි වූ හුදෙකලාවේ තම සිතුවිලි යටපත් කරගෙන ජීවත්වන තැනැත්තෙකු බවට පත් වේ. ළමා ලොවේ සුන්දරම අවධිය වන අවු 03-05 කාලයේදි හුදකලා පවුල් පරිසරයෙන් මිදී පෙර පාසල වෙල පිවිස සම වයස් කණ්ඩායම් සමග සමාජානුයෝජනය වී තම ජීවිතයට අලුත් අත්දැකීම් එක්කර ගනී.මේ ජීවන රටාවට අවතීරණවත්ම දරුවා පෙර පාසල් ගුරුවරිය සමග සම්ප වී තම ජීවිතයට අලුත් අත්දැකීම් එක්කර ගනි.මේ ජීවන රටාවට අවතීරණවත්ම දරුවා පෙර පාසල් ගුරුවරිය සමග සමීපව දරුවා සොයන ආදරය, කරුණාව,පිළිගැනීම, ප්‍රශංසාව ඇයගෙන් ලබා ගැනිමට උනන්දු වේ.

ඒ අනුව දරුවාගේ කායික හා මානසික ක්‍රියාකාරිත්වය වර්ධනය සඳහා පෙර පාසල් ගුරුවරුන්ගේ ආකල්ප හා ධාරිතා සංවර්ධනය සඳහාත්, දෙමාපිය ආකල්ප වැඩිදියුණු කිරීම සඳහාත්, දරුවාගේ ඉගෙනුම් ක්‍රියාවලිය ශක්තිමත් කිරිමට භෞතික සම්පත් සංවර්ධනය සඳහාත්, මේවන විට ශ්‍රී ලංකා සමාජවාදි ජනරජයේ 13 වන සංශෝදනය 09 වැනි උපලේඛණයේ 01 වන ලැයිස්තුවේ 03 වන වගන්තිය ප්‍රකාරව පළාත් සභාවට බලතල පැවරීමේ විධිවිධානවලට අනුකූලව උතුරු මැද පළාත තුළ විධිමත් හා යහපත් මුල් ළමාවිය අධ්‍යාපනය සංවර්ධනය කිරීම පිණිස පෙර පාසල් පිහිටුවීම හා අනුසාංගික කාරණා සඳහා විධි

විධාන සැලසීම පිණිස ප්‍රඥප්තියක් පිහිටුවා ඇත. එය අංක 04 දරණ උතුරු මැද පළාතේ මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වන ලදි.

එය උතුරු මැද පළාත් සභාව විසින් සම්මත කර 2004 පෙබරවාරි මස 19 වන දින උතුරු මැද පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇත. ඒ අනුව උතුරු මැද පළාතේ ස්ථාපිත කර ඇති මුල් ළමාවිය ප්‍රඥප්තියට අනුව පෙර පාසල් පද්ධතිය ගොඩනැගීම සඳහා මේවන විට උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ලබා දුන් ප්‍රතිපාදන වලින් ගුරු පුහුණු වැඩසටහන් සඳහාද වැයකර ඇත.

ජාතියේ ජීවනාලිය වූ ළමා පරපුර, දැනුම, කුසලතා හා ආකල්ප වලින් සපිරි දරුවන් පිරිසක් බවට පත්කිරීමේ, අත්පොත් තබන්නේ මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධනයයි. පුංචි දරුවෙකුගේ උපතේ පටන් ප්‍රාථමික අවධියට පිවිසෙන, අවුරුදු 05 දක්වා කාලය වන රත්තරන් දින 1000 ට ඇතුලත්, අවුරුදු 3 – 5 අතර කාලය දරුවකුගේ ජීවිතයේ ඉතාම වැදගත් කාලයයි.

බුද්ධිමත් දරුවෙකු ලොවට දායාද කිරීමට මුල් ළමා අවධියේදී දරුවන්ගේ ඉගෙනුම් ක්‍රියාකාරකම්, කුසලතා වර්ධනය සඳහා ඔවුනට මානසික, ශාරීරික, සමාජ, චිත්තවේග, සෞන්දර්ය යන අංශ වර්ධනය විය යුතු ය. ඒ සඳහා උතුරු මැද පළාත් සභාව මගින් උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍ය ගරු පේෂල බංඩාර ජයරත්න මැතිතුමාගේ සංකල්පයකට අනුව මුල් ළමාවිය දරුවන් සංවර්ධනය කිරීමෙන් “විධිමත් ප්‍රාථමික අවධියකට දරුවා රැගෙන යමු” යන සංකල්පය යටතේ රුපියල් මිලියන 132 ක මුදලක් (රුපියල් ලක්ෂ 1320ක්) මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධනය වෙනුවෙන් වැය කරන ලදි.

**නව ආදර්ශ පෙර පාසල් 02ක්.**

(අනුරාධපුරට හා පොළොන්නරුවට මිලියන 30ක්)





නව ව්‍යාපෘති **250ක්.**

- පෙරපාසල් ගොඩනැගිලි අළුත්වැඩියා
- සෙල්ලම් මිදුල සැකසීම.
- ආරක්ෂිත වැට ඉදි කිරීම.

### පෙර පාසල් පිරියත සකස් කිරීම



එක් පෙර පාසලකට රුපියල් ලක්ෂය බැගින් ලබා දී පෙර පාසල් පිරියත සකස් කර ගැනීමට කටයුතු සිදුකරන ලදි. ඒ තුළින් පෙර පාසල් භූමිය අලංකාරව පවත්වාගෙන යාමට අවශ්‍ය මූලික මගපෙන්වීම හා අඩිතාලම සපයන ලදී.

### පෙර පාසල් ගුරුතුමියන් සඳහා රු.2000/- බැගින් මාසිකව දිමනාව ලබාදීම

මීටපෙර පෙර පාසල්වල ප්‍රධාන ගුරුවරියන් 1000ක් සඳහා පමණක් ලබාදුන් රු.1000/- ක මාසික දීමනාව



උතුරු මැද පළාතේ 2400 ක් වූ සියලුම පෙර පාසල් ගුරුතුමියන් සඳහා රු.2000/- බැගින් මාසිකව ලබාදීම සිදු විය. මෙය 100%ක දීමනාව වැඩිවීමක් වන අතර පෙර පාසල් පාලිකාවන් සඳහා ලබාදුන් අතිමහත් ධෛර්යයකි. ඒ සම්බන්ධයෙන් උතුරු මැද පළාත් පෙර පාසල් පාලිකාවන්ගේ අභිප්‍රේරණයද ඉහල මට්ටමක පවතින බව දැකිය හැකිය. එසේම මුල් ළමාවිය සංවර්ධනය උදෙසා පෙර පාසල් පාලිකාවන්ගේ දායකත්වය හා මුල් ළමාවිය සංවර්ධනය උදෙසාවන දායකත්වය ඉහළ නැංවීම සඳහාත් මෙම ව්‍යාපෘතිය ඉතාමත් වැදගත් වේ.

### එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් පැවැත්වීම.

පෙර පාසල් පාලිකාවන්ගේ පවතින දැනුම යාවත්කාලීනක කිරීම සඳහා නව ඉගැන්නුම් ක්‍රමවේද කෙරෙහි අවධානය යොමු කරමින් දැනුම යාවත්කාලීන කිරීම සඳහා අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පෙර පාසල් ගුරුවරියන් 100ක් සඳහා එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් නොමිලයේ පවත්වන ලදී.

### කොට්ඨාස මට්ටමින් දෙමාපිය වැඩසටහන් පැවැත්වීම.

මුල් ළමාවිය දරුවන්ගේ කායික මානසික සෞඛ්‍ය සංවර්ධනය කෙරෙහි මුල් ළමාවිය මධ්‍යස්ථානය තුළින් සැපයෙන මඟපෙන්වීම හා යොමු කිරීම පමණක්ම ප්‍රමාණවත් නොවන හෙයින් ඒ සඳහා එකී දූවා දරුවන්ගේ දෙමාපියන්ගේ ආකල්ප සංවර්ධනය කිරීමද ඉතාමත් වැදගත් බව හඳුනාගත් හෙයින් දෙමව්පියන්ගේ දායකත්වය හා කැපවීම ලබා ගැනීම සඳහා කොට්ඨාස මට්ටමින් දෙමාපිය වැඩසටහන් පැවැත්වීම 2016 වර්ෂයේදී සිදු විය.

### පෙර පාසල් යටිතල පහසුකම් සංවර්ධනය

පෙර පාසල්දරුවන්ගේ සංවර්ධනය සඳහා පෙර පාසල් භෞතික වශයෙන් සංවර්ධනය කර දරුවන්ට විවිධ ක්‍රියාකාරකම්, හසුරු කුසලතා සඳහා අවස්ථාව සලසා දීම.මේ සඳහා පූර්ව ළමාවිය මධ්‍යස්ථානවල අත්‍යාවශ්‍ය යෙන්ම සංවර්ධනය විය යුතු අංග කෙරෙහි අවධානය යොමු කරමින් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු විය.ඒ යටතේ පූර්ව ළමාවිය සංවර්ධනය මධ්‍යස්ථානය, සෙල්ලම් මිදුල,සනීපාරක්ෂක පහසුකම් සැපයීම කෙරෙහි වැඩි අවධානය 2016 වර්ෂයේදී යොමු විය.

### පෙර පාසල් ගුරුවරියන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.

පෙර පාසල් ගුරුවරියන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය පුහුණුකරුවන් පුහුණු කර ගැනීමේ වැඩසටහන්ද 2016 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලදී. .මේ යටතේ විවිධ වැඩසටහන් පැවැත්වූ අතර ඒ තුළින් ළමා මනස වටහා ගැනීමටත් ක්‍රියාකරකම් පාදක කරගත් මුල් ළමාවිය සංවර්ධනය සඳහා ඔවුන් ධෛර්යයමත් කිරීමටත් අවශ්‍ය අභිප්‍රේරණය ලබා දෙන ලදී. සියලුම පෙර පාසල් ගුරුවරියන් සඳහා උතුරු මැද පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 29 හි තෙදින ගුරු ධාරිතා පුහුණු වැඩසටහන් පැවැත්වීම සිදු විය.

එසේම වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදි අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා ආයතන අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් අනෙකුත් පාර්ශවකරුවන්ද සමග සහයෝගයෙන් කටයුතු කරමින් සංවර්ධන කාර්යාවලිය මෙහෙයවීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ඉලක්ක ලඟා විමටත් ආයතනයේ කාර්ය සාධනය ඉහල නැංවීමට හැකි විය.

# 6.4

# පුස්තකාල සේවා මණ්ඩලය

### ඉදිරි දැක්ම

"උතුරු මැද පළාත තුළ යහපත් පුස්තකාල සහ තොරතුරු සේවාවක් පවත්වා ගෙන යෑම".

### මෙහෙවර

"යහපත් පුස්තකාල සහ තොරතුරු සේවාවක් පවත්වාගෙන යාම තුළින් පොත පත කියවීමෙන් දැනුම, ආකල්ප, කුසලතා වලින් පිරිපුන් සංවේදී බුද්ධිමත් ජන සමාජයක් ගොඩනැගීම".




### ප්‍රධාන කාර්යයන්

- උතුරු මැද පළාතේ පුස්තකාල සහ තොරතුරු සේවා කටයුතු සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම හා සම්බන්ධීකරණය
- පුස්තකාල සංවර්ධනයට අවශ්‍ය කටයුතු සැලසුම් කිරීම.
- පළාත් වාසී පාඨකයන් සඳහා පුස්තකාල සහ තොරතුරු සේවා සැපයීම.
- පුස්තකාල සේවා ව්‍යාපෘතියකට අවශ්‍ය වන්නා වූ සාමූහික ප්‍රතිග්‍රහණය, මධ්‍යගත සැලසුම්කරණය, ඒකාබද්ධ සූචීන් සම්පාදනය, ප්‍රාදේශීය එකතුන් සංවර්ධනය කරලීම, අන්තර් පුස්තකාල පිරුළු සේවා, ජංගම පුස්තකාල සේවා, විඥාපන ජාල පිහිටුවීම සහ අදාළ අනෙකුත් කටයුතු සිදු කිරීම.
- පොත් පත්, වාර සඟරා ඇතුළු මුද්‍රිත මාධ්‍ය, ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය සහ පරිගණගත තොරතුරු සේවාවන් යොදා ගනිමින් පළාත තුළ උසස් මට්ටමේ තොරතුරු සේවාවක් පවත්වාගෙන යෑම.
- පොත්පත් හා ලේඛණ උතුරු මැද පළාතට විශේෂිත වූ දුර්ලභ ලිපි ලේඛණ හා ග්‍රන්ථයන්හි අත්පිටපත්, පුස්කොළ පොත් ආදිය රැස් කිරීම හා සංරක්ෂණය.
- ජාතික, ජාත්‍යන්තර හා කලාපීය තොරතුරු ජාල හා සේවාව සම්බන්ධ වීම.
- පළාත් සභාව ක්‍රියාත්මක කරනු ලබන විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය තොරතුරු සහ දත්ත සැපයීම මගින් සහය වීම.
- පුස්තකාල කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා උසස් කිරීම් පටිපාටි, විභාග පටිපාටි සකස් කිරීම.

- දැනට පවත්වාගෙන යන පුස්තකාල පිළිබඳ අධ්‍යයනය කිරීම තුළින් අදාළ පුස්තකාල සංවර්ධනය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- පළාතේ පුස්තකාල හා තොරතුරු සේවා සංවර්ධනය සඳහා සුදුසු වෙනත් පියවර ගැනීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- පාසල් හා මහජන පුස්තකාල සඳහා පොත් හා පුස්තකාල කබඩ් ලබා දීම.
- පාසල්, පිරිවෙන් හා මහජන පුස්තකාලයන්හි සේවය කරන කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.
- පාඨක සමාජ හා කියවීම් කඳවුරු පැවැත්වීම.
- නිර්මාණ තරඟ පැවැත්වීම.
- ස්වයං නිර්මාණ දිරිගැන්වීම සඳහා විවිධ වැඩසටහන් සංවිධානය.

## කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 09 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 07 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 02 |

## මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව අනෙකුත් පුනරාවර්තන වියදම් | 1.83 | 1.83 | 0.00 | 100 |
| එකතුව | 1.83 | 1.83 | 0.00 | 100 |

## මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| එකතුව | 30.00 | 22.86 | 7.13 | 76.20 |

**මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්යසාධනය**

| ව්‍යාපෘතිය | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| **අනුරාධපුර** | | | |
| තඹුත්තේගම නගරයේ අංග සම්පූර්ණ පුස්තකාලයක් ඉදි කිරීම | 10.00 | 8.33 | 83.30 |
| තඹුත්තේගම ඉදි කරන ලද පුස්තකාලයට පොත් හා උපකරණ ලබා ගැනීම | 2.00 | 0.00 | 0 |
| පුස්තකාල 70 ක් සඳහා පොත් මිලදී ගැනීම | 0.90 | 0. 90 | 100 |
| පුස්තකාල 70 ක් සඳහා කබඩ් මිලදී ගැනීම | 1.20 | 1.20 | 100 |
| පුස්තකාල පාඨක සමාජ 60 ක් ඇති කිරීම | 0.06 | 0.06 | 100 |
| කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන් 4 ක් පැවැත්වීම | 0.31 | 0.31 | 100 |
| කියවීම් කඳවුරු 30 ක් පැවැත්වීම | 0.04 | 0.0 4 | 100 |
| **පොළොන්නරුව** | | | |
| පුස්තකාල 40 ක් සඳහා පොත් මිලදී ගැනීම | 0.60 | 0. 60 | 100 |
| පුස්තකාල 40 ක් සඳහා කබඩ් මිලදී ගැනීම | 0.80 | 0.80 | 100 |
| පුස්තකාල පාඨක සමාජ 40 ක් ඇති කිරීම | 0.04 | 0.04 | 100 |
| කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන් 3 ක් පැවැත්වීම | 0.20 | 0.20 | 100 |
| කියවීම් කඳවුරු 20 ක් පැවැත්වීම | 0.06 | 0.06 | 100 |
| පොළොන්නරුව නගරයේ අංග සම්පූර්ණ පුස්තකාලයක් ඉදි කිරීම | 10.00 | 8.64 | 86.40 |
| පොළොන්නරුව නගරයේ ඉදි කරන ලද පුස්තකාලයට පොත් හා උපකරණ ලබා ගැනීම | 2.00 | 0.00 | 0 |
| **පොදු** | | | |
| නිර්මාණ තරඟාවලිය පැවැත්වීම හා තෝරාගත් ප්‍රකාශන 4 ක් මුද්‍රණය කිරීම | 0.22 | 0.15 | 68.18 |
| තෝරාගත් සාර්ථක නිර්මාණ 7 ක් සඳහා මුද්‍රණ ආධාර ලබාදීම | 0.20 | 0. 20 | 100 |
| ස්වයං නිර්මාණ දිරිගැන්වීමක් වශයෙන් ඔවුන්ගේ නිර්මාණ 50 ක් මිලදී ගැනීම | 0.80 | 0.78 | 97.5 |

| | | | |
|---|---|---|---|
| තෝරාගත් සාර්ථක නිර්මාණ 7 ක් සඳහා මුද්‍රණ ආධාර ලබාදීම | 0.09 | 0.06 | 66.67 |
| පුස්තකාල කබඩ් ලබා ගැනීම. | 0.48 | 0.47 | 97.91 |
| **එකතුව** | **30.00** | **22.83** | **70.33** |

**2016** වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ ගී රස වින්දන වැඩසටහන් 02ක් සඳහා ශිල්පීන්ගෙන් දින වෙන් කර ගැනීමට නොහැකි වූ අතර ලබා දුන් දිනයන් පාසල් සිසුන්ගේ විභාග දිනයන් වූ බැවින් එම වැඩසටහන් අවලංගු කර එම මුදල් පුස්තකාල කබඩ් ලබා ගැනීම සඳහා යොදවන ලදි.

## 01. සාර්ථක නිර්මාණ ප්‍රකාශන සඳහා අනුග්‍රහය දැක්වීම හා නිර්මාණකරණය දිරිගැන්වීම.

| අනු අංකය | කර්තෘ | ග්‍රන්ථ නාමය | මුද්‍රණ ආයතනය | ලබා දුන් මුදල (රු.මි) |
|---|---|---|---|---|
| 01 | රත්න බී. ඒකනායක | සුදු ඇඳගත්තෝ | සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය | 0.03 |
| 02 | කේ. ආර්. තිලකරත්න බණ්ඩා | පොඩි බණ්ඩයියා | සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය | 0.02 |
| 03 | නිමල් උඩගෙදර | දිය බුබුළ | පියසිරි මුද්‍රණාලය | 0.02 |
| 04 | රත්න බී. ඒකනායක | අප්පච්චි | අස්ලිය ප්‍රින්ටර්ස් | 0.03 |
| 05 | එල්.පී. ධාර්මිකා ඒකනායක | සූස් සූස් සූස් | සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය | 0.02 |
| 06 | තිලක් අශෝක බණ්ඩාර | නොනිමෙන තරු | සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය | 0.01 |
| 07 | කේ.බී.සී. රත්නායක | විජේපාල උන්නැහේ රජවෙලා | සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය | 0.03 |
| 08 | ඩබ්.එම්.බී. කරුණාරත්න | අප්පා නැති දරුවෙක් | සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය | 0.45 |
| 09 | බී .ජේ. රණසිංහ මිය | දහම් මැදුර | අස්ලිය ප්‍රින්ටර්ස් | 0.04 |
| **එකතුව** | | | | **0.24** |

මුද්‍රණ ආධාර ලබා දීමේ ව්‍යාපෘතිය යටතේ ග්‍රන්ථ මුද්‍රණය කිරීම සඳහා ආධාර ලබා දුන් අතර ඒ තුළින් පළාතේ නිර්මාණකරුවන් දිරි ගැන්වීමට පියවර ගන්නා ලදී. ඒ ෙස්ම සාර්ථක නිර්මාණ ප්‍රකාශන සඳහා අනුග්‍රහය දැක්වීම හා නිර්මාණකරණය දිරිගැන්වීම සඳහා මනා පිටුවහලක් ඉහත කී ව්‍යාපෘතිය තුළින් කිරීමට හැකි විය.



පොතේ නම පොඩි බණ්ඩයියා

කර්තෘ කේ. ආර්. තිලකරත්න බණ්ඩා




| | |
|---|---|
| පොතේ නම | සුදු ඇඳ ගත්තෝ |
| කර්තෘ | රත්න බී ඒකනායක |
| මුද්‍රණ ආධාර ලබා දුන් මුදල | 33,000.00 |
| මුද්‍රණ ආයතනය | අස්ලිය මුද්‍රණාලය, කුරුණෑගල |




| | |
|---|---|
| පොතේ නම | දිය බුබුළ |
| කර්තෘ | කේ.ආර්.තිලකරත්න |
| මුද්‍රණ ආධාර ලබා දුන් මුදල | 20,000.00 |
| මුද්‍රණ ආයතනය | පියසිරි මුද්‍රණාලය, නුගේගොඩ |




| | |
|---|---|
| පොතේ නම | අප්පච්චී |
| කර්තෘ | රත්න බී ඒකනායක |
| මුද්‍රණ ආධාර ලබා දුන් මුදල | 30,000.00 |
| මුද්‍රණ ආයතනය | අස්ලිය මුද්‍රණාලය, කුරුණෑගල |

**02. ස්වයං නිර්මාණ දිරිගැන්වීමක් වශයෙන් ඔවුන්ගේ නිර්මාණ මිලදී ගෙන පුස්තකාල සඳහා නොමිලේ බෙදා දීම.**

මේ වන විට පොත් 27 ක් මිලදී ගෙන ඇත.

| අනු අංකය | පොතේ නම | කර්තෘ | මිල (රු) | පිටපත් ගණන | ගෙවූ මුළු මුදල (රු) |
|---|---|---|---|---|---|
| 1 | සංගීත අධ්‍යාපනයේ ගමන් මඟ | ඉරංගා සමින්දනී වීරක්කොඩි | 800.00 | 50 | 28,000.00 |
| 2 | චින්තන රේඛා තුලින් ජීවන රටා | කොහොලන්වෙල කරුණාපාල | 275.00 | 100 | 19,250.00 |
| 3 | ජන යහගුණ දිවි පැවතුම | පාලිත ශ්‍රී ගීගන ආරච්චිගේ | 250.00 | 50 | 8,750.00 |
| 4 | කිරි කුරහන් | සුනන්දා විජයලතා මුණසිංහ | 250.00 | 100 | 17,500.00 |
| 5 | කවි සයුර | කමලා විල්සන් | 150.00 | 100 | 10,500.00 |
| 6 | සිංහල සිනමාව සහ මම | සනත් ගුණතිලක | 600.00 | 200 | 84,000.00 |
| 7 | පාර | යනූෂා ලක්මාලී | 250.00 | 50 | 8,750.00 |
| 8 | යක්දෙහි කන්ද | යනූෂා ලක්මාලී | 275.00 | 50 | 9,625.00 |
| 9 | මඩුවන්වෙල | යනූෂා ලක්මාලී | 400.00 | 50 | 14,000.00 |
| 10 | පතොක් කටු | ශක්තික සත්කුමාර | 175.00 | 50 | 6,125.00 |
| 11 | බලපුළුවන්කාරයෝ | | 350.00 | 100 | 24,500.00 |
| 12 | අකලට ආ ඉස්කෝලේ | ගුණසේකර ගුණසෝම | 580.00 | 50 | 20,300.00 |
| 13 | ලොව වටා මුහුදු ගමනක් | ගුණසේකර ගුණසෝම | 420.00 | 50 | 14,700.00 |
| 14 | දෑස අහිමි වූ දියණිය | ඩී.ඩී.ආරියවතී | 300.00 | 50 | 10,500.00 |
| 15 | අපේ පුංචි කැදැල්ල | ඩබ්.හෂානි වාසනා | 150.00 | 100 | 10,500.00 |
| 16 | අකඩසර | රජරට පැදි නදිය | 275.00 | 100 | 19,250.00 |
| 17 | ශ්‍රී ලංකාවේ පැරණි පොත්ගුල .... | අශෝකා ශ්‍රියානී | 300.00 | 150 | 31,500.00 |
| 18 | මහ කැලේයාම | පූජ්‍ය වත්තේවැව ධම්මානන්ද හිමි | 350.00 | 100 | 24,500.00 |
| 19 | මළගිය ඇත්තෝ නවකතා විමර්ශනය | ශක්තික සත්කුමාර | 150.00 | 50 | 5,250.00 |
| 20 | ඉරණම්කාරයෝ | කේ.ආර්.තිලකරත්න බණ්ඩා | 250.00 | 85 | 14,875.00 |
| 21 | වැලපෙන මුහුද | ගාමිණී ප්‍රනාන්දු | 200.00 | 50 | 7,000.00 |
| 22 | ගොළු මුහුද වියරු වී | කොහොලන්වෙල කරුණාපාල | 125.00 | 50 | 4,375.00 |
| 23 | රළු මුහුද | කොහොලන්වෙල කරුණාපාල | 150.00 | 50 | 5,250.00 |
| 24 | දෙවැනි හුවෙන් පසු | කොහොලන්වෙල කරුණාපාල | 125.00 | 50 | 4,375.00 |
| 25 | සිංහල ජාතියේ ප්‍රභවය හා පරිණාමය | ඒ.කේ.තිලකරත්න | 300.00 | 100 | 21,000.00 |
| 26 | වරිගක්කාරයෝ | සුනේත්‍රා අලුත්දුන්න | 300.00 | 50 | 10,500.00 |
| 27 | බුදුන් දේශිත චතුරාර්ය සත්‍ය | ඒ.කේ.තිලකරත්න | 300.00 | 100 | 21,000.00 |
| 28 | මිණිමුතු අකුරු හුරුව | ජේ.එම්.එම් ජයසුන්දර | 240.00 | 50 | 8,400.00 |
| 29 | මායා රංජන් | ගුණසේකර ගුණසෝම | 350.00 | 50 | 12,250.00 |
| 30 | හඳයයි බූලයි | මිතුන් අර්චන චන්ද්‍රසේකර | 150.00 | 100 | 10,500.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 31 | සාර්ථක ජීවිතයකට බුදු දහම | එච්.ජේ ප්‍රයන්ත කුමාර | 350.00 | 50 | 12,250.00 |
| 32 | සිත් සයුරෙන් තුෂර බිඳක් | මාලිණී පද්මලතා අනුරාධපුර | 350.00 | 50 | 12,250.00 |
| 33 | මට මතක ගම | පද්මා ගුණසේකර | 650.00 | 50 | 22,750.00 |
| 34 | මාළින්දලාගේ වික්‍රමය | කේ වයි ජී වනිගසේකර | 300.00 | 100 | 21,000.00 |
| 35 | අලි පැංචයි හා පැංචයි | මිළිදු ගිම්හාන විජේරත්න | 160.00 | 100 | 11,200.00 |
| 36 | ලිංකල් ඩිගෝල් | ගුණසිංහ හේරත් | 400.00 | 50 | 14,000.00 |
| 37 | හිමි අහිමි | හේමසිරි නානායක්කාර | 200.00 | 50 | 7,000.00 |
| 38 | ඉරිච්ච සඳ | මංජුල සෙනවිරත්න | 300.00 | 50 | 10,500.00 |
| 39 | ලංකා දේශපාලනයේ සේනානායකවරු | පී ඇම් සේනාරත්න | 650.00 | 50 | 22,750.00 |
| 40 | දෝලි | ප්‍රේමකීර්ති රණතුංග | 520.00 | 25 | 9,100.00 |
| 41 | මුතු වසන්තය | ප්‍රේමකීර්ති රණතුංග | 480.00 | 50 | 16,800.00 |
| 42 | වකුගඩු සටන | චන්න සුදත් ජයසුමන | 750.00 | 50 | 26,250.00 |
| 43 | ඉංදියාව සැබවින්ම අසිරිමත් දේශයකි | එල් එස් චන්ද්‍ර සෝම | 250.00 | 50 | 8,750.00 |
| 44 | අධ්‍යාපන සාමාන්‍ය දැනිම | ආර් එම් එස් රාජපක්ෂ | 450.00 | 25 | 7,875.00 |
| 45 | අධ්‍යාපන පරිපාලනයට න්‍යායාත්මක....... | ආර් එම් එස් රාජපක්ෂ | 500.00 | 25 | 8,750.00 |
| 46 | දැනමුතු ආතාගේ කථා-2 | දිනුක මධුෂාන් වන්නිනායක | 325.00 | 50 | 11,375.00 |
| 47 | ප්‍රේමය ඇත්තේ කොහිද | දිනුක මධුෂාන් වන්නිනායක | 250.00 | 50 | 8,750.00 |
| 48 | පොඩි මාමා | දික් ඇල්ලේ විජයතිලක | 320.00 | 50 | 11,200.00 |
| 49 | සිංහල වියරණ විමසුම | කමල් විජිත කුමාර | 220.00 | 50 | 7,700.00 |
| 50 | පියගැට පෙල | සාලිය දිසානායක | 300.00 | 45 | 9,450.00 |
| 51 | සපත්තු පාලම | දිනිල් ඩී ලියනගේ | 300.00 | 45 | 9,450.00 |
| 52 | ස්වර්ණ හංස | ඩබ් එස් ලියනගේ | 250.00 | 45 | 7,875.00 |
| 53 | ඔපාදූපකාරයෝ | දිනුක මධුෂාන් වන්නිනායක | 150.00 | 41 | 4,305.00 |
| 54 | චරන්දාස් | පරාක්‍රම නිරිඇල්ල | 400.00 | 26 | 7,280.00 |
| 55 | චරන්දාස් (දෙමළ) | පරාක්‍රම නිරිඇල්ල | 500.00 | 11 | 3,850.00 |
| එකතුව | | | | | **779,485.00** |

ස්වයං නිර්මාණ දිරිගැන්වීම යටතේ පුස්තකාල සේවා මණ්ඩලය විසින් මිලදී ගත් කෘතීන් ප්‍රධාන අමාත්‍යතුමාට පිළිගැන්වීම. (2016.12.12 පොළොන්නරුව රාජකීය විද්‍යාලයීය ශ්‍රවණාගාරය.)



**ඉරිච්ච සඳ**
මංජුල සෙනවිරත්න



**මාළින්දලාගේ වික්‍රමය**
කේ.වයි.ජී.වනිගසේකර

## 2016 වර්ෂයේ ස්වයං නිර්මාණ මිලදී ගැනීමේ ව්‍යාපෘතිය යටතේ මිලදී ගත් කෘතීන් කිහිපයක්



































## 03. කාර්යය මණ්ඩලය පුහුණු කිරීමේ වැඩසටහන් ව්‍යාපෘතිය 2016

| අනු අංකය | පුහුණු වැඩසටහන | මුදල (රු.මි) |
|---|---|---|
| 01 | පුස්තකාලයක සම්පත් තෝරා ගැනීම, ප්‍රතිග්‍රහණය සහ පිරිසැකසුම්කරණය (තාක්ෂණික කටයුතු) | 0.51 |
| 02 | දිස්ත්‍රික්කයේ පාසල් පුස්තකාලයාධිපතිවරුන් සඳහා එක් දින පුහුණු වැඩමුළුව | |
| 03 | පාසල් පුස්තකාලය සංවිධානය සඳහා පුස්තකාලයාධිපතිවරුන් සඳහා එක් දින පුහුණු වැඩමුළුව | |
| 04 | පාසල් පුස්තකාලය සංවිධානය හා නව තාක්ෂණය පාසල් පුස්තකාල සඳහා යොදා ගැනීම | |

## 04. අඩු පහසුකම් සහිත පාසල් සඳහා පොත් හා පුස්තකාල ද්‍රව්‍ය ලබා දීම.

2016 වර්ෂයේ පාසල් 110ක් සඳහා පුස්තකාල කබඩ් හා පොත් කට්ටල ලබා දීම සිදු විය

## 05. අංග සම්පූර්ණ පුස්තකාල දෙකක් ඉදි කිරීම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉදි කරනු ලබන පුස්තකාලය තඹුත්තේගම නගරයේ ඉදි කරනු ලබන අතර පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඉදි වන පුස්තකාලය දිඹුලාගල නගරයේ ඉදි වේ.



උතුරු මැද පළාත් පුස්තකාල සේවා මණ්ඩලය උතුරු මැද පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශය මඟින් පාලනය වන ආයතනයකි. නිලධාරීන් 09 දෙනෙක්ගෙන් සමන්විත මෙම ආයතනය 2010 වර්ෂයේ ආරම්භ කරන ලද අතර 2014 වර්ෂයේ සිට උතුරු මැද පළාතේ ජීවත් වන පාසල් දරුවන් හා මහ ජනතාවගේ කියවීම් කුසලතාව සහ ලිවීමේ හැකියාව වර්ධනය කිරීමේ අරමුණින් ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මකකර ඇත. එසේම වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා ආයතන අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් අනෙකුත් පාර්ශවකරුවන්ද සමග සහයෝගයෙන් කටයුතු කරමින් කාර්යාවලිය මෙහෙයවීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ඉලක්ක ලඟා විමටත් ආයතනයේ කාර්ය සාධනය ඉහල නැංවීමට හැකි විය.

.

07

# 7.පළාත් කෘෂිකර්ම, නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය, ධීවර සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

## 7.1.පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

## 7.2.පළාත් සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

07

# පළාත් කෘෂිකර්ම, නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය, ධීවර සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

### ඉදිරි දැක්ම

" ඉසුරුමත් භූමියක්, අසිරිමත් ගොවි කැළක් "

### මෙහෙවර

"කෘෂිකර්ම, කෘෂි හා සත්ත්ව නිෂ්පාදන ප්‍රවර්ධන හා අලෙවි, සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය, ධීවර සහ නිවාස කටයුතු, සියලු පාර්ශ්වකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිද භාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම".

### දිගු කාලීන හා කෙටි කාලීන අරමුණු

### දිගුකාලීන අරමුණු

ජාතික ප්‍රතිපත්තීන්ට අනුගත වෙමින් පළාත් ප්‍රතිපත්ති සැකැස්ම හා වැඩසටහන් සැලසුම් කිරීම ඔස්සේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සම්ප්‍රදායන් රැක ගනිමින් සහ නවීන තාක්ෂණයට අනුගත වෙමින් කෘෂිකාර්මික අස්වැන්න සහ නිෂ්පාදනය ඉහළ නැංවීමෙන් මෙම පළාතේ 80 % ක් වූ ගොවි ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම, පළාතේ කෘෂිකර්මාන්තයටත්, ජනතාවටත් හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට මනා දායකත්වයක් සැපයීමත්, පළාතේ ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කරමින් ජාතික සංවර්ධනය ඉහළ නැංවීමට දායක වීමත්, අඩු ආදායම් ලාභීන්ගේ නිවාස පුනරුත්ථාපනය සඳහා සහයෝගය ලබාදීමෙන් ආරක්ෂිත නිවහනක් ස්ථාපනය කිරීම මෙම අමාත්‍යාංශයේ දිගු කාලීන අරමුණු වන්නේ ය.

### කෙටිකාලීන අරමුණු

දේශීය සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම සහ නව කෘෂි තාක්ෂණික දැනුම මෙන්ම සාම්ප්‍රදායික දැනුම ප්‍රචලිත කිරීම ජාතික අවධානයට ලක් කිරීම තුළින් දිගු කාලීන පරමාර්ත ළඟාකර ගැනීමේ අරමුණින් පොදු සහ එකිනෙකට බැඳුණු වැඩසටහන් අමාත්‍යාංශය සහ අදාල දෙපාර්තමේන්තු කාර්යයන් තුළ ඒකාබද්ධ කිරීම මෙන්ම ප්‍රතිපත්ති තීරණය කිරීම සහ ඊට අදාල ක්‍රමවේද සැකසීම, නියාමනය හා එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දෙපාර්තමේන්තු මෙහෙයවීම.

1. 2014 වසරේ ආරම්භ කළ කෘෂි නිෂ්පාදන අලෙවි සමිති ජාලය තුළින් උතුරු මැද පළාත තුළ ගොවීන් කෘෂිකාර්මික කටයුතු සඳහා සංවිධානය කිරීම හා කෘෂි නිෂ්පාදන

අලෙවි පහසුකම් ඇති කරලීම සඳහා මහපෙන්වීම හා චක්‍රීය ණය යෝජනා ක්‍රම මෙන්ම ඒ පිළිබඳව කෘෂි සමිති නිලධාරින් දැනුවත් කිරීම හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

2. අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු දෙක මගින් සැලසුම් කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රතිලාභ පළාතේ ගොවීන් වෙත ලබාදීම හා ඒවා වඩා ඵලදායී අයුරින් සිදු කිරීම සඳහා අධීක්ෂණ කටයුතු සිදු කිරීම.

3. කෘෂි නිෂ්පාදන අලෙවි සමිති පදනම් කරගෙන කෘෂිකර්මාන්තයේ නියැලෙන ගොවි ජනතාව සඳහා නව කෘෂි නිෂ්පාදන ක්‍රමවේද මෙන්ම තාක්ෂණික දැනුම කේන්ද්‍ර කරගත් විධිමත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

4. දේශීය බීජ ප්‍රවර්ධනය හා වස විෂ නැති ආහාර නිෂ්පාදනයට ගොවීන් පෙළඹවීම තුළින් පරිසර තුල්‍යතාවය ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම.

5. පළතුරු ගම්මාන වැඩසටහන, කාබනික පොහොර නිෂ්පාදනය, අතිරේක බෝග වගාව, දේශීය බෝග ප්‍රවර්ධනය සහ බෝග කලාපීයකරණ වැඩසටහන්වලට ප්‍රමුඛත්වය ලබාදීම.

6. නිෂ්පාදන ඉහළ නැංවීම ඉලක්ක කරගත් දැනුම, කුසලතා වර්ධනය, නවීන තාක්ෂණ ක්‍රමවේද මෙන්ම යෝග්‍ය තාක්ෂණ ක්‍රමවේද පහසුවෙන් සහ ඉක්මණින් ගොවීන් වෙත ලබා ගැනීමේ කෙටි කාලීන වැඩපිළිවෙලක් සකස් කිරීම.

7. ජාතික සංවර්ධන ක්‍රියාවලියේ දායකත්වයට ගොවි කාන්තාවන්ගේ සහභාගීත්වය කෘෂිකර්ම, සත්ව පාලන ක්ෂේත්‍රයෙහි උපරිම අයුරින් ලබාදීම සඳහා උපාය මාර්ග සංවිධානය කිරීම.

8. මධ්‍යම හා මහා පරිමාණ කෘෂිකාර්මික ආයෝජන ක්ෂේත්‍රයන් සඳහා පෞද්ගලික අංශයේ සහාය ලබා ගැනීම.

9. කෘෂි නිෂ්පාදනයන් සඳහා අගය එකතු කිරීමේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම.

10. උතුරු මැද පළාතේ කිරි නිෂ්පාදනයේ අවශ්‍යතාවයන් අගය එකතු කිරීමේ වැඩසටහන් සහ ප්‍රමුඛතාවයන් දැක්වෙන වැඩසටහන් හඳුන්වා දීම.

11. උතුරු මැද පළාත තුළ අභ්‍යන්තර ජලජීවී වගාව හා මත්ස්‍ය සම්පත ඉහළ දැමීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් පළාතේ සත්ව ප්‍රෝටීන සුලබ කිරීමත් එමගින් ධීවර කාර්මිකයින්ගේ ජීවන තත්ත්වය උසස් කරලීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

12. විධිමත් මෙහෙයුම් සහ තොරතුරු පද්ධතියක් සඳහා අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු ඒකාබද්ධව පළාත් මට්ටමේ වැඩසටහන් සංවිධානය කිරිම.

13. දේශීය ආහාර නිෂ්පාදන තාක්ෂණය දියුණු කිරීම සහ පරිභෝජනය සුලභ කිරීම.

14. පළාත්වාසී අඩු ආදායම්ලාභීන්ගේ නිවාස පුනරුත්තාපනය සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම.

## ප්‍රධාන කාර්යයන් හා ප්‍රධාන උපාය මාර්ගයන්

| අනු අංකය | ප්‍රධාන කාර්යයන් | උපාය මාර්ග (ය) |
|---|---|---|
| 01 | ගොවි ප්‍රජාව සංවිධානය කිරීම හා ආයතනගත කිරීම. | • මූලික දැනුවත් කිරීමේ වැඩසටහන්<br>• කුඩා කණ්ඩායම්<br>• ප්‍රාදේශීය කණ්ඩායම්<br>• කණ්ඩායම් පුහුණු කිරීමේ වැඩසටහන්<br>• සංවිධාන ලියාපදිංචි කිරීම |
| 02 | පාරම්පරික දේශීය බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා ව්‍යාප්ත කිරීම. | • කුඩා කණ්ඩායම්<br>• සහන පදනම මත යෙදවුම් ලබා දීම<br>• පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් |
| 03 | සෞඛ්‍යයට හිතකර ආහාර නිෂ්පාදනය හා ප්‍රවර්ධනය. | • කාබනික ගොවිපල වැඩසටහන්<br>• කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රවර්ධනය<br>• අලෙවි සැල්<br>• පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් |
| 04 | කෘෂිකර්මාන්තයේ ඵලදායීතාවය වර්ධනය කිරීම. | • සාමාන්‍ය කෘෂිකාර්මික උපකරණ හා යන්ත්‍ර සූත්‍ර ලබා දීම<br>• නවීණ කෘෂිකාර්මික උපකරණ හා යන්ත්‍ර සූත්‍ර ලබා දීම<br>• පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>• ඒකාබද්ධ ගොවිපළ ප්‍රවර්ධනය කිරීම |
| 05 | උස්බිම් කෘෂිකර්මාන්තය සංවර්ධනය කිරීම. | • වගා ළිං පුනරුත්තාපනය හා ආශ්‍රිත කෘෂිකාර්මික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>• පුහුණු වැඩසටහන් පැවැත්වීම |
| 06 | ගෘහස්ත ආදායම් උත්පාදනය ඉහළ නැංවීම. | • නිදැලි කුකුළු පාලන වැඩසටහන්<br>• ගෙවතු වගා වැඩසටහන්<br>• මී මැසි පාලනය<br>• ගුණාත්මක සහල් නිෂ්පාදන වැඩසටහන්<br>• පුහුණු හා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |
| 07 | පළතුරු වගා ගම්මාන ප්‍රවර්ධනය හා අපනයන පළතුරු බෝග හඳුන්වාදීම | • අන්නාසි වගා වැඩසටහන්<br>• වැල් දොඩම් / බද්ධ පැණි දොඩම් වගා වැඩසටහන්<br>• TEJC වගා ව්‍යාප්තිය<br>• පුහුණු හා ප්‍රවර්ධන වැඩසටහන් |

| | | |
|---|---|---|
| 08 | ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම. | • ධීවර ප්‍රජා සුභසාධනය<br>• මත්ස්‍ය බීජ නිෂ්පාදනය<br>• මත්ස්‍ය බීජ තැන්පත් කිරීම<br>• ධීවර ආම්පන්න ආධාර<br>• පුහුණු හා ධාරිතා ප්‍රවර්ධන වැඩසටහන්<br>• මත්ස්‍ය අලෙවිය<br>• පසු අස්වනු තාක්ෂණ කටයුතු හා අගය එකතු කිරීම<br>• ජල ජීවී පොකුණු සංවර්ධනය<br>• විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය<br>• මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන ඇති කිරීම<br>• ෆයිබර් ග්ලාස් ඔරු ලබා දීම |
| 09 | අතිරේක බෝග වගා ප්‍රවර්ධනය | • උතුරු මැද පළාත තුළ වගා කළ හැකි බීජ සහන පදනම මත ලබා දීම<br>• පාංශු සංරක්ෂණය<br>• බෝග මාරු වැඩසටහන්<br>• බීජ නිෂ්පාදන වැඩසටහන් |
| 10 | නිවාස පුනරුත්තාපනය හා පිළිසකර කිරීම | • සෙවිලි තහඩු ලබාදීම<br>• සිමෙන්ති ආධාර ලබාදීම<br>• නිවාස පුනරුත්තාපනය සඳහා මූල්‍යාධාර ලබාදීම |
| 11 | ආයතන නියාමනය කිරීම. | • අධීක්ෂණය/පසු විපරම හා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම<br>• අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම, වැඩමුළු පැවැත්වීම<br>• දැනුවත් කිරීම් හා පුහුණු |
| 12 | ආයතනික ධාරිතා ප්‍රවර්ධනය කිරීම. | • පුහුණු වැඩසටහන්<br>• ක්ෂේත්‍ර අධ්‍යයන<br>• අධ්‍යයන චාරිකා<br>• භාණ්ඩ හා උපකරණ මිලට ගැනීම |

### කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 73 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 60 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 13 |
| අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික පදනමේ සිටින සංඛ්‍යාව | 01 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 37.65 | 37.97 | 0.32 | 100.82 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 17.27 | 13.20 | 4.07 | 76.45 |
| **එකතුව** | **54.93** | **51.17** | **4.39** | **93.16** |

### මූලධන වියදම්

| වියදමේ ස්වාභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | ෙ2වර්ෂය වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0.60 | 0.44 | 0.16 | 74.10 |
| යන්ත්‍ර සූත්‍ර සවිකිරීම් හා උපකරණ | 0.87 | 0.86 | 0.01 | 98.67 |
| වාහන | 2.90 | 2.42 | 0.48 | 83.34 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 0.20 | 0.03 | 0.17 | 16.41 |
| **එකතුව** | **4.57** | **3.75** | **0.82** | **82.11** |

### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය

| අංකය | ව්‍යාපෘතිය | ඉලක්කය | වෙන්කළ ප්‍රතිපාදන (රු) | වියදම (රු.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| 1. | කෘෂි අලෙවි සමිති සාමාජිකයින්ගේ හා අමාත්‍යාංශ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම | ♦ විසිතුරු මල් වගා පුහුණු වැඩසටහන් පැවැත්වීම<br>♦ කෘෂි අලෙවි සමිති සාමාජිකයින් සඳහා බිම්මල් වගා පුහුණු වැඩසටහන් පැවැත්වීම<br>♦ කාබනික පොහොර නිෂ්පාදන පුහුණු වැඩසටහන් පැවැත්වීම<br>♦ මී මැසි පාලන පුහුණු වැඩසටහන් පැවැත්වීම මඟින් කෘෂි අලෙවි සමිති සාමාජිකයින්ගේ ජීවන තත්වය නඟා සිටුවීමට අවශ්‍ය ශිල්පීය දැනුම ලබා දීම. | 1.00 | 0.61 | 61 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2. | දේශීය බීජ ,ඌන භාවිත පලතුරු හා ගෘහාශ්‍රිත ආහාර සුරක්ෂිතතා වැඩසටහන ප්‍රචලිත කිරීම | ♦ ගෙවතු බීජ කට්ටල ලබා දීම තුළින් පළාත තුළ ගෙවතු වගාව ප්‍රවර්ධනය කිරීම<br>♦ ගොවීන් අතර පැරෂුට් තවාන් තැටිවල වී වගාව ප්‍රචලිත කිරීම තුළින් අස්වැන්නේ ඵලදායීතාවය වර්ධනය කිරීම<br>♦ ඌණ භාවිත පලතුරු පැල ගෙවතු සඳහා ලබා දීම තුළින් දේශීය පලතුරු භාවිතය ප්‍රචලිත කිරීම | 4.00 | 2.16 | 54 |
| 3. | අනාරක්ෂිත වගා ළිං පුනරුත්ථාපනය හා වගා කටයුතු සඳහා කාර්යක්ෂමව යොදා ගැනීම | ♦ දැනට ඉදිකර ඇති වගා ළිං පුනරුත්ථාපනය සඳහා රු. 20,000/- බැගින් වූ වාරික, වගා ළිං 130 ක් සඳහා ද රු.15,000/- බැගින් වූ දෙවන වාරික, වගා ළිං 29 ක් සඳහා ද ප්‍රතිලාභීන් 130 දෙනෙකු වෙත බෙදා දීම හා අක්කර 05ක් තුළ සවි කිරීමට විසුරුම් ජල පද්ධති 20ක් ප්‍රතිලාභීන් 20ක් වෙත ලබා දීම. එමඟින් දැනට වගා කටයුතු සඳහා භාවිත නොකරන වගා ළිං වගා කටයුතු සඳහා යොදා ගැනීම දිරිගැන්වමින් ගොවියා කාර්යක්ෂම ජල භාවිතයට හුරු කිරීමත්, එමඟින් එළවළු හා පලතුරු පළාතේ නිෂ්පාදනය ඉහළ නැංවීමටත් අපේක්ෂිතය | 5.00 | 4.22 | 85 |
| 4. | වගා ඵලදායීතාව ඉහල නැංවීම සඳහා ගොවීන් වෙත කෘෂි උපකරණ ලබා දීම | ♦ ඩිසල් වතුර මෝටර් 33 ක්,<br>♦ ට්‍රැක්ටර් වතුර මෝටර්,<br>♦ තණකොළ කප්පාදු යන්ත්‍ර 400ක්, ප්‍රතිලාභීන් 434 ක් අතර බෙදා දීම.<br>❖මෙම කෘෂි යන්ත්‍ර ලබාදීම මඟින් ගොවීන් වගා කටයුතු සඳහා නව තාක්ෂණය යොදා ගැනීමට හුරු කරලීමත්, එමඟින් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට කටයුතු කිරීම. | 4.00 | 3.77 | 95 |
| 5. | උතුරු මැද පළාතේ අපනයන කෘෂිකාර්මික බෝග ව්‍යාප්ත කිරීම | ♦ පුහුණු හා දැනවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමෙන් බුලත්, ගම්මිරිස් හා කුරුඳු වැනි වගාවන් කෙරෙහි ගොවීන් නැඹුරු කිරීමත්, එමඟින් කාර්යක්ෂම වන ඵලදාව තුළින් ජාතික අපනයන අවශ්‍යතාවය සපුරාලීමට පළාතෙන් දක්වන දායකත්වය ඉහළ නැංවීමටත් අපේක්ෂිතය. | 1.50 | 0.03 | 18 |
| 6. | පලතුරු වගා ගම්මාන ව්‍යාප්ත කිරීමේ වැඩසටහන | ♦ TEJC බද්ධ අඹ පැළ 4500 ක් අක්කර 112 ක වගා කිරිමට ප්‍රතිලාභීන් 400 දෙනෙකු සඳහා ලබා දෙන ලදි. අපනයන වෙළඳපළ සඳහා යෝග්‍ය අඹ නිෂ්පාදනය මෙහි ඉලක්කය වේ. | 5.00 | 1.52 | 30 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 7. | කෘෂි අලෙවි සමිති සාමාජිකයන් සඳහා කෘෂිකාර්මික ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | ♦ ගෙවතු වගාව ප්‍රවර්ධනය සඳහා විදුලි වතුර මෝටර් 75 ක් ලබා දීම.<br>♦ සහල් හා ධාන්‍ය ඇඹරුම් යන්ත්‍ර 108 ක් ලබා දීම තුළින් ඒ ආශ්‍රිත නිෂ්පාදනයන් දිරිගැන්වීම. | 4.50 | 3.72 | 83 |
| 8. | මී මැසි ගම්මාන සංවර්ධන වැඩසටහන | ♦ ජනපද සහිත මී මැසි පෙට්ටි 140 ක්,<br>♦ මී පැණි නිස්සාරණ යන්ත්‍ර 20ක්,<br>මී මැසි ගම්මාන 15 ක ප්‍රතිලාභීන් 135 දෙනකු වෙත බෙදා දීම.<br>❖මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම මඟින් පළාතේ පිරිසිදු මී පැණි නිෂ්පාදනය වාර්ෂිකව මෙ.ටො. 05 කින් ඉහළ නැංවීමට හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. පුෂ්ප පරාගනය හේතුවෙන් නිෂ්පාදනය ඉහළ යාම හා ස්වභාවික පාරිසරික ක්‍රියාවලි පවත්වාගෙන යාම වක්‍ර ප්‍රතිඵලයක් වේ. | 1.50 | 0.09 | 63 |
| 9. | ගුණාත්මක සහල් නිෂ්පාදන ගම්මාන ඇතිකිරීම. | ♦ මේ වන විට ඉහළ ඉල්ලුමක් ඇති ග්‍රාමීය වශයෙන් ස්ටීම් කරන ලද ගුණාත්මක සහල් නිෂ්පාදනය ඉහළ නැංවීම හා ගෘහාශ්‍රිත පරිභෝජනය සඳහා සහල් නිෂ්පාදනය කරනු ලබන නව ප්‍රතිලාභීන් 200 ක් හා කුඩා පරිමාණ සහල් නිෂ්පාදන ව්‍යවසායකයින් 50 දෙනෙකු ඇති කිරීමද ඔවුන්ගේ මාසික ආදායම රු. 10,000/= තෙක් ඉහළ නංවා එම කණ්ඩායමේ වාර්ෂික ආදායම රු.මි. 6 ඉපදවීම ඉලක්කයයි. මේ සඳහා ප්‍රතිලාභීන් 900 ක් සඳහා වී තම්බන බැරල් 900 ක් ලබා දී ඇත.<br>♦ ප්‍රතිලාභීන් 318 ක් සඳහා කමත් අතුරණු 318 ක් ලබා දීම මඟින් පිරිසිදු වී නිෂ්පාදනය ඉලක්ක කරගෙන ඇත. | 3.00 | 3.00 | 100 |
| 10. | සුළු හා මධ්‍ය පරිමාන මල් වගා කරුවන් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | ♦ කුඩා පරිමාණ මල් වගාකරුවන් 165 දෙනෙකු සඳහා මල් වගා උපකරණ කට්ටල 165 ක් ලබා දීම හා මව් ශාක ලබා දීම තුළින් දැනට කුඩා පරිමාණ මල් වගාකරුවන් දිරිගැන්වීම හා විසිතුරු මල් වගාව ප්‍රචලිත කිරීම හා එමඟින් ඔවුන්ගේ වාර්ෂික ආදායම මෙන්ම නිෂ්පාදනය ඉහළ නැංවීමට අපේක්ෂිතයි. මෙම වගාකරුවන් අතරින් තෝරාගත් මල්වගා කරුවන් අපනයන වෙළඳපළ දක්වා මඟ විවර කර දීම. | 3.00 | 3.50 | 117 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 11. | කෘෂි අලෙවි සමිති ආශ්‍රිතව අතිරේක බෝග වගා ව්‍යාප්තිය ඉහල නැංවීම සඳහා බීජ ලබාදීම | ♦ ආනයනික දෙමුහුන් බඩ ඉරිඟු බීජ කිලෝ 6,000 ක් ප්‍රතිලාභීන් 900 කට අක්කර 1,200 ක වගා කිරිමට ලබා දීම. දැනට වාර්ෂිකව ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන මෙ.ටො. ලක්ෂ 2 ක් පමණ වන බඩඉරිඟු ප්‍රමාණයෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් එමගින් නිෂ්පාදනය කරනු ලැබේ. එහි මූල්‍ය වටිනාකම රු.මි. 100 ක් පමණ වේ. එක් පවුලක් සඳහා අපේක්ෂිත ආදායම රු.40,000/= ක් පමණ වේ.<br>♦ උඳු බීජ කිලෝ 3,000 ක් ප්‍රතිලාභීන් 200 කට අක්කර 150 ක වගා කිරීමට ලබා දීම.<br>❖ දේශීය අතිරේක ආහාර බෝග අවශ්‍යතාවය සම්පූර්ණ කර ගැනීම සඳහා මෙම පළාතේ ගොවි දායකත්වය ඉහළ නැංවීම ඉලක්කයයි. | 4.00 | 3.75 | 94 |
| 12. | පරිසර හිතකාමී කාබනික ගොවිපල හා කාබනික පොහොර නිෂ්පාදනය ප්‍රවලිත කිරීම | ♦ වාණිජ මට්ටමින් කාබනික පොහොර නිෂ්පාදන ඒකක 18 ක් ඇති කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර ලබා දීම හා ගෘහාශ්‍රිත කාබනික පොහොර නිෂ්පාදනය සඳහා අවශ්‍ය උපකරණ ලබාදීම තුළින් ගොවීන් තුළ කාබනික වගාව ප්‍රචලිත කිරීමෙන් සෞඛ්‍යාරක්ෂිත වගා කටයුතු සඳහා නැඹුරු කිරීමත් නිෂ්පාදනයට හුරු කිරීම තුළින් ආදායම් උත්පාදනයත් මෙහි අරමුණයි. | 4.00 | 3.69 | 92 |
| 13. | ගොවීන් වෙත නව කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර ලබාදීම | ♦ දියර ඉසින යන්ත්‍ර 556 ක් ,<br>♦ අතින් ක්‍රියාත්මක කරන කප්පාදු කියත් 248 ක්,<br>♦ යාන්ත්‍රික කප්පාදු කියත් 10 ක්,<br>♦ තණකොල කප්පාදු යන්ත්‍ර 210 ක්, ප්‍රතිලාභීන් 1024 ක් අතර බෙදා දීම.<br>❖මෙම කෘෂි යන්ත්‍ර ලබාදීම මගින් ගොවීන් වගා කටයුතු සඳහා නව තාක්ෂණය යොදා ගැනීමට හුරු කරලීමත්, එමගින් වැඩි අස්වැන්නක් ලබා ගැනීමත් අපේක්ෂිත ඉලක්ක වේ. කප්පාදු කිරීමට ගොවීන් හුරු කිරීම මගින් නව ශාක රෝපණය වෙනුවට, තිබෙන ශාක වලින් ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට අපේක්ෂිතය. | 5.00 | | 100 |
| **එකතුව** | | | **50.50** | **36.15** | **72** |

2015 වසරට සාපේක්ෂව ගත් කළ ඉහල සාපේක්ෂ ඵලදායිතාවයක් 2016 වසර තුළ අමාත්‍යාංශයෙහි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඔස්සේ අත්පත් කර ගෙන ඇත. එය ප්‍රතිශතයක් ලෙස ගත්විට 77.37 % ක් පමණ වේ. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් අපේක්ෂිත ඉලක්ක කරා මෙහෙයවීමට පසුගිය වසරේ දී මෙම අමාත්‍යාංශයට හැකි විය. නිදැළි කුකුළු පාලන වැඩසටහන, දේශීය බීජ ප්‍රවර්ධන වැඩසටහන, මී මැසි ගම්මාන වැඩසටහන හා ගුණාත්මක සහල් නිෂ්පාදන ගම්මාන ඇති කිරීමේ වැඩසටහන වැනි ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් සඳහා ඉතා සාධනීය ඉහළ



ප්‍රතිචාරයක් ප්‍රතිලාභීන් වෙතින් ලැබී තිබූ අතර පළතුරු ගම්මාන වැඩසටහන ද ගොවීන් අතර ඉහළ ජනප්‍රියතාවයක් ලබා ගත් වැඩසටහනක් බව සඳහන් කළ යුතු ය. එම සියළු වැඩසටහන් මඟින් රු.බිලියන තුනක පමණ අතිරේක ආදායමක් පළාත් ආදායමට එකතු වීමට නියමිතය.

මෙම අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය යටතේ ක්‍රියාත්මක කෘෂි නිෂ්පාදන අලෙවි සමිති ජාලය මඟින් ගොවීන් වෙත ප්‍රතිලාභ බොහෝමයක් සපයා දීමට හැකි වූ අතර අමාත්‍යාංශයෙහි ප්‍රතිලාභ ලබාදීමේ කටයුතු කෘෂි නිෂ්පාදන අලෙවි සමිති හරහා සිදු කිරීම තුලින් ක්‍රමවත් හා විධිමත් අයුරින් එම කටයුතු සිදු කිරීමට හැකි වූ බව ද මෙහිදි සඳහන් කළ යුතුව ඇත. මෙම අමාත්‍යාංශයේ අධීක්ෂණය හා නියාමනය යටතේ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු මඟින් ක්‍රියාත්මක කළ වැඩසටහන් බොහොමයක් ප්‍රතිලාභී ගොවීන්ගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීමට දායක වී තිබූ අතර ලැබෙන මහජන පැමිණිලි හා පෙත්සම් ප්‍රමාණය අවම වීමක් ද 2016 වසරේ දී දැක ගත හැකි වූ අතර එය යහ පාලනය පිළිබඳ සාර්ථක දර්ශකයක් වූ බව ද පැහැදිළි ව ප්‍රකාශ කළ හැකි ය.

**7.1**

# පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ඉදිරි දැක්ම

"තෘප්තිමත් හා සෞභාග්‍යමත් ගොවි ප්‍රජාවක් සහිත සමෘද්ධිමත් පළාතක් බිහි කිරිම".

### මෙහෙවර

"නව යෝග්‍ය කෘෂිකාර්මික තාක්ෂණය හා කෘෂිකාර්මික යටිතල පහසුකම් භාවිතයෙන් ආහාර සුරක්ෂිතතාව හා පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය, වාණිජ කෘෂිකර්මාන්තය හා කෘෂි ව්‍යාපාර සියළුම පාර්ශවකරුවන්ගේ මනා සහයෝගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරිම".

### අරමුණු

- වී, අතිරේක බෝග,අල බෝග,එළවළු හා වෙනත් ආහාර බෝග සඳහා ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්ති හා පළාත් කෘෂිකර්ම අවශ්‍යතාවයන් හා ප්‍රමුඛතාවයන් මත පිහිටා විශිෂ්ඨ පළාත් කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන් ඉහල කාර්යක්ෂමතාවයකින් හා ඵලදායිතාවයකින් සාක්ෂාත් කර ගැනිම.

- පළාත් කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන් තුළින් ගොවීන් ගේ ජීවන තත්වය ඉහල නැංවීම, දිළිඳුකම පිටු දැකිම හා ජාතික ආහාර සුරක්ෂිතතාව හා යහපත් කෘෂි පිළිවෙත් අනුගමනය මගින් ගුණාත්මක හා ආරක්ෂාකාරි ආහාර නිෂ්පාදනය, පරිසර හිතකාමී කෘෂිකර්මාන්තයක් ළඟාකර ගැනිම.

- ජලය හා පස සංරක්ෂණය කර ගනිමින්, වෙනස් වන සමාජ, ආර්ථික හා කාලගුණික ප්‍රවණතාවයකට අනුකූලවන සේ සැකසු වැඩසටහන් තුලින් තිරසාර කෘෂිකාර්මික ක්‍රමෝපායන් ළඟාකර ගැනිම.

- උසස් ගුණත්වයෙන් යුතු බීජ හා රෝපණ ද්‍රව්‍ය පළාත තුළ සුලභ කිරිම.
  දේශීය හා විදේශීය වෙළඳපොළ ඉලක්ක කර ගත් කෘෂිකර්මාන්තයට අවශ්‍ය සංවර්ධන වැඩසටහන් දියත් කිරිම තුළින් පළාතේ ගොවි ජනතාවගේ කෘෂි ව්‍යවසාය හැකියාවන් වර්ධනය කිරිම තුළින් තෘප්තිමත් ගොවි ජනතාවක් බිහි කිරිම.

### ප්‍රධාන කාර්යයන්

- යහපත් ව්‍යාප්ති සේවාවක් සැපයීම සඳහා ගොවිජනතාවට නව තාක්ෂණය හඳුන්වා දීම තුළින් ඔවුන්ගේ දැනුම , ආකල්ප, කුසලතාවයන් වර්ධනය කිරිම.
- ගුණාත්මක බීජ හා රෝපන ද්‍රව්‍ය නිෂ්පාදනය හා සුලභතාවය ඇතිකිරිම.
- පහත සඳහන් කෘෂිකාර්මික කටයුතු වලට අදාල පනත් ක්‍රියාත්මක කිරිම
  - පැළෑටි සංරක්ෂණ පනත
  - පාංශු සංරක්ෂණ පනත
  - පළිබෝධනාශක පාලන පනත
  - බීජ පනත

- මහඉළුප්පල්ලම සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයෙන් ක්ෂේත්‍ර පුහුණු හා ප්‍රායෝගික සේවාස්ථ පුහුණු ගොවීන් හා නිලධාරීන් වෙත ලබා දීම.
- පළාත තුළ පරිසර හිතකාමී යහපත් කෘෂි පිළිවෙත් අනුගමනය කරන කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රමවේදයන් ප්‍රචලිත කිරිම.
- රටේ ආහාර සුරක්ෂිතතාවය ඇතිකිරිම මගින් ආහාර ද්‍රව්‍ය ආනයනය අඩු කිරිම.
- පළාත තුළ කෘෂිකර්මය මත පදනම් වූ කර්මාන්ත හා ව්‍යවසායකයින් හඳුනාගෙන වැඩිදියුණු කිරිම.
- ගොවීන්ගේ කෘෂි තාක්ෂණික ගැටළු හඳුනාගෙන පර්යේෂණ ආයතනයන් වෙත යොමු කිරිම.
- කෘෂිකර්මයට අදාල දත්ත හා තොරතුරු ජාලයක් හා තොරතුරු කේන්ද්‍රයක් පවත්වා ගැනීම තුළින් ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව සහ වෙනත් රාජ්‍ය ආයතනයන් මෙන්ම තොරතුරු දැන ගැනිමේ අදාල අය වෙත තොරතුරු ලබා දීම.
- කෘෂිකර්ම අමාත්‍යාංශය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය දායකත්වය ලබා දීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- වී සහ අතිරේක බෝග සඳහා නව තාක්ෂණය හඳුන්වා දීමට බෝග ආදර්ශණ සහ ක්‍රම, ආදර්ශණ ක්‍රියාත්මක කිරිම.
- පරිසර හිතකාමි කෘෂිකර්මය සඳහා ඒකාබද්ධ පාලන ක්‍රම හා යහපත් කෘෂි පිළිවෙත් අනුගමනය කරන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
- අස්වනු වැඩි කිරිම සඳහා බෝගවලට ඒකාබද්ධ පැළෑටි පෝෂණ ආදර්ශණ ක්‍රියාත්මක කිරිම හා වී සඳහා පැරිෂුට් තාක්ෂණය හඳුන්වා දීම වැනි නව උචිත තාක්ෂණයන් හඳුන්වා දිම.
- නව කෘෂි ව්‍යවසායකයින් බිහි කිරිම සඳහා ගොවි කාන්තා හා තරුණ ගොවි සමාජ පිහිටු විම හා කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
- පාංශු සංරක්ෂණය දිරිමත් කිරිම සඳහා පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරිම.
- පළිබෝධ පාලන නියාමනය සඳහා පළිබෝධ පාලන පනත ක්‍රියාත්මක කිරිම.
- වී සහ අතිරේක බෝග වල ගුණාත්මක බීජ සුලභ කිරිම සඳහා බීජ නිෂ්පාදන යාය පිහිටුවීම හා බීජ පනත ක්‍රියාත්මක කිරිම.
- කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ යාන්ත්‍රීකරණය හඳුන්වා දිම තුළින් ඵලදායිතාව ඉහළ නැංවිම.

## කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 352 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 244 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 125 |
| අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික පදනමේ සිටින සංඛ්‍යාව | 16 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 113.65 | 111.59 | 2.06 | 98.19 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 18.89 | 16.40 | 2.49 | 86.81 |
| **එකතුව** | **132.54** | **127.99** | **4.55** | **96.56** |

### මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1.00 | 0.92 | 0.08 | 92 |
| වාහන | 1.32 | 1.32 | 0.0<br>(රු.300) | 100 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 1.94 | 1.83 | 0.11 | 94 |
| **එකතුව** | **4.26** | **4.07** | **0.19** | **96** |

### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්යසාධනය

| අංකය | ව්‍යාපෘතිය | වෙන් කල ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|
| 1. | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (නව වැඩ) | | |
| | අනුරාධපුර දිස්ත්‍රික්කය | 88.64 | 68.65 |
| | පොළොන්නරු දිස්ත්‍රික්කය | 60.54 | 51.49 |
| | උපමාන පාදක | | |
| | අනුරාධපුර දිස්ත්‍රික්කය | 2.83 | 2.82 |
| | අවිච්ඡේද ව්‍යාපෘති | | |
| | අනුරාධපුර දිස්ත්‍රික්කය | 1.00 | 0.92 |
| | පොළොන්නරු දිස්ත්‍රික්කය | 0.45 | 0.34 |
| 2. | ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන | 105.00 | 43.27 |

| | | | |
|---|---|---|---|
| 3. | වියළි කලාපිය බඩඉරිඟු වගා බිම්වල පාංශු සංරක්ෂණ වැඩසටහන | 8.88 | 5.09 |
| 4. | කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩසටහන | 1.04 | 0.69 |

උතුරු මැද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් 2016 වර්ෂයේදි පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ක්‍රියාත්මක කරන ලද වී වගාවේ ඵලදායිතාවය හා බීජ නිෂ්පාදන වැඩසටහන ක්‍රියාත්මක කිරිම සඳහා මිලියන 06 ක් වෙන් වූ අතර එම වර්ෂයේ වර්ෂාපතනය නිසි කලට නොලැබිම නිසා එහි ප්‍රගතිය අඩුවිය. එහෙත් අතිරේක බෝගවල ඵලදායිතාව ඉහළ නැංවීමේ හා බීජ නිෂ්පාදන වැඩසටහන් සියළුම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි සාර්ථකව ක්‍රියාත්මක කරන ලදි.

සෞඛ්‍ය ආරක්ෂිත හා ගුණාත්මක එළවළු හා පළතුරු නිෂ්පාදනය කිරිමේ අරමුණින් අඩු කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් එළවළු හා පළතුරු වගාව ප්‍රචලිත කිරිම පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. මෙමගින් පළාතේ ගොවි ජනතාව තුල යහපත් කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳ දැනුම වර්ධනය කිරිම ප්‍රධාන අරමුණ විය.

## අඩු රසායනික ද්‍රවය භාවිතයෙන් එළවළු වගාව ප්‍රචලිත කිරීම

| ප්‍රතිපාදන දිස්ත්‍රික්කය | වෙන්වූ ප්‍රතිපාදන (මිලියන ) | වියදම |
|---|---|---|
| අනුරාධපුර | 1.1 | 1.1 |
| පොලොන්නරුව | 0.6 | 0.6 |

| වැඩසටහන | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| අවාරයේ එළවළු වගාව අක්කර **1/4** ආදර්ශන | **40** | **40** |
| කාර්යක්ෂම ජල කළමනාකාරණය කිරිම | 37 | 37 |
| පුහුණු වැඩසටහන් | 40 | 40 |




එමෙන් ම 2016 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ඉඟුරු වගාව ප්‍රචලිත කිරිමේ වැඩසටහන මගින් ඉඟුරු කි.ග්‍රෑ. 40,500 ක ප්‍රමාණයක් ගොවි ජනතාව වෙත ලබාදි ප්‍රදේශයේ ඉගුරු වගාව ප්‍රචලිත කිරිම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

# ඉඟුරු වගා වැඩසටහන

| ප්‍රතිපාදන දිස්ත්‍රික්කය | වෙන්වූ ප්‍රතිපාදන (මිලියන ) | වියදම |
|---|---|---|
| අනුරාධපුර | 7 | 5 |
| පොලොන්නරුව | 3 | 3 |

| වැඩසටහන | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| ඉඟුරු මව් අල ලබාදීම | 500000 kg | 39900kg |





ටෙන්ඩර් ඉදිරිපත් කිරිමේදී අඩු මිල ගණන් ඉදිරිපත් විම නිසා මුදල් ඉතිරි විය.
භෞතික ප්‍රගතිය ඇත

උතුරු මැද පළාත එමෙන්ම යල මහ දෙකන්නයේ බඩ ඉරිඟු වගාව ප්‍රචලිත කිරිම සඳහා වෙන් වු ප්‍රතිපාදන මගින් පළාතේ අක්කර 2,740 ක් සඳහා 50% ගොවි දායකත්වය මත බඩඉරිඟු බීජ කි.ග්‍රෑ. 13,700 ක් ගොවීන් වෙත ලබා දිමට හැකියාව ලැබුණි. මෙමගින් ප්‍රදේශයේ ගොවි ජනතාවගේ අතිරේක ආදායම් මට්ටම වැඩිවීම තුළින් පවුලේ ආර්ථික තත්වය ඉහළ නැංවිම ප්‍රධාන අරමුණ විය.

# යල කන්නයේ කුඹුරු ඉඩම් වල බඩ ඉරිඟු වගාව ප්‍රචලිත කිරිම







ලොකුළූණු වගාවේ ඵලදායිතාව හා බීජ නිෂ්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් වූ ප්‍රතිපාදන මගින් ලොකුළූණු බීජ නිෂ්පාදනය සඳහා ලොකුළූණු මව් බල්බ 21,650 ක් මිලදී ගෙන ගොවි ජනතාව වෙත ලබා දී ඇත. එමෙන්ම ලොකුළූණු බීජ නිෂ්පාදනය සඳහා අවශ්‍ය වැසි ආවරණ ගෘහ 43 ක් හා 50%

## වැසි ආවරණ ගෘහ ඉදිකිරීම ( මිරිස් / ලොකු ළූණු බීජ නිෂ්පාදනය)

| ප්‍රතිපාදන දිස්ත්‍රික්කය | වෙන්වූ ප්‍රතිපාදන (මිලියන ) | වියදම |
|---|---|---|
| අනුරාධපුර | 2.5 | 1.5 |
| පොලොන්නරුව | 1.5 | 1 |

| වැඩසටහන | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| වැසි ආවරණ ගෘහ ඉදිකිරීම | 40 | 34 |





වැසි ආවරණ ගෘහ
ගම්බිරිගස්වැව
කෘ .උ .කොට්ඨාසය

ගොවි දායකත්වය මත ලොකුළූණු ගබඩා 06 ක් ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ගොවින් වෙත ලබා දී ඇත.

තවද, දෙපාර්තමේන්තුව මගින් පවත්වා ගෙන යනු ලබන පැළ තවාන් 07 ක් නඩත්තු හා සංවර්ධන කිරීම තුලින් උතුරු මැද පළාතේ ගොවි ජනතාව වෙත ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය ලබා දෙන ලදි. ප්‍රදේශයට නව වගාවන් හඳුන්වා දීමේ අරමුණින් බුලත් ගම්මාන ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලැබුණු අතර එමගින් බුලත් පැළ 14,000 ක් නොමිලේ ගොවින් වෙත ලබා දී ඇත. මෙමගින් නව ආදායම් මාර්ග උත්පාදනය ප්‍රධාන අරමුණ වේ.

## බුලත් වගා වැඩසටහන

| ප්‍රතිපාදන දිස්ත්‍රික්කය | වෙන්වූ ප්‍රතිපාදන (මිලියන ) | වියදම |
|---|---|---|
| අනුරාධපුර | 0.7 | 0.1 |
| පොලොන්නරුව | 0.3 | 0.05 |

| වැඩසටහන | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| බුලත් පැල | 14000 | 14000 |

## පැල තවාන් සංවර්ධනය හා නඩත්තුව

| ප්‍රතිපාදන දිස්ත්‍රික්කය | වෙන්වූ ප්‍රතිපාදන (මිලියන ) | වියදම |
|---|---|---|
| අනුරාධපුර ( පැලතවාන් 04) | 3.5 | 3.5 |
| පොලොන්නරුව ( පැලතවාන් 03) | 2.5 | 2.5 |

තරුණ ගොවීන් කෘෂිකර්මාන්තය වෙත යොමු කිරිමේ අරමුණින් නව තාක්ෂණය හඳුන්වා දිම සඳහා 50% ගොවි දායකත්වය මත ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති 93 ක් හා මිරිස් වගා ඵලදායිතාවය ඉහල නැංවිම සඳහා කෘමි ආරක්ෂිත දැල් 43 ක් හා බිත්තර වී පිරිසිදු කිරිමේ යන්ත්‍ර 04 ක් ලබා දි ඇත.




ඊට අමතරව ගොවි කාන්තාවන් හා තරුණ ගොවීන් සවිබල ගැන්වීම අරමුණින් මල් නිෂ්පාදනය කරන ගොවීන් වෙත දැල් ගෘහ 27 ක් හා ඕකිඩ් මව් ශාක 2,000 ක් හා වී තම්බන බැරල් 30 ක් ගොවි කාන්තාවන්ට ලබා දි ඔවුන්ගේ ආර්ථික තත්වය ඉහළ නංවන ලදි. උතුරුමැදපළාත්කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ දි රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන තුලින් මිරිස් නිෂ්පාදනය හා වගාව ප්‍රවර්ධනය කිරිම සඳහා රුපියල් මිලියන 14.125 ක් වෙන් වී තිබුණු අතර වගාලිං 77 ක්, විදුලි ජල පොම්ප70 ක්, ඉන්ධන ජල පොම්ප 65 ක්, බහු කාර්ය ඇඹරුම් යන්ත්‍රයක්, සීලර් යන්ත්‍රයක් ගොවීන් වෙත ලබාදිම සිදු කරන ලදි. තවද විසුරුම් ජල සම්පාදන පද්ධති ලබා දිම සඳහා රුපියල් මිලියන 1.421ක මුදලක් ආයෝජනය කරන ලදී.

පළතුරු ගම්මාන වැඩසටහන සඳහා රුපියල් මිලියන 33.6 ක් වෙන් කරන ලද අතර එක් ගම්මානයකට පැළ 900 ක් බැගින් දෙහි,කෙසෙල්,කටු අනෝදා,පැපොල්,පැණි දොඩම්,ජමනාරං යන පැළ වර්ග ලබා දෙන ලදි. ගෙවතු වගාව සඳහා කාන්තා ගොවීන් 20 දෙනෙකුගෙන් සමන්විත ඒකක 13,944 ක් සඳහා පැළ වර්ග 5 බැගින් පැළ 69720 ක් ලබා දි ඇත.

එළවළු වගාව සඳහා රුපියල් මිලියන 4.278 ක් වෙන් වී අතර වැසි ආවරණ 3 ක් කෘමි ආරක්ෂිත දැල් 15 ක් හා පොලිතින් වසුන් 06 ක් ද විදුලි ජල පොම්ප 45 ක් හා ඉන්ධන ජල පොම්ප 15 ක් ද ජල සම්පාදන පද්ධති 13 ක් ද ලබා දිමට කටයුතු සිදුකරන ලදි.

තවද, ස්වභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානය මගින් රුපියල් මිලියන 6 ක් වෙන්ව තිබු අතර ඒ තුළින් විසුරුම් ජල සම්පාදන පද්ධති 63 ක් හා වියළි කලාපිය බඩඉරිගු වගා බිම්වල පාංශු සංරක්ෂණ වැටි අක්කර 152 ක් සඳහා වැටි යොදන ලදි. එසේම වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරිමේදි අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා ආයතන අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් අනෙකුත් පාර්ශවකරුවන්ද සහයෝගයෙන් කටයුතු කරමින් කාර්යාවලිය මෙහෙයවීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ලඟා විමටත් ආයතනයේ කාර්ය සාධනය ඉහල නැංවාගැනීමටත් හැකි විය.

7.2

# පළාත් සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ඉදිරි දැක්ම

" නිරෝගී හා ඵලදායී පශු සම්පතක්, ඉසුරුමත් ප්‍රජාවක් "

### මෙහෙවර

" පශු සම්පත්, සත්ව නිෂ්පාදන හා එහි ඵලදායිතාවය, වෙළඳපොල සහ ඒ ආශ්‍රිත පරිසර ආරක්ෂාව සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම ".

### දිගු කාලීන හා කෙටි කාලීන අරමුණු

### දිගු කාලීන අරමුණු

දේශීය කිරි නිෂ්පාදනයට උතුරු මැද පළාතේ 2012 වසරෙහි පැවති දායකත්වය වන 10% 2020 වසර වනවිට 30% දක්වා ඉහළ නැංවීම.

### කෙටි කාලීන අරමුණු

- ගොවිපල සතුන්ගේ සෞඛ්‍ය සතුටුදායක මට්ටමක පවත්වා ගැනීම.
- සතුන්ගේ නිෂ්පාදන ධාරිතාව ඉහල නැංවීම.
- සත්ව පාලනය ප්‍රචලිත කිරීම.

### ප්‍රධාන කාර්යයන්




### ප්‍රධාන උපාය මාර්ගයන්

ප්‍රශස්ත සත්ව සෞඛ්‍ය සේවාවක් ලබා දීම තුලින් සත්ව සෞඛ්‍ය සතුටුදායක මට්ටමක පවත්වා ගැනීමත්, ආරය උසස් කිරීම මගින් නිෂ්පාදන ධාරිතා වර්ධනය කර ගැනීමත්, සහ තාක්ෂණ ප්‍රචාරණය මගින් උචිත නිෂ්පාදන ක්‍රමවේද ප්‍රචලිත කිරීම.

### කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 309 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 224 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 107 |
| අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික පදනමේ සිටින සංඛ්‍යාව | 20 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 112.06 | 112.06 | 0.00 | 100 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 15.59 | 13.99 | 1.60 | 90 |
| **එකතුව** | **127.65** | **126.05** | **1.60** | **98.7** |

### මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 10.0 | 0.00 | 10.0 | 0 |
| යන්ත්‍ර සූත්‍ර සවිකිරීම් හා උපකරණ | 5.00 | 4.85 | 0.15 | 97 |
| වාහන | 1.50 | 1.36 | 0.14 | 91 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 15.0 | 11.92 | 3.08 | 79 |
| **එකතුව** | **31.5** | **18.13** | **13.37** | **58** |

### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය

පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව අනුරාධපුර හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක දෙක ආවරණය වන පරිදි සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය අංශයේ ප්‍රවර්ධනය උදෙසා පහත සඳහන් අංශයන් යටතේ සංවර්ධන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලදී. ඒ තුළින් පළාතේ සත්ව නිෂ්පාදන අංශයේ ප්‍රවර්ධනය උදෙසා සැලකිය යුතු දායකත්වයක් 2016 වර්ෂය තුළදී ලබාදිය හැකි විය.

**පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින්**
**2016 වර්ෂයේදී ක්‍රියාත්මක කළ**
**සංවර්ධන ව්‍යාපෘති**

| අනු අංකය | වැඩසටහන |
|---|---|
| 1 | ජංගම සායන පැවැත්වීම |
| 2 | සත්ව පෝෂණය ඉහළ නැංවීම |
| 3 | කිරි නිෂ්පාදන ප්‍රමිතිය ඉහළ නැංවීම |
| 4 | කෘතිම සිංචන ප්‍රවර්ධනය |
| 5 | කිරි ගොවිපල් සංවර්ධනය |
| 6 | පශු වෛද්‍ය කාර්යාල අළුත්වැඩියාවන් |
| 7 | යතුරුපැදි සැපයීම |
| 8 | ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ සැපයීම |
| 9 | පශු වෛද්‍ය කාර්යාල ඉදිකිරීම - මිහින්තලය |
| 10 | තිරප්පනේ සත්ව ගොවිපොලෙහි ගොඩනැගිලි අළුත්වැඩියාවන් |
| 11 | සත්ව ගොවිපොලෙහි විදුලි වැට ඉදිකිරීම |
| 12 | සත්ව ගොවිපොලෙහි ගැඹුරු ළිදක් ඉදිකිරීම |
| 13 | සත්ව ගොවිපොලෙහි ලීටර් 10,000 ජල ටැංකියක් ඉදිකිරීම සහ ජල පොම්පයක් සවිකිරීම |
| 14 | ගොවිපොල අභ්‍යන්තර මාර්ග පිළිසකර කිරීම |

## 01. ජංගම සායන පැවැත්විම තුළින් තාක්ෂණික සේවා ගොවින් වෙත සෘජුව ලබා දීම.

කෘෂිකාර්මික සතුන් සඳහාවන තාක්ෂණ සේවා ගොවිපල් වෙතට සෘජුව ලබාදීම ජංගම සායන තුළින් අරමුණු කරගෙන තිබුණි. මෙහිදී සායන 882ක් පැවැත්වීමට සැලසුම්කර රු.මි.1.5ක මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර ගෙන තිබුනද අනපේක්ෂිත වැය හේතුවෙන් සායන 590ක් පමණක් පැවැත්විය හැකි වුණු අතර ඒ සඳහා රු.මි. 0.16 අමතර මූල්‍ය ප්‍රතිපාදන මාරු ගැනීමට සිදුවිය. මෙම සායන මගින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ 59,331ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 26,276ක ගවයින් සංඛ්‍යාවක ගැබ් පරීක්ෂා කිරීම්, මද සරුභාවයට ප්‍රතිකාර කිරීම්, රෝග සඳහා එන්නත් කිරීම් සහ හඳුනාගත් ගොවිපළ ගැටළු වලට විසඳුම් ලබා දීමට හැකිවිය. මෙම ව්‍යාපෘතිය මගින් ගොවීන්ට තාක්ෂණ සේවා ලබාගැනීමේ දුෂ්කරතාවයට යම් විසඳුමක් ලැබෙන අතර මෙම සේවාවේ ප්‍රතිඵලයක් ලෙස කෘෂිකාර්මික සතුනගේ සෞඛ්‍ය තත්වය ආරක්ෂාවන අතර සත්ව රෝග වසංගත අවම වීම තුළින් ගොවීන්ගේ වැය බර අඩුවීම ද සිදුවේ.

## 02. සත්ව පෝෂණය ඉහළ නැංවීම තුළින් පළාතේ කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම.



වසර පුරා කිරි දෙනුන්හට නිසි ආකාරයට ආහාර ලබා නොදීම මෙම පළාතේ කිරි නිෂ්පාදනය ඉහළ නංවා ගැනීමට ඇති ප්‍රධාන බාධාවක් වී ඇත. දියුණු තෘණ හා පෝෂණ වගා කර වියළි කාලයේදී සතුන් පෝෂණය සඳහා සංරක්ෂණය කිරීම අද වන විට අත්‍යාවශ්‍යව ඇත. අනුරාධපුර දිස්ත්‍රික්කයේ Co4 තෘණ ඒකක (පර්. 20) 350ක්ද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඒකක 150ක්ද වගාකර සයිලේජ් සැකසීම ප්‍රවර්ධනය කිරීමට සැලසුම්කර රු.මි. 5.0ක ආයෝජනයක් සිදු කිරීමට බලාපොරොත්තු වුවද අනපේක්ෂිත නියඟය හේතුවෙන් වගා ඒකක 301ක් පමණක් සංවර්ධනය කළ හැකි විය. ඉතිරි ප්‍රතිපාදන කිරි ගොවිපල් සංවර්ධනය සඳහා මාරු කර ගැනුණි.

## 03. කිරි නිෂ්පාදන ප්‍රමිතිය ඉහළ නැංවීම

උතුරු මැද පළාතේ නිෂ්පාදනය වන කිරි වලින් අගය එකතු කෙරෙනුයේ 6% ක් පමණ වූ සුළු ප්‍රමාණයකට වේ. මෙයට ප්‍රධාන හේතුවක් වන්නේ සුළු පරිමාණ නිෂ්පාදනවල ප්‍රමිතිය එතරම් යහපත් නොවීම හේතුවෙන් විවෘත වෙළඳපොළේ තරඟකාරිත්වයට මුහුණ දීමට ඇති නොහැකියාව වේ. මෙයට පිළියමක් ලෙස සුළු පරිමාණ අගය එකතුකරන්නන්ගේ නිෂ්පාදනවල ප්‍රමිතිය පර්යේෂණාගාර පරීක්ෂණ මගින් ඇගයීම්කර නිෂ්පාදනවල තත්වය ගොවීන්ට පැහැදිළිකරදී ප්‍රමිතිය ඉහළ නංවා ගැනීමට අවශ්‍ය තාක්ෂණයත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ පූර්ව අවශ්‍යතා පිළිබඳවත් ගොවීන් දැනුවත්කර නිෂ්පාදන ප්‍රමිතීන් ඉහළ නංවා ගැනීමට අවශ්‍ය මැදිහත්වීම් මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලදී. මෙයින් සුළු පරිමාණ කිරි සැකසුම්කරුවන් 84 දෙනෙකුට ප්‍රතිලාභ හිමිවිය.

## 04. කෘතිම සිංචන ප්‍රවර්ධනය

කෘතිම සිංචනය මගින් ආරය උසස් කිරීම ප්‍රවර්ධනය කිරීම සහ උදෙසා නව තාක්ෂණ ප්‍රචාරණය කිරීමට පශු වෛද්‍ය කාර්යාල 29 වෙත ලැප් ටොප් පරිගණ සහ මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් සැපයීම, දියර නයිට්‍රජන් බඳුන් 8ක් සැපයීම, ගොවීන් දැනුවත් කිරීම සඳහා පෝස්ටර් සහ අත් පත්‍රිකා සැපයූ අතර ඉලක්ක ඉක්මවා කෘතිම සිංචන සිදුකළ සත්ව සංවර්ධන උපදේශකවරුනට සහ ගැබ් පරීක්ෂා ඉලක්ක ඉක්මවූ පශු වෛද්‍ය නිලධාරීනට දිරි දීමනා ගෙවීමද මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ ලබා දුන් පහසුකම් භාවිතා කර 2017 වසරෙහිදී තාක්ෂණ ප්‍රචාරණය පුළුල් කිරීමට ඉලක්ක කර ඇත.

## 05. කිරි ගොවිපල් සංවර්ධනය

මෙම ව්‍යාපෘතිය යටතේ උතුරු මැද පළාතෙහි ගොවිපල් 572ක් සංවර්ධනය කිරීමට ඉලක්කකර තිබුණි. කිරි ගොවිපල් සංවර්ධනය සඳහා ගොවීන්ගේ ඇති ඉල්ලුම ඉතා ඉහල වීමත්, නියගය හේතුවෙන් තෘණ වගා ව්‍යාපෘති ඉලක්ක සපුරා ගත නොහැකි වීමත් සහ තිරප්පනේ සත්ව ගොවිපල සංවර්ධනයට වෙන් කළ ප්‍රතිපාදන ඉතිරිවීමේ හැකියාවත් සැලකිල්ලට ගෙන එම ව්‍යාපෘති සහ ප්‍රතිපාදන සංශෝධනය කර

එමගින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ කිරි ගොවිපල් 539ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවිපල් 207ක් සංවර්ධනය කෙරුණු අතර එම ගොවිපල් සඳහා තෘණ කැබලි කිරීමේ යන්ත්‍ර 83ක්, කිරි දෙනුන් 386 දෙනෙකු, පුං ගවයින් 3දෙනෙකු, සත්ව නිවාස 133ක්, කිරි දොවන යන්ත්‍ර12ක්, සයිලේජ් සැකසීමට භාජන, තෘණ කැපීමේ යන්ත්‍ර 12ක් සහ පිදුරු ගබඩා 2ක් ලබා දී ඇත..

## 06. සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය කාර්යමණ්ඩල සුභසාධනය,පශු වෛද්‍ය කාර්යාල උපකරණ සැපයීම,අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය

**මේ යටතේ නැගෙනහිර නුවරගම් පළාත, තඹුත්තේගම සහ රාජාංගණය පශු වෛද්‍ය කාර්යාල 3 අළුත්වැඩියා කිරීම සම්පූර්ණයෙන් නිම කරන ලදී. තමන්කඩුව, බකමූණ සහ මින්නේරිය පශු වෛද්‍ය කාර්යාල අළුත්වැඩියාව උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කෙරුණි. මිහින්තලය පශු වෛද්‍ය කාර්යාලය ඉදිකිරීම උතුරු මැද කෘෂිකර්ම අමාත්‍යාංශය මැදිහත් වීම මගින් ක්‍රියාත්මක කෙරුණි. තවද තිරප්පනේ සත්ව ගොවිපළෙහි ගොඩනැගිලි අළුත්වැඩියාව සඳහා රු.මි. 5.38ක මූල්‍ය ප්‍රතිපාදන වෙන් කළද ගොඩනැගිලි දෙකෙහි අත්‍යවශ්‍ය අළුත්වැඩියාවන් රු.මි. 1.234ක් වැය කර සිදුකර ගැනීමට හැකිවිය.**

යතුරුපැදි සැපයීම යටතේ හොරොව්පොතාන, පදවිය, කැබිතිගොල්ලැව, මැදවච්චිය, ඉපලෝගම සහ ලංකාපුර පශු වෛද්‍ය කාර්යාලවලට අළුතින් පත්වීම් ලද සත්ව සංවර්ධන උපදේශකවරුනට යතුරුපැදි ලබා දුණි.ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ සැපයීම යටතේ මේස, පුටු, මුද්‍රණ යන්ත්‍ර, ශීතකරණ, ශල්‍ය උපකරණ, ජීවානුහරණ උපකරණ සහ අල්මාරි සපයා ඇත.

තිරප්පනේ සත්ව ගොවිපළෙහි විදුලි වැට ඉදිකිරීම තුළින් තිරප්පනේ සත්ව ගොවිපළෙහි ආරක්ෂාව සඳහා පැවති විශාල ගැටළුවක් මෙම ව්‍යාපෘතිය තුළින් විසඳාගත හැකි වූ අතර එම ව්‍යාපෘතිය උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කෙරුණි.තිරප්පනේ සත්ව ගොවිපළෙහි ළිඳ ජාතික ජල සම්පත් මණ්ඩලය මගින් මීටර් 65ක් ගැඹුරු කර ඉදිකරවා ගන්නා ලදී.එසේම තිරප්පනේ සත්ව ගොවිපළෙහි අභ්‍යන්තර මාර්ග පිළිසකර කිරීමද 2016 සංවර්ධන කාර්යය යටතේ සිදු කරන ලද අත්‍යාවශ්‍ය සංවර්ධන ව්‍යාපෘතින් විය.

2016 වසරෙහිදී ඇතිවූ නියං තත්වය මත සත්ව පෝෂණ ව්‍යාපෘති අපේක්ෂා කළ ආකාරයට ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා රු.මි. 5.0 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර එයින් රු.මි. 2.02 ක ප්‍රතිපාදන ඉතිරි විය. කිරි නිෂ්පාදන ප්‍රමිතිය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය සඳහා රු.මි. 1.0 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ භෞතික ඉලක්ක සපුරා ගත්තද රු.මි. 0.43ක මූල්‍ය ප්‍රතිපාදන ඉතිරි විය. කෘතිම සිංචන ප්‍රවර්ධන ව්‍යාපෘතිය නවතම ව්‍යාපෘතියක් වූ අතර ඒ සඳහා රු.මි. 5.0 ක් වෙන්කර තිබුනි. මේ යටතේ දිරි දීමනා ගෙවීමේ ප්‍රායෝගික ගැටළු මතුවීම හේතුවෙන් රු.මි. 2.17ක ප්‍රතිපාදන ඉතිරි විය. තිරප්පනේ සත්ව ගොවිපලෙහි නව කුකුළු නිවාසයක් අළුතින් ඉදිකර කිකිළි පැටවුන් ඇති කිරීමේ කාර්යය පුළුල් කිරීමට රු.මි. 1.5 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබුනද අමාත්‍යාංශය මගින් ගම් කිකිළියන් පිටතින් මිලදී ගැනීමට කටයුතු සිදුකිරීම හේතුවෙන් නව කුකුළු නිවාසයක් ඉදිකිරීම අවශ්‍ය නොවීමෙන් සම්පූර්ණ ප්‍රතිපාදන ඉතිරිවිය. තිරප්පනේ සත්ව ගොවිපලෙහි ගොඩනැගිලි අළුත්වැඩියාව සඳහා රු.මි. 10.0 ක ප්‍රතිපාදන වෙන්වුවද කාර්යය ඉටුකරවා ගැනීමේදී වැය බර අඩුවීමෙන් රු.මි. 4.62ක ප්‍රතිපාදන ඉතිරි විය. එසේම තිරප්පනේ සත්ව ගොවිපලෙහි ගැඹුරු ළිඳක් ඉදි කිරීම සඳහා වෙන් කළ රු.මි. 3.0ක ප්‍රතිපාදනයෙන් රු.මි. 2.35ක් සහ ජල ටැංකිය සහ පොම්පය සවිකිරීම සඳහා වූ රු.මි. 2.5 න් රු.මි. 1.0ක් ද ඉතිරි විය. ඒ අනුව ඉතිරි වූ මුළු මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 14.09 ක් විය..

මෙලෙස ඉතිරිවූ සම්පූර්ණ මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය ජංගම සායන පැවැත්වීම සඳහා රු.මි. 0.16ක්, කිරි ගොවිපල් සංවර්ධනය සඳහා රු.මි. 7.93ක්, තිරප්පනේ සත්ව ගොවිපලෙහි විදුලි වැටට සූර්යබල පහන් සවි කිරීම සඳහා රු.මි. 2.0ක් සහ පොළොන්නරුව පශු වෛද්‍ය කාර්යාලයේ අවත්වැඩියාවේ අමතර වැඩ සඳහා ඉදිරිපත්වූ අතුරු ඇස්තමේන්තුවට රු.මි. 4.0 ක් ලෙස ආයෝජනය කළ හැකි අයුරින් ව්‍යාපෘති සංශෝධනය කරවා ගෙන ක්‍රියාත්මක කරන ලදී.

## 05. වෙනත් මූල්‍ය ප්‍රභව යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශ මූල්‍ය ප්‍රතිපාදන යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ අභිජනන ගොවිපල් 17ක් සංවර්ධනය කිරීම සඳහා රු.මි. 1.49ක් වැය කර කිරි දොවන යන්ත්‍ර 3ක් සපයා ඇති අතර සත්ව නිවාස 13ක් ඉදිකර එක් කිරි ගවයෙකු ලබා දී ඇත. කාන්තා මූලික කිරි සැකසුම්කරුවන් සවිබල ගැන්වීම යටතේ සැකසුම්කාරිණියන් 9 දෙනෙකු සඳහා ශීතකරණ 3ක් ලබා දී ඇති අතර කිරි සැකසුම් මධ්‍යස්ථාන 3ක් නවීකරණය කර දී ඇත. ඉතිරි මධ්‍යස්ථාන 3 සඳහා ක්‍රීම් සෙපරේටර් 2ක්, කිරි උණුකරණ උපකරණ කට්ටල 2ක්, KM 010 මාදිලි මික්ස්චර් බීටරයක්, මැනුවල් සීලරයක් සහ ප්‍රින්ටින් කිට් 1ක් ලබා දී ඇත. මෙම කාන්තා ප්‍රතිලාභීන් සඳහා රජය රු.මි. 0.4ක මූල්‍ය අනුග්‍රහයක් ලබා දී ඇත. තවද කිරි ගොවිපල් 4ක් සඳහා රු.මි. 0.12 ක් වැය කර කිරි ගවයින් 4 දෙනෙකු ලබා දී ඇත. ඊට අමතරව පවුල් පෝෂණ තත්වය ඉහළ නැංවීම සඳහා රු.මි. 1.124ක් වැය කර ප්‍රතිලාභීන් 2,720 දෙනෙකු සඳහා මාසයක් වයසැති කිකිළි පැටවුන් 2,720ක් ලබා දී ඇත.




පොළොන්නරුව දිස්ත්‍රික්කයේ රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ රු.මි. 0.36ක් වැයකර ගව අභිජනන ගොවිපල් 4ක් සඳහා ගව නිවාස ඉදිකර දී කිරි දොවන යන්ත්‍රයක්ද සපයා ඇත. එසේම සුළු පරිමාණ කිරි ගොවිපල් 19ක් සඳහා රු.මි. 0.993ක් වැයකර කිරි ගවයින් 10 දෙනෙකු සහ තෘණ කැබලි කිරීමේ යන්ත්‍ර 9ක් ලබා දී ඇත. එසේම කාන්තා මූලික කිරි සැකසුම්කාරිණියන් 8 දෙනෙකු සඳහා රු.මි. 0.395ක් වැය කර ක්‍රීම් සෙපරේටර් 2ක්, ශීතකරණයක්, කිරි උණුකරන භාජන කට්ටලයක්, මී ගව දෙනක්, යෝගට් සෑදීමට අවශ්‍ය උපකරණ සහ කොයිල් සීලර් මැෂින් යනාදිය ලබා දී ඇත.

ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කිරි ගොවිපල් 37 ක රු.මි. 2.14ක ආයෝජනයක් මගින් කිරි දෙනුන් 29ක්, කිරි දොවන යන්ත්‍ර 5ක්, තෘණ කැබලි කිරීමේ යන්ත්‍ර 3ක්, පුං ගවයින් දෙදෙනෙක්, මී ගව දෙනක් සහ මී ගවයෙක්, ජීව වායු ඒකකයක්, විදුලි සහ ජල මෝටරයක් ලබා දී ඇත. මෙම වැඩසටහන යටතේම එළු ගොවිපල් 15ක් සඳහා රු.මි. 0.9ක් වැය කර පට්ටි එළුවන් 13ක් සහ එළිච්චියන් 59 ක් ලබා දී ඇති අතර එළු ගාල් 4ක් ද ඉදි කර දී ඇත.

ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සුළු පරිමාණ කිරි ගොවිපල් 10ක් සඳහා රු.මි. 0.582ක් වැයකර කිරි දෙනුන් 11 දෙනෙකු සහ කිරි දොවන යන්ත්‍රයක් ලබා දී ඇත.

එසේම රු.මි. 0.72ක් වැයකර එළු ගොවිපල් 12ක් සඳහා එළුවන් 10ක්, එළිච්චියන් 48ක් ලබා දී ඇති අතර එළු ගාල් 8ක් ඉදිකර දී ඇත.

සීමිත පහසුකම් යටතේ වුවද දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කෙරෙන සංවර්ධන ව්‍යාපෘති ඇතුළු සියළු සේවාවන් සඳහා ඉතා හොඳ දායකත්වයක් ලබා දුණි. ගොවීන් මෙම දෙපාර්තමේන්තුවෙන් ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වන්නේ සත්ව රෝග ප්‍රතිකාර සහ පාලනයත් සතුන්ගේ ආරය උසස් කර ගැනීමේ සේවාවන් ලබා ගැනීමයි. එසේම රජයේ ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා අපගේ සහාය අපේක්ෂා කළද වර්තමානයේ මෙම දෙපාර්තමේන්තුව මුහුණ පා සිටින සත්ව සංවර්ධන උපදේශකයින්ගේ හිඟය නිසා එම අපේක්ෂාවන් ඉටු කිරීම අති දුෂ්කර කටයුත්තක්ව ඇත.

එසේම 2016 වර්ෂයේ කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා පළාතේ දිස්ත්‍රික්ක දෙක දැක්වූ දායකත්වය පහත පරිදි වේ.

### අනුරාධපුර දිස්ත්‍රික්කය

| අංකය | ව්‍යාපෘතිය | ඉලක්කය | වෙන්කළ ප්‍රතිපාදනය (රු.මි) | නිමකළ සංඛ්‍යාව | | වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|
| | | | | සංඛ්‍යාව | % | | |
| 1. | ජංගම සායන පැවැත්වීම | 588 | 1.07 | 476 | 81 | 1.068 | 100 |
| 2. | සත්ව පෝෂණය ඉහල නැංවීම | ගොවිපල් 350 | 2.05 | 209 | 60 | 2.02 | 98.5 |
| 3. | කිරි නිෂ්පාදන ප්‍රමිතිය ඉහල නැංවීම | ව්‍යවසායකයින් 64 | 0.45 | 64 | 100 | 0.44 | 99 |
| 4. | කෘතිම සිංචන ප්‍රවර්ධනය | * | 1.68 | | * | 1.67 | 99 |
| 5. | කිරි ගොවිපල් සංවර්ධනය | 342 | 18.68 | 539 | * | 18.63 | 100 |
| 6. | පශු වෛද්‍ය කාර්යාල අළුත්වැඩියාවන් | 3 | 5.00 | 3 | 100 | 4.79 | 96 |
| 7. | යතුරුපැදි සැපයීම | 5 | 1.20 | 5 | 100 | 1.13 | 94 |
| 8. | ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ සැපයීම | - | 3.30 | - | | 3.86 | * |
| 9. | පශු වෛද්‍ය කාර්යාල ඉදිකිරීම - මිහින්තලය | 1 | 10.00 | * | | | |
| 10. | තිරප්පනේ සත්ව ගොවිපොලෙහි ගොඩනැගිලි අළුත්වැඩියාවන් | 3 | 5.38 | 2 | 66 | 1.23 | * |
| 11. | සත්ව ගොවිපොලෙහි විදුලි වැට ඉදිකිරීම | 1 | 7.00 | * | | 0.25 | 4 |

| අංකය | ව්‍යාපෘතිය | ඉලක්කය | වෙන්කළ ප්‍රතිපාදනය (රු.මි) | නිම කළ සං ඛ්‍යා ව | වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) | අංක ය |
|---|---|---|---|---|---|---|---|
| **12.** | සත්ව ගොවිපොලෙහි ගැඹුරු ළිදක් ඉදිකිරීම | 1 | 0.65 | 1 | 100 | 0.65 | 100 |
| 13. | සත්ව ගොවිපොලෙහි ලීටර් 10,000 ජල ටැංකියක් ඉදිකිරීම සහ ජල පොම්පයක් සවිකිරීම | 1 | 1.50 | 1 | 100 | 1.47 | 98 |
| 14. | ගොවිපොලෙහි අභ්‍යන්තර මාර්ග පිළිසකර කිරීම | | 0.50 | * | 100 | 0.97 | 19 |
| **එකතුව** | | | **58.46** | | | **37.3** | |

## පොළොන්නරුව දිස්ත්‍රික්කය

| අංකය | ව්‍යාපෘතිය | ඉලක්කය | වෙන්කළ ප්‍රතිපාදනය (රු.මි.) | නිමකළ සංඛ්‍යාව | | වියදම රු.මි. | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| | | | | සංඛ්‍යාව | % | | |
| 1. | ජංගම සායන පැවැත්වීම | 294 | 0.59 | 114 | 39 | 0.58 | 98 |
| 2. | සත්ව පෝෂණය ඉහල නැංවීම | ගොවිපල් 150 | 0.93 | 92 | 61 | 0.92 | 99 |
| 3. | කිරි නිෂ්පාදන ප්‍රමිතිය ඉහල නැංවීම | ව්‍යවසායකයි න් 20 | 0.12 | 20 | 100 | 0.114 | 99 |
| 4. | කෘතිම සිංචන ප්‍රවර්ධනය | * | 1.15 | | * | 1.14 | 99 |
| 5. | කිරි ගොවිපල් සංවර්ධනය | 217 | 9.25 | 260 | * | 9.22 | 100 |
| 6. | පශු වෛද්‍ය කාර්‍යාල අළුත්වැඩියාවන් | 3 | 14.00 | * | | | |
| 7. | යතුරුපැදි සැපයීම | 1 | 0.30 | 1 | 100 | 0.23 | 77 |
| 8. | ගෘහභාණ්ඩ සහ කාර්‍යාලීය උපකරණ සැපයීම | - | 1.70 | - | | 0.98 | 58 |
| **එකතුව** | | | **28.04** | | | **13.12** | |

එසේම වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදි අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා ආයතන අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් අනෙකුත් පාර්ශවකරුවන්ද සහයෝගයෙන් කටයුතු කරමින් කාර්යාවලිය මෙහෙයවීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ලඟා විමටත් ආයතනයේ කාර්ය සාධනය ඉහල නංවා ගැනීමටත් හැකි විය.

08

# 8.පළාත් සෞඛ්‍ය,දේශීය වෛද්‍ය,සමාජ සුභසාධන,පරිවාස හා ළමාරක්ෂක,පරිසර සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය

## 8.1. පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

## 8.2. පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව

## 8.3. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

## 8.4. පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව

08

# පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක, පරිසර සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය

### ඉදිරි දැක්ම

“සුව සම්පන්න හා සුරක්ෂිත ප්‍රජාවක්, සමෘද්ධිමත් පළාතක්”.

### මෙහෙවර

“සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම”.

### අරමුණු

- පළාත තුළ සෞඛ්‍ය සම්පන්න ජනතාවක් හා යහපත් ළමා පරපුරක් බිහිකිරීම.
- ආබාධිත හා අසරණභාවයට පත්වූවන් නගා සිටුවීම.
- ජව සම්පන්න ප්‍රබෝධමත් ජනතාවක් බිහි කිරීම.
- අසරණ පවුල් නගාසිටුවීම.
- පරිසර දූෂණය වැළැක්වීම හා පරිසර සංරක්ෂණයට දායක වෙමින් අනාගත පරපුර සඳහා සුවදායී පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම.

### ප්‍රධාන කාර්යයන්




### ප්‍රධාන උපාය මාර්ගයන්

- ගුණාත්මක සෞඛ්‍ය සේවයක් ඇති කිරීම.
- දේශීය වෛද්‍ය ක්‍රමය වඩාත් ප්‍රචලිත කිරීම.
- පළාතට අවශ්‍ය නිමි ඖෂධ පළාත තුළම නිපදවීම.
- ළමා අපචාරවලට ලක්වූවන් රැකගැනීම හා පුනරුත්ථාපනය කිරීම.
- ආබාධ සහිත වූවන් නගාසිටුවීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- අසරණ පවුල් නගා සිටුවීමට කටයුතු කිරීම.
- මානසික හා කායික වශයෙන් නිරෝගී ශක්ති සම්පන්න ප්‍රජාවක් බිහි කිරීම.
- නගර හා උප නගරවල පරිසර සංරක්ෂණය හා අලංකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ස්වභා උයන් මහජන පරිහරණයට සුදුසු පරිදි වැඩිදියුණු කිරීම.
- පිරිසිදු පානීය ජලය මහජනතාවට ලබාදීම හා උල්පත් සංරක්ෂණය.
- පාසල් හා විශ්ව විද්‍යාල සිසුන් පරිසරය ආරක්ෂා කිරීමට නැඹුරු කිරීම.

### කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 49 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 44 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 02 |
| අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික පදනමේ සිටින සංඛ්‍යාව | 02 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 33.03 | 30.44 | 2.59 | 92.15 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 15.67 | 15.18 | 0.49 | 96.87 |
| **එකතුව** | **48.70** | **45.62** | **3.08** | **93.68** |

### මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 304.17 | 191.356 | 116.08 | 62.91 |
| යන්ත්‍ර සූත්‍ර සවිකිරීම් හා උපකරණ | 87.25 | 47.35 | 40.10 | 54.27 |
| වාහන | 28.78 | 27.82 | 0.46 | 96.67 |

| | | | | |
|---|---|---|---|---|
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 29.63 | 20.87 | 9.09 | 70.44 |
| **එකතුව** | **449.83** | **287.39** | **165.73** | **63.88** |

**මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය**

| අංකය | ව්‍යාපෘතිය | වෙන්කළ ප්‍රතිපාදනය (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| **අමාත්‍ය කාර්ය මණ්ඩලය** | | | | |
| 1 | වාහන අලුත්වැඩියා | 0.50 | 0.00 | 0 |
| 2 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | 0.34 | 0.34 | 100 |
| **අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය** | | | | |
| 3 | ලේකම්/සහකාර ලේකම් නිල නිවාස අලුත්වැඩියාව | 1.10 | 0.88 | 80 |
| 4 | වාහන අලුත්වැඩියාව | 0.78 | 0.32 | 41 |
| 5 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 0.86 | 0.76 | 84 |
| 6 | සහකාර ලේකම් (සැලසුම්/මුදල්) නිල නිවස ඉදි කිරීම II අදියර | 5.50 | 5.30 | 97 |
| 7 | දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 0.23 | 0.93 | 41 |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | | | | |
| 8 | පරිසර සත්කාරක වැඩසටහන | 4.5 | 4.40 | 100 |
| 9 | පළාතේ තෝරාගත් නගර හා උපනගරවල පරිසර සංරක්ෂණ හා අලංකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | 8.0 | 7.00 | 87 |
| 10 | පළාතේ හඳුනාගත් උල්පත් සංරක්ෂණය සඳහා උල්පත් ජලය මහජනතාවට පාවිච්චිය සහා විධිමත් ක්‍රමවේදයක් සැකසීම | 2.1 | 2.10 | 98 |
| 11 | සුව සේවා පෙළහර | 0.2 | 0.20 | 99 |
| 12 | හඳුනාගත් රාජ්‍ය හා පොදු ස්ථාන සඳහා පිරිසිදු පානීය ජලය ලබා දීම | 2.8 | 2.40 | 98 |

| | | | | |
|---|---|---|---|---|
| 13 | ඖෂධීය හා දුර්ලභ ශාක ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 0.25 | 0.21 | 84 |
| 14 | පොදු ස්ථානවල පාංශු සංරක්ෂණ විධි හඳුන්වා දීම. | 1.00 | 1.00 | 0 |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | | | | |
| 15 | සුව සේවා පෙළහර | 1.00 | 1.00 | 100 |
| 16 | පළාතේ තෝරාගත් නගර හා උපනගරවල පරිසර සංරක්ෂණ හා අලංකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | 2.00 | 1.70 | 83 |
| 17 | ඖෂධීය හා දුර්ලභ ශාක ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 0.45 | 0.03 | 20 |
| 18 | පොදු ස්ථානවල පාංශු සංරක්ෂණ විධි හඳුන්වා දීම. | 0.40 | 0.0 | 0 |

2016 වර්ෂයේ සංවර්ධන කටයුතු සඳහා පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ රුපියල් මිලියන 32 ක් වෙන්කර තිබූ අතර එයින් රුපියල් මිලියන 28ක මුදලක් වැයකර ඇති අතර එය ප්‍රතිශතාත්මකව 87%කි. පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 49ක් වෙන් කර තිබූ අතර එයින් රුපියල් මිලියන 46ක් වැයකර ඇත. එය ප්‍රතිශතාත්මකව 94 %කි.මෙම අමාත්‍යාංශය යටතේ පවතින සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු මෙහෙයවමින් ජනතාවට ඉටුවිය යුතු සේවය උපරිම මට්ටමින් ඉටුකිරීම මගින් හොඳ මහජන සේවයක් ලබාදීමට කටයුතු කර ඇති අතර 2016 වර්ෂයේ කාර්ය සාධනය ඉහළ මට්ටමක පවතී.

එසේම 2016 වර්ෂයේ සංවර්ධන කටයුතු ප්‍රධාන ශිර්ෂ කිහිපයක් ඔස්සේ ක්‍රියාත්මක විය.



## 01. පරිසර සත්කාර වැඩසටහන

ප්‍රජාව විසින් අපද්‍රව්‍ය පරිසරයට මුදාහැරීම නිසා වන පරිසර දූෂණය අවම කිරීම සඳහා පරිසරයේ ඇති ප්ලාස්ටික්, පොලිතින්, ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය හා නොදිරන අපද්‍රව්‍ය පූර්ණ ලෙස විධිමත්ව බැහැර කිරීම පිලිබඳව දැනුවත් කිරීමේ හා ප්‍රායෝගික වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ජනතාවට සුරක්ෂිත පරිසරයක් ඇති කිරීමට කටයුතු කිරීම සිදු විය. මෙම වැඩසටහන් පහත සඳහන් ස්ථානවලදී ක්‍රියාත්මක කරන ලදී.

- පොළොන්නරුව ගල් විහාරය.
- අනුරාධපුර පූජා නගරය, තන්තිරිමළය පුදබිම, මිහින්තලය පූදබිම.
- විජිතපුර රජමහ විහාරය.
- හබරණ නගරය.
- හබරණ - මින්නේරි රක්ෂිතය.

## 02. පළාතේ තෝරාගත් නගර හා උපනගරවල පරිසර සංරක්ෂණ හා අලංකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ප්‍රජාවට සනීපාරක්ෂක පහසුකම් අවම වීම නිසා මුහුණපාන දුෂ්කරතාවයන්ට පිළියමක් වශයෙන් පොදු ස්ථානවල ජනතාවට හිතකර හා අලංකාර ලෙස තෝරාගත් උපනගර කේන්ද්‍ර කොටගෙන වැසිකිළි පද්ධති ඉදිකිරීමට කටයුතු කළ අතර ඒවා පහත සඳහන් ස්ථානවල ස්ථාපිත කරන ලදී.

- මැදවච්චිය - පැරණි සතිපොළ භූමිය
- හොරොව්පොතාන - නගරයේ සතිපොළ භූමිය
- නොච්චියාගම පැරණි ප්‍රාදේශීය සභා කාර්යාල භූමිය
- තලාව - තඹුත්තේගම බස්නැවතුම්පොළ
- ඇළහැර - බකමූණ නගරයේ බස්නැවතුම්පොළ අසළ

## 03. පළාතේ හඳුනාගත් උල්පත් සංරක්ෂණය සඳහා උල්පත් ජලය මහජනතාවට පාවිච්චිය සභා විධිමත් ක්‍රමවේදයක් සැකසීම

පරිසරය සුරකිමින් නිරෝගී ජනතාවක් උදෙසා අවශ්‍ය පහසුකම් ලබාදීමේ අරමුණින් ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සපුරාලීම සඳහා පළාත තුළ පිහිටා ඇති ප්‍රධාන ජල උල්පත් සංරක්ෂණයකර සීමා මායිම් ලකුණු කිරීමටත් වකුගඩු රෝග වැනි රෝගවලින් මිදීමට අවශ්‍ය පිරිසිදු පානීය ජලය ලබාදීමට කටයුතු කළ අතර කැබිතිගොල්ලැව සිංහයා උල්පත සංරක්ෂණය කරන ලදී.

## 04. සුව සේවා පෙළහර

අමාත්‍යාංශය හා ඊට අදාළ දෙපාර්තමේන්තු ඒකාබද්ධව ජනතාව මුහුණ දෙන ගැටලුවලට යම් හෝ පිළියමක් ලබාදීමේ අරමුණින් ජනතාව අතරට ගොස් ඔවුන්ගේ ගැටලු විසඳීමට කටයුතු කළ අතර පහත සඳහන් ස්ථානවලදී මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- ගලෙන්බිඳුණුවැව - මධමහා විද්‍යාලය
- මැදවච්චිය - ශ්‍රී භාරතීන්ද්‍ර රජමහා විහාරය
- කැඹිතිගොල්ලෑව - ධර්මවර්ධනාරාමය

## 05. හඳුනාගත් රාජ්‍ය හා පොදු ස්ථාන සඳහා පිරිසිදු පානීය ජලය ලබා දීම

වකුගඩු රෝග වැනි රෝගවලින් මිදීමට අවශ්‍ය පිරිසිදු පානීය ජලය ලබාදීමට කටයුතු කළ අතර පහත සඳහන් ස්ථානවලදී ප්‍රති ආශ්‍රත ජල පෙරණ ලබා දෙන ලදී.

- දුටුවැව - ගලෙන්බිඳුණුවැව ශ්‍රී ගාමිණී රජමහා විහාරය
- සීප්පුකුලම - වෙරුප්පන්කුලම වේලුසුමන රජමහා විහාරය
- ගලෙන්බිඳුණුවැව - අ/ ගලෙන්බිඳුණුවැව මධ්‍ය මහා විද්‍යාලය
- බුල්නෑව - ලෝලුගස්වැව - දොරවේරුව වෙද මැදුර
- නැනුප - නිවත්තකචේතිය මහා විද්‍යාලය, අනුරාධපුර
- කැබිතිගොල්ලෑව -18 - ශ්‍රී ධර්මවර්ධනාරාමය, කැබිතිගොල්ලෑව
- ඉලුක්වැව, ගලෙන්බිඳුණුවැව - ශ්‍රී අභිනවාරාමය
- කහටගස්දිගිලිය - අ/ දිගන්හල්මිල්ලෑව විදුහල
- මිහින්තලේ, තම්මැන්නාව - ප්‍රාදේශීය රෝහල තම්මැන්නාව
- ගල්කන්දේගම - 85 - ගල්කන්දේගම ශ්‍රී සම්බුද්ධ විහාරය, ගල්කන්දේගම, කැදෑව
- ඇත්දත්කල්ල, පේමඩුව - හස්පීදත්ත විහාරය
- පදවිය - පදවිය මූලික රෝහල

## 06. ඖෂධීය හා දුර්ලභ ශාක ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

පාරිසරික වශයෙන් වැදගත් අධ්‍යාපනික වටිනාකමක් සහිත ග්‍රන්ථ 200ක් පාසල් 200කට බෙදාදීම හා පාසල් 11කට ඖසු පැල 415ක් බෙදාදීම සිදු කරන ලදී.

එසේම වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදි අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් අනෙකුත් පාර්ශවකරුවන්ද සමග සහයෝගයෙන් කටයුතු කරමින් කාර්යාවලිය මෙහෙයවීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ලඟා වීමටත් ආයතනයේ කාර්ය සාධනය ඉහල නංවා ගැනීමටත් හැකි විය.

**8.1**

# පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### ඉදිරි දැක්ම

" නිරෝගීමත් ජනතාවක්, සමෘද්ධිමත් පළාතක්"

### මෙහෙවර

"උතුරු මැද පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් සමාන හා සමානුපාතික ලෙස ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් ප්‍රජාව වෙත සැපයීම සඳහා තම සම්පත් කාර්යක්ෂම හා ඵලදායි ලෙස යොදවනු ඇත. "

### දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු

- උතුරු මැද පළාත් සෞඛ්‍ය ආයතනයන්හී යටිතල පහසුකම් සංවර්ධනය කිරිම.
- උතුරු මැද පළාතට සුවිශේෂී වු සෞඛ්‍ය ගැටළුවන වකුගඩු රෝග, වස විෂ ශරීරගතවීම් සහ පිළිකා රෝග තත්වයන් විධිමත් ලෙස පවත්වාගෙන යාම.
- ප්‍රාදේශීය රෝහල් මගින් ගුණාත්මක ප්‍රතිකාර, පළාතේ මුලික රෝහල් අංග සම්පූර්ණ පහසුකම් සහිත රෝහල් ලෙස වැඩිදියුණු කිරීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ප්‍රජා දායකත්වය සහ අන්තර පාර්ශවීය සම්බන්ධතා වැඩිදියුණු කිරීම.

### කෙටිකාලින අරමුණු

- වාර්ෂිකව වෙන්වන ප්‍රතිපාදනයන් කාර්යක්ෂම ලෙස ආයෝජනය කිරිම.
- ප්‍රමුඛතාවය මත හඳුනාගත් ඉලක්කගත වැඩසටහන් කාලානුරූපව ක්‍රියාත්මක කිරිම.
- වකුගඩු රෝග කළමනාකරණයේදී හඳුනාගත් රෝහල් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
- වසවිෂ ශරීරගත විම් සහ පිළිකා තත්වයන් කළමනාකරණය ඉලක්කසහගත ලෙස ක්‍රියාත්මක කිරිම.
- සුනඛ වන්ධ්‍යාකරණ වැඩසටහන් ඉලක්කසහගත ලෙස ක්‍රියාත්මක කිරිම
- හදිසි ප්‍රතිකාර ඒකක වැඩිදියුණු කිරීම.
- තොරතුරු තාක්ෂණය යොදා ගනිමින් සෞඛ්‍ය දෙපාර්තමේන්තු කළමනාකරණය.

### ප්‍රධාන කාර්යයන්

- ප්‍රතිකාර සෞඛ්‍ය සේවා වර්ධනය
- රෝග වළක්වා ගැනීමේ සෞඛ්‍ය සේවා වර්ධනය
- යටිතල පහසුකම් සංවර්ධනය
- පර්යේෂණ හා නියමු සංවර්ධනය
- සමාජ සජිවිකරණය හා බල ගැන්විම.
- අන්තර් ආංශික සම්බන්ධතා ශක්තිමත් කිරිම.
- ආයතනික ධාරිතා සංවර්ධනය
- යහපාලන කටයුතු සංවර්ධනය

### ප්‍රධාන උපාය මාර්ග

- ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත්ව අධීක්ෂණය කිරීම.
- පුහුණු වැඩසටහන් දත්ත පද්ධතියක් මගින් යාවත්කාලීන කිරීම.
- කාර්ය මණ්ඩල තොරතුරු සහ පෞද්ගලික ලිපිගොනු,වැටුප් වර්ධක,පත්වීම් සම්බන්ධයෙන් ඉලක්කසහගත ලෙස කළමනාකරණය සිදු කිරිම.
- පුහුණුකරුවන් පුහුණු කිරීම,දැනුවත් කිරිම් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ගුණාත්මක ලෙස සිදු කිරිම.
- සෞඛ්‍ය ආයතන ආයෝජනයේදී ප්‍රතිකාර සේවා සඳහා ප්‍රමුඛත්වය ලබාදීම.
- ප්‍රදේශයේ ඇති සෞඛ්‍ය ආයතන අදාල ශ්‍රේණියට අනුව සියලු පහසුකම් ලබාදිය හැකි සෞඛ්‍ය ආයතන ලෙස ක්‍රියාත්මක කිරීම.
- පළාත තුළ ක්‍රියාත්මක වන පර්යේෂණ හා සමීක්ෂණ, පළාත් පර්යේෂණ හා සමාලෝචන කමිටුව මගින් සාකච්ඡා කිරීම.

### කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 4487 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 3832 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 1007 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 2.79 | 2.78 | 0.01 (රු.4547) | 99.64 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 0.48 | 0.46 | 0.02 (රු23471) | 95.83 |
| **එකතුව** | **3.27** | **3.24** | **0.03** | **99.08** |

### මූලධන වියදම

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් යන්ත්‍රසූත්‍ර සවිකිරීම් හා උපකරණ,වාහන සහ වෙනත් මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 1045.49 | 428.54 | 616.95 | 40.99 |
| **එකතුව** | **1045.49** | **428.54** | **616.95** | **40.99** |

### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය

| මූල්‍ය ප්‍රභවය | වෙන්කළ මුදල (රු.මි) | අඛණ්ඩ/නව | ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි) | වියදම (රු.මි) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| ප.නි.සං.ප්‍ර | 588.82 | අඛණ්ඩ | 28.82 | 165.17 | 13 |
| | | නව | 560.00 | 213.00 | 177 |
| ප.ස.සං.ප්‍ර | 297.37 | අඛණ්ඩ | 114.37 | 79.79 | 57 |
| | | නව | 183.00 | 169.43 | 195 |



**2016** වර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අඛණ්ඩ ව්‍යාපෘති සඳහා රු.මි.30ක් සහ නව ව්‍යාපෘති සඳහා රු.මි 560ක්,පළාත් සභා ප්‍රදාන යටතේ රු.මි. 06ක් හා ලෝක බැංකු ආධාර යටතේ අඛණ්ඩ ව්‍යාපෘති සඳහා රු.මි 91 සහ නව ව්‍යාපෘති සඳහා රු.මි 365ක් වෙන්කර තිබුණි. මෙම වැඩසටහන් මඟින්

- නව ඉදි කිරීම් ව්‍යාපෘති ,
- අත්‍යාවශ්‍ය අලුත්වැඩියා කිරීම,
- අඛණ්ඩ ව්‍යාපෘති සම්පූර්ණ කිරීම,
- වෛද්‍ය උපකරණ හා කාර්යාලවලට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම
- ආකල්ප වර්ධනය හා දැනුවත් කිරීම් සඳහා යොදා ගන්නා ලදී.

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අඛණ්ඩ ව්‍යාපෘති 15ක් සහ නව ව්‍යාපෘති 181ක් පමණ සහ දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන [ප්‍රදාන යටතේ අඛණ්ඩ ව්‍යාපෘති 57 සහ නව ව්‍යාපෘති 200ක් පමණද ඇතුළත්කර තිබුණි. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ මූල්‍ය ප්‍රගතිය 40%ක්ද, දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ප්‍රදාන යටතේ 43%ක්ද ලෙස අත්පත්කර ගන්නා ලදී.

සමස්තයක් ලෙස 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් ලැබුනද ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේ ප්‍රමාද, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේදී සිදු වූ දුර්වලතා හා කොන්ත්‍රාත්කරුවන් නියමිත කාලයට ඉදි කිරීම් නොකිරීම හේතු විය.

මීට අමතරව මානව හා භෞතික සම්පත්වල හිඟකමද අපේක්ෂිත ඉලක්ක ඉටුකර ගැනීමට බාධාවක් විය.කෙසේ වුවද බොහෝ දුෂ්කරතා මැද 2016 වර්ෂයේදී ප්‍රගතිය අත්පත්කර ගැනීමට පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව සමත් විය.

8.2

# පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව

### දැක්ම

" සොබාදහමට අනුකූල වු නිරෝගිමත් ජනතාවක්, සමෘද්ධිමත් පළාතක් "

### මෙහෙවර

" ආයුර්වේද දර්ශනය අර්ථවත් ලෙස උපයෝගී කරගනිමින් රෝග නිවාරණ හා ප්‍රතිකාර හා පර්යේෂණ සේවා වැඩිදියුණු කිරීම, පාරම්පරික වෛද්‍ය ක්‍රමය හා ඖෂධීය ශාක වගාව සංරක්ෂණය, ප්‍රවර්ධනය සහ ඖෂධ නිෂ්පාදනය ඉහළ නැංවීම විනිවිද භාවයෙන් හා ආයුර්වේද සේවාවේ හා අනෙකුත් පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් යුතුව ක්‍රියාවට නැංවීම. "

### අරමුණු

ජනතාවගේ සෞඛ්‍ය සම්බන්ධයෙන් වැඩිම වගකීමක් දරන්නන් බවට පත් වීම.

### ප්‍රධාන කාර්යයන්

පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය සහ ප්‍රවර්ධනය.

රෝග නිවාරණ සත්කාර සංවර්ධනය.

ඖෂධීය ශාක වගාව සහ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සංවර්ධනය



රෝගී ප්‍රතිකාර සේවාව සංවර්ධනය

ආයතනික ධාරිතා සංවර්ධනය

යහපාලන කටයුතු සංවර්ධනය

### ප්‍රධාන උපාය මාර්ගයන්

<u>රෝග නිවාරණ</u>

ආදර්ශ ගම්මාන ඇති කිරිම, ප්‍රවර්ධන සමාජ ඇති කිරිම, පාසල් සෞඛ්‍යදාන ඒකක ඇති කිරිම, පෙර පාසල් පෝෂණ වැඩ සටහන් ඇති කිරිම, රාජ්‍ය ආයතන දැනුවත් කිරිම, ජංගම සායන පැවැත්විම.

**රෝග ප්‍රතිකාරක සේවා**

සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකටම ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවක්, සෑම රෝහලකම ආයුර්වේද විවිධ සායන ආරම්භ කිරිම,සෑම රෝහලකම හා මධ්‍යම බෙහෙත් ශාලවකම බෝ නොවන රෝග සායන පැවැත්විම.

**ඖෂධ නිෂ්පාදනය වැඩි දියුණු කිරිම**

ඔසු ගොවින් ඇති කිරිම, පළාත් ඖෂධ නිෂ්පාදනාගාරය වැඩි දියුණු කිරිම, රෝහල් ආශ්‍රිතව ඔසඋයන් 7 ක් අරම්භ කිරිම.

**කාර්යය මණ්ඩල සංයුතිය**

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 559 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 457 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 142 |

**මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්**

| වියදමේ ස්වාභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 207.00 | 203.00 | 4.00 | 98.07 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 77.00 | 76.80 | 0.20 | 99.74 |
| එකතුව | 284.00 | 279.80 | 4.20 | 98.52 |

**මූලධන වියදම්**

| වියදමේ ස්වාභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| යන්ත්‍රසූත්‍ර සවිකිරීම් හා උපකරණ | 0.50 | 0.50 | 0.00 | 100 |
| **එකතුව** | **0.50** | **0.50** | **0.00** | **100** |

**මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය**

| අංකය | ව්‍යාපෘතිය | වෙන්කල ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| | **පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - නව වැඩ** | | | |
| 01 | කැබිතිගොල්ලෑව අයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව ඉදිකිරීම | 3.29 | 2.89 | 100 |
| 02 | ඇලයාපත්තුව අයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව ඉදිකිරීම | 3.56 | 3.56 | 100 |
| 03 | තඹුත්තේගම ආයුර්වේද රෝහලේ පිරිමි වාට්ටුව | 5.41 | 1.72 | 90 |

| | | | | |
|---|---|---|---|---|
| | ඉදිකිරීම | | | |
| 04 | පළාත් ඖෂධ නිශ්පාදනාගාරයට වියළි ඖෂධ ගබඩාවක් ඉදිකිරීම. | 4.56 | 4.38 | 100 |
| 05 | මැදවච්චිය අයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව ඉදිකිරීම | 2.64 | 2.64 | 100 |
| 06 | ඇලහැර ආයු. රෝ. වාට්ටු දෙක ඉදිකිරීම - ii අදියර | 3.97 | 3.39 | 100 |
| 07 | ඇලහැර බෛසර්ජකාගාරය ඉදිකිරීම | 1.26 | 0.52 | 100 |
| 08 | සිරිපුර නිල නිවාසය ඉදිකිරීම | 1.20 | 0.65 | 100 |
| 09 | වැලිකන්ද නිල නිවාසය ඉදිකිරීම | 1.41 | 1.39 | 100 |
| 10 | මනම්පිටිය නිල නිවාසය ඉදිකිරීම | 1.69 | 1.62 | 100 |
| 11 | අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහලේ වාට්ටු අලුත්වැඩියාව | 13.00 | 12.32 | 95 |
| 12 | මින්නෙරිය මූලික ආයුර්වේද රෝහලේ වාට්ටු අලුත්වැඩියාව | 18.99 | 17.40 | 95 |
| 13 | පළාත් නිෂ්පාදනාගාරයට යන්ත්‍රසූත්‍ර සවිකිරීමට ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 7.56 | 5.79 | 95 |
| 14 | ඉපලෝගම ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව සෑදීම | 7.02 | 0.79 | 11 |
| 15 | විලච්චිය ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව සෑදීම | 7.69 | 7.691 | 100 |
| 16 | අත්තනකඩවල ආයුර්වේද මධ්‍යම බෙහෙත්ශාලා නිල නිවාසය අලුත්වැඩියාව | 3.98 | 2.91 | 95 |
| 17 | පාරම්පරික වෛද්‍ය වරුන්ගේ බෙහෙත් අලෙවි සැල හා පෝෂණ මන්දිරය ඉදිකිරීම | 5.50 | 0.72 | 13 |
| 18 | මැදිරිගිරිය ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව සෑදීම | 6.76 | 6.76 | 100 |
| 19 | රෝහල් උපකරණ මිළදී ගැනීම | 3.00 | 2.99 | 100 |
| 20 | යන්ත්‍ර සූත්‍ර මිළදී ගැනීම | 2.00 | 2.00 | 100 |
| 21 | ඔසු උයන සංවර්ධනය | 2.00 | 0.94 | 37 |
| 22 | ආයුර්වෙද ප්‍රවර්ධන සමාජ සවිබල ගැන්වීම | 2.50 | 2.41 | 95 |
| 23 | ආයුර්වේද ආදර්ශ ගම්මාන | 1.00 | 1.00 | 100 |

2016 වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුවේ සංවර්ධන කාර්යයන් සඳහා පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන 100 % ක භෞතික ප්‍රගතිය කරා ළඟා වීමට හැකි විය. ඉහත කී ප්‍රගතිය ළඟාකර ගැනීම සඳහා ආයතනයේ ප්‍රධාන කාර්යයන් මගින් කාර්යය සාධන ඉලක්ක ළඟාකර ගැනීම මගින් ජනතාව නිතර නිතර රෝගාබාධවලට ලක් වීම අඩු වීම. ප්‍රතිකාර සඳහා ගතවන ජනතාවගේ කාලය ඉතිරි වීම. රෝහල්වල තදබදය අඩු වීම, ජනතාවට සෞඛ්‍ය පහසුකම් වෙත ඇති ප්‍රවේශය වර්ධනය වීම, පළාතේ අකල් මරණ අඩු වීම, ජනතාවගේ වැඩ කළ හැකි දින ගණන වර්ධනය වීම, පළාතේ සිටින පාරම්පරික වෛද්‍යවරුන්ගෙන් සහ පාරම්පරික වෛද්‍ය ක්‍රම දන්නා අයගෙන් ජනතාවට ලැබෙන සේවය ඉහළ යාම, දේශීය පාරම්පරික දැනුම ආරක්ෂා වීම, පළාතේ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය ඉහළ යාම,පළාතේ නිෂ්පාදනය කෙරෙන ආයුර්වේද ඖෂධවල ගුණාත්මකභාවය වර්ධනය වීම වැනි ප්‍රතිලාභ පළාතේ ජනතාව වෙත ළඟාකර දීමට හැකි විය.

ඒ යටතේ කැබිතිගොල්ලෑව අයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව ඉදිකිරීම, ඇලයාපත්තුව අයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව ඉදිකිරීම, තඹුත්තේගම ආයුර්වේද රෝහලේ පිරිමි වාට්ටුව ඉදිකිරීම,පළාත් ඖෂධ නිශ්පාදනාගාරයට වියළි ඖෂධ ගබඩාවක් ඉදිකිරීම, මැදවච්චිය අයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව ඉදිකිරීම, ඇලහැර ආයුර්වේද රෝහලේ වාට්ටු දෙක ඉදිකිරීම - ii අදියර, ඇලහැර භෛසර්ජකාගාරය ඉදිකිරීම,සිරිපුර නිල නිවාසය ඉදිකිරීම,වැලිකන්ද නිල නිවාසය ඉදිකිරීම,මනම්පිටිය නිල නිවාසය ඉදිකිරීම,අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහලේ වාට්ටු අලුත්වැඩියාව,,මින්නෙරිය මූලික ආයුර්වේද රෝහලේ වාට්ටු අලුත්වැඩියාව,පළාත් නිෂ්පාදනාගාරයට යන්ත්‍රසූත්‍ර සවිකිරීමට ගොඩනැගිල්ලක් ඉදිකිරීම,ඉපලෝගම ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව සෑදීම,විලච්චිය ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව සෑදීම, අත්තනකඩවල ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලා නිල නිවාසය අලුත්වැඩියාව,පාරම්පරික වෛද්‍ය වරුන්ගේ බෙහෙත් අලෙවිසැල හා පෝෂණ මන්දිරය ඉදිකිරිම ,මැදිරිගිරියආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව ඉදිකිරීම හා අළුත්වැඩියා ව්‍යාපෘති අතර ප්‍රමුඛ ව්‍යාපෘති විය.

ආයුර්වේද රෝහල් හා මධ්‍යම බෙහෙත් ශාලා සඳහා අත්‍යාවශ්‍ය උපකරණ මිළදී ගැනීම,යන්ත්‍රසූත්‍ර මිළදී ගැනීම සඳහා යම් ආයෝජනයක් කිරීමට 2016 වර්ෂය තුළදී හැකි විය.

දේශීය පාරම්පරික වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කිරීමටත් මේවන විට පිහිටුවා ඇති ආයුර්වේද ප්‍රවර්ධන සමාජ සවිබල ගැන්වීම සඳහාත් ආයුර්වේද ආදර්ශ ගම්මාන පිහිටුවීම තුළින් පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව විශේෂ අවධානය යොමු කරමින් කටයුතු කර ඇත. ඒ තුළින් විෂය පථයේ සංවර්ධනය සඳහාත් ආයතනයේ දැක්ම කරා ළඟා වෙමින් උසස් මහජන සේවයක් සැලසීමටත් අවකාශ සැලසුණි.

ඒ අනුව 2016 වර්ෂයේදී ඉලක්කගත සංවර්ධන වැඩසටහන සාර්ථකව අවසන් කිරීමට හැකි වූ අතර ඒ තුළින් ආයතනයේ කාර්ය සාධනය සාපේක්ෂව ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකි වූ බව සඳහන් කළ හැකි ය.

# 8.3

# පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

## ඉදිරි දැක්ම

“නීති ගරුක ප්‍රජාවක්,සුරක්ෂිත ළමා පරපුරක්”

## මෙහෙවර

“සමාජ විරෝධි ක්‍රියාවල යෙදෙන්නවුන්, විශෝධනය සහ ළමුන්ගේ සමස්ත අයිතීන් සුරකිමින් සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් සහ විනිවිදභාවයෙන් යුක්තව ක්‍රියාවට නැංවීම”.

## අරමුණු

ළමා ආරක්ෂණය

## ප්‍රධාන කාර්යයන්.




## කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 152 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 113 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 41 |
| අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික පදනමේ සිටින සංඛ්‍යාව | 10 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 51.51 | 49.22 | 2.29 | 96 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 30.54 | 27.02 | 3.52 | 89 |
| **එකතුව** | **82.05** | **76.24** | **5.81** | 93 |

### මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 8.00 | 4.65 | 3.35 | 50 |
| යන්ත්‍රසූත්‍ර සවිකිරීම් හා උපකරණ | 0.10 | 0.09 | 0.00 (රු.1202) | 99 |
| **එකතුව** | **8.10** | **4.74** | **3.35** | 59 |

### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය

| අංකය | ව්‍යාපෘතිය | වෙන්කළ ප්‍රතිපාදනය (රු.මි) | වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 01 | බෝසත් බාලිකා ළමා නිවාසය අළුත්වැඩියාව | 1.00 | 0.21 | 20 |
| 02 | දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරය අළුත්වැඩියා කිරීම | 2.00 | 1.86 | 93 |
| 03 | අභය ළමා නිවාසය පෙර පාසල අළුත්වැඩියාව | 1.00 | 1.10 | 100 |
| 04 | සාද නිල නිවස අළුත්වැඩියාව | 0.25 | 0.22 | 90 |
| 05 | කාර්යාල වැසිකිළි පද්ධතිය අළුත්වැඩියාව | 0.25 | 0.21 | 83 |
| 06 | යෙහෙළි උපදේශන මධ්‍යස්ථානයේ වැසිකිළි පද්ධතිය අළුත්වැඩියාව | 2.00 | 1.86 | 93 |
| 07 | කැකිරාව පරිවාස කාර්යාලයේ සුළු ඉදි කිරීම් | 0.70 | 0.39 | 56 |
| 08 | ළමා නිවාස සහ කාර්යාල සඳහා උපකරණ මිලට ගැනීම | 1.50 | 1.50 | 100 |
| 09 | ළමා නිවාස හා කාර්යාල සඳහා උපකරණ මිලට ගැනීම | 0.50 | 0.49 | 100 |
| 10 | දිවා සුරැකුම් මධ්‍යස්ථානය හා අනුරාධපුර පරිවාස කාර්යාලය ඉදි කිරීම | 5.90 | 5.81 | 100 |

| අංකය | ව්‍යාපෘතිය | වෙන්කළ ප්‍රතිපාදනය (රු.මි) | වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 11 | දෙපාර්තමේන්තු වාහන අංගනය ඉදි කිරීම | 1.20 | 1.02 | 90 |
| 12 | යෙහෙළිය උපදේශන මධ්‍යස්ථානයේ මුර කුටිය ඉදි කිරීම | 0.80 | 0.74 | 92 |
| 13 | නිවාසගත දරුවන්ගේ විෂයානුබද්ධ දැනුම හා කුසලතා වැඩිදියුණු කිරීම | 0.50 | 0.49 | 100 |
| 14 | දිස්ත්‍රික්ක ළමාරක්ෂක කමිටු පිහිටුවීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රධාන | 0.50 | 0.50 | 100 |
| 15 | දිස්ත්‍රික්ක ළමාරක්ෂක කමිටු පිහිටුවීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රධාන | 0.50 | 0.50 | 100 |
| 16 | පරිවාසකයින් ස්වයං රැකියා සඳහා යොමු කිරීම | 0.30 | 0.30 | 100 |
| 17 | පරිවාසකයින් ස්වයං රැකියා සඳහා යොමු කිරීම | 0.20 | 0.19 | 100 |
| 18 | පාසල් ළමුන් දැනුවත් කිරීම | 0.70 | 0.70 | 100 |
| 19 | පාසල් ළමුන් දැනුවත් කිරීම | 0.30 | 0.18 | 60 |
| 20 | නිවාසගතවීම අවම කිරීම සඳහා ස්වයං රැකියා ආධාර | 0.70 | 0.70 | 100 |
| 21 | නිවාසගතවීම අවම කිරීම සඳහා ස්වයං රැකියා ආධාර | 0.30 | 0.29 | 100 |
| 22 | ළමාරක්ෂක කමිටු පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම | 2.20 | 2.20 | 100 |
| 23 | ළමාරක්ෂක කමිටු පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම | 0.70 | 0.70 | 100 |
| 24 | පරිවාසකයින් දැනුවත් කිරීම | 0.30 | 0.30 | 100 |
| 25 | පරිවාසකයින් දැනුවත් කිරීම | 0.20 | 0.19 | 100 |
| 26 | කොමසාරිස් නිල නිවාසය ඉදි කිරීම 2 අදියර | 0.50 | 4.65 | 93 |
| 27 | මඩාටුගම පුහුණු පන්ති ශාලාව ඉදි කිරීම 1 අදියර | 3.00 | | |
| 28 | ළමා නිවාස හා කාර්යාල උපකරණ මිලට ගැනීම | 0.10 | 0.09 | 99 |

ආයතනයේ ප්‍රධාන අංශ යටතේ වන කාර්ය සාධනයෙන් අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ වන්නේ, ආයතනයේ සියළුම කටයුතුවල කාර්යක්ෂමතාව හා ඵලදායිතාව ඉහළ යාම, ආයතනයේ සේවක අභිප්‍රේරණය ඉහළ යාම, ළමුන්ගේ සමස්ත අයිතීන් ආරක්ෂා වීම වර්ධනය වීම, ළමා සුභසාධනය

ඉහළ යාම, ළමා අපයෝජන හා ළමා අපචාර අඩු වීම, සමාජ විරෝධී ක්‍රියාවල යෙදෙන්නවුන් යහ මඟට යොමු වීම, පුද්ගලයින් සමාජ විරෝධී ක්‍රියාවල යෙදීම අඩු වීම යනාදිය වේ.

2016 වර්ෂයේදී පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් පාලනය වන පරිවාස කාර්යාල, ළමා නිවාස, උපදේශන මධ්‍යස්ථානයන්හී යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ඉලක්කගත සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ යටතේ පහත සඳහන් ඉදිකිරීම්, අළුත්වැඩියා කිරීම් හා මිල දී ගැනීම්වලට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

- දිවා සුරැකුම් මධ්‍යස්ථානය හා අනුරාධපුර පරිවාස කාර්යාලය ඉදි කිරීම,
- දෙපාර්තමේන්තු වාහන අංගනය ඉදි කිරීම,
- යෙහෙළිය උපදේශන මධ්‍යස්ථානයේ මුර කුටිය ඉදි කිරීම,
- බෝසත් බාලිකා ළමා නිවාසය අළුත්වැඩියාව,
- දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරය අළුත්වැඩියා කිරීම,
- අභය ළමා නිවාසය පෙර පාසල අළුත්වැඩියාව,
- සාද නිල නිවස අළුත්වැඩියාව,
- කාර්යාල වැසිකිළි පද්ධතිය අළුත්වැඩියාව,
- යෙහෙළි උපදේශන මධ්‍යස්ථානයේ වැසිකිළි පද්ධතිය අළුත්වැඩියාව,
- කැකිරාව පරිවාස කාර්යාලයේ සුළු ඉදි කිරීම්,
- ළමා නිවාස සහ කාර්යාල සඳහා උපකරණ මිලට ගැනීම

නිවාසගත දරුවන්ගේ දැනුම කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම තුළින් ඔවුන් යහපත් මෙන්ම ආත්ම අභිමානයක් සහිත පිරිසක් බවට පත් කිරීම සඳහා වූ විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.ඒ යටතේ,

- නිවාසගත දරුවන්ගේ විෂයානුබද්ධ දැනුම හා කුසලතා වැඩිදියුණු කිරීම,
- දිස්ත්‍රික්ක ළමාරක්ෂක කමිටු පිහිටුවීම,
- පරිවාසකයින් ස්වයං රැකියා සඳහා යොමු කිරීම, පාසල් ළමුන් දැනුවත් කිරීම,

යන ව්‍යාපෘති කැපී පෙනේ.

- නිවාසගතවීම අවම කිරීම සඳහා
- ස්වයං රැකියා ආධාර,
- ළමාරක්ෂක කමිටු පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම,
- පරිවාසකයින් දැනුවත් කිරීම,
- මඩාටුගම පුහුණු පන්ති ශාලාව ඉදි කිරීම 1 අදියර,
- ළමා නිවාස හා කාර්යාල උපකරණ මිලට ගැනීමට
  අවකාශ ලැබුණි.

2016 වර්ෂය පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් අනෙකුත් පාර්ශවකරුවන්ද සහයෝගයෙන් කටයුතු කරමින් කාර්යාවලිය මෙහෙයවීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ළඟා වීමටත් ආයතනයේ කාර්ය සාධනය ඉහල නැංවා ගැනීමටත් හැකි විය.

8.4

# පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව

## ඉදිරි දැක්ම

"සමාජ රැකවරණය අවශ්‍ය වූවන්ට සුරක්ෂිත ජීවිතයක්".

## මෙහෙවර

"පළාතේ ජීවත්වන දිළිඳු විශේෂ අවශ්‍යතා සහිත, වැන්දඹු භාවයට පත් සහ ව්‍යසනයන්ට ලක්වූ අසරණ ජනතාවට සාධාරණ ක්‍රමවේදයක් සමගින් ආධාර හා මග පෙන්වීම් , අවශ්‍ය සහන සහ රැකවරණය සලසමින්, ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම හා සමාජයේ පිළිගත් පිරිසක් බවට පත්කිරීම".

## දිගු කාලීන හා කෙටි කාලීන අරමුණු

### දිගුකාලීන අරමුණු

- රෝගී බව, වැඩිහිටි බව, ආබාධ සහිත බව හා අනාථ භාවය නිසා සමාජයීය වරප්‍රසාද අහිමිවූ පුද්ගලයින්ගේ සුභසාධනය තහවුරු කිරීම.
- වැඩිහිටි නිවාස හා රැකවරණය අහිමි විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා නිවාස පවත්වාගෙන යැම හා නඩත්තු කිරීම.
- වැඩිහිටියන් වැඩිහිටි නිවාසවලට යොමු කිරීම අවම වන පරිදි ඔවුන් රැකබලා ගැනීමේ වගකීම ඔවුන්ගේ පවුල්වලට සහ ප්‍රජාවට පැවරෙන අයුරින් ක්‍රියාමාර්ග හා ක්‍රමවේද හඳුනා ගැනීම.
- සමාජයීය වශයෙන් අවාසි සහගත පුද්ගලයින් සඳහා සමාජයීය වටිනාකමක් ගොඩ නැගීම.

### කෙටි කාලීන අරමුණු

- දිළිඳු බවින් පීඩාවට පත් පුද්ගලයින් සඳහා ආධාර ලබාදීම තුළින් ජීවත්වීමට රුකුලක් වීම.
- ශාරීරික හා මානසික වශයෙන් ආබාධ සහිත වූ පුද්ගලයින්ගේ ආර්ථික තත්ත්වය නගා සිටුවීමට කටයුතු කිරීම හා රැකවරණය සැලසීම.
- රෝගී වීම මගින් අසරණ වූ පුද්ගලයින් සඳහා සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට උපකාර කිරීම.
- අසරණ වූ වැඩිහිටියන් සුරක්ෂිත කිරීම හා වැඩිහිටි සුභ සාධනය ඉහළ නැංවීම.
- වැන්දඹු කාන්තා පවුල්වල සුභ සාධනය හා ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීම, හදිසි ආපදාවන්ට ලක් වූ පුද්ගලයන්ට සහන සැලසීම.

- පළාත තුළ මත්ද්‍රව්‍ය නිවාරණය, භාවිතය අවම කිරීම සහ එමගින් ආධ්‍යාත්මික සංවර්ධිත පවුල් ගොඩනැගීම.
- අන්ත දුගී පවුල්වල අධ්‍යාපනයට දක්ෂ දරුවන් සඳහා අධ්‍යාපන සංවර්ධනය.
- වකුගඩු රෝගය නිසා මව, පියා, භාරකරු මියගිය පවුල්වල අධ්‍යාපනය ලබන දරුවන් සඳහා අධ්‍යාපන සංවර්ධනය.
- තැලසීමියා රෝගය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන කාලවකවානුවක ඇටමිදුළු බද්ධ කිරීමේ සැත්කම් සඳහා සහන සැලසීම.
- තවදුරටත් සුවිශේෂී වූ අවශ්‍යතා සම්බන්ධයෙන් ක්ෂේත්‍රය තුළින් ලැබෙන ගැටළු අවස්ථාවන් පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් අවශ්‍ය සෑම විටෙකම අදාල අවශ්‍යතා ඉටුකරමින් පුද්ගල සහන සැලසීම.

## ප්‍රධාන කාර්යයන්

වැඩිහිටියන් වැඩිහිටි නිවාසවලට යොමු කිරීම අවම වන පරිදි ඔවුන් රැකබලා ගැනීමේ වගකීම ඔවුන්ගේ පවුල්වලට සහ ප්‍රජාවට පැවරෙන අයුරින් ක්‍රියාමාර්ග හා ක්‍රමවේද හඳුනා ගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

රෝගී බව, වැඩිහිටි බව, ආබාධ සහිත බව හා අනාථ භාවය නිසා සමාජයීය වරප්‍රසාද අහිමිවූ පුද්ගලයින්ගේ සුභසාධනය තහවුරු කිරීම සඳහා යෝග්‍ය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

වැඩිහිටි නිවාස හා රැකවරණය අහිමි විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා නිවාස පවත්වාගෙන යෑම හා නඩත්තු කිරීම සහ නේවාසිකයින්ගේ කායික, මානසික, ආධ්‍යාත්මය සංවර්ධනය කිරීම.

සමාජයීය වශයෙන් අවාසි සහගත පුද්ගලයින් සඳහා සමාජයීය වටිනාකමක් ගොඩනැගීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

## ප්‍රධාන උපාය මාර්ගයන්

**01**.ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආශ්‍රිත සියළුම ග්‍රාම නිලධාරි තුලාන්වල ජීවත්වන අඩු ආදායම්ලාභී අන්ත අසරණ බවට පත්ව සිටින රෝගී පුද්ගලයින් සහ එම පවුල්, ආර්ථික හා වෙනත් හේතූන් මත විවිධ තර්ජනයන්ට ලක්ව සිටින , කායික මානසික රැකවරණය අහිමිව සිටින වැඩිහිටි තැනැත්තන් පිළිබඳව, ආබාධ සහිත බව නිසා සමාජයීය වරප්‍රසාද අහිමි වූ පුද්ගලයින් පිළිබඳව, දත්ත රැස්කරමින් එම පුද්ගල අවශ්‍යතාවයන් සඳහා සෘජු මැදිහත්වීම හා අවශ්‍ය පරිදි මාසික සහනයන් සැලසීම සිදු කෙරේ.

**02**.රැකවරණය අහිමිව විවිධ ස්ථානයන්හි අනාරක්ෂිතව සහ නිවෙස් තුළ අසරණව අනාරක්ෂිතව සිටින වැඩිහිටි, ආබාධ සහිත තැනැත්තන් සඳහා රැකවරණය සපයමින් නිවාසගත කිරීමට හෝ පවුල් තුළ කායික, මානසික, රැකවරණය සහිතව ජීවත්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මැදිහත්වීම.

**03.**සමාජයීය වශයෙන් අවාසි සහගත පුද්ගලයින් සඳහා සමාජයීය වටිනාකමක් ලබාදීම අරමුණු කරමින් ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය කරන ආධාරක, උපකරණ ලබාදීම.

**04.**එම පුද්ගලයින්ගේ සහ එම පවුල්වල ආර්ථික ගැටළු අවම කරමින් ජීවන උත්පාදනයන් සඳහා අවශ්‍ය දැනුම ලබාදීම සඳහා අවශ්‍ය පුහුණු සමග ස්වයං රැකියා අවස්ථා වෙත යොමු කරමින් එමගින් ආර්ථික වාසි ලබාගැනීමට අවශ්‍ය මග පෙන්වීම සිදුකරනු ලැබේ.

**05.**ස්වාමියා අහිමිවීම නිසා වැන්දඹු භාවයට හා අසරණ භාවයට පත්වෙමින් තම දූදරුවන් සමග ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධව වෙහෙසෙමින් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා වෙහෙස වෙමින්, තම ආර්ථිකය ද ශක්තිමත් කරගැනීමට වෙර වීරිය දරන කාන්තාවන්ගේ අනාරක්ෂිත නිවාස සහ ආබාධ සහිත, වැඩිහිටි තැනැත්තන්ගේ අනාරක්ෂිත නිවාස සකස්කර ගැනීමට සුවසේ ජීවත්වීම සඳහා නිවාස ආධාර ලබාදීම ද උපාය මාර්ගයකි.

**06.**ඉහතින් සඳහන් කරන ලද රෝගී පවුල්, වැන්දඹු සහ ආබාධ සහිත තත්ත්වයනට පත්ව සිටින පවුල්වල, මහත් දුෂ්කරතාවයෙන් යුතුව අධ්‍යාපනය ලබා දීමට වෙහෙසෙන මෙන්ම මහත් උනන්දුවෙන් අධ්‍යාපනය ලැබීමට වෙහෙසෙන දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සඳහා මාසිකව ශිෂ්‍යාධාර ලබා දෙමින් රටට වැඩදායී දරු පිරිසක් නිර්මාණය කිරීමට මැදිහත්වීම.

**07.**වර්තමානයේ ඉතා විශාල ව්‍යසනයක්ව පවතින වකුගඩු රෝගය නිසා මව, පියා, භාරකරු අහිමිව සිටින පවුල්වල අධ්‍යාපනය ලබන දරුවන් සඳහා අවශ්‍ය සහනයන් සැලසීම සඳහා මැදිහත්වීම.

**08.**ඉහත පරිද්දෙන්ම දරුණු ලෙස ව්‍යාප්තව පවතින තැලසීමියා රෝගය සඳහා ශල්‍යකර්මයන් වෙනුවෙන් පෞද්ගලිකව දැරීමට සිදුවන මුදල අවම කරමින් ඒ සඳහා සහනයන් සැලසීමට මැදිහත්වීම.

**කාර්යය මණ්ඩල සංයුතිය**

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 173 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 127 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 55 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වාභාවය | ප්‍රතිපාදනය (රු.මි.) | 2016 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව අනෙකුත් පුනරාවර්තන වියදම් | 377.82 | 375.12 | 2.69 | 99.29 |
| **එකතුව** | **377.82** | **375.12** | **2.69** | **99.29** |

### මූලධන වියදම්

| වියදමේ ස්වාභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම්, යන්ත්‍ර සූත්‍ර සවිකිරීම් හා උපකරණ,වාහන, වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 2.1 | 2.09 | 0.00 (රු.4070.71) | 99 |
| **එකතුව** | **2.1** | **2.09** | **0.00** | **99** |

### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය

2016 වසරේ අනුමත මූලධන වියදම් අනුව සංවර්ධන ව්‍යාපෘතීන් 06 ක් පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ ද, ව්‍යාපෘතීන් 08 ක් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ද ආරම්භ කර සාර්ථක ලෙස නිමා කර ඇත. ඒ අතරින් පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ ඉදිකරන ලද ගිරිතලේ විශ්‍රාමික වැඩහිටි නිවාසයේ කටයුතු නිමකිරීම වර්ෂය තුළ ලද විශාල ජයග්‍රහණයකි.

එසේම මූලධන ප්‍රතිපාදන මෙන්ම පුනරාවර්තන ප්‍රතිපාදනද භාවිතා කරමින් සමාජ ආරක්ෂණය සඳහා සැලසුම්ගත ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

### 2016 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන

| ව්‍යාපෘතිය | ඉලක්කය | වෙන්කළ ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|
| සාලියපුර වැඩිහිටි නිවාසය නේවාසිකාගාර වාට්ටු අංක 1 වහලය අලුත්වැඩියාව | 01 | 10 | 0.57 |
| සාලියපුර වැඩිහිටි නිවාසයේ කාර්ය මණ්ඩල වැසිකිළි පද්ධතිය ඉදිකිරීම | 02 | | 1.48 |
| සාලියපුර වැඩිහිටි නිවාසයේ අධිකාරි නිල නිවාසය අලුත්වැඩියාව | 01 | | 1.48 |
| සාලියපුර වැඩිහිටි නිවාසය ජලටැංකි රඳවනය ඉදිකිරීම | 01 | | 0.92 |

| | | | |
|---|---|---|---|
| සාලියපුර වැඩිහිටි නිවාසය නේවාසිකාගාර වාට්ට්ටු අංක 5 වහලය අලුත්වැඩියාව | 01 | | 1.54 |
| සාලියපුර වැඩිහිටි නිවාසය විදුලි පද්ධතිය නවීකරණය | 01 | | 2.12 |
| සමාජ සේවා දෙපාර්තමේන්තු කාර්යාලය නවීකරණය | 01 | 3 | 1.94 |
| ඇලගමුව ආබාධිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ නේවාසිකාගාරයේ ඉතිරි වැඩ | 01 | 2 | 1.70 |
| දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 42 | 1 | 0.96 |
| **එකතුව** | | **16** | **12.71** |

## 2016 පළාත් සභා සංවර්ධන ප්‍රදාන

| **ව්‍යාපෘතිය** | **ඉලක්කය** | **වෙන්කළ ප්‍රතිපාදන (රු.මි)** | **වියදම (රු.මි)** |
|---|---|---|---|
| බුල්නෑව ආබාධිත වෘත්තීය පුහුණු ආයතනයේ වැසිකිළි පද්ධතිය නවීකරණය | 01 | 6 | 0.96 |
| බුල්නෑව ආබාධිත වෘත්තීය පුහුණු ආයතනයේ මුළුතැන්ගේ සිවිලිම සකස් කිරීම | 01 | | 0.92 |
| ගිරිතලේ විශ්‍රාමික වැඩිහිටි නිවාසය නවීකරණය | 01 | | 1.44 |
| පළාත් සමාජ සේවා අධ්‍යක්ෂක නිල නිවාසය ඉදිකිරීම | 01 | 6 | 5.73 |
| අධ්‍යක්ෂ නිල නිවස වටා තාප්පය හා ගේට්ටුව ඉදිකිරීම | 01 | 2 | 1.95 |
| කාර්යාලය හා නිවාස සඳහා උපකරණ මිළදී ගැනීම | 01 | 3 | 2.99 |
| මිතුරු සෙවන (සමාජ රැකවරණ සුරක්ෂිත කිරීමේ ව්‍යාපෘතිය) | 10 | 1 | 1.00 |
| කාර්යාලය හා නිවාස සඳහා උපකරණ මිළදී ගැනීම | 01 | 1 | 0.09 |
| **එකතුව** | | 18.1 | 14.19 |


වැඩිහිටි නිවාසයේ අංක 01 වාට්ටුව


ගිරිතලේ විශ්‍රාමික වැඩිහිටි නිවාසය

සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත වෙන් කරන ලද පුනරාවර්තන වැය උපයෝගීකර ගනිමින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

**01 උපාය මාර්ගය ක්‍රියාවට නංවමින්,** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආශ්‍රිත සියළුම ග්‍රාම නිලධාරි තුලාන්වල ජීවත්වන අඩු ආදායම්ලාභී අන්ත අසරණ බවට පත්ව සිටින රෝගී පුද්ගලයින් සහ එම පවුල් ,ආර්ථික හා වෙනත් හේතූන් මත විවිධ තර්ජනයන්ට ලක්ව සිටින ,කායික මානසික රැකවරණය අහිමිව සිටින වැඩිහිටි තැනැත්තන් පිළිබඳව ආබාධ සහිත බව නිසා සමාජයීය වරප්‍රසාද අහිමි වූ පුද්ගලයින් පිළිබඳව, දත්ත රැස්කරමින් එම පුද්ගල අවශ්‍යතාවයන් සඳහා සෘජු මැදිහත් වීම හා අවශ්‍ය පරිදි මාසික සහනයන් සැලසීම සිදු කෙරේ. ඒ අනුව,

| අනු අංකය | ආධාර වර්ගය | පුද්ගල සංඛ්‍යාව | මුදල (රු.මි) |
|---|---|---|---|
| 01 | මහජනාධාර | 35,325 | 132.09 |
| 02 | රෝගාධාර | | 68.33 |
| | පිළිකා | 1,931 | |
| | තැලසීමියා | 356 | |
| | ක්ෂය රෝග | 51 | |
| | ලාදුරු | 49 | |
| | බරවා | 09 | |
| 03 | නිවුන් දරු | 228 | 2.71 |
| 04 | පූර්ණ ආබාධ | 841 | 12.44 |
| 05 | පාසල් ශිෂ්‍යාධාර | 4,551 | 39.95 |
| 06 | සිසු දරු (වකුගඩු රෝගී පවුල්) | 42 | 0.49 |
| | | 43,380 | 256.01 |

**02 උපාය මාර්ගය ක්‍රියාවට නංවමින්,** රැකවරණය අහිමිව විවිධ ස්ථානයන්හි අනාරක්ෂිතව සහ නිවෙස් තුළ අසරණව අනාරක්ෂිතව සිටින වැඩිහිටි, ආබාධ සහිත තැනැත්තන් සඳහා රැකවරණය සපයමින් නිවාස ගත කිරීමට හෝ පවුල් තුළ කායික, මානසික, රැකවරණය සහිතව ජීවත්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මැදිහත්වීම.

| ඇතුළත් කරන ලද නිවාසය | ඇතුළත් කරන ලද සංඛ්‍යාව |
|---|---|
| **වැඩිහිටි නිවාස** | |
| සාලියපුර වැඩිහිටි නිවාසය | 52 |
| පැරකුම් වැඩිහිටි නිවාසය | 02 |
| පළාතෙන් පිට වැඩිහිටි නිවාස | - |
| පෞද්ගලික වැඩිහිටි නිවාස | - |
| **එකතුව** | **54** |
| **ආබාධිත නිවාස** | |
| සාලියපුර සතුටු නිවාසය | 03 |
| නොච්චියාගම විශේෂ පුහුණු පාසල | 04 |
| ඇලගමුව වෘත්තීය පුහුණු නිවාසය | 04 |
| සේවාගම නිවාසය | 02 |
| පළාතෙන් පිට ආබාධිත නිවාස | 02 |
| පෞද්ගලික නිවාස | - |
| **එකතුව** | **15** |

**03** **උපාය මාර්ගය ක්‍රියාවට යොදවමින්**,සමාජයීය වශයෙන් අවාසි සහගත පුද්ගලයින් සඳහා සමාජයීය වටිනාකමක් ලබාදීම අරමුණු කරමින් ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය කරන ආධාරක,උපකරණ ලබාදීම.

| උපකරණ වර්ගය | ඉල්ලීම් ප්‍රමාණය | ලබා දීම් | වැය වූ මුදල (රු.මි) |
|---|---|---|---|
| රෝද්පුටු | 290 | 219 | 3.06 |
| ත්‍රයිසිකල් | 80 | 26 | 0.03 |
| අත්වාරු | 340 | 282 | 0.28 |
| කිහිලිකරු | 115 | 86 | 0.15 |
| කොමඩ් රෝද්පුටු | 190 | 148 | 1.41 |
| ළමා රෝද්පුටු | 25 | 13 | 0.02 |
| හැරමිටි | 11 | 08 | 0.01 |
| සුදු සැරයටි | 06 | 06 | 0.01 |
| වතුර මෙට්ට | 110 | 83 | 0.71 |
| වායු මෙට්ට | 30 | 21 | 0.18 |
| ශ්‍රවණ උපකරණ | 200 | 103 | 2.37 |
| අක්ෂි කාච | 880 | 833 | 14.50 |
| ඇස් කණ්නාඩි | 696 | 1,540 | 1.56 |
| ඇවිදින උපකරණ ආධාර | 110 | 61 | 0.18 |

**04,05,06,07 හා 08 උපාය මාර්ග ක්‍රියාවට නංවමින්,** ලබා දුන් මුල්‍යමය ආධාර

| ඉල්ලීම් වර්ගය | 2016 ඉල්ලීම් සංඛ්‍යාව | 2016 ලබා දුන් සංඛ්‍යාව | වැය වූ මුළු මුදල (රු.මි) |
|---|---|---|---|
| සමාජයීය වශයෙන් අවාසි සහගත පුද්ගලයින් සඳහා සමාජයීය වටිනාකමක් ලබාදීම අරමුණු කරමින් වූ ඉල්ලීම් | 350 | 275 | |
| වැන්දඹු භාවයට පත් කාන්තාවන්ගේ අනාරක්ෂිත නිවාස සහ ආබාධ සහිත තැනැත්තන්ගේ, වැඩිහිටි තැනැත්තන්ගේ අනාරක්ෂිත නිවාස සකස්කර ගැනීම සඳහා වූ ඉල්ලීම් | 375 | 332 | 7.29 |
| රෝගී පවුල්, වැන්දඹු සහ ආබාධ සහිත තත්ත්වයනට පත්ව සිටින පවුල්වල, උනන්දුවෙන් අධ්‍යාපනය ලැබීමට වෙහෙසෙන දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සඳහා මාසිකව ශිෂ්‍යාධාර සඳහා වූ ඉල්ලීම් | 2,183 | 733 | - |
| වකුගඩු රෝගය නිසා මව, පියා, භාරකරු අහිමිව සිටින පවුල්වල අධ්‍යාපනය ලබන දරුවන් සඳහා අවශ්‍ය සහන සැලසීම වෙනුවෙන් වූ ඉල්ලීම් | 98 | 98 | - |

| | | | |
|---|---|---|---|
| තැලසීමියා රෝගය සඳහා වු ශල්‍යකර්මයන්වලට ආධාර ලබා ගැනීම වෙනුවෙන් වු ඉල්ලීම් | 05 | 05 | 2.50 |
| වෙනත් ශල්‍යකර්මයන් සඳහා වු ඉල්ලීම් | 46 | 39 | - |





### දිරියට අත්වැලක් සමග සමාජ සවිබල ගැන්වීමේ මත් නිවාරණ වැඩසටහන්



යහපත් සමාජයක් නිර්මාණය කිරිම සඳහා පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ දායකත්වය අතිමහත්ය. සමාජ ව්‍යසනයන්ගෙන් ජනතාව මුදා ගනිමින් ඔවුන්ගේ ජීවන තත්වය වඩා යහපත් කිරීමේ අරමුණින් දිරියට අත්වැලක් වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

මත්ද්‍රව්‍ය, දුම්වැටි, භාවිතයෙන් ප්‍රජාව මුදාගනිමින් ඔවුන්ගේ දුෂ්කර ආර්ථිකයට ශක්තිමත් අත්වැලක් සැපයීමේ වැඩසටහනක් ලෙස දිරියට අත්වැලක් සමග සමාජ සවිබල ගැන්වීමේ වැඩසටහන ප්‍රමුඛ වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කරන ලදි . මෙම වැඩසටහන දින 03ක නේවාසික වැඩසටහනක් වන අතර එමගින් යහපත් සමාජයක් නිර්මාණය කිරිම සඳහා අවශ්‍ය පෙළඹවීම සිදු විය.

| අනු අංකය | වැඩසටහන | සහභාගී වූ සංඛ්‍යාව | ප්‍රා.ලේ.කො | වෙන්කළ මුදල (රු.මි) |
|---|---|---|---|---|
| 01 | දිරියට අත්වැලක් සවිබල ගැන්වීම 1 අදියර | 112 | අ/පු දිස්ත්‍රික් | 0.72 |
| 02 | දිරියට අත්වැලක් II අදියර | 65 | අ/පු දිස්ත්‍රික් | 0.12 |
| 03 | මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන | - | පලාගල | 0.01 |
| 04 | එම | - | වැලිකන්ද | 0.02 |
| 05 | එම | - | කැබිතිගොල්ලෑව | 0.01 |

### සමාජයීය වශයෙන් අවාසි සහගත පුද්ගලයින් සඳහා සමාජයීය වටිනාකමක් ගොඩ නැගීම සඳහා ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති

ජීවිතයේ සැඳෑසමය ගත කරන වැඩිහිටි ප්‍රජාවගේ කායිකව මෙන්ම මානසික සංවර්ධනය උදෙසා වන වැඩසටහන් ක්‍රියාත්මක විය. ඒ යටතේ විශ්‍රාම පූර්ව වැඩසටහන, දිස්ත්‍රික් බල මණ්ඩලයේ වන්දනා චාරිකා සත්කාරක සුහද හමුව (වැඩිහිටි නිවාසය), දැය නැගූ පරපුරක ගායන පෙළහර වැඩසටහන ක්‍රියාත්මක විය.

| අනු අංකය | වැඩසටහන | සහභාගී වූ සංඛ්‍යාව | වෙන්කළ මුදල (රු.මි) |
|---|---|---|---|
| 01 | විශ්‍රාම පූර්ව වැඩසටහන | 139 | 0.25 |
| 02 | දිස්ත්‍රික් බල මණ්ඩලයේ වන්දනා චාරිකා | 66 | 0.15 |
| 03 | සත්කාරක සුහද හමුව (වැඩිහිටි නිවාසය) | 80 | 0.10 |
| 04 | දැය නැගූ පරපුරක ගායන පෙළහර වැඩසටහන | 1800 | 3.50 |
| 05 | වාර්ෂික වන්දනා චාරිකා | කොට්ඨාස 29 | 2.90 |

### විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජා ව්‍යාපෘති



විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා සමාජය තුළ සම අයිතිවාසිකම් සහිත කොට්ඨාසයක් බවට පත්කිරීම සහ කායික මානසික, සමාජීය සහ ආධ්‍යාත්මික වශයෙන් මෙන්ම සංස්කෘතික වැඩසටහන් සංවිධානය කරමින් ඔවුන්ට සුවිශේෂී අවස්ථාවන් ලබාදීම මෙහිදී අපේක්ෂා කරන ලද අරමුණ විය.

| අනු අංකය | වැඩසටහන | සහභාගී වූ සංඛ්‍යාව | වෙන්කළ මුදල (රු.මි) |
|---|---|---|---|
| 01 | ආබාධ සහිත වූවන්ගේ අවුරුදු උත්සවය | 1,154 | 3.03 |
| 02 | දිස්ත්‍රික් සංගමයේ විනෝද චාරිකා | 66 | 0.10 |
| 03 | කොට්ඨාස සංගම් විනෝද චාරිකා | කොට්ඨාස 29 | 1.45 |



වැන්දඹු කාන්තාවන් සහ දූදරුවන් වෙනුවෙන් සුවිශේෂී වූ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. එමගින් කාන්තාවන්ගේ මානසික තත්වය ශක්තිමත් කරමින්, ආර්ථික වශයෙන් නැගී සිටීමට අවශ්‍ය ශක්තිය ලබා දීම මෙම වැඩසටහන මගින් සිදු විය.

| අනු අංකය | වැඩසටහන | සහභාගී වූ සංඛ්‍යාව | වෙන්කළ මුදල (රු.මි) |
|---|---|---|---|
| 1 | විනෝද චාරිකා | කොට්ඨාස 29 | 0.87 |

**රුධිරය කාන්දුකරණ රෝගීන් සඳහා පහසුකම් ලබා දීම.**

රුධිරය කාන්දුකරණය සඳහා දෛනිකව පැමිණෙන ආර්ථික අපහසුතා සහිත වකුගඩු රුධිර කාන්දුකරණ රෝගීන් සඳහා අවශ්‍ය නවාතැන් පහසුකම් ලබා දීම සහ වකුගඩු රෝගය හේතුවෙන් මිය ගිය පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනය නඟා සිටුවීම සඳහා ශිෂ්‍යාධාර ලබා දීෙම් වැඩසටහනද ක්‍රමයද මේ යටතේ ක්‍රියාත්මක කරනු ලබයි.



| වැඩසටහන | ඉල්ලීම් | ලබා දීම | වර්ෂයේ වියදම් කළ මුදල (රු.මි) |
|---|---|---|---|
| ආහාර මුද්දර ලබා දීම | 245 | 245 | 2.87 |
| සිසු දිරිය වැඩසටහන | 98 | 42 | 0.49 |
| සුවෝදය නේවාසිකාගාරය | දිනකට 20 | 20 | නඩත්තු කටයුතු |

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සුවසේවා පෙරහර සහ ප්‍රජා සත්කාරක සේවා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

උතුරු මැද පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක ගරු අමාත්‍ය කේ.එච් නන්දසේන මැතිතුමාගේ සංකල්පයක් ලෙස 2016 ක්‍රියාවට නංවන ලද ප්‍රජා සත්කාරක සේවාවන් මගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රජා සත්කාරක සේවා වැඩසටහන් ක්‍රියාත්මක විය.

එසේම වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදි අනෙකුත් රේඛීය අමාත්‍යාංශ,ෙදපාර්තෙමන්තු හා ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් අනෙකුත් පාර්ශවකරුවන්ද සමග සහයෝගයෙන් කටයුතු කරමින් සංවර්ධන වැඩසටහන මෙහෙයවීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ලඟා විමටත් ආයතනයේ කාර්ය සාධනය ඉහල නැංවා ගැනීමටත් හැකි විය.

**09**

## 9.පළාත් ප්‍රවාහන, ක්‍රීඩා සහ යෞවන කටයුතු,සමුපකාර වෙළෙඳ,ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය

### 9.1.පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

### 9.2.පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

### 9.3.පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

### 9.4.මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

### 9.5.පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව

# 09

# පළාත් ප්‍රවාහන,ක්‍රීඩා සහ යෞවන කටයුතු,සමුපකාර වෙළෙඳ,ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය

## ඉදිරි දැක්ම

"අභිමානවත් සමාජයක්,ඉසුරුමත් පළාතක්."

## මෙහෙවර

"ප්‍රවාහන ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර වෙළෙඳ හා ආහාර සහ කර්මාන්ත අංශ සඳහා සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරිමේ ආයතන නිසි පරිදි නියාමනය කිරිම".

## අරමුණු

- කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමේ ආයතන පද්ධතියක් ඇති කිරීම.
- තෘප්තිමත් පාරිභෝගික හා වෙළඳ ප්‍රජාවක් ඇති කිරීම.
- උසස් ආහාර පරිභෝජන සංස්කෘතියක් හා පළාතේ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම.
- පළාතේ තරුණ තරුණියන් සඳහා වෘත්තීමය රැකියා අවස්ථා ලඟාකර දීම හා ඔවුන්ගේ යහගුණ ආකල්ප සංවර්ධනය කිරීම.
- පළාතේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය තුලින් කර්මාන්තකරුවන් සවිබල ගැන්වීම

## ප්‍රධාන කාර්යයන්




.

## උපාය මාර්ගයන්

ආයතනික සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවලට අනුකූලව ආයතනික කටයුතු මෙහෙය වීමෙන් සංවර්ධන ව්‍යාපෘතිවල අපේක්ෂිත අරමුණු හා ඉලක්ක ලඟාකර ගැනීම මඟින් පළාතේ සංවර්ධන ක්‍රියාවලියට දායක වීම.

### කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 36 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 33 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 03 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016 වර්ෂයේවියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩි නඩි ඇතුලත්ව | | | | |
| අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය. | 6.17 | 6.17 | 0.009 | 99.98 |
| අමාත්‍යාංශ කාර්යාලය. | 17.04 | 16.98 | 0.06 | 99.64 |
| මොටර් රථ දෙපාර්තුමේන්තුව. | 3.85 | 3.58 | 0.27 | 92.91 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | | | | |
| අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය. | 8.86 | 7.62 | 1.24 | 86 |
| අමාත්‍යාංශ කාර්යාලය. | 58.04 | 56.73 | 1.31 | 97.74 |
| මොටර් රථ දෙපාර්තුමේන්තුව. | 20.0 | 1.663 | 0.33 | 8.315 |
| **එකතුව** | **113.96** | **92.74** | **3.219** | **81.37** |

### මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|---|
| අමාත්‍යාංශ කාර්යාලය. | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1.00 | 0.78 | 0.21 | 78 |
| | යන්ත්‍රසූත්‍ර සවි කිරීම් සහ උපකරණ | 2.59 | 2.59 | 0.003 | 99.88 |
| | වාහන | 0.50 | 0.38 | 0.10 | 76 |
| | වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 0.10 | 0.00 | 0.10 | 0 |
| | **එකතුව** | 4.195 | 3.752 | 0.413 | 89.43 |

| | | | | | |
|---|---|---|---|---|---|
| අමාත්‍ය කාර්ය මණ්ඩලය | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1.50 | 0.00 | 1.50 | 0 |
| | යන්ත්‍රසූත්‍ර සවි කිරීම් සහ උපකරණ | 0.22 | 0.13 | 0.84 | 59.09 |
| | වාහන | 0.60 | 0.00 | 0.60 | 0 |
| | වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 0.04 | 0.00 | 0.04 | 0 |
| | **එකතුව** | 2.36 | 0.13 | 2.98 | 5.50 |
| මෝටර් රථ දෙපාර්තමේන්තුව | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 5.00 | 4.76 | 0.023 | 95.2 |
| | යන්ත්‍රසූත්‍ර සවි කිරීම් සහ උපකරණ | 2.61 | 2.60 | 0.0006 | 99.61 |
| | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 15.0 | 8.281 | 6.71 | 55.20 |
| | **එකතුව** | 29.16 | 19.52 | 10.23 | 67 |

**මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්ය පිළිබඳ කාර්ය සාධනය**

| ව්‍යාපෘතිය | ඉලක්කය ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වෙන්කළ ප්‍රතිපාදනය (මි.රු) | වියදම (මි.රු) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| දේශීය ආහාර ප්‍රචලිත කිරීමදේශීය ආහාර ) වට්ටෝරු පොතක් (නිර්මාණය කිරීම | පළාතේ ජනතාව දේශීය ආහාර වට්ටෝරු භාවිතයට පෙළඹවීම | 0.5 | 0.49 | 100 |
| සුළු පරිමාණ වෙළඳ කටයුතු ප්‍රවර්ධනය කිරීම | සුළු පරිමාණ ව්‍යාපාරිකයින්ගේ ව්‍යාපාරික කටයුතු ප්‍රවර්ධනය කිරීම . | 1.0 | 0.95 | 98 |
| වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන සහ වෘත්තීය පුහුණු ලබා දීම | වෘත්තීමය ක්ෂේත්‍රය වෙත පළාතේ තරුණ තරුණියන් යොමු කිරීමරැකියා පොළ ) . (.පැවැත්වීම | 1.8 | 0.84 | 48 |
| තරුණ කඳවුරු වැඩසටහන වැඩසටහන | තරුණ ප්‍රජාව තුල ආකල්පමය සංවර්ධනයක් ඇති කිරීම තුලින් නිර්මාණශීලි හා විනයගරුක තරුණ ප්‍රජාවක් බිහිකිරීම . | 3.0 | 2.62 | 90 |
| ව්‍යාපාර නාම ලියාපදිංචිය පිළිබඳ | ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම පිළිබඳව ඇති වන | 0.5 | 0.088 | 20 |

| | | | | |
|---|---|---|---|---|
| දැනුවත් කිරීමේ වැඩසටහන | ගැටළු අවම කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ අදහස් ලබාගෙන නව ප්‍රඥප්තියක් සකස් කිරීම . | | | |
| ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ හැසිරවීමේ පුහුණු වැඩසටහන | පළාතේ විරැකියාවෙන් පෙළෙන තරුණයින් ඉදිකිරීම් යන්ත්‍ර හැසිරවීමට යොමුකිරීම මඟින් විරැකියාව අඩු කිරීම . | 2.00 | 1.20 | 60 |
| පළාත් කර්මාන්ත සැලැස්ම සකස් කිරීම | පළාතේ විවිධ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නගා සිටුවීම සඳහා පස් අවුරුදු සැලැස්මක් සකස් කිරීම . | 1.00 | | සැලැස්ම සකස්කර ක්‍රියාත්මක කිරීම සඳහා කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙත භාර දී ඇත |
| හබරණ කර්මාන්ත නිෂ්පාදන අලෙවි සංකීර්ණය ඉදිකිරීම | අත්කම් හා හස්ත කර්මාන්ත නිපැයුම්කරුවන්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපල අවස්ථා ඇති කිරීම . | 7.00 | 7.00 | 100 |

### 01.කර්මාන්ත හා වෙළඳ ප්‍රදර්ශනය 2016



උතුරු මැද පළාතේ විසිරී සිටින විවිධ ක්ෂේත්‍රයන්හී නිරතවන (හස්ත කර්මාන්ත, පේෂ කර්මාන්ත, අත්කම් නිෂ්පාදන ඇතුළු) සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සඳහා පළාත තුළත් ජාතික හා ජාත්‍යන්තර වෙළෙඳපල අවස්ථා ඇති කිරීමේ අරමුණු ඇතිව සෑම වර්ෂයකදිම පවත්වනු ලබන “රජරට විස්කම් කර්මාන්ත හා වෙළෙඳ ප්‍රදර්ශනය” මෙම වර්ෂයේදී අමාත්‍යාංශය හා සෙසු දෙපාර්තමේන්තු එක්ව සාර්ථකව නිම කරන ලදී.

### 02.ව්‍යාපාර නාම ලියාපදිංචිය පිළිබඳ වැඩමුළු සංවිධානය -රු.මි.0.5




පළාතේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් වශයෙන් අමාත්‍යාංශ ලේකම්ගේ බලතල අනුව, ව්‍යාපාර නාම ලියාපදිංචියේදී පවතින ගැටළු අවමකර වඩා පහසු හා පැහැදිලි උපදෙස් ඇතුළත් නව පළාත් චක්‍ර ලේඛනයක් සකස් කර ගැනීම සඳහා, ප්‍රාදේශීය ලේකම්වරුන්

හා ව්‍යාපාර නාම ලියාපදිංචි විෂය භාර නිලධාරින් හා ව්‍යාපාරික ප්‍රජාවගේ අදහස් හා යෝජනා ද ලබා ගැනීමෙන් පසුව අවසානයේදී නව ව්‍යාපාර නාම පළාත් ප්‍රඥප්තිය සකස් කිරීමේ අරමුණුද සහිතව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි.

## 03.සුළු පරිමාණ වෙළඳ කටයුතු ප්‍රවර්ධනය කිරීම-රු.මි.1.0

විවිධ ක්ෂේත්‍රයන්ට අදාල ස්වයං රැකියාලාභීන්, විවිධ කර්මාන්තකරුවන් සඳහා නිෂ්පාදන කටයුතු සිදු කළද එම නිෂ්පාදන අලෙවි කිරීමේ ගැටළු හා බාධාවන් ඔවුන්ට පවතී. ව්‍යවසායකයින් ව්‍යාපාරික දැනුමෙන් සන්නද්ධ කිරීම, අන්‍යොන්‍ය ව්‍යාපාරික අදහස් හුවමාරුකර ගැනිමේ අවස්ථා ඇති කිරීම යන අරමුණ ඇතිව ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මකකර ඇත.

## 04.හබරණ කර්මාන්ත නිෂ්පාදන අලෙවි සංකීර්ණය ඉදිකිරීම -රු.මි.7.0

විසිරි සිටින අත්කම් හා හස්ත කර්මාන්ත නිපැයුම් කරුවන්ගේ නිෂ්පාදන සඳහා නව වෙළඳපල



අවස්ථා ඇති කිරීම මඟින් සීඝ්‍ර වර්ධනයක් අත්කර ගැනීමත් අත්කම් හා හස්ත කර්මාන්ත නිෂ්පාදනය සඳහා දේශීය හා විදේශීය වෙළඳපල ප්‍රවර්ධනය කිරීමත් සාම්ප්‍රදායික කර්මාන්ත ආරක්ෂා කිරීම මෙන්ම නිපැයුම් කරුවන්ගේ ජීවන මාර්ග සුරක්ෂිත කිරීමත් සඳහා මෙම අලෙවි සංකීර්ණය ඉදිකිරිමේ ව්‍යාපෘතිය ආරම්භ කර ඇත .

## 05.තරුණ කඳවුරු වැඩසටහන් පැවැත්වීම- රු.මි.3.0

වර්තමාන තාරුණ්‍ය විරැකියාව, සමාජ අපචාර, සංස්කෘතික පරිහානිය, සියදිවි නසා ගැනීම, මත් ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වීමත්, සයිබර් අවකාශය තුළ අසභ්‍ය දේ භාවිතයට පෙළඹීම වැනි ගැටළු රැසකට



මුහුණ පා සිටිති. මෙවැනි තත්වයන්ගෙන් පළාතේ තරුණ ප්‍රජාව මුදවා ගනිමින් ඔවුන් තුළ ආකල්පමය සංවර්ධනයක් ඇති කිරීමත් ඒ සඳහා ඔවුන් පෙළඹවීමේ අදහස ඇතිව ,තරුණ කඳවුරු වැඩසටහන් පවත්වා ඇත.

- ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 14ක තරුණ තරුණියන් 1500කට ආසන්න පිරිසක් සඳහා වැඩසටහන් පැවැත්විය. මෙම වැඩසටහන් සඳහා සහභාගී වු පිරිස අතුරින් හඳුනාගත් නිර්මාණශිලි තරුණ තරුණියන් සහභාගී කර නේවාසික පළාත් තරුණ කඳවුරු වැඩසටහනක් පවත්වා ඇත.



වැඩසටහන් මගින් ආකල්ප සංවර්ධනය සහ අභිප්‍රේරණය, අභියෝග ජයගැනීම,ඉලක්ක හා අරමුණු ලඟාකර ගැනීමට වැඩ සැලසුම්කරණය, තරුණයා හා සමාජ අභියෝග, ගීත විචාරාත්මක සංගීතමය වැඩසටහන (අර්ථවත් ගීත කලාව පිළිබඳව සජීවි පැය 2.30ක වැඩසටහනකි),පළාතේ පිහිටි ඓතිහාසික, පාරිසරික, පුරාවිද්‍යාත්මක, නව නිර්මාණාත්මක ඉදි කිරීම් ආදිය පිළිබඳව ගවේෂණාත්මක චාරිකාව.

- ඉහත ක්ෂේත්‍රයන්ට අදාලව දින 02ක් පුරා පැවති ප්‍රායෝගික හා න්‍යායාත්මක වැඩසටහන් හා දේශන ඇතුලත්ව දෙදින වැඩසටහනක් ලෙසත් පළාත් කඳවුර නේවාසිකව දින 03ක වැඩසටහනක් ලෙස පැවැත්විය.

## 06.වෘත්තිමය ක්ෂේත්‍ර ප්‍රවේශයන් සඳහා වන රැකියා පිළිබඳ තරුණ තරුණියන් දැනුවත් කිරිම - රු.මි.1.8

සාමාන්‍ය පෙළ හා උසස් පෙළ අධ්‍යාපනයෙන් පසුව විශ්ව විද්‍යාල වරම් ලබා ගනුයේ වර්තමාන තරුණ ප්‍රජාවෙන් සීමිත පිරිසකි. ඉතිරි පිරිසෙන් බහුතර ප්‍රමාණයක් රැකියා විරහිත බවට හෝ නිසි ඉලක්කයන් හා නිශ්චිත අරමුණින් තොර වෘත්තීන් කරා යොමු වීමේ ප්‍රවණතාවයක් ඇත. එම තත්වයට පිළියමක් ලෙස විවිධ වෘත්තිමය ක්ෂේත්‍රයන්ට (බැංකු/කාර්මික/ඉදි කිරීම්/පරිගණක/උසස් අධ්‍යාපන/සංචාරක) අදාල වෘත්තීමය පාඨමාලා අධ්‍යාපනය ලබාදෙන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සහභාගීත්වයෙන් තරුණ ප්‍රජාව දැනුවත් කිරිම සඳහා මෙම වැඩසටහන් සංවිධානය කරන ලදී. රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ විවිධ නිෂ්පාදන සිදු කරන ආයතන සම්බන්ධ කිරිම මගින් එම ආයතනවල රැකියා සඳහා තරුණ තරුණියන් විශාල ප්‍රමාණයක් යොමුකර ඇත. අනුරාධපුර හා පොළොන්නරුව රැකියාපොල වැඩසටහන් 02ක් සංවිධානය කල අතර මෙම වැඩසටහන් සඳහා තරුණ තරුණියන් 100කට ආසන්න පිරිසක් සහභාගිකර දැනුවත්කර ඇත.



ජාතික වෘත්තීය පුහුණු අධිකාරිය, විවෘත විශ්ව විද්‍යාලය, කාර්මික විද්‍යාලය, තාක්ෂණික විද්‍යාලය, NIBM , ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් පාසල වැනි ආයතන හා ලාෆ් ගෑස්, රයිගම්, නිපොලැක්, මාස් හෝල්ඩින් වැනි පෞද්ගලික සමාගම්ද විය.

ජාතික වෘත්තීය සුදුසුකම්(NVQ-3/4/5) මට්ටම් ලබාදෙන පාඨමාලා පිළිබඳව දැනුවත්කර ඇත.

**07.ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී පුහුණු පාඨමාලා -රු.මි 2.0**



පළාතේ තරුණයින් මුහුණ දෙන ප්‍රධානතම ගැටළුවක්වන රැකියා විරහිත බවට පිළියම් වශයෙන් ගල්කුලම ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ ආයතනයේ සම්පත් දායකත්වයෙන් "ඉදි කිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී පුහුණු පාඨමාලා ව්‍යාපෘතිය" ආරම්භ කළ අතර පුහුණුලාභින් 62ක් සඳහා පුහුණුව ලබා දුන් අතර පාඨමාලා ගාස්තුවෙන් 50%ක් සඳහා පුහුණුලාභීන්ගෙන් අයකර ගන්නා ලදී.

- දේශීයව හා ජාත්‍යන්තරව පිළිගත් වෘත්තීය සහතික NVQ 03 හා 04 මට්ටම් සඳහා ප්‍රනීතනය කරන ලද පාඨමාලා හැදෑරීමට හැකි වීම.
- ඉදි කිරීම් ක්ෂේත්‍රයේ ඇතිවූ සීඝ්‍ර වර්ධනය හා ඉදි කිරීම් යන්ත්‍ර පුහුණුව ලැබූ පිරිස් හිඟයක් පැවතීමක් රැකියා විරහිත තරුණ මානව සම්පත මේ සඳහා යොමු කිරීම මගින් තරුණ විරැකියාව අඩු කිරීම හා පළාතේ තරුණ ප්‍රජාවගේ ආදායම් ඉහල දැමීමත් අරමුණ ඇතිව මෙම ව්‍යාපෘතිය පවත්වා ඇත.

**08.දේශීය ආහාර ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය- (රු.මි. 3.0)**

**දේශීය ආහාර අලෙවි සැලක් ඉදිකිරීම. – (රු.මි.2.5 ක් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත.)**

**දේශීය ආහාර වට්ටෝරු ඇතුලත් පොතක් නිර්මාණය කිරීම -(රු.මි. 0.5)**

වර්තමාන ලාංකිය ජනතාව අධි පරිභෝජනවාදි ආහාර සංස්කෘතිය සහ කෙටි ආහාර භාවිතයට හුරු වීමත් දේශීය ආහාර පරිභෝජනයෙන් ඉවත් වීමත් හේතුවෙන් දියවැඩියාව, අධි රුධිර පීඩනය, වකුගඩු රෝග, හෘද රෝග වැනි බෝ නොවන රෝග වලින් පළාතේ බහුතර ප්‍රජාවක් පීඩා විඳිති. මෙවැනි රෝගී තත්වයන්ට ජනතාව ගොදුරු වීම වළක්වා ගැනිම, ගුණාත්මක දේශීය ආහාර




පරිභෝජන සංස්කෘතිකයක් පළාත තුල ඇති කිරීම, දේශීය ආහාර පාන පළාතේ ජනතාව තුළ ප්‍රචලිත කිරීම, දේශීය ආහාර වට්ටොරු පිළිබඳ පොතක් නිර්මාණය කර එම පොත පළාතේ ජනතාව වෙත ලබා දීම යන අරමුණු ඇතිව මෙම පොත නිර්මාණය කරන ලදි.

## 09.පළාත් කර්මාන්ත සැලැස්ම සකස් කිරීම.

දේශීය වෙළඳපොළ මෙන්ම විදේශීය වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් භෞතික හා මානව සම්පත් භාවිතයට ගනිමින් නව කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා යටිතල පහසුකම් සපයා ගැනීම ඉලක්ක කර නව ක්‍රමෝපායන් සකස් කරන ලද අතර ක්‍රියාත්මක කිරීම සඳහා කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙත භාරදෙන ලදි.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අප අමාත්‍යංශයට අයත් සෙසු දෙපාර්තමේන්තු මෙන් පළාතේ සංවර්ධන කාර්යයේ කොටස්කරුවෙකි. ඒ අනුව වාහන ආදායම් බල පත්‍ර නිකුත් කිරීම මඟින් 2016 වර්ෂයේදී රු.මි. 470කට ආසන්න ආදායමක් උතුරු මැද පළාත් සභාවට එකතු කර දීමට හැකි විය. වාහන ආදායම් බල පත්‍ර අන්තර්ජාලයෙන් නිකුත් කිරීමට අදාල විද්‍යුත් ආදායම් බල පත්‍ර නිකුත් කිරීමේ නව ක්‍රම වේදයක් හඳුන්වාදීමට හැකි විය.




ආයතනික නීති හා මූල්‍ය රෙගුලාසි වලට අනුව අමාත්‍යංශ කාර්යය මණ්ඩලයේ සියලූම නිලධාරීන් හා සෙසු දෙපාර්තමේන්තු සහ සම්බන්ධ වී පළාතේ සංවර්ධනය හා එහි ප්‍රතිලාභ පළාතේ ප්‍රජාව වෙත ළඟා කරදීමේ අරමුණු ඇතිව සියලූම වැඩසටහන් සහ ව්‍යාපෘති සාර්ථකව නිමකිරීම සඳහා හැකි සෑම උත්සාහයක්ම ගන්නා ලදි.

මහජනතාව වෙත සුහදශීලි හා කාර්යක්ෂම සේවාවක් උපරිම ලෙස ඉටු කරමින් ද අනෙකුත් ආයතන සහ දෙපාර්තමේන්තු මනා සම්බන්ධීකරණයෙන් යුතුව අපේක්ෂිත අරමුණු වෙත ළඟාවීමට එසේම වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදි අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් අනෙකුත් පාර්ශවකරුවන්ද සහයෝගයෙන් කටයුතු කරමින් කාර්යාවලිය මෙහෙයවීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ලඟා විමටත් ආයතනයේ කාර්ය සාධනය ඉහළ නංවා ගැනීමටත් හැකි විය.

9.1

# පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

### දැක්ම

"තිරසාර සමුපකාර ව්‍යවසායත්, සෞභාග්‍යමත් සමාජයක්".

### මෙහෙවර

සමුපකාර ක්‍රමය හා එම ජාලය ශක්තිමත් කිරීම, සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන්, විනිවිද භාවයෙන් යුක්තව සහ සමුපකාර සංකල්පවලට හා ප්‍රතිපත්තිවලට මුල්තැන දෙමින් සංවර්ධනය කිරීම.

### දිගු කාලින හා කෙටි කාලීන අරමුණු

උතුරු මැද පළාතේ සමුපකාර ව්‍යාපාරය තුළින් පොදු මහජනතාවට ඵලදායීතාවයක් සපයමින් තිරසාර සංවර්ධනයට දායකත්වය සැපයීම.

### කෙටිකාලීන අරමුණු

සමුපකාර ව්‍යාපාරය තුළින් තාක්ෂණික උපකාර හා ක්‍රමෝපායන් සැකසීම.

### ප්‍රධාන කාර්යයන්

- සමුපකාර ක්‍රමය ප්‍රවර්ධනය කිරීම.
- සමුපකාර ජාලය ශක්තිමත් කිරීම.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහපාලනය කටයුතු සංවර්ධනය.

### ප්‍රධාන උපාය මාර්ගයන්

- පළාතේ පාරිභෝගික ජනතාවට සහන මිලට ද්‍රව්‍ය සැපයීම.
- පළාතේ නිෂ්පාදනය සඳහා වෙළඳ පොලක් ඇති කිරීම මඟින් ගොවීන්ට සහන සැලසීම.
- පළාතේ ජනතාවට සහනදායී මූල්‍ය පහසුකම් සැපයීම.

### කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 171 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 95 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 81 |
| අතිරික්ත | 05 |

මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 49.38 | 49.32 | 0.05 | 99.88 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 11.80 | 10.16 | 1.64 | 86.10 |
| **එකතුව** | **61.18** | **59.48** | **1.69** | **97.22** |

මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1.40 | 1.23 | 0.17 | 87.8 |
| යන්ත්‍රසූත්‍ර සවිකිරීම් හා උපකරණ | 0.30 | 0.29 | 0.01 | 96.6 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 0.30 | 0.28 | 0.02 | 93.3 |
| **එකතුව** | **2.00** | **1.80** | **0.20** | **90.0** |

මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්යය සාධනය

| අංකය | ව්‍යාපෘතිය (640 - වැය විෂය) | වෙන් කළ ප්‍රතිපාදනය (රු.මි) | වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 1 | මල්වානේගම මානව සම්පත් කේන්ද්‍රය මුළුතැන්ගෙය හා කෑම කාමරය අලුත්වැඩියාව | 2.00 | 0.00 | 0 |
| 2 | මල්වානේගම මානව සම්පත් කේන්ද්‍රයේ වහලය අලුත්වැඩියා කිරීම. | 5.00 | 0.00 | 0 |
| 3 | මල්වානේගම මානව සම්පත් කේන්ද්‍රයේ වාහන නවත්වන ගරාජය හා දෙපාර්තමේන්තුව සඳහා යන්ත්‍ර . ඡායා පිටපත් යන්ත්‍ර) පකරණ මිල දී ගැනීමයන්ත්‍රෝ ,02පරිගණක (02 | 2.00 | 0.00 | 0 |
| 4 | දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් දෙපාර්තමේන්තු ) ක් පැවැත්වීම 04 (නිලධාරීන් හා සමූපකාර සමිති නිලධාරීන් | 0.40 | 0.33 | 83 |
| 5 | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජාල ගත කිරීම තුළ ග්‍රාමීය බැංකු වල මෘදුකාංග පද්ධතියක් හා දත්ත ගබඩාවක් ඉදිකිරීම | 0.50 | 0.49 | 98 |

| | | | | |
|---|---|---|---|---|
| 6 | තෝරා ගත් ග්‍රාමීය බැංකු ජාල ගත කිරීම අවශ්‍ය පහසුකම් සැලසීම | 1.50 | 0.00 | 0 |
| 7 | උතුරු මැද පළාතේ අනුරාධපුර හා පොළොන්නරුව වී මෝල් නවීකරණය | 5.00 | 5.00 | 100 |
| 8 | විවිධ සේවා සමිති බල ප්‍රදේශ වල ගොවි සමූපකාර සමිති පිහිටු වීම | 2.60 | 2.60 | 100 |

| අංකය | ව්‍යාපෘතිය (641 - වැය විෂය) | වෙන් කළ ප්‍රතිපාදන ය (රු.මි) | වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 1 | ශ්‍රවණාගාරයේ පිවිසුම් මාර්ගයේ තාර ඇතිරීම , ආබාධිත පිවිසුම් මාර්ගයක් ,කිරීම සවි වීදිලාම්පු සැකසීම සහ එළිමහන් භෝජනාගාරයක් ඉදි කිරීම | 1.40 | 1.23 | 88 |
| 2 | සමූපකාර සමිති වල අධ්‍යක්ෂ මණ්ඩල ඇතුලු සේවකයන් සහ සමූපකාර සංවර්ධන නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළු ක් පැවැත්වීම 04 | 0.30 | 0.28 | 94 |
| 3 | ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය යන්ත්‍ර හා උපකරණ මිල දී ගැනීම | 0.30 | 0.29 | 99 |

දෙපාර්තමේන්තුවට වෙන් වූ පුනරාවර්තන ප්‍රතිපාදන අනුව අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීමට හැකි වූ අතර 2016.12.31 දින වනවිට මූලධන ව්‍යාපෘති සියල්ලේ වැඩ අවසන්කර තිබුන අතර අත්තිකාරම් බී ගිණුම අනුමත සීමාවන් තුල ප්‍රගතියක් අත්කර ගෙන ඇති අතර ලැබුණු අක්මුදල් අනුව 100% ක ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

2016 වර්ෂයට අදාල සංවර්ධන කාර්යයන් අතර මල්වානේගම මානව සම්පත් කේන්ද්‍රය මුළුතැන්ගෙය හා කෑම කාමරය අලුත්වැඩියාව,මල්වානේගම මානව සම්පත් කේන්ද්‍රයේ වහලය අලුත්වැඩියා කිරීම, මල්වානේගම මානව සම්පත් කේන්ද්‍රයේ වාහන නවත්වන ගරාජය සැකසීම, දෙපාර්තමේන්තුව සඳහා


ග්‍රාමීය බැංකු පරිගණකගත කිරීම

යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම (ඡායා පිටපත් යන්ත්‍ර 02,පරිගණක 02) , දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් 04 ක් පැවැත්වීම (දෙපාර්තමේන්තු නිලධාරීන් හා සමූපකාර සමිති නිලධාරීන්) , අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජාල ගත කිරීම තුළ ග්‍රාමීය බැංකුවල මෘදුකාංග පද්ධතියක් හා දත්ත ගබඩාවක් ඉදිකිරීම, තෝරා ගත් ග්‍රාමීය බැංකු ජාල ගත කිරීම අවශ්‍ය පහසුකම් සැලසීම , උතුරු මැද පළාතේ වී මෝල් නවීකරණය, විවිධ සේවා සමිති බල ප්‍රදේශවල ගොවි සමූපකාර සමිති පිහිටු වීම, සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ

පිවිසුම් මාර්ගයේ තාර ඇතිරීම, වීදි ලාම්පු සවි කිරීම, ආබාධිත පිවිසුම් මාර්ගයක් සැකසීම සහ එළිමහන් භෝජනාගාරයක් ඉදි කිරීම, සමූපකාර සමිති වල අධ්‍යක්ෂ මණ්ඩල ඇතුළු සේවකයන් සහ සමූපකාර සංවර්ධන නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළු 04 ක් පැවැත්වීම, ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය යන්ත්‍ර හා උපකරණ මිල දී ගැනීම යනාදි කාර්යයන් ප්‍රධාන වේ.

දෙපාර්තමේන්තුවේ අරමුණු හා ප්‍රධාන කාර්යයන් ඉටු කර ගැනීමේ දී අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු විශාල ප්‍රමාණයක් පැවතීම හා ප්‍රධාන ගැටලු වශයෙන් පැවතුන ද සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය මනා කාර්ය සාධනයෙන් යුක්තව, සමූපකාර සේවකයින්ගේ හා පළාතේ පාරිභෝගික ජනතාවගේ සුබ සිද්ධිය උදෙසා කැපවීමෙන් කටයුතු කරන ලද අතර ආයතනික විනය හා මූල්‍ය විනය යහපත් හා විධිමත්ව පවත්වා ගනිමින් යහපාලනය හා විනිවිදභාවය ආරක්ෂා කර ගනිමින් මහජන ප්‍රසාදය ලබා ගැනීමට ප්‍රයන්ත දරා ඇත.

එසේම පළාතේ සමූපකාර අංශයේ සංවර්ධනය උදෙසා වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදි අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් අනෙකුත් පාර්ශවකරුවන්ද සහයෝගයෙන් කටයුතු කරමින් කාර්යාවලිය මෙහෙයවීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ලඟා විමටත් ආයතනයේ කාර්ය සාධනය ඉහල නංවා ගැනීමටත් හැකි විය.

9.2

# පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

### ඉදිරි දැක්ම

"නිර්මාණශීලි කර්මාන්ත ප්‍රජාවක් , අභිමානවත් පළාතක්"

### මෙහෙවර

"කර්මාන්ත ක්ෂේත්‍රයේ මානව සම්පත්, ආයෝජන, නිෂ්පාදන හා වෙළඳපළ අවස්ථා, පර්යේෂණ හා සංවර්ධන, සියළු පාර්ශ්වකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව ප්‍රවර්ධනය කිරීම".

### දිගු කාලීන හා කෙටි කාලීන අරමුණු

උතුරු මැද පළාතේ හස්ත කර්මාන්ත, පේෂකර්මාන්ත හා කුඩා කර්මාන්ත ක්ෂේත්‍රයන්හී නිෂ්පාදනය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඉහළ නැංවීම තුළින් ජාතික නිෂ්පාදනයට කරනු ලබන්නා වූ දායකත්වය ඉහළ නංවාලීම හා ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවාලීම.

### කෙටිකාලීන අරමුණු

උතුරු මැද පළාතේ හස්ත කර්මාන්ත, පේෂකර්මාන්ත හා කුඩා කර්මාන්ත ක්ෂේත්‍රයන්හි ශිල්පීන් හට රැකියා අවස්ථා සලසා දීම හා ඔවුන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය ජාතික ප්‍රමිති තත්ත්වයට නංවාලීම හා පවත්නා නිෂ්පාදන අලෙවි ආදායම් මට්ටම ඉහළ නැංවීම හා වැඩි කිරීම.

### ප්‍රධාන කාර්යයන්




### ප්‍රධාන උපාය මාර්ගයන්

- හස්ත කර්මාන්තය, පේෂ කර්මාන්ත හා වඩු කර්මාන්ත යන අංශවල කර්මාන්ත කරුවන් හා ශිල්පීන් සඳහා නව තාක්ෂණය පිළිබඳ පුහුණුව ලබා දීමෙන් ගුණාත්මක නිර්මාණ හා නිෂ්පාදන එළිදැක්වීමට කටයුතු කිරීම.
- ස්වයං රැකියාවන්ට යොමුකිරීමට අවශ්‍ය ප්‍රාග්ධන ආධාර ලබා දී අලෙවි පහසුකම් ද සලසා දීමෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම.

### කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 157 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 135 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 22 |
| අතිරික්ත | 01 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 64.66 | 63.05 | 1.6 | 98 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 32.56 | 25.70 | 6.8 | 79 |
| **එකතුව** | 97.22 | 88.75 | 8.4 | 91 |

### මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 5.00 | 4.77 | 0.23 | 95 |
| **එකතුව** | 5.00 | 4.77 | 0.23 | 95 |

### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය

### අනුරාධපුර දිස්ත්‍රික්කය

| ව්‍යාපෘතිය | ඉලක්කය | වෙන්කළ ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| ගෝමරන්කල්ල පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියාව | ගොඩනැගිලි නවීකරණය | 0.65 | 0.59 | 92 |
| පුබ්බෝගම පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියාව | ගොඩනැගිලි අළුත්වැඩියාව | 0.16 | 0.16 | 96 |
| කච්චේරිය අලෙවිසැල අළුත්වැඩියාව | අලෙවි ප්‍රදර්ශනාගාරය නවීකරණය කිරීම | 0.88 | 0.88 | 100 |
| පණ්ඩුලගම පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියාව | ඉදිරිපස තාප්පය සකස් කිරීම | 0.30 | 0.29 | 98 |

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රාදේශීය වඩු කාර්මිකයින් සඳහා නව තාක්ෂණය පිළිබද පුහුණු වැඩ සටහන් 6 ක් පැවැත්වීම | වඩු කර්මාන්ත කරුවන් හා ශිල්පීන් සඳහා නවතාක්ෂණය හඳුන්වා දීම | 1.50 | 0.92 | 60 |
| පේෂකර්ම ගම්මාන 4 ක් ආරම්භ කිරීම(කිරිගල්ලෑව,උට්ටිමඩුව, සාලියපුර සහ පදවිය රුවන්ගම) | ස්වයං රැකියා බිහිකිරීම | 3.00 | 3.00 | 100 |
| හස්ත කර්මාන්ත කර්මාන්තකරුවන්ට නව තාක්ෂණය සමගින් පුහුණු කිරීම සහ දිරිගැන්වීම | හස්ත කර්මාන්ත කරුවන් හා ශිල්පීන් සඳහා නව තාක්ෂණය හා පුහුණු අවශ්‍යතා ලබාදීම | 3.00 | 2.49 | 83 |
| කච්චේරිය අලෙවිසැල අළුත්වැඩියාව | අලෙවි ප්‍රදර්ශනාගාරය නවිකරණය කිරීම | 1.00 | 1.00 | 100 |
| කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ කඩ 50 අලෙවි සංකිර්න භූමි පරිශ්‍රය ගල් අතුරා සකස් කිරීම | පරිසර අලංකරණය | 2.00 | 1.98 | 99 |
| කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ අලෙවි සංකිර්න නවිකරණ කටයුතු | අත්‍යාවශ්‍ය නවිකරණ කටයුතු ඉටුකිරීම | 0.38 | 0.38 | 100 |
| අලෙවි සංකිර්ණයට පැමිණෙන ළමුන්ගේ ප්‍රයෝජනය සඳහා සෙල්ලම් උපකරණ සකස් කර සිවිකිරීම | අලෙවි ප්‍රවර්ධනය | 0.22 | 0.22 | 100 |
| කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ කඩ 50 අලෙවි සංකිර්න භූමි පරිශ්‍රය ගල් අතුරා සකස් කිරීම | පරිසර අලංකරණය | 5.00 | 4.97 | 94 |
| කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ භූමියේ 10 X10 ප්‍රමාණයේ වෙළඳ කුටි 30 ඉදිකිරීම | ස්වයං රැකියා සඳහා සුදුසු ස්ථාන ලබාදීම | 5.00 | 4.94 | 99 |

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

| ව්‍යාපෘතිය | ඉලක්කය | වෙන්කළ ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| පත්තිනිගම පෙදෙස ගම පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියාව | මූලික පහසුකම් වඩි දියුණු කිරීම | 0.76 | 0.71 | 93 |

| | | | | |
|---|---|---|---|---|
| කඩවලවැව පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියාව | විදුලි පහසුකම් ලබාදීම | 0.09 | 0.07 | 83 |
| අරලගංවිල පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියාව | ගොඩනැගිලි අළුත්වැඩියාව | 0.19 | 0.19 | 99 |
| නෙළුම්විල පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියාව | ආයතන කටයුතු කාර්යක්ෂම කිරීම ගොඩනැගිලි අළුත්වැඩියා | 0.22 | 0.22 | 100 |
| බොඅත්ත පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියාව | ගොඩනැගිලි අළුත්වැඩියාව | 0.45 | 0.43 | 96 |
| රජඇලගම පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියාව | අලෙවි ප්‍රදර්ශනාගාරය වැඩි දියුණු කිරීම | 0.61 | 0.61 | 100 |
| හිඟුරක්දමන පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියාව | ගොඩනැගිලි අළුත්වැඩියාව | 0.33 | 0.31 | 96 |
| පුලතිසිගම පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියාව | ගොඩනැගිලි නවීකරණය කිරීම | 0.28 | 0.28 | 100 |
| ප්‍රාදේශීය වඩු කාර්මිකයින් සඳහා නව තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩ සටහන් 4 ක් පැවැත්වීම | වඩු කර්මාන්ත කරුවන් හා ශිල්පීන් සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම | 1.00 | 0.89 | 88 |
| පේෂකර්ම ගම්මාන 2 ක් ආරම්භ කිරීම (තඹාල හා තමන්කඩුව ) | ස්වයං රැකියා බිහිකිරීම | 2.00 | 1.99 | 100 |
| හස්ත කර්මාන්ත කර්මාන්තකරුවන්ට නව තාක්ෂණය සමගින් පුහුණු කිරීම | හස්ත කර්මාන්තකරුවන් හා ශිල්පීන් සඳහා නව තාක්ෂණය හා පුහුණු අවශ්‍යතා ලබාදීම | 2.00 | 1.41 | 58 |

පළාතේ කර්මාන්ත අංශයේ සංවර්ධනය උදෙසා එසේම වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදි අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් අනෙකුත් පාර්ශවකරුවන්ද සහයෝගයෙන් කටයුතු කරමින් කාර්යාවලිය මෙහෙයවීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ලඟා විමටත් ආයතනයේ කාර්ය සාධනය ඉහළ නංවා ගැනීමටත් හැකි විය.

# 9.3

# කර්මාන්ත සංවර්ධන අධිකාරිය

### ඉදිරි දැක්ම

"උතුරු මැද පළාතේ හොඳම කර්මාන්ත ප්‍රවර්ධකයා වෙමින් තිරසාර සංවර්ධනයේ ප්‍රධානතම පහසුකම් සලසන්නා වීම".

### මෙහෙවර

"උතුරු මැද පළාතේ සම්පත් ඵලදායි ලෙස යොදා ගනිමින් වෙළඳ පොළ අභිමුඛ කාර්මීකරණයක් තුළින් අදාළ පාර්ශවකරුවන් සමඟ උතුරු මැද පළාතේ නව ව්‍යවසායකත්ව සංස්කෘතියක් බිහි කිරීම".




### ප්‍රධාන කාර්යයන්

- ව්‍යවසායකයින් සඳහා තාක්ෂණික උපකරණ, පුහුණු හා මූල්‍ය පහසුකම් ලබාදීම.
- ව්‍යවසායක සංගම් ආරම්භ කිරීම හා සංවර්ධනය පවත්වාගෙන යාම.

### ප්‍රධාන උපාය මාර්ගයන්

- යටිතල පහසුකම් සැලසීම.
- ආකල්ප වර්ධනයට හා කුසලතා වර්ධනයට සුදුසු දේශකයන් යොදා ගැනීම.

### කාර්ය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 12 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 04 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 08 |
| අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික පදනමේ සිටින සංඛ්‍යාව | 05 |

### මෙහෙයුම් ප්‍රතිඵල-පුනරාවර්තන වියදම්

| වියදම් ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි) | 2016 වර්ෂයේ වියදම් (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 2.74 | 2.74 | 0.00 (රු.459.40) | 99.96 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 1.23 | 1.19 | 0.04 | 96.34 |
| **එකතුව** | **3.97** | **3.93** | **0.04** | **98.86** |

## මුලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි) | 2016 වර්ෂයේ වියදම් (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය % |
|---|---|---|---|---|
| යන්ත්‍රසූත්‍ර සවිකිරීම හා උපකරණ | 1.50 | 1.49 | 0.01 | 99.13 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 9.60 | 9.52 | 0.08 | 99.18 |
| **එකතුව** | **11.10** | **11.01** | **0.09** | **99** |

## මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය

| අනු අංකය | ව්‍යාපෘතිය | ඉලක්කය ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වෙන්කළ ප්‍රතිපාදනය (රු.මි) | වියදම් (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| 1. | කර්මාන්ත ගම්මාන චක්‍රිය අරමුදල | 112 | 5.10 | 5.10 | 100 |
| 2. | ප්‍රාදේශිය සංගම් සවිබල ගැන්වීම | | 2.90 | 2.9 | 100 |
| 3. | කර්මාන්ත ගම්මාන ප්‍රවර්ධන ව්‍යාපෘතිය | 142 | 0.10 | 0.09 | 91.71 |
| 4. | ව්‍යවසායක දැනුම හා කුසලතා වර්ධනය | 1004 | 0.50 | 0.41 | 82.7 |
| 5. | තාක්ෂණික පුහුණු වැඩ සටහන් පැවැත්වීම | 648 | 1.00 | 0.87 | 86.58 |

## 2016 වර්ෂය තුළදී

කර්මාන්ත සංවර්ධන අධිකාරිය සතු දැක්ම හා මෙහෙවරට අනුව යමින් පළාතේ කර්මාන්ත අංශය නගා සිටුවීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන ලදී. ඒ සඳහා කර්මාන්ත ගම්මාන චක්‍රිය අරමුදල,ප්‍රාදේශිය සංගම් සවිබල ගැන්වීම,කර්මාන්ත ගම්මාන ප්‍රවර්ධන ව්‍යාපෘතිය,ව්‍යවසායක දැනුම හා කුසලතා වර්ධනය,තාක්ෂණික පුහුණු වැඩ සටහන් පැවැත්වීම ආදි ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදී.විශේෂයෙන්ම කර්මාන්තඅංශයේ සංවර්ධනය උදෙසා දක්වන අංශීය දායකත්වය තුළ කුඩා කර්මාන්තකරුවන් නඟා සිටුවීම කෙරෙහි වැඩි අවධානයක් යොමුකර ඇති අතර ඒ සම්බන්ධයෙන් විවිධ මැදිහත් කිරීම් සිදු කරන ලදී.







සුළු පරිමාණ කර්මාන්තකරුවන් දැනුවත් කිරීම, ඔවුන්ගේ ආකාල්ප හා කුසලතා වර්ධනය, තාක්ෂණික දැනුම ලබාදීම, විසිරි සිටි ව්‍යවසායකයන් එක්රැස් කර සංගම් පිහිටුවීම සහ එම තෝරාගත් කර්මාන්තකරුවන්ගේ සංගම් සඳහා ණය සහ දැනුම ලබාදීම, හිඟුරක්ගොඩ සිරිකෙත මල්වවන්නන්ගේ සංගමයේ සාමාජිකයන් සහ මල් සංගමයේ සාමාජිකයන් මරදගහමුල ප්‍රදේශය, ගම්පහ බඩල්ගම දිවුලපිටිය ආශ්‍රිත මල් වවන්නන්ගේ වඩාත් දියුණු තත්වයේ මල් හා ඒ ආශ්‍රිත පැලැටි වගාවන් නිරික්ෂණ චාරිකා සහ ඔවුන්ගේ අදහස් හුවමාරු කර ගැනීම සඳහා නිරික්ෂණ චාරිකා දෙකක් සංවිධානය කිරීම සිදු විය.

ශ්‍රාවස්තිපුර මිනිමුතු විසිතුරු මත්සය සංගමය සාමාජිකයන් රම්බොඩගල්ල මත්සය අභිජනන මධ්‍යස්ථානය වෙත නිරික්ෂණ චාරිකාවට යොමු කර එම කර්මාන්තය දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය දැනුම හා තාක්ෂණික දැනුම ලබාදීම, නොච්චියාගම ප්‍රාදේශි ලේකම් බල ප්‍රදේශයේ ගාලදිවුල්වැව . අත්කම් නිෂ්පාදන සංගමයේ නිළධාරින් රැගෙන පොළොන්නරුව මනම්පිටිය පන් පුහුණු මධ්‍යස්ථාන වෙත ගොස් අදාළ පුහුණු නිළධාරීන් සමඟ ඉතාම වටිනා පන් පුහුණු රටා විෂය දැනුම ප්‍රායෝගිකව ලබාදීමට කටයුතු කිරීම, දිස්ත්‍රික්කයෙන් බාහිරව කරන ලද වැදගත් ක්‍රියාකාරකම් වේ.

එසේම දිස්ත්‍රික්කයේ මල් වවන්නන්ගේ වෙළඳ පොළ අවස්ථා වැඩිදියුණු කර ගැනීම ඔවුන් එකිනෙකා හඳුනා ගැනීම හා අදහස් හුවමාරු කර ගැනීම යන පරමාර්ථ මුල්කර ගනිමින් මල් ප්‍රදර්ශණ හා අලෙවි පොළ දෙකක් සල්ගාදු පිටියේ සහ කඩ 50 කර්මාන්ත දෙපාර්තමේන්තු පරිශ්‍රයේ දී පවත්වන ලදී.

2016 වර්ෂයේදී කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් ඉලක්කගත කරන ලද සංවර්ධන වැඩසටහන ඉලක්ක කරා ළඟාවිය හැකි විය.

9.4

# මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය

### ඉදිරි දැක්ම

"කාර්යක්ෂමතා ජනතාවාදී ප්‍රවාහන සේවාවක්".

### මෙහෙවර

"මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවා හා යටිතල පහසුකම් සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිද භාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම".

### දිගු කාලීන හා කෙටි කාලීන අරමුණු

### දිගුකාලීන අරමුණු

ජාතික ප්‍රතිපත්තීන්ට අනුගත වෙමින් පළාත් සභාව විසින් පළාතේ ජනතාවගේ ආර්ථික සමාජීය හා සංස්කෘතික පරිපාලනමය හා සමාජ සුභසාධනමය කටයුතු අරමුණුකරගෙන සැලසුම් කරනු ලබන ප්‍රතිපත්තීන්ට අනුව පළාත් ප්‍රවාහන සේවා පද්ධතිය කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබාදීමත් ,ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත්, මෙම අධිකාරියේ දිගුකාලීන අරමුණ වන්නේය.

### කෙටිකාලීන අරමුණු

අධිකාරිය විසින් නියාමනය කරනු ලබන බස්රථ, මාර්ගස්ථ ප්‍රවාහන බස්රථ, පාසැල් ළමුන් ප්‍රවාහන වෑන්රථ,ත්‍රීරෝද රථ, භාණ්ඩ ප්‍රවාහනය කරනු ලබන ට්‍රක් රථ සඳහා නව තාක්ෂණ දැනුම ලබාදීම, ක්ෂේත්‍රයේ නියැලී සිටින කාර්ය මණ්ඩලවල සමාජ සදාචාරාත්මකතාවය හා දේශීය අනන්‍යතාවය ආරක්ෂා කිරීම හා සංස්කෘතික වටිනාකම ආරක්ෂාකර ගැනීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනීම අධිකාරියේ අරමුණයි.

### ප්‍රධාන කාර්යයන්

| අනු අංකය | ප්‍රධාන කාර්යයන් | උපාය මාර්ග |
|---|---|---|
| 01 | කාලසටහන් අනුව ධාවනයවන බස්රථවල ගුණාත්මක අගය වැඩිකිරීම හා ආයතනගත කිරීම | ♣ මාර්ග සාකච්ඡා පවත්වමින් ධාවනයේදී ඇතිවන ගැටලු අවම කිරීමට උත්සාහ කිරීම.<br>♣ ශ්‍රී ලංගම බස්රථ 40% ක් ධාවනයට එක්කිරීම.නියාමනය ආයතනය 60%ක් ධාවනයට යෙදවීම.<br>♣ කාලසටහන් අනුව ධාවනය කිරීම සඳහා බස්නැවතුම්පල සේවකයින් යෙදවීම හා ලොග්පත්‍ර අත්සන්කිරීමට කටයුතු යෙදීම.<br>කොන්දොස්තර මහතුන් ,රියදුරු මහතුන් |

| | | |
|---|---|---|
| | | ,බස්හිමියන් පුහුණු කිරීම සඳහා වැඩමුලු පැවැත්වීම.<br>♣ රියදුරු කොන්දොස්තර මහතුන් සඳහා හැඳුණුම්පත්‍ර නිකුත්කිරීම. |
| 02 | සිසු ප්‍රවාහන බස්රථ,වෑන් රථ,කර්මාන්ත සේවක බස්රථ නියාමනය කිරීම. | ♣ මාර්ග හඳුනාගැනීම හා ලයිස්තුගත කිරීම.<br>♣ පළාත් සඳහා වෙන වෙනම ලාංඡන ලබාදීම.<br>♣ පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br>♣ පාසැල්වල විදුහල්පතීන්ගෙන් වාර්තා ලබාගැනීම.<br>♣ GPS තාක්ෂණික මෙවලම් හඳුන්වාදීම. |
| 03 | ත්‍රිරෝද රථ නියාමනය. | ♣ ත්‍රිරෝද රථ අවසරපත්‍ර ලබාදීම.<br>♣ නිල ලාංඡන ලබාදීම.<br>♣ පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br>♣ තාක්ෂණික දැනුම ලබාදීම.<br>♣ ටැක්සි මීටර් හඳුන්වාදීම. |
| 04 | බස්නැවතුම්පල නවීකරණය කිරීම හා අලුත්වැඩියා කිරීම. | ♣ මගීන් සඳහා අසුන් ඉදිකිරීම.<br>♣ වහලය සහ බිත්ති වාර්ෂිකව අලුත්වැඩියා කිරීම.<br>♣ විදුලිය හා ජලය පහසුකම් ලබාදීම. |

## කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 121 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 136 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 01 |
| අතිරික්ත | 07 |
| අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික පදනමේ සිටින සංඛ්‍යාව | 08 |

### මෙහෙයුම් ප්‍රතිඵල-පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 105.39 | 6.77 | 37.69 | 6.4 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 16.52 | 9.37 | 7.14 | 57 |
| **එකතුව** | **121.91** | **16.14** | **44.83** | **13** |

### මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 20.00 | 6.40 | 13.59 | 32 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 4.00 | 2.95 | 1.04 | 74 |
| **එකතුව** | **24.00** | **9.35** | **14.63** | **39** |

### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය

| අනු අංකය | ව්‍යාපෘතිය | ඉලක්කය | වෙන්කල ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| 01 | ප්‍රධාන කාර්යාලීය පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරිම | ♣ අධිකාරියේ සේවකයින් සඳහා ස්ථිර සේවා ස්ථානයක් ලබාදීම. අනුමත සේවකයින් 121 සහ අනියම් සේවකයින් 13 දෙනෙකු සේවයේ යෙදෙමින් ගුණාත්මක හා කාර්යක්ෂම මහජන සේවාවක් සැපයීමට දායක වීම.<br>♣ 2017 වර්ෂයේදී පරිපාලන ගොඩනැගිල්ලේ වැඩ අවසන්කර කාර්ය මණ්ඩලය එහි ස්ථානගත කිරීම.<br>♣ කාලසටහන් අනුව ධාවනයවන බස්රථ 650 ක් පමණද,පැසැල් බස්රථ 70 ක් පමණද, ත්‍රීරෝද රථ 4000 ක් පමණද, සේවයේ නියැලී සිටින කාර්ය මණ්ඩල සඳහා අවශ්‍ය පහසුකම් | 24.21 | | 60 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | සැපයීමට හැකිවීම.<br>♣ පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br>♣ ධාවන ගැටලු සඳහා මාර්ග සාකච්ඡා පැවැත්වීමට සුදුසු ස්ථානයක් ලබාදීමට හැකිවීම. | | | |
| 02 | තඹුත්තේගම බස්නැවතුම්පල I අදියර වැඩ අවසන් කිරිම. | ♣ නැවතුම්පල පර්යන්තයෙන් ගමන් ආරම්භවන සහ අවසන්වන බස්රථ 20 ක් සඳහාද,පර්යන්තයේ ගමන් පහසුකම් ලබාගන්නා අන්තර් පළාත් බස්රථ 300 කට පමණ නැවතුම්පල පහසුකම් ලබාදීමට හැකිවීම.<br>♣ දිනකට මගීන් 2000 කට පමණ මගී ධාවනයට පහසුකම් සැපයීමට හැකිවීම.<br>♣ ත්‍රිරෝද රථ හිමියන් 40 කට පමණ නැවතුම් පහසුකම් සැපයීමට හැකිවීම.<br>♣සුලු පරිමාණ ව්‍යාපාරිකයින් 100 කට පමණ වෙළඳ ව්‍යාපාර පවත්වාගෙන යාමට පහසුකම් සැපයීම සහ ජංගම වෙළඳුන් 50 කට පමණ ද ව්‍යාපාර සඳහා පහසුකම් සැපයීම.<br>♣ 2000 කට පමණ ආසන්න මගීන් ප්‍රමාණයකට දිනකට පහසුකම් සැපයීම.<br>♣ වාණිජ නගරයක් ලෙස සංවර්ධනය වීමට යටිතල පහසුකම් සැපයීම.<br>♣ බස්රථ නඩත්තු වියදම් අවමකර ගැනීමට හැකිවීම | 2.00 | 1.89 | 100 |
| 03 | මගී ආවරණ ඉදිකිරීම | ♣ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මගී ආවරණ 10 ක්ද,පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 05 ක්ද වශයෙන් මගී ආවරණ 15 ක් ඉදිකිරීම.<br>♣ ප්‍රධාන නගර ආශ්‍රිතව තෝරාගනු ලබන ස්ථානයන්හි මාර්ග සංවර්ධන අධිකාරිය, පොලීසිය, පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, මහනගර සභාව, ප්‍රාදේශීය සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මහවැලි අධිකාරිය, වැනි රාජ්‍ය ආයතනවල නිර්දේශයට අනුව ඉදිකිරීම් කටයුතු කිරීමට හැකිවීම. එමගින් නීත්‍යානුකූලභාවය හා විනිවිධභාවයකින් වඩාත් සුදුසු ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට හැකිවීම.<br>♣ අව් වැසිවලින් ආරක්ෂාවීමට වැඩිහිටි,පාසැල් ළමුන්,හා මාර්ගයේ | 5.70 | 5.12 | 100 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | ධාවනයවන සියලුම මගීන් 15000 කට පමණ සෙවන ලබාදීමට හැකිවීම.<br>♣ පරිසර අලංකරණයට දායක වීමට හැකිවීම. | | | |
| 04 | තඹුත්තේගම බස්නැවතුම්පල I අදියර වැඩ අවසන් කිරීම | ♣ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවය කරණ 1000 ක් පමණ වන සේවකයින්ට අවශ්‍ය ගමන් පහසුකම් ලබාදීමට හැකිවීම.<br>(පාසැල්, පොලීසිය, රෝහල, මහවැලි කාර්යාල, උසාවිය, කාර්යාල සේවකයින්ද, පෞද්ගලික අංශයේ රැකියාවන් වල නියැලී සිටින අයවලුන්ද සමග.) | 2.00 | 0.20 | 100 |
| 05 | ගල්නෑව බස්නැවතුම්පල භූමිය සකස්කිරීම | ♣ පර්යන්තයෙන් ගමන් ආරම්භකරන සහ අවසන්කරන පෞද්ගලික බස්රථ 20 ක් සහ ශ්‍රී ලංගම බස්රථ 12 කට පමණ නැවතුම්පොල පහසුකම් ලබාදීමට හැකිවීම.<br>♣ප්‍රදේශයේ කෘෂිකාර්මික,වාණිජ හා රාජ්‍ය අංශයේ නියැලී සිටින පොදු මගී ජනතාවට (දිනකට 1000 කට පමණ) ප්‍රවාහන පහසුකම් සැපයීමට හැකිවීම.<br>පාසැල් ළමුන්, රාජ්‍ය සේවකයින්, පෞද්ගලික අංශයේ සේවකයින් සඳහා ධාවන පහසුකම් සැපයීම. | 1.00 | 0.81 | 100 |
| 06 | කහටගස්දිගිලිය බස්නැවතුම්පල මගී ජනතාවට පහසුකම් සැපීම | ♣ 2012 වර්ෂයේදී සංවර්ධනය කරන ලද කහටගස්දිලිය බස්නැවතුම්පල මගීන් සඳහා අසුන් සවිකර නොතිබුණි. එමගින් දිනකට මගීන් 1500 ක් පමණ අසීරුතාවයකට පත්විය. ගැබිනි මාතාවන්, වැඩිහිටියන්, පාසැල් ළමුන්, රාජ්‍ය සේවකයින්, මේ අතර විය. ගොඩනැගිලි දෙක සඳහා පුටු 72 ක් පමණ ලබාදීම මගින් නිරන්තර ධාවනයවන බස්රථ සඳහා නැවතුම්පල පහසුකම් ලබාදීමට හැකිවීම. | 0.30 | 0.32 | 100 |
| 07 | ජලය විදුලිය නොමැති බස්නැවතුම්පල සඳහා ජලය විදුලිය ලබාදීම | ♣ අනුරාධපුර නව බස්නැවතුම්පල වැසිකිලි පද්ධතිය ඉදිකිරීම.<br>2015 වැඩ අවසන්කරන ලද කාමර දෙකකින් සමන්විත මහජන වැසිකිලි පද්ධතිය සඳහා ජලය ලබාගැනීමට නොහැකිවීම නිසා ජල ටැංකියකට ජලය | 0.50 | 0.49 | 100 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | පුරවා ගනිමින් අවශ්‍යතා ඉටුකර ගන්නා ලදි.<br>එම අවශ්‍ය සපුරාලමින් නව ජල සම්බන්ධතාවයක් ලබාගැනීමෙන් සනීපාර්කෂක පහසුකම් ඉහල නැංවීමට හැකියාව ලැබී ඇත. | | | |
| 08 | නව බස්නැවතුම්පල නව ගොඩනැගිල්ල වෙත විදුලිය ලබාදීම | ♣ පර්යන්තයේ උඩුමහලේ කඩකාමර සඳහා විදුලිය ලබාදීම මගින් ව්‍යාපාර කටයුතු කිරීමට අවස්ථාව ලබාදීම.<br>♣ දිනකට මගීන් 2000 කට පමණ ධාවන පහසුකම් ලබාදීම.<br>♣ ස්ථිර වෙළඳ ව්‍යාපාර,බැංකු,හා රක්ෂණ සමාගම් දියුණුවට වක්‍රලෙස දායක වීමට හැකිවීම.<br>♣ ජංගම වෙළඳුන් 100 කට අධික සංඛ්‍යාවකට රැකියා අවස්ථා ලබාදීම.<br>♣ ත්‍රීරෝද රථ ක්ෂේත්‍රයේ නියැලී සිටින 150 කට පමණ රැකියා අවස්ථා පහසුකම් ලබාදීමට හැකිවීම.<br>♣ රාත්‍රී කාලයේ ධාවනයවන අන්තර්පළාත් බස්රථ 100 කට පමණ නැවතුම්පල පහසුකම් ලබාදීමට හැකිවීම. | 1.71 | 1.71 | 100 |
| 09 | වේලාසටහන් කුටි | ♣ ප්‍රධාන බස්නැවතුම්පල ස්ථානවලට අමතරව හඳුනාගනු ලැබූ අතුරු ස්ථානවල වේලාසටහන්කුටි ස්ථානගත කිරීම මගින් කුටි 05 ක් මගින් දිනකට බස්රථ 500 ක් පමණ නියාමනය වීම.<br>♣ නියාමන කාලයතුල ධාවනය වීම නිසා දිනකට මගීන් 20000 කට පමණ මිනිස් ශ්‍රමකාලය අඩුකර ගැනීමට හැකිවීම.<br>♣ සේවා ස්ථානය සුරක්ෂිත වීම. | 0.50 | 0.45 | 100 |
| 10 | රියදුරු කොන්දොස්තර මහතුන් පුහුණු වැඩසටහන් කිරීම ආයතන ධාරිතා සංවර්ධනය | ♣රියදුරු කොන්දොස්තර මහතුන් 1000 කට පුහුණු වැඩසටහන් මගින් ප්‍රගුන කිරීම හා ආයතනය විසින් හඳුනාගැනීමේ බලපත්‍ර ලබාදීම.<br>♣ රටේ යහපාලනය පවත්වාගෙන යාමට හැකිවීම.<br>♣ පුහුණු වැඩසටහන් සඳහා අත්‍යාවශ්‍ය උපකරණ ලබාගැනීම මගින් සාර්ථක පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 2.00 | 1.91 | 100 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | ♣.නැවතුම්පල බස්රථ තොරතුරු ගබඩා කිරීම,<br>♣ බස්හිමියන් 600 කගේද කොන්දොස්තර මහතුන් 1400 කගේද, ත්‍රීරෝද රථ හිමියන් 4000 කගේද ,සිසු ප්‍රවාහන හිමියන් 70 කගේද දත්ත ගබඩාකර ගැනීමට හැකිවීම. | | | |
| 11 | පැරණි බස්නැවතුම්පොල භූමිය කාපට් කිරීම | ♣ පර්යන්තයෙන් ගමන් ආරම්භ කරන සහ අවසන් කරන බස්රථ පෞද්ගලික බස්රථ 80ක් සහ ශ්‍රී ලංගම බස්රථ 60කට පමණ නැවතුම්පොල පහසුකම් ලබාදීමට හැකිවීම.<br>♣ ප්‍රදේශයේ කෘෂිකාර්මික,වාණිජ හා රාජ්‍ය අංශයේ නියැලී සිටින පොදු මගී ජනතාවට(දිනකට 3000 කට පමණ) ප්‍රවාහන පහසුකම් සැපයීමට හැකිවීම.<br>පාසැල් ළමුන්,රාජ්‍ය සේවකයින්,පෞද්ගලික අංශයේ සේවකයින් සඳහා ධාවන පහසුකම් සැපයීම. | 2.00 | 1.51 | 100 |

2015 වර්ෂයට සාපේක්ෂව ගත්කල 2016 වර්ෂයේදී ඉහළ සාපේක්ෂ ඵලදායිතාවයක් පෙන්නුම් කරන ලදී. එය 90% ක ප්‍රතිශතයක් බව දැක්විය හැකිය. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා පළාත් සභා ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මකකල සංවර්ධන වැඩසටහන් අපේක්ෂිත ඉලක්ක කරා ළගා විය හැකි විම හා ක්‍රියාත්මක කල වැඩසටහන් අතුරින් ප්‍රවාහන අධිකාරියේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමට හැකි වීම තුළ වඩා ඵලදායි හා කාර්යක්ෂම සේවාවක් සැපයීමට හැකි විය.

එසේම මගී ආවරණ ඉදිකිරීම, බස්නැවතුම්පල සංවර්ධනය කිරිම, ජලය විදුලිය නොමැති බස්නැවතුම්පල සඳහා ජලය විදුලිය ලබාදීම,ධාවනය විධිමත් කිරීම සඳහා වේලා සටහන් කුටි සකස් කිරීම, වැසිකිලි පද්ධති අලුත්වැඩියා කිරීම වැනි ව්‍යාපෘති මගින් සමස්ත මගී ජනතාවට ඉටුවන සේවය අතිවිශාලය. ප්‍රධාන මාර්ග පුළුල් කිරීමට සාපේක්ෂව අතුරු මාර්ග සංවර්ධනය කිරීම නිසා අතුරු මාර්ගවල බස්රථ ධාවනය කිරීම මගින් ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා ඉටුකර ගැනීමට හැකිවීමද ලද ජයග්‍රහණ අතර වේ.

ප්‍රධාන නගරයට පැමිණෙන ජනතාව ඉහල මට්ටමක පවතී.මේ නිසා වක්‍රලෙස මාර්ග පද්ධති නවීකරණය කිරීමට පෙලඹවීමට ආයතනයට හැකිවී ඇත.එය ආර්ථික සංවර්ධනයට දායකත්වයක් ලබාදී ඇත.විශේෂයෙන්ම කෘෂි නිෂ්පාදන අලෙවිය සඳහා ප්‍රධාන නගරය වෙත ලොරි රථවලින් ප්‍රවාහනය කර , බස්රථ මගින් ගොවියන් පැමිණීම සැලකිය යුතු කරුණකි.

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථාන මෙන්ම තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය වෙත ළඟාවෙන රාජාංගණය,ගල්නෑව,තලාව,නොච්චියාගම, වැනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පදිංචි ගොවි මහත්ම මහත්මීන්ට මෙමගින් පහසුවක් සැලසුණි.. එය විධිමත් පරිදි බස්රථ ධාවනයවන බවට කදිම නිදසුනකි. අධිකාරියේ සේවක පරිපාලනය කිරීමේදී පාලන ගිණුම් අංශවල ක්‍රියාකාරීත්වය විනිවිදභාවයකින් දැකිය හැකි වුවද, ධාවන අංශයේ කටයුතු අතර බස්රථ සඳහා බලපත්‍ර ලබාදී සිසු ප්‍රවාහන බලපත්‍ර ලබාදීම කාලසටහන් සංශෝධන මාර්ග සාකච්ඡා ආදී කටයුතු පිළිබඳව විනිවිදභාවයක් නොමැතිවීම යහපාලන මූලධර්මවලට පටහැනිව කටයුතු කරන බව පෙනේ.

කෙසේ වුවද අපේක්ෂිත ඉලක්ක සපුරාගැනීමට හැකිවුවද අධිකාරියේ නීති රෙගුලාසි සකස්කර නොමැති වීමත්,අපේක්ෂිත ඉලක්ක කරා ලගාවීමට මහත් පරිශ්‍රමයක් දැරිය යුතු බව පෙනීයන කරුණකි.කෙසේ වුවද අධිකාරිය විසින් ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ චක්‍රලේඛන පළාත් සභාවේ අමාත්‍යාංශ විසින් කලින් කලට නිකුත්කරන ලද රෙගුලාසිවලට අනුගත විය යුතුය.

මගී ජනතාවගේ සුභසාධනය උදෙසා පවතින ප්‍රඥප්තිය ප්‍රකාරව උතුරු මැද ත්‍රීරෝද රථ නියාමනය, පාසැල් වෑන්රථ, භාණ්ඩ ප්‍රවාහන ටිපර් රථ, ලොරි රථ, හා මගී හා භාණ්ඩ ප්‍රවාහන කරන සියලුම වාහන නියාමනය කලයුතු කාර්යයන් වන අතර ඉන් 2016 වර්ෂයේදී 50%ක් පමණ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.

එසේ වුවද සේවක ස්ථාන මාරුකිරීම් විෂයන් පැවරීම ක්‍රියාත්මක කර නිලධාරියාට තම විෂය ක්ෂේත්‍රයන් තුල දැනුම ලබාදීම මගින් අක්‍රමිකතා අවම කර ගැනීමට හැකිවීම සහ කාර්යාල ලිපිගොනුවල නිවැරදිතාවය හා බස්නැවතුම්පල මගී ජනතාව හා බස්රථ රියදුරන් හා කොන්දොස්තරවරුන් උදෙසා මහජනශීලී සේවය ලබාදීමට අත්දැකීම් ලබාගැනීමට ඇති හැකියාව අවම වීම අධිකාරියේ ඉදිරිගමනට බාධාවන් ලෙස හඳුනාගෙන ඇති අතර එකී ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා සැලසුම් සහගත වැඩසටහනක් 2017 වසරේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරිමේදි අනෙකුත් අමාත්‍යාංශ හා ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් අනෙකුත් පාර්ශවකරුවන්ද සහයෝගයෙන් කටයුතු කරමින් කාර්යාවලිය මෙහෙයවීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ලඟා විමටත් ආයතනයේ කාර්ය සාධනය ඉහල නංවා ගැනීමටත් හැකි විය.

9.5

# පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව

### ඉදිරි දැක්ම

"ජාතික හා ජාත්‍යන්තර කෙළිබිම ජයගන්නා නීරෝගීමත් හා ක්‍රියාශීලී ජනතාවක්, සංවර්ධිත පළාතක්".

### මෙහෙවර

"උතුරු මැද පළාතේ ජනතාව නීරෝගීමත් හා ක්‍රියාශීලී කිරීම සඳහාත් ක්‍රීඩකයින් ජාතික හා ජාත්‍යන්තර ජයග්‍රහණ වෙත යොමු කිරීම සඳහාත් ක්‍රීඩා පුහුණු කටයුතු, හඳුනාගන්නා ලද ක්‍රීඩකයින්ට පහසුකම් සැලසීම,යටිතල පහසුකම් හා ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම."

### අරමුණු

- උතුරු මැද පළාත තුළ සිටින සැඟවුණු කුසලතාවලින් හෙබි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මනා ක්‍රීඩා පුහුණුවක් ලබා දී ජාතික හා ජාත්‍යන්තර තලයට ගෙන ඒම.
- උතුරු මැද පළාත තුළ අභිමානවත් ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම.
- ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රීඩා කෞශල්‍යයෙන් පිරි ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනාගැනීම.
- පළාත තුළ සිටින සියළුම ප්‍රජාව ආවරණය වන පරිදි ක්‍රීඩා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පළාතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩා සහ පුහුණු කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය.
- විධිමත් හා කාර්යක්ෂම සේවා සපයන ආයතනික පද්ධතියක් සකස් කිරීම

### ප්‍රධාන කාර්යයන්

01.ක්‍රීඩා පුහුණුව සංවර්ධනය

02.හඳුනාගන්නා ලද ක්‍රීඩකයින්ට පහසුකම් සැලසීම හා සංවර්ධනය කිරීම

03.යටිතල පහසුකම් සංවර්ධනය

04.ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම

05.ආයතනික ධාරිතා සංවර්ධනය

06.යහපාලන කටයුතු සංවර්ධනය

## ප්‍රධාන උපාය මාර්ගයන්

01.ප්‍රාදේශීය පුහුණු කඳවුරු පැවැත්වීම.

02.ක්‍රීඩක,ක්‍රීඩිකාවන් සඳහා දිරිදීමනා ලබාදීම.

03.ක්‍රීඩක,ක්‍රීඩිකාවන් සඳහා පෝෂණ අවශ්‍යතා ලබාදීම.

## කාර්ය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 92 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 71 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 23 |

## මෙහෙයුම් ප්‍රතිඵල-පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 16.44 | 16.43 | 0.01 | 100 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 51.35 | 46.57 | 4.78 | 91 |
| **එකතුව** | **67.79** | **63.00** | **4.79** | **93** |

## මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0.51 | 0.51 | 0.00 (රු74.32) | 100 |
| යන්ත්‍රසූත්‍ර සවිකිරීම් හා උපකරණ | 0.15 | 0.14 | 0.00 (රු.122.50) | 100 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 1.84 | 1.72 | 0.12 | 93 |
| **එකතුව** | **2.50** | **2.37** | **0.12** | **95.16** |

### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය

| ව්‍යාපෘතිය | වෙන්කළ ප්‍රතිපාදනය (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|
| ගොඩනැගිලි අළුත් වැඩියාව | 0.51 | 0.51 |
| ක්‍රීඩා නේවාසිකාගාර පහසුකම් සංවර්ධනය කිරීම | 0.50 | 0.50 |
| ක්‍රීඩා පිටි සංවර්ධනය | 1.50 | 1.18 |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 1.22 | 1.22 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 0.15 | 0.14 |
| ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ කුසලතා ඇගයීම | 0.12 | 0.09 |
| | **4.00** | **3.65** |

### ක්‍රීඩා පිටි සංවර්ධනය ඇතුළත් යටිතල පහසුකම් සංවර්ධනය

ඉහත දක්වා ඇති සංවර්ධන කාර්යයන්ට අමතරව පළාතේ ක්‍රීඩා අංශය සංවර්ධනය කෙරෙහි විශාල වශයෙන් බලපානු ලබන ක්‍රීඩා පිටි සංවර්ධනය ඇතුළත් යටිතල පහසුකම් සංවර්ධනයත්,ක්‍රීඩා උපකරණ සැපයීම, ක්‍රීඩා සමාජ සංවර්ධනය කිරීම,ක්‍රමවත් හා විධිමත් ක්‍රීඩා පුහුණු සංචිත හා කඳවුරු පැවැත්වීමත්, නවක ක්‍රීඩකයින් හඳුනා ගැනීමත් නිරන්තර පුහුණුව ලබා දීමත්,දැනටමත් හඳුනාගත් ක්රීඩකයින් නිරන්තර පුහුණු කරමින් ජාතික හා ජාත්‍යන්තර මට්ටම කරා යොමු කිරීමටත්,ක්‍රමානුකූලවූ ඉලක්ක සහගත වූත් වැඩපිළිවෙළක් ආරම්භකර ක්‍රියාත්මක කිරීම 2016 වර්ෂය තුළදී හැකි විය.



### 2016 ලඟාකරගත් ඉලක්ක කිහිපයක්.....

උතුරු මැද පළාත තුල අභිමානවත් ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම.

සැඟවුණු කුසලතාවලින් හෙබි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මනා ක්‍රීඩා පුහුණුවක් ලබා දී ජාතික හා ජාත්‍යන්තර තලයට ගෙනඒම

dක්‍රීඩා කෞශල්‍යයෙන් පිරි ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනාගැනීම

.

.



විධිමත් හා කාර්යක්ෂම සේවා සපයන ආයතනික පද්ධතියක් සකස් කිරීම

පළාතේ සියළුම ප්‍රජාව ආවරණය වන පරිදි ක්‍රීඩා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

## පළාතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩා සහ පුහුණු කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය

### 01. ක්‍රීඩා පිටි සංවර්ධනය (රු.මි.20)

2016 වර්ෂයට අදාළව පළාතේ ක්‍රිඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම උදෙසා අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය යටතේ ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීම ක්‍රියාත්මක විය. ඒ යටතේ පළාතේ ක්‍රීඩා පිටි 111ක් සංවර්ධනය කර ඇත..

| | | | |
|---|---|---|---|
| I. එළිය දිවුල්වැව මහජන ක්‍රීඩාංගන ය | රු.2,000,000.00 | ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම |  |
| II. පතිරාජගම ක්‍රීඩාංගන ය | රු.100,000.00 | ක්‍රීඩාංගනයට දුරපැනීමේ වළක් ඉදිකිරීම ස |  |
| III. කුට්ටිකුල ම ක්‍රීඩාංගන ය | රු.800,000.00 | ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම |  |

### 02. පුහුණු කඳවුරු හා වැඩමුළු පැවැත්වීම (රු.මි.5)



2016 වර්ෂයේදීද පළාතේ ක්‍රිඩා අංශය සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා ක්‍රීඩා නිළධාරීන් සඳහා ක්‍රමවත් පුහුණු කඳවුරු පැවැත්වීම සිදු විය.

### 03. ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා උපකරණ ලබා දීම (රූ.මී.5.5)

2016 වර්ෂයට අදාලව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 29 අවාරණය වන පරිදි ලියාපදිංචි ක්‍රීඩා සමාජ 1100ක් සඳහා ක්‍රිකට්, වොලිබෝල්, නෙට්බෝල් සහ පාපන්දු යන ක්‍රීඩා උපකරණ ලබා දීම සිදු කර ඇත.




### 04. ක්‍රීඩා උත්සවයන් සංවිධානය කිරීම (රූ.මී.10.1)

දිස්ත්‍රික්, පළාත්, සහ ජාතික මහ ක්‍රීඩා උළෙල සඳහා 2016 වර්ෂයෙදි ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහාභාගිවීම හා පළාත වෙනුවෙන් ජයග්‍රහණ ලබාදීම මෙහිදි පෙන්වා දිය හැක.

### 01.දිස්ත්‍රික් ක්‍රීඩා උළෙල

අනුරාධපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක දෙකෙහි දක්ෂතා ඇති ක්‍රීඩකයන් තේරීම මෙහිදී සිදුවූ අතර ජයග්‍රාහකයන් පළාත් ක්‍රීඩා උළෙල සඳහා තෝරාගැනීම මෙහිදී සිදු විය.

### 02.පළාත් ක්‍රීඩා උළෙල

27 වන පළාත් ක්‍රීඩා උළෙල අනුරාධපුර මහජන ක්‍රිඩාංගනයේ පැවති අතර එහිදී ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගනණාවක් ජාතික මට්ටම නියෝජන කිරීමේ අවස්ථා උදාකර ගනු ලැබිය.

### 03.ජාතික මහ ක්‍රීඩා උළෙල

ජාතික මහ ක්‍රීඩා උලලේ සමස්ත පදක්කම් සටහන

| ස්ථානය | පළාත | රන් | රිදී | ලෝකඩ | පදක්කම් එකතුව |
|---|---|---|---|---|---|
| 1 | බස්නාහිර | 113 | 74 | 67 | 254 |
| 2 | දකුණ | 33 | 29 | 43 | 105 |
| 3 | මධ්‍යම | 28 | 38 | 41 | 107 |
| 4 | වයඹ | 23 | 38 | 38 | 99 |
| 5 | සබරගමුව | 16 | 24 | 44 | 84 |
| 6 | උතුරු මැද | 15 | 17 | 43 | 75 |
| 7 | ඌව | 12 | 15 | 34 | 61 |
| 8 | නැගෙනහිර | 7 | 12 | 11 | 30 |
| 9 | උතුර | 2 | 5 | 5 | 12 |




යාපනය දුරෙයප්පා ක්‍රීඩාංගනයේ පැවති 42 වන ජාතික මහ ක්‍රීඩා උලළේදී උතුරු මැද පළාත රන් පදක්කම් 15ක්ද රිදී පදක්කම් 17ක්ද ලෝකඩ පදක්කම් 43ක්ද වශයෙන් සමස්ත පදක්කම් සටහනේ පදක්කම් ගණන 75ක් ලෙස සටහන් තබමින් පළාත් මට්ටමෙන් හයවන (6) ස්ථානය හිමිකර ගැනීමට සමත් විය.

### 05. ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ කුසලතා ඇගයීම (රු.මි. 4.5)

2016 වර්ෂයේදී කුසලතා ලබා ගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා පුහුණුකරුවන් ඇගයීම සිදු වූ අතර තරඟ ඉසව් 19ක් සඳහා රන් පදක්කම් 34ක්ද රිදී පදක්කම් 38ක් හා ලෝකඩ පදක්කම් 53ක් වශයෙන් මුළු පදක්කම් 125ක් දිනා ගැනීමට පළාතේ දූ දරුවන් සමත් විය.

| ක්‍රීඩාව | රන් | රිදී | ලෝකඩ | උපහාර ලැබූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ප්‍රමාණය |
|---|---|---|---|---|
| කායවර්ධන (පිරිමි) | 1 | | 2 | 3 |
| බොක්ෂිං (පිරිමි) | 2 | 2 | 3 | 7 |
| එල්ලේ (පිරිමි) | | | 20 | 20 |
| එල්ලේ (කාන්තා) | 20 | | | 20 |
| ජිම්නාස්ටික් (පිරිමි) | | 6 | | 6 |
| ජිම්නාස්ටික් (කාන්තා) | 1 | | 1 | 2 |
| ජුඩෝ (පිරිමි) | | | 3 | 3 |
| ජුඩෝ (කාන්තා) | 2 | | 2 | 4 |
| කබඩි (කාන්තා) | | 11 | | 11 |
| කාරතේ දෝ (පිරිමි) | 1 | 3 | 3 | 7 |
| කාරතේ දෝ (කාන්තා) | | | 3 | 3 |
| තරඟ ඇවිදීම (පිරිමි) | | 1 | | 1 |
| බර ඉසිලීම (පිරිමි) | 2 | 2 | | 4 |
| බර ඉසිලීම (කාන්තා) | 1 | 3 | 3 | 7 |
| මල්ලවපොර (පිරිමි) | | 4 | 6 | 10 |
| මලල ක්‍රීඩා (පිරිමි) | 1 | 5 | | 6 |
| මලල ක්‍රීඩා (කාන්තා) | | | 1 | 1 |
| තයිකොන්ඩෝ (පිරිමි) | 3 | 1 | 3 | 7 |
| තයිකොන්ඩෝ (කාන්තා) | | | 3 | 3 |
| **එකතුව** | **34** | **38** | **53** | **125** |

### 06. ක්‍රීඩා පුහුණු සහ ක්‍රීඩා සංගම් වෙනුවෙන් ක්‍රීඩා ඉසව් සංවර්ධනය කිරීම (රු.මි. 15)

මෙහිදී හඳුනාගත් ක්‍රීඩා ඉසව් පහළොවක් (15) වෙනුවෙන් එම ක්‍රීඩාව නගා සිටුවීම සඳහා උපකරණ ලබා ගැනීම සිදු කර ඇත. (බර ඉසිලීම, බොක්ෂිං, කරාතේ දෝ, මළල ක්‍රීඩා, ජුඩෝ, තයිකොන්ඩෝ, මල්ලවපොර, දැල්පන්දු, කබඩි, වොළිබෝල්, පිහිනුම්, එල්ලේ, පාපැදි, පාපන්දු, පැසිපන්දු, කායවර්ධන)

**ක්‍රීඩා පුහුණු සහ ක්‍රීඩා සංගම් වෙනුවෙන් ක්‍රීඩා ඉසව් සංවර්ධනය කිරීම (රු.මි. 15)**

| අංශය | උපකරණය | ලබාගත් ප්‍රමාණය |
|---|---|---|
| මලල ක්‍රීඩා උපකරණ | **ස්ප්‍රින් බෝඩ්** | 3 |
| | යගුලිය 7.260 KG | 6 |
| | ගුලිය 4 Kg | 1 |
| | යගුලිය 5 Kg | 1 |
| | මිටිය කාන්තා (වයිනා) | 4 |
| | මිටිය පිරිමි (වයිනා) | 4 |
| | මිටිය 7.260 Kg | 2 |
| | මිටිය 4 Kg | 2 |
| | හෙල්ල 800g(ගොල්ඩ්කප්) | 4 |
| | හෙල්ල 600g(ගොල්ඩ්කප්) | 4 |
| | ස්ටොප් බෝඩ් (යගුලිය සඳහා ) | 1 |
| | රිටි පැනීමේදී ඉපිලීමේ කුල්ල | 2 |
| | ආරම්භක පුවරු | 12 |
| | හුවමාරු යශ්ටි | 28 |
| | කවපෙත්ත 2 Kg | 4 |
| | රිටි පැනීමේ මෙට්ට | 2 |
| | රිටි පැනීමේ රිට | 6 |

| | | |
|---|---|---|
| එල්ලේ ක්‍රීඩා උපකරණ | **එල්ලේ බැට්** | 30 |
| | ටෙනිස් බෝල | **100** |

| | | |
|---|---|---|
| බර ඉසිලීම ක්‍රීඩා උපකරණ | **හයිඩ්රොලික් ස්කොට් රැක්** | 01 |
| | බර ඉසිලීමේ බඳ පටි | **05** |
| | බර ඉසිලීමේ වේදිකා | **01** |
| | කාන්තා බර ඉසිලීමේ පුහුණු කට්ටල (වයිනිස්) | **02** |

| | | |
|---|---|---|
| කරාතේ දෝ ක්‍රීඩා උපකරණ | **ටොප් ටෙන් කරාතේ ග්ලවුස් (නිල්/රතු)** | **24** |
| | දීපක් කරාතේ පපු ආවරණ | 20 |
| | දීපක් කරාතේ ෂින් ගාර්ඩ්(නිල්/රතු) | 24 |
| | කරාතේ බෙල්ට් | 06 |
| | කෝචින් කික් පෑඩ් | 06 |
| | පන්චින් බෑග් බෙස්(කි.ග්‍රෑ.20) | 03 |
| | මවුත් ගාර්ඩ්-ඩබල් | 36 |
| | ස්කිපින් රෝප්-වයර් 228 | 36 |

| | | |
|---|---|---|
| කායවර්ධන ක්‍රීඩා උපකරණ | **ස්ථාවර බර යෙදූ ඩම්බෙල් කි.ග්‍රෑ. 02** | **08** |
| | ස්ථාවර බර යෙදූ ඩම්බෙල් කි. ග්‍රෑ.05 | 08 |
| | ස්ථාවර බර යෙදූ ඩම්බෙල් කි. ග්‍රෑ.7.5 | 06 |
| | ස්ථාවර බර යෙදූ ඩම්බෙල් කි. ග්‍රෑ.10 | 06 |
| | ස්ථාවර බර යෙදූ ඩම්බෙල් කි. ග්‍රෑ.15 | 04 |
| | අඩි 04 කර්ල් බාර් | 08 |
| | ඩම්බෙල් බාර් | 20 |
| | බර තැටි කි.ග්‍රෑ.2 5 | 10 |
| | බර තැටි කි.ග්‍රෑ.5.0 | 34 |
| | බර තැටි කි.ග්‍රෑ.7.5 | 21 |
| | බර තැටි කි.ග්‍රෑ.10 | 18 |
| | බර තැටි කි.ග්‍රෑ.20 | 22 |
| | ඩික්ලයින් බෙන්ච් | 03 |
| | ප්‍රීචර් කර්ල් මැෂින් | 05 |
| | කන්නාඩි අඩි 6x4 | 04 |

| | | |
|---|---|---|
| පැසිපන්දු ක්‍රීඩා උපකරණ | **පැසි පන්දු (පිරිමි) ප්‍රමාණය නො- 7** | **60** |
| | පැසි පන්දු (කාන්තා) ප්‍රමාණය නො- 6 | 60 |
| | පැසි පන්දු (මිනි) ප්‍රමාණය නො- 5 | 40 |
| | ස්කිපින් රෝප් | 40 |
| | කෝන්ස්(අඩි 1 උස) | 40 |
| | - එම -(අඩි 1.5 උස) | 40 |
| | - එම - (අඩි 2 උස) | 40 |
| | පැසි පන්දු නෙට් | 10 |

| | | |
|---|---|---|
| | ලැඩර් | 06 |
| | මෙඩිසින් බෝල කි.ග්‍රෑ.01 | 10 |
| | මෙඩිසින් බෝල කි.ග්‍රෑ.02 | 10 |
| | ටෙනිස් බෝල(විල්සන්) | 50 |

| | | |
|---|---|---|
| පාපන්දු ක්‍රීඩා උපකරණ | **පා පන්දු (මැච් බෝල)** | **20** |
| | මාර්කස් (පාට කිහිපයකින්) | 50 |
| | බිබ්ස් (පාට දෙකකින්) | 15 |
| | ලේඩර් | 01 |
| | ස්ටොප් වොච් | 01 |

| | | |
|---|---|---|
| චෙස් ක්‍රීඩා උපකරණ | **චෙස් බෝර්ඩ් (පොර්ටර්බල්)** | **10** |
| | ඉලෙක්ට්‍රොනික් විරාම ඝටිකා | 10 |

| | | |
|---|---|---|
| බොක්සිං ක්‍රීඩා උපකරණ | **පන්චින් බෑග් (අඩි 06)** | **06** |
| | අත් වෙළුම් පටි යුගල් | 24 |
| | මුඛ ආවරණ | 36 |
| | ස්කිපින් රොප් | 36 |
| | බර ඉසිලීමේ කට්ටල(කි.ග්‍රෑ.50) | 03 |

| | | |
|---|---|---|
| කිමිඳුම ක්‍රීඩා උපකරණ | **රෙස්කියු රින්ග්** | **06** |
| | රෙස්කියු ටියුබ් | 04 |
| | ත්‍රෝ බෑග් | 06 |
| | මවුත් මාස්ක් | 05 |
| | මෙඩිකල් බෑග් | 01 |
| | බැක් බෝර්ඩ් | 01 |
| ටයිකොන්ඩෝ ක්‍රීඩා උපකරණ | හිස් ආවරණ (නිල් / රතු ) | 06 |
| | බඳ ආවරණ (නිල් / රතු) | 08 |
| | අත් ආවරණ කට්ටල | 08 |
| | පා ආවරණ කට්ටල | 08 |
| | අත් මේස් කට්ටල | 06 |

එසේම වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරිමේදි අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් අනෙකුත් පාර්ශවකරුවන්ද සහයෝගයෙන් කටයුතු කරමින් කාර්යාවලිය මෙහෙයවීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ළඟා විමටත් ආයතනයේ කාර්ය සාධනය ඉහල නැංවා ගැනීමටත් හැකි විය.

10

# 10. පළාත් වාරිමාර්ග,ඉඩම්,ග්‍රාම සංවර්ධන සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය

## 10.1. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව

## 10.2. පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

## 10.3. පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව

10

# පළාත් වාරිමාර්ග,ඉඩම්,ග්‍රාම සංවර්ධන සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය

## ඉදිරි දැක්ම

" තෘප්තිමත් ජනතාවක් ,ඉසුරුමත් පළාතක්"

## මෙහෙවර

"වාරිමාර්ග,ඉඩම්,ග්‍රාම සංවර්ධන,කාන්තා කටයුතු සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව නියාමනය කිරීම මගින් සංවර්ධනය කිරීම."

## අරමුණු

- උතුරු මැද පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මෙහයවීම හා අධීක්ෂණය තුළින් හා විෂය භාර ගරු අමාත්‍යවරයා සම්බන්ධීකරණය කරමින් පළාත තුළ සුළු හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග සංවර්ධනය.

- උතුරු මැද පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මෙහයවීම හා අධීක්ෂණය තුළින් හා විෂය භාර ගරු අමාත්‍යවරයා සම්බන්ධීකරණය කරමින් පළාත තුළ ඇති ඉඩම් ප්‍රශස්ත මට්ටමකින් සංවර්ධනය කිරීම හා උපයෝජනය කිරීම.

- උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මෙහයවීම හා අධීක්ෂණය තුළින් හා විෂය භාර ගරු අමාත්‍යවරයා සම්බන්ධීකරණය කරමින් පළාත තුළ උරුමය සුරකින පිරිපුන් ගමක් බිහි කිරීම.

- උතුරු මැද පළාතේ තෝරා ගත් කාන්තාවන්ගේ දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය කිරීම හා ආර්ථික සවිබල ගැන්වීම තුළින් ජීවන මට්ටම නඟා සිටුවීමට සහය වීම.

## ප්‍රධාන කාර්යයන්

- වාරිමාර්ග, ඉඩම්, ග්‍රාම සංවර්ධන සහ කාන්තා කටයුතු යන විෂයන්ට අදාළව පළාත් සභාව සම්පාදනය කරනු ලබන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- වාරිමාර්ග, ඉඩම්, ග්‍රාම සංවර්ධන සහ කාන්තා කටයුතු යන විෂයන්ට අදාළව ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- වාරිමාර්ග, ඉඩම්, ග්‍රාම සංවර්ධන සහ කාන්තා කටයුතු යන විෂයන්ට අදාළව සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම.
- යහපාලනය පවත්වාගෙන යාම.

### කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 65 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 30 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 36 |
| අතිරික්ත | 01 |
| අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික පදනමේ සිටින සංඛ්‍යාව | 05 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි ඇතුළත්ව | 23.64 | 21.611 | 2.02 | 91 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 17.16 | 14.18 | 2.98 | 82 |
| **එකතුව** | 40.80 | 35.79 | 5.01 | 87 |

### මුලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2016 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1.00 | 0.97 | 0.03 | 97 |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ මිලදී ගැනීම් | 0.50 | 0.50 | 0.00 | 100 |
| වාහන | 0.50 | 0.00 | 0.50 | 0 |
| වාහන | 0.50 | 0.23 | 0.27 | 46 |
| දැනුම හා ආයතනික සංවර්ධනය | 1.00 | 0.80 | 0.20 | 80 |
| **එකතුව** | 3.50 | 2.50 | 1.00 | 71.43 |

### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය

| ව්‍යාපෘතිය/ ක්‍රියාකරකම | ඉලක්කය ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | තෘප්තිමත් වැඩ පරිසරයක් ඇති කිරිම | 0.50 | 0.50 | 100 |

| ව්‍යාපෘතිය/ ක්‍රියාකරකම | ඉලක්කය ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| කාන්තා සවිබල ගැන්වීම සහ සජීවිකරණ වැඩසටහන | ආර්ථික වර්ධනයට කාන්තා දායකත්වය ලබාගැනීමට | 2.90 | 2.16 | 74.48 |
| දිරිය කාන්තා වැඩසටහන(50% ප්‍රතිලාභි දායකත්වය මත තෝරාගත් කාන්තාවන් සඳහා ස්වයං රැකියා උපකරණ ලබා දීම) | කාන්තාවන්ට ස්වයං රැකියා උපකරණ ලබාදීම තුලින් කාන්තාවන්ගේ ආර්ථිකය දියුණු කිරිම,අවම වශයෙන් වැන්දඹු කාන්තාවන් 350ට වත් ආධාර ලබා දිම. | 5.30 | 3.95 | 74.53 |
| වැන්දඹු හෝ කාන්තා මූලික අඩු ආදායම්ලාභි කාන්තාවන් සඳහා නිවාස ඉදිකිරීම හෝ අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් ආධාර ලබාදීම | අවම වශයෙන් වැන්දඹු කාන්තාවන් 800ට වත් ආධාර ලබා දිම. | 11.46 | 9.16 | 79.93 |
| වැන්දඹු හෝ කාන්තා මූලික අඩු ආදායම්ලාභි කාන්තාවන් සඳහා නිවාස ඉදිකිරීම හෝ අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් ආධාර ලබාදීම | අවම වශයෙන් වැන්දඹු කාන්තාවන් 200ට වත් ආධාර ලබා දිම. | 3.24 | 2.44 | 75.31 |
| **එකතුව** | | **23.40** | **18.21** | **77.82** |

| ව්‍යාපෘතිය/ ක්‍රියාකරකම | ඉලක්කය ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වෙන් කළ ප්‍රතිපාදන(රු.මි) | වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය% |
|---|---|---|---|---|
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදි ගැනීම | තෘප්තිමත් වැඩ පරිසරයක් ඇති කිරිම.. | 0.50 | 0.42 | 84 |
| **එකතුව** | | **0.50** | **0.42** | **84** |

| ව්‍යාපෘතිය/ ක්‍රියාකරකම | ඉලක්කය ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වෙන් කළ ප්‍රතිපාදන(රු.මි) | වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය% |
|---|---|---|---|---|
| ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා කාර්යාලීය උපකරණ මිළදි ගැනීම | තෘප්තිමත් වැඩ පරිසරයක් ඇති කිරිම.. | 0.50 | 0.37 | 74 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | තෘප්තිමත් වැඩ පරිසරයක් ඇති කිරිම.. | 0.50 | 0.44 | 88 |
| **එකතුව** | | **1.00** | **0.82** | **82** |

